අඛණ්ඩවම 15 වසරක් ජනප්‍රියතම මහජන සම්මානයෙන් පිදුම් ලද දිනපතා ජාතික පුවත්පත

ලංකාදීප 2

2021 අගෝස්තු මස 17 වැනිදා අඟහරුවාදා

අන්තර්ජාල ලිපිනය - www.lankadeepa.lk

උදේ රෝහලට ආ කොරෝනා රෝගියා පස්සෙ පැන ගිහින්

(පානදුර සුමිත් ප්‍රේමතිලක)

කොවිඩ් 19 වයිරසය ආසාදනය වී පානදුර මූලික රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටි රෝගියෙකු පෙරේදා (15) පස්වරුවේ පැනගොස් ඇතැයි රෝහල් ආරංචි මාර්ග පවසයි.

පැනගොස් ඇත්තේ වාද්දුව, පොතුපිටිය, දෙල්ගස් හන්දිය ප්‍රදේශයේ පදිංචි විසි හැවිරිදි තරුණයෙකු බව සඳහන්ය.

එදින උදෑසන රෝහලට ඇතුළත්ව ඇති ආසාදිතයා, රෝහලේ 4 වන වාට්ටුවේ නේවාසිකව ප්‍රතිකාර ලබමින් සිට ඇති අතර ,"මිස් මෙතන ඉන්න බෑ මම ගෙදර යනවා" යනුවෙන් හෙදියකට පවසා රෝහලෙන් පැනගොස් ඇති බවට තොරතුරු ලැබී ඇතැයි රෝහල් ප්‍රකාශකයෙක් සඳහන් කළේය.

ආසාදිතයා සොයා පොලිසිය සහ බුද්ධි අංශ පරීක්ෂණ පවත්වයි.

සහන මලු පරීක්ෂයි

බේරුවලින් චෝදනා

රෝගීන් වැඩිවන නිසා පොඩි ප්‍රමාදයක්

ප්‍රාදේශීය ලේකම්

(අලුත්ගම තුසිත කුමාර ද සිල්වා)

කොරෝනා ආසාදිතව බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිවෙස්වල ප්‍රතිකාර ලබමින් නිරෝධායනයට ලක්වන්නන් හා ආශ්‍රිතයන් ලෙස නිරෝධායන වන පවුල් සඳහා ලබාදෙන වියළි ආහාර සලාකය ලැබීමේ යම් ප්‍රමාදයක් පවතින බව ආසාදිත පවුල්වල සහ නිරෝධායනය වන පවුල්වල සාමාජිකයෝ චෝදනා කරති.

මේ සම්බන්ධයෙන් බේරුවල ප්‍රාදේශීය ලේකම් රන්ජන් ප්‍රියශාන්ත මහතාගෙන් කළ විමසීමේ දී ඒ මහතා පැවසුවේ (16) සඳහන් කළේ දිනපතා වැඩි වශයෙන් රෝගීන් වාර්තා වීම හේතුවෙන් සුළු ප්‍රමාදයක් විය හැකි බවත් තමා නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත්තේ මොනයම් බාධක මැද හෝ කඩිනමින් එම සහන ඔවුන්ට ලබා දීමට කටයුතු කරන ලෙසත් බවය.

ආහාර ද්‍රව්‍ය පාර්සල් දෙවන අදියර ලබා දීමට ඇත්තේ නිරෝධායනය වන පවුල් 366 කට සහ පළමු වියළි සලාකය පවුල් 31 කට ලබා දීමට ඇති බවත් කීය.

පසුගිය සෙනසුරාදා වනවිට වාර්තාවී තිබූ නිරෝධායන පවුල් 983 කින් පවුල් 586 ක් සඳහා ද අද වනවිට එම බඩු මලු ඔවුන්ගේ නිවෙස් වෙත යවා ඇතැයි ද පළමු හා දෙවැනි වර බඩු මලු ලබා දීමට ඇත්තේ පවුල් 397 ක් සඳහා පමණක් බව ද කීය.

සේවකයකුට කොරෝනා: ගල්කිස්ස ළමා උයන වසයි

(ගල්කිස්ස අධිකරණ - දිලංගා ගෝමස්)

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාවට අයත් ගල්කිස්ස ළමා උයනේ සේවකයකු කොවිඩ් ආසාදිතයකු බවට හඳුනා ගැනීමත් සමඟ ළමා උයන පෙරේදා (14) සිට වසා දැමීමට කටයුතු යොදා ඇතැයි රත්මලාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු පවසති.

ආවොත් අනතුරේ! කොළඹ එන්න එපා

කොළඹ නගරාධිපතිනියගෙන් ඉල්ලීමක්

(ඩයනා උදයංගනී)

කොවිඩ් වසංගතයේ ශීඝ්‍ර ව්‍යාප්තියක් පවතින බැවින් අත්‍යවශ්‍ය කරුණකට හැර කොළඹ නගරයට පැමිණීමෙන් වළකින්නැයි කොළඹ නගරාධිපතිනි රෝසි සේනානායක මහතැමිය ජනතාවගෙන් ඉල්ලීමක් කරයි.

මේ දිනවල කොළඹ නගරයට පැමිණීම දැඩි ජීවිත අවදානමකට ලක්වීමක් බැවින් කොළඹට එන්න පෙර වරක්, දෙවරක් නොවෙයි කිහිප වරක්ම එය අත්‍යවශ්‍ය දැයි සිතා බලා හැකිතාක් නිවෙස්වලටම වී සිටින ලෙස ඇය ඉල්ලා සිටී.

කොළඹ නගරය පුරා කොරෝනා වයිරසය ඉතා වේගයෙන් ව්‍යාප්ත වී සෑම ප්‍රදේශයකින්ම මෙන්ම ව්‍යාපාරික ස්ථානවලින්ද ආසාදිතයන් වාර්තා වන බවත් කොරෝනා ආසාදිතයන් ඉතා විශාල පිරිසක් දෙනිකව මියයන බවත් සඳහන් කරයි.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ උපදෙස් මත කොරෝනා මර්දනයට ක්‍රියාමාර්ග රැසක් ගෙන තිබුණත් රට දිනෙන් දින ඉතිහාසයේ කවදාවත් නොදැකපු නොසිතපු තරම් භයානක තත්ත්වයකට ගමන් කරමින් ඇතැයි ද ඇය ප්‍රකාශ කරයි.

පළාත් අතර දැඩි සංචරණ සීමා පනවා ඇති නමුත් දිස්ත්‍රික්ක සහ නගර සභා බල ප්‍රදේශයේ සංචරණ සීමා නැතැයි සිතා නිවෙසින් බැහැරව ගමන් නොකරන ලෙස කොළඹ පදිංචිකරුවන්ගෙන් සහ කොළඹට පැමිණෙන සියලු දෙනාගෙන් ඉල්ලා සිටින බව රෝසි සේනානායක මහතැමිය කියයි.

පවතින දරුණු වසංගතය පාලනය කිරීමට නම් ජනතාව සෞඛ්‍ය උපදෙස් පිළිපැදීම අත්‍යවශ්‍ය බව ද ඇය සඳහන් කරයි.

එබැවින් කොළඹින් ලබාගැනීමට අවශ්‍ය සේවා හැකිතාක් මාර්ගගත ක්‍රමයට ලබාගැනීම, සෞඛ්‍ය උපදෙස් පිළිපැදීම, හැකි තරම් නිවසේ සිට රාජකාරි කටයුතු කිරීම, ආපනශාලා, සුපිරි වෙළෙඳසල් ආදියට ඇතුළුවීමේදී ඒවාගේ ඇති ඉඩ පහසුකම් හා සෞඛ්‍යාරක්ෂිත බව පිළිබඳ සැලකිලිමත්වීම, වැදගත් බව ද ඇය පවසයි.

මහරගම පොලිසියේ 12කට කොරෝනා

(මත්තේගොඩ ශාන්ත ප්‍රදීප් කුමාර කුලරත්න)

මහරගම පොලිසියට අනුයුක්තව සේවයේ නියුතු පොලිස් පරීක්ෂකවරයකු, උප පොලිස් පරීක්ෂකවරුන් සිව් දෙනෙකු ඇතුළු පොලිස් නිලධාරීන් දොළොස් දෙනකුට කොරෝනා වයිරසය ආසාදනය වී ඇතැයි මහරගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය පවසයි.

මේ හේතුවෙන් තවත් නිලධාරීන් පහළොස් දෙනෙකු ගෘහස්ථ නිරෝධායනයට යොමුකර ඇතැයි ද පැවසේ.

මහරගම පොලිසියේ ස්ථානාධිපතිවරයා උද්ඝෝෂණයක් අතරතුර දී අනතුරකට ලක් වීමෙන් පසු, පොලිස් ස්ථානාධිපති ලෙස, වැඩ බැලූ පොලිස් පරීක්ෂකවරයා, ප්‍රජා පොලිස් ඒකකයේ ස්ථානාධිපතිවරයා, ඇතුළු නිලධාරීන් දෙළොස් දෙනෙකු මෙසේ ආසාදිතයන් ලෙස හඳුනාගෙන ඇතැයි සෞඛ්‍ය අංශ පවසයි.

ආසාදිත නිලධාරීන් අතර පොලිස් පරීක්ෂකවරයෙකු, උප පොලිස් පරීක්ෂකවරුන් සිවුදෙනකු, පොලිස් සැරයන්වරයකු සහ පොලිස් කොස්තාපල්වරුන් හයදෙනෙකු වන බව මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීහු පවසති.

මීගොඩ ආයුර්වේදයේ සේවිකා 2කට කොරෝනා

(හෝමාගම ප්‍රියන්ත ජයලත්)

මීගොඩ ආයුර්වේද රෝහලේ සේවිකාවන් දෙදෙනෙකුට කොරෝනා වයිරසය ආසාදනය වී ඇති අතර ඔවුන්ගේ ආශ්‍රිතයන් නිරෝධායනය කිරීමට රෝහල් බලධාරීන් කටයුතු නොකිරීම හේතුවෙන් එහි සේවකයන් සහ රෝහලට පැමිණෙන රෝගීන් දැඩි අවදානම් තත්ත්වයක සිටින බව එම රෝහලේ සේවක සේවිකාවෝ පවසති.

එම රෝහලේ බාහිර රෝගී අංශයේ තුන්වූ නිකුත් කරන අංශයේ සහ බාහිර අංශයේ සේවිකාවන් දෙදෙනෙකුට එසේ වෛරසය ආසාදනය වී ඇති අතර ඔවුන් සේවය කළ ස්ථාන විෂබීජහරණය කිරීමටවත් රෝහල් බලධාරීන් කටයුතු නොකළ බවට ඔවුන් තවදුරටත් චෝදනා කරති.

එහි සේවකයන් පත්වී සිටින අවදානම් තත්ත්වය සැලකිල්ලට ගෙන මේ පිළිබඳව බලධාරීන්ගේ අවධානය යොමුවිය යුතු බව එම රෝහලේ සේවකයෝ ඉල්ලා සිටිති.

මීගොඩ ආයුර්වේද රෝහලේ අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය සමන් නාලක මහතාගෙන් අප කළ විමසීමක දී මෙසේ පැවසිය.

අපේ රෝහලේ සේවිකාවන් දෙදෙනෙකුට කොරෝනා වයිරසය ආසාදනය වෙලා තියෙනවා. ඒ අතරින් එක් සේවිකාවකට දැන් සුවයි. අනිත් සේවිකාවට පෙරේදා (14දා) තමයි කොරෝනා වයිරසය ආසාදනය වී ඇති බව දැන ගත්තේ. ඒ දෙන්නම දැන් සේවයට එන්නේ නැහැ. අපේ සේවකයන් දැනගන්න ඕනේ සෞඛ්‍ය උපදෙස් අනුව දුරස්තභාවය තියාගෙන රාජකාරිය කරන්න. මේ අවස්ථාවෙන් ප්‍රයෝජනය අරගෙන සමහරු බොරු කියලා නිරෝධායනය වෙන්න හදනවා.



ආරක්ෂිත ඇඳුම් නැතැයි එන්නත් සායනයට ආ සංවර්ධන නිලධාරීන් හැරී ගිහින්

එහෙම දෙන්න පහසුකම් නෑ - වාද්දුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී

(වාද්දුව - දයා හේමන්ත සිල්වා)

සෞඛ්‍යාරක්ෂක පහසුකම් සපයා නැතැයි පවසා කොරෝනා එන්නත ලබාදීමේ වැඩසටහනකට එක්ව සිටි සංවර්ධන නිලධාරිනියන් පිරිසක්, රාජකාරියෙන් ඉවත් වී ඇත.

වාද්දුව කුඩා වස්කඩුව දකුණ, උතුර හා නැගෙනහිර ග්‍රාමසේවා වසම්වල, අවුරුදු 60ට වැඩි ජනතාවට දෙවැනි මාත්‍රාවක්, අවුරුදු 30 - 60 ත් අතර ජනතාවට පළමු මාත්‍රාවක් ලබාදීමේ වැඩසටහනක්, වාද්දුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, වෛද්‍ය රන්ජන් ද සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන්, වස්කඩුව රාජගුරු ශ්‍රී සුභූති විහාරස්ථානයේ පෙරේදා (14 ද) පැවැත්වුණි. ඒ සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්ය මණ්ඩලයට අමතරව, සංවර්ධන නිලධාරීන් හා අදළ වසම්වල ග්‍රාම නිලධාරියෝ ද සහභාගී වූහ.

රාජකාරී ආරම්භ කිරීමට පෙර, සංවර්ධන නිලධාරීන් වාද්දුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයාගෙන් සෞඛ්‍යාරක්ෂිත ඇඳුම් කට්ටල ඉල්ලා ඇති අතර, එහි දී වෛද්‍යවරයා පවසා ඇත්තේ, මුඛ ආවරණ, අත්වැසුම් හා අනිකුත් මූලික පහසුකම් ලබාදිය හැකි බවත්, නමුත් ඇඳුම් කට්ටල ලබා දීමට නොහැකි බවත්ය.

පසුව ඔවුහු එම වැඩසටහනින් ඉවත් වූහ.

මේ පිළිබඳව අදහස් දැක්වූ වාද්දුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෛද්‍ය රන්ජන් ද සිල්වා මහතා:-

එන්නත් ලබාදීමේ වැඩසටහනට සහභාගීවීමට කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දහදෙනකු පමණ සංවර්ධන නිලධාරිණියන් පිරිසක් සහභාගී වීමට පැමිණියා.

ඔවුන් සෞඛ්‍යාරක්ෂිත ඇඳුම් කට්ටල ලබාදෙන ලෙස ඉල්ලා සිටියා, නමුත් අපට තියෙන පහසුකම් අනුව අත්‍යාවශ්‍ය අවම පහසුකම් ලබාදි හැකියි. නමුත් අපේ කාර්ය මණ්ඩලයේත්, හැමෝටම මෙම ඇඳුම් කට්ටල නැහැ. නමුත් අවම පහසුකම් යටතේ රාජකාරී කටයුතු කරනවා.

මේ පිළිබඳව අදහස් දැක්වූ කළුතර ප්‍රාදේශීය ලේකම් එස්. ත්‍රිමාන්න මහතා:-

එම සංවර්ධන නිලධාරිනියන් පිරිසකගේ ක්‍රියා කලාපය ගැන මා කනගාටු වෙනවා, ඒ අනුව ඔවුන්ට තරයේ අවවාද කළා.

මෙතැන අවම පහසුකම් යටතේ නිරතුරුවම සේවය කරන ග්‍රාම නිලධාරිනියන්ගේ සේවය මා අගය කරනවා.

කළුතර කොරෝනා රෝගීහු නිදැල්ලේ සෞඛ්‍ය අංශ කියයි

(බුලත්සිංහල ලක්මි කුඩලිගම)

කොවිඩ් වයිරසය ආසාදිතයන් නිරෝධායනය වෙමින් සිටින නිවෙස්වල පුද්ගලයන් නිදැල්ලේ හැසිරීමෙන් කළුතර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ප්‍රදේශවල කොවිඩ් රෝගය පැතිරයාම වේගවත් වී ඇතැයි මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරිහු කියති.

නිවසින් බැහැර නොයන ලෙස උපදෙස් දී නිවෙසේ ඉදිරිපස දැන්වීමක් අලවා ග්‍රාම නිලධාරී හා මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ගේ අධීක්ෂණය කළ ද මෙම නිවාසවල තරුණ තරුණියන් ඇතුළු සෙසු පුද්ගලයන් සමාජයේ නිදැල්ලේ හැසිරෙන බවට පැමිණිලි ලැබෙන බව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු කියති.

බුලත්සිංහල ප්‍රදේශයේ නිරෝධානයට යොමු කරන ලද කාන්තාවක් පසුගිය දිනක දෙළ පාරක නාන්නට ගොස් දෙළ අසල ඇද වැටී මරණයට පත් වූ බවත්, පයාගල ප්‍රදේශයේ නිරෝධායනය කළ නිවෙසක පුද්ගලයකු කසිප්පු බී ආරාවුලක් ඇති කරගෙන පිරිසක් ආසාදිතයන් බවට පත්කර ඇති බවත්, මේ ආකාරයට බුලත්සිංහල, මධුරාවල, අගලවත්ත සහ මතුගම ඇතුළු ප්‍රදේශ ගණනාවක පුද්ගලයන් වගකීමෙන් තොරව සැරි සැරීමේ රෝගය පැතිර යාම ඉහළ යන බවත් මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීහු කියති.

ලංකාදීප ලහුඩු දැන්වීම්

ඕනෑකර නිමේ

යතුරුපැදි ත්‍රිරෝද රථ ඩිමෝ බට්ටා ලක්ෂ 20 ට අඩු කාර් වෑන් නිවසටම පැමිණ මිලට ගනු ලැබේ. ලියනගේ 0718937286, 0778324826, 0767793229, 0766974826. L285386-2

කුලියට බද්දට උවමනායි

කියුබ් 3, 4 ටිපර් රථ අවශ්‍යයි. දිනපතා මුදල්. 0773344149. L289667-1

මෝටර් සයිකල් උවමනායි

ත්‍රීවිල් යතුරුපැදි කාර්, වෑන් ෆිනෑන්ස් පියවා ඉහළ මිලට Bajaj Honda Hero, TVS, Yamaha 0716222339, 0773680594. L289113-2

විකිණිමට

ඔබ සොයන්නේ ඉඩමක් ද නිවසක් ද කොට්ටාව මහරගම හෝමාගම බත්තරමුල්ල විශ්වාසව අපට කතා කරන්න. 0704536631. L289659-1

වතුපිටි උවමනායි

මහියංගනය නගරයේ සිට 15Km පමණ ඇතුළතින් කුඹුරු අක්කර 10ක් පමණ අත්පිට මුදලට ගැනීමට අවශ්‍යයි. 0777637636 L1021609297-1

ගේදොර ඉඩකඩම් සේවා

කඩවත අධිවේගයට නගරයට ඉතා ආසන්න වටිනා දේපලක් විකුණා ගැනීමට දිවයින වටා දක්ෂ වෘත්තියමය ඉඩම්, දේපල, බ්‍රෝකර් මහතුන් කිහිප දෙනෙකුගේ සේවය අවශ්‍යයි. 0722401400, 0787695911. L289632-1

නම් වෙනස් කිරීම

අංක.31/3B නුවරතැන්න පාර, අළුත්වත්ත, වත්තේගම 595 වත්තේගම උතුර ග්‍රාම නිලධාරී වසමේ පදිංචි සාහුල් හමීඩ් සමන්ත වන මම අද සිට හේරත් මුදියන්සේලාගේ සැමියන් සමන්ත වශයෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් දැනුම් දෙමි. L289660-1

අකුරැස්සෙ ගෙදර මාර්ගොඩ මත්තක පදිංචි විතානාච්චි ධාර්මිකා වන මම මින් ඉදිරියට විතානාච්චි ධම්මිකා ලෙස භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි. L289617-1

අනුරාධපුර නාච්චාදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 272, සුභදගම ග්‍රාමනිලධාරී කොට්ඨාසයේ 75, 5 ඇල, සුභදගම, හිදෝගම ලිපිනයේ පදිංචි අනුලා ඕපාත වන මා මින් ඉදිරියට ඕපාත කංකානම්ලාගේ අනුලාවතී ලෙස භාවිතා කරන බවට ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි. L289577-1

කළුතර දිස්ත්‍රික්කයේ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 704/ මොල්ලිගොඩ ග්‍රාම නිලධාරී වසමේ අංක 30 ශාන්ත පැට්‍රික් මාවත, මොල්ලිගොඩ යන ලිපිනයෙහි පදිංචි දෙහිපාවල අංගල කුඹුරේ රුවන්දිකා ඉෂාදිනි මධුෂානි නමැති මා මෙතැන් පටන් විජේරූප රුවන්දිකා ඉෂාදිනි මධුෂානි යන නාමය භාවිතා කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ සැමට ගෞරවයෙන් දැනුම් දෙමි. මෙයට, විජේරූප රුවන්දිකා ඉෂාදිනි මධුෂානි. L289588-1

කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හල්පිට ග්‍රාමසේවා වසමේ අංක 29 සෞම්‍ය උයන හල්පිට පොල්ගස්ඕවිට යන ලිපිනයේ පදිංචි උපේජා හංසලී තේනුවර වන මා මින් ඉදිරියට උත්තරා සෙව්මිණී තේනුවර යනුවෙන් භාවිතා කරන බවට ලක්වැසි සැමට මෙයින් දැනුම් දෙමි. මෙයට උත්තරා සෙව්මිණී තේනුවර. L289547-1

කැගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 22C පත්තම්පිටිය ග්‍රාම නිලධාරී වසමේ අංක 219, පත්තම්පිටිය, රඹුක්කන ලිපිනයේ පදිංචි සිල්වෙස්ටර් ජනක සුරේෂ් කුමාර, සිල්වෙස්ටර් වජිර සුරේෂ් කුමාර වන අප මින් ඉදිරියට පිළිවෙලින් සූරියආරච්චිලාගේ ජනක සුරේෂ් කුමාර, සූරියආරච්චිලාගේ වජිර සුරේෂ් කුමාර යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමු. L289646-1

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රා.ලේ. කොට්ඨාසයේ 517, දෙහෙල්ගමුව ග්‍රාම නිලධාරී වසමේ ඉහළගම, මහගෙදර, දෙහෙල්ගමුව, ඉබ්බාගමුව ලිපිනයෙහි පදිංචි මිල්ලවානේ ගෙදර දුනීදු මැණිකේ තිලකරත්න ඉහලගම වන මම මෙතැන් පටන් මිල්ලවානේ ගෙදර දුනීෂා මධුෂානි තිලකරත්න ඉහලගම යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි. L289591-1

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බමුණුගෙදර ග්‍රාම නිලධාරී වසමේ 797 අංකයෙහි පදිංචි මොහම්මඩ් හුවාඩ් ශෙයිමා ෂාන් වන මම මෙතැන් පටන් හේරත් මුදියන්සේලාගේ ලක්වාසී ජනතාවටත් මෙයින් දන්වා සිටිමු. මෙයට, හේරත් මුදියන්සේලාගේ මලීනා ශෙයිමා ෂානු හේරත් යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් සියලු ලක්වාසී ජනතාවටත් මෙයින් දන්වා සිටිමි. L289593-1

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 1589 දරණ මාකඳුර පහළ ග්‍රාම නිලධාරී වසමේ 200/1, මීගමුව පාර, මාකඳුර, ගෝනවිල යන ලිපිනයේ පදිංචි අංක 725301804V දරණ ජාතික හැඳුනුම්පත හිමි රන්දෙනි ආරච්චිගේ ඉන්ද්‍රානි වන මම අද පටන් රන්දෙනි ආරච්චිගේ ඉන්ද්‍රානි රන්දෙනි යන නම භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයේ සියළු පුරවැසියන් වෙත දන්වා සිටිමි. L289587-1

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 388 දෙරවේරුව ග්‍රාම නිලධාරී වසමේ දෙරවේරුව වත්ත මාවිළිය පදිංචි හංගිලි ගුරුන්නැහැල ගෙදර තුසාන් පුෂ්ප කුමාර ලියනගේ වන මම අද පටන් හංගිලි ගුරුන්නැහැලාගේ තුෂාන් පුෂ්ප කුමාර ලියනගේ නම භාවිතා කරන බවට ශ්‍රී ලංකා පුරවැසියන්ට මෙයින් දන්වා සිටිමි. L289594-1

කුරුණෑගල දිස්ත්‍රික්කයේ රදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 562 හිනිහිරිය ග්‍රාම නිලධාරී වසමේ 359 අංකයෙහි පදිංචි බන්දුවා දේවගේ අජිත් ශාන්ත වන මම මෙතැන් පටන් බන්දුවා දේවයලාගේ අජිත් ශාන්ත යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් සියලු ලක්වාසී ජනතාවටත් මෙයින් දන්වා සිටිමු. මෙයට, බන්දුවා දේවයලාගේ අජිත් ශාන්ත. L289595-1

ගම්පහ දිස්ත්‍රික්කයේ කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 155 ඒ. වල්පොල ග්‍රාම නිලධාරී වසමේ නො. 10/1, වල්පල, ආඬිඅම්බලම යන ලිපිනයේ පදිංචි සිංහ මහමුදලිගේ ලඝන්ත සඳුනෙත් යන මාගේ පුතාගේ නම මින් ඉදිරියට සිංහ මහමුදලිගේ ලක්මිණ සඳුනෙත් යනුවෙන් භාවිතා කරන බවට ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. L289599-1

ගාල්ල දිස්ත්‍රික්කයේ ඉමදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 153 B රංගොඩ ග්‍රාම නිලධාරී වසමේ, අංක 460, ගල්ලලවත්ත, රංගොඩ, අඟුළොහ ලිපිනයේ පදිංචි, පාතික හැඳුනුම්පත් අංක 665011569V හිමි දෙරපෙ විතානගේ සියන්ති රේණුකා නමින් හැඳින් වූ මා මෙතැන් පටන් අබේගොඩ ලියන ආරච්චිගේ ශ්‍රියන්ති රේණුකා යන නමින් හඳුන්වනු ලබන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. L1021609302-1

ගාල්ල දිස්ත්‍රික්කයේ මාදම්පාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් 79 A - උස්මුදුලාව ග්‍රාම නිලධාරී වසමේ නො : 271/2, පන්සල පාර, උස්මුදුලාව, කුලීගොඩ යන ලිපිනයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 200307711964 හිමි ලද්දු පිනාස් සඳරුවන් යන නම භාවිතා කළ මා මෙතැන් පටන් ලද්දු පීනාත් සඳරුවන් යන නම භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. මෙයට, ලද්දු පීනාත් සඳරුවන්. L289676-1

නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 468 - A කඩදොරපිටිය ග්‍රාම නිලධාරී වසමේ පාසැල් මාවත පුඹළුඔය ලිපිනයේ පදිංචි උප්පන්න සහතිකයේ සඳහන් වැලිගම්පල වික්‍රම ගෙදර දයානන්ද වන මම මින් ඉදිරියට වික්‍රම ගෙදර දයානන්ද යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. L289673-1

නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රකිල්ලගස්කඩ ග්‍රාම නිලධාරී වසමේ අංක.1/38, සිසිල, රත්මැටිය පාර, රකිල්ලගස්කඩ ලිපිනයේ පදිංචි නයිමලේ ගෙදර මහින්ද බණ්ඩාර වන මම මින් ඉදිරියට දිසානායක මුදියන්සේලාගේ මහින්ද බණ්ඩාර යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි. L289627-1

බස්නාහිර පළාතේ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 490, අතුරුගිරිය ග්‍රාම නිලධාරී වසමේ අංක 211/A, මොරටුවාතේන පාර, අතුරුගිරිය ලිපිනයේ පදිංචි දම්මික චරන්දින දෙනවක වන මම මෙතැන් සිට දෙනවක දෙන් ධම්මික චරන්දින ලෙසට භාවිතා කරන බව ලක්වාසී ජනතාවට හා ලක්රජයට මෙයින් දන්වා සිටිමි. L289619-1

මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාළිගාතැන්න ග්‍රාම නිළධාරී වසමේ එම්.සී පාරේ පදිංචි රණසිංහ ආරච්චිගේ උසද එම්පි විතුෂණී පෙරේරා වන මම මින් ඉදිරියට රණසිංහ ආරච්චිගේ ළඝද එම්පි විතුෂණී පෙරේරා යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයට දන්වා සිටිමි. L289561-1

මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 102 - A දෙලියද්ද ග්‍රාම නිලධාරී වසමේ දුම්දු දෙලියද්ද බිබිල යන ලිපිනයේ පදිංචි හෝරාප පතිගේ දුම්දු මාලිංග වසන්ත කුමාර, හෝරාප පතිගේ නෙත්මී රංගනා වසන්ත කුමාර, හෝරාප පතිගේ රවිඳු කේනක වසන්ත කුමාර යන තිදෙනා දැනට රාජකාරී කිරීමේදී හා වෙනත් කටයුතු සඳහා පහත නම් භාවිතා කරන බව සහතික කරමි. ඒ අනුව මේ නම් දැන්වීම් ප්‍රසිද්ධ කිරීමට අවසර ලබාදීම සුදුසු බවට නිර්දේශ කරමි. 1. හෙට්ටි ආරච්චිගේ දුම්දු මාලිංග 2. හෙට්ටි ආරච්චිගේ නෙත්මී රංගනා 3. හෙට්ටි ආරච්චිගේ රවිඳු කේනක. L289615-1

මොණරාගල දිස්ත්‍රික්කයේ මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 110/H පොල්ගහපිටිය ග්‍රාම සේවා වසමේ පොල්ගහපිටිය, කිරමානාහෙල යන ලිපිනයේ පදිංචි ජා.හැ. අංක 996951820V හිමි ජයසිංහ මුදියන්සේලාගේ චන්දිමා මල්කාන්ති වන මම මින් ඉදිරියට ජයසිංහ මුදියන්සේලාගේ චන්දිමා මල්ෂා සමරකෝන් යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි. L289563-1

රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 262/A කරදියමුල්ල ග්‍රාමසේවා වසමේ පදිංචි පොන්නසාමි මංජුලා වන මම මෙතැන් පටන් ගෙදර අරාවේ ගෙදර මංජුලා මධුවන්ති ලෙස වෙනස් කර භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් ප්‍රකාශ කරමි. L289643-1

රත්නපුර පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 162B බැරැන්ඩුව වසමේ පදිංචි කහංගම මනන්නලාගේ සුමුදු දිලීප් ප්‍රේමසිරි වන මා මින් ඉදිරියට කහංගම මනන්නලාගේ එනිදු රඟේන් හිමංෂු රණදේව යනුවෙන් භාවිතා කරන බව ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි. L289559-1

වාසගම වෙනස් කිරීම. රත්නපුර දිස්ත්‍රික්කයේ වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හදගිරිගොඩ වසමේ පදිංචි කුමුදප්පුලාගේ චම්පා ප්‍රියදර්ශනී වන මම මෙතැන් පටන් කුරුප්පුලාගේ චම්පා ප්‍රියදර්ශනී යනුවෙන් භාවිතා කරන බව ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි. L289589-1

සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 445, පහළ හංවැල්ල ග්‍රාම නිලධාරී වසමේ ගෘහ අංක 175/D, පහළ හංවැල්ල හංවැල්ල යන ලිපිනයෙහි පදිංචි විජේපුලි හේවගේ සුනන්දා ශ්‍රීපාලි රෝහිණී කුමාරි වන මම මින් ඉදිරියට, වීරප්පුලි හේවගේ සුනන්දා ශ්‍රීපාලි රෝහිණී කුමාරි වශයෙන් භාවිතා කරන බවට ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. L289585-1

රියදුරන්

011-2825719, 071-5179662 සහැල්ලු බරවාහන රියදුරන් සහයකයින් පැමිණි දිනම සේවයට අවශ්‍යයි. රැකියාව මත 65000/- වැටුප්. 0776349650 L289574-1

අප ආයතනයට කොළඹ පළපුරුදු බර වාහන රියදුරන් පොලිස් වර්තාව සමඟ අවශ්‍යයි. (කොළඹ අවට විශේෂයි) ටෙලි :- 0714808109. L289576-1

බරවාහන (අඩි 20) රියදුරන් සහ අත්දැදිකරුවන් අවශ්‍යයි (ප්‍රධාන පෙළේ ආයතනයකට) දුරකතන 0779484371, 0777155762. L289672-1

වයස අවුරුදු 50-60 අතර කොළඹ නගරයේ මාර්ග පිළිබඳව මනා අවබෝධයක් ඇති රියදුරු වෘත්තියේ අවුරුදු 10ට වඩා පළපුරුද්දක් සහිත විනීත රියදුරෙකු කාර්යාල කටයුතු සඳහා වහාම අවශ්‍යයි. නවාතැන් පහසුකම් සපයනු ලැබේ. වැටුප සාකච්ඡා කරගත හැක. විමසීම් 0705-988454, 0713-387661. L289551-1

හෝටල් සහ බේකරි

011-2825719, 071-5179662 හොටෙල් රෙස්ටුරන්ට් බේකරි සමූහයට පුහුණු නුපුහුණු සියළුම සේවකයින් පැමිණි දිනම සේවයට අවශ්‍යයි. ආහාර නවාතැන් සමඟ රැකියාව මත 65000/- වැටුප්. 077-6349650 L289575-1

අලුත පටන් ගත් අවන් බේකරියට වැඩකරුවෙක් සහ චූන්පාන් ත්‍රීවිලර් වැඩට සේවකයන් අවශ්‍යයි. විමසන්න. 0779824311 L289648-1

කළුතර හෝටලයට කෝකිවරයෙකු සහ අත්දැදිකරුවෙක් අවශ්‍යයි. (හොටෙල් රෝසි). Te. 077-8718739, 077-5813112. L289597-1

කොත්තු බාස් කෙනෙකු අවශ්‍යයි. 0762779869, 0704634413. L289670-1

චයිනීස්, රයිස් ඇන්ඩ් කරි කුක්, හෙල්පර්වරුන් අවශ්‍යයි. හෝමාගම. 0777743612. L289160-3

මහනුවර බේකරි වැඩ දන්නා බාස්වරු අවශ්‍යයි. කෑම, නවාතැන් නොමිලේ. වඩියට 1500-2000 අතර. 0773496312, 0715496312, 0812217505. L289564-1

මහරගම හෝටලයකට කොත්තු බාස් කෙනෙකු වහාම අවශ්‍යයයි. වැටුප 75000/-. 0714483505, 0714167642. L289684-1

රත්තනපිටියේ පිහිටි Grill war රෙස්ටුරන්ට් ආයතනය සඳහා ෂාප්ප, කොත්තු, සෝපීස් වර්ග සෑදීමට දන්නා කෝකිවරයෙකු අවශ්‍යව ඇත. විමසීම් 0763036187, 0112048999. L283158-5

හවායි බේකර්ස් සඳහා බේකරි බාස් කෙනෙකු සහ බේකරි උදව්කරුවෙකු අවශ්‍ය වී ඇත. පඩිය පිළිවෙලින් රු. 75000ක් සහ රු. 45000ක් වේ. විමසීම්. 0773658648. L270588-13

මේසන්වරු සහ වඩුබාස්වරු

L289365-2

071-7262680 කොළඹ අවට වැඩකිරීම් සඳහා දක්ෂ මේසන්වරුන් හා ගෝලයින් අවශ්‍යයි. ඉහළ වැටුප්. L284250-3

071-8780930 මීරිගමට ෂටරින් බාස්වරු 2800/- අත්දැදිකරුවන් 2000/- ඉතා ඉක්මනින් අවශ්‍යයි. දිනපතා වියදම් මුදල්, සතිපතා වැටුප්. L289620-1

0759900778 කඩවත වැඩබිමකට මේසන් බාස්වරුන් සහ ගෝලයින් අවශ්‍යයි. වැටුප සාකච්ඡා කරගත හැක. 075-9063065. L289615-1

0766589702 පන්නිපිටිය වැඩබිම් සඳහා මේසන්වරු, කම්කරුවන් අවශ්‍යයි. ගෙවීම් 3000/- - 2200/- ටාගට් OT ඇත. L289612-1

අංගොඩ ෂටරින් බාස්වරු 2800/- ගෝලයන් 2000/- OT ඇත. සති පඩි. 0773376747, 0717123444 L289614-1

කඳනේ වැඩබිමක් සඳහා දක්ෂ කපාරාරුකරුවන් අවශ්‍යයි. දෛනික වැටුප්. 077-4543153 L289625-1

කපරාරුවට දක්ෂ බාස් කෙනෙකු අවශ්‍යයි. මත්තේගොඩ නවාතැන් නොමැත. 0714758757 L289644-1

කොරෝනාවෙන් ආරක්ෂිත වැඩබිම් සඳහා උපකොන්ත්‍රාත්කරුවන්, මේසන් බාස්වරු සහ ගෝලයින් අවශ්‍යයි. ඉහළ වැටුප්. 076-9926484, 077-3815906. L1021609300-1

කොළඹ ප්‍රධාන පෙළේ නිවාස ඉදිකිරීම් ආයතනයකට අත්තිවාරම් හා බිත්ති, සැටලිම්, ටයිල්, පේන්ට් සඳහා උපකොන්ත්‍රාත්කරුවන් අවශ්‍යයි. 0706800500 L289526-2

කොළඹ රාජගිරිය ඉදිකිරීම් ආයතනයක් සඳහා කනු, බීම් දක්ෂ ලෙස කපරාරු කල හැකි මේසන් බාස්වරු (වැටුප 3000/-), දක්ෂ ලෙස පොට් අදිය හැකි පේන්ට් බාස්වරු (2500/-) දිනපතා වියදම් මුදල්, දින 7 වැටුප්, නවාතැන් පහසුකම්. 071-4345444, 071-2105176. L285421-2

කොළඹ වැඩබිම් සඳහා මේසන්වරු (2700/-) ගෝලයන් (2000/-) වහාම අවශ්‍යයි. සති වැටුප්. 0764960757. L286121-2

ගොනවුව වැඩබිමක් සඳහා දක්ෂ මේසන්වරු පුරුදු ගෝලයින් ඉක්මණින් අවශ්‍යයි. කෑම දෙනු ලැබේ. දිනපතා වියදම් මුදල්. 0763476694, 0740952877. L289567-1

ගෝලයින් (1800/-) මේසන් බාස්වරු (2800/-) සහ සැටලිම් බාස්වරු කම්බි (2800/-) අවශ්‍ය කෙරේ. නවාතැන් සැපයේ. (පන්නිපිටිය ආසන්නයි) 0777745143 L284787-2

දක්ෂ මේසන් බාස්වරු සහ ගෝලයින් අවශ්‍යයි. මේසන් බාස් වැටුප රු. 2500 සිට 3000 දක්වා ගෝල වැටුප රු. 2000 දිනපතා වැටුප් දෙනු ලැබේ. නවාතැන් පහසුකම් ඇත. දිවා ආහාරය නොමිලේ. මහරගම. 0714758531 L289611-1

දක්ෂ මේසන්වරු අවශ්‍යයි. වැටුප 3000/- පේන්ට් බාස්වරු අවශ්‍යයි. 2800/- අත්දැදිකරුවන් අවශ්‍යයි. වැටුප 2000/- දවස් පඩි. 0702175433 L289571-1

දක්ෂ සැටලින් බාස්වා ගෝලයෝ ඉක්මනින් අවශ්‍යයි. කෑම නවාතැන් නොමිලේ. බාස්ට 2500/- ගෝලයන්ට 1500/- හොරණ. 0717363061, 0777214315 L289580-1

දිනපතා වැටුප් මේසන් 3000/-, අත්දැදිකරු 2200/-, දිවා ආහාර නොමිලේ බණ්ඩාරගම වැඩබිම්. 0714107575 L289576-1

නුගේගොඩ අලුතින් පටන්ගන්නා වැඩබිමක් සඳහා මේසන්වරුන් ගෝලයන් සැටර්න් ගෝලයන් උවමනාය. 0789976154. L289675-1

පළපුරුදු සැටලිම් බාස්වා 2700 සිට ගෝලයෝ 2000 සිට 2500 දක්වා අවශ්‍යයි. කටුබැද්ද. 0760200337 L289657-1

පුද්ගලික වැඩබිමක් සඳහා දක්ෂ මේසන්වරයකු සහ දක්ෂ ගෝලයකු අවශ්‍යයි. බීම් කපරාදු සඳහා නවාතැන් පහසුකම් ඇත. සතිපඩි දක්ෂ අය පමණක් අමතන්න. 0770078794 L289661-1

බියගම අවට වැඩබිම් සඳහා මේසන් බාස්වරු අවශ්‍යයි. ඉහළ වැටුප්. නවාතැන් නොමිලේ. 0773561596, 0719962727 L289519-2

මීගොඩ අවට වැඩබිම් සඳහා මේසන්වරු අවශ්‍යයි. මේසන් 2800/-, අත්දැදිකරුවන් 2000/- දිනපතා වැටුප්. 0750902491, 0712781043 L289583-1

මේසන් කම්බි, සැටලින් පේන්ට් බාස්වරුන් ගෝලයෝ අවශ්‍යයි. නවීන්. 0773470324 L284346-3

මේසන් බාස්වරු සහ ෂටරින් බාස්වරු, ගෝලයින් දක්ෂ අය පමණක් කතා කරන්න. 3000/-, 2500/-, 2000/- සති පතා වැටුප්. මාලඹේ. 0779756193, 0715605193 L289554-1

මේසන් බාස්වරුන් හා අත්දැදිකරුවන් අවශ්‍යයි. කොළඹ අවට වැඩබිම්වලට. 0723312461, 0766861090 L289570-1

මේසන් බාසුන්නැ අවශ්‍යයි. ගෝලයන් අවශ්‍යයි. නවාතැන් ඇත. 078-8969403, 072-3319372 L289553-1

මේසන් වැඩ සඳහා ගෝලයින් අවශ්‍ය. දිනපතා වැටුප් නැවතීමේ පහසුකම් ඇත. 0750435130, 0762970639 L289639-1

මේසන්වරුන් අවශ්‍යයි. වැටුප දිනපතා 3000/- මීගමුව. 0775333597. L289091-3

රාගම පිහිටි ඉන්ටර්ලොක් ගල් ආයතනයක් සඳහා අත්දැදිකරුවන් උවමනාකර ඇත. නවාතැන් පහසුකම් සහිතයි. 0714465817, 0770744319 L289605-1

වඩු බාස්වරු අවශ්‍යයි (දවස් පඩිය) නවාතැන් පහසුකම් ඇත. 0771618813 L289621-1

වත්තල කඳන කඩවත වැඩබිම් සඳහා මේසන් හා ගෝලයින් අවශ්‍යයි. 2000-3000/- අතර වැටුප් නවාතැන් ඇත. 0710363630 L289607-1

වැටුප් 3800/- සිට 2000/- දක්වා මේසන්, ටයිල්, බිත්ති පේන්ටර්, කම්කරු, ගල්කිස්ස වැඩබිම් දුර පළාත් දිනපතා වැටුප් ආහාර නවාතැන්. 071-3307264, 077-4020678, 078-4396219. L289668-1

ෂටරින් කම්බි මේසන්වරු අත්දැදිකරුවන් අවශ්‍යයි. 3000/ 2000 නවාතැන් ඇත. කොළඹ අවට වැඩබිම් සඳහා පිට පළාත්වලින්. 0716539058, 0763255275. L289658-1

මේසන්, සටලින්, බාස්වරුන් ගෝලයින් අවශ්‍යයි. දිනපතා වැටුප්. 0769492736 L289584-1

ගෘහ සේවකයෝ

මිරිහානේ වෛද්‍යවරයෙකුගේ නිවසේ ගෘහ සේවිකාවක් ලෙස නැවතී සේවය කිරීමට වසර 2 පළපුරුදු අවු. 40-50 අතර කාන්තාවක් අවශ්‍යයි. වැටුප 35,000-40,000 අතර. 0777-704887. L289629-1

කාර්මිකයෝ

ඉදිකිරිමි ආයතනයක වැඩ කිරීමට වැල්ඩින්කරුවන් සහ අත්දැදිකරුවන් අවශ්‍යයි. නැවතීමේ පහසුකම් දිනපතා/ වියදම් මුදල් (කොළඹ). 0778102657, 0776432768 L282069-3

ටයර් වැඩ කිරීමට අය අවශ්‍යයි. වැඩි වැටුප්. 0777743612. L289284-2

ටයර් වැඩට දක්ෂ සේවකයින් අවශ්‍යයි. නවාතැන් සමඟ ඉහළ වැටුප් පිළියන්දල (අලුතින් පටන්ගන්නා). 0779510144, 0779709288 L288438-1

අලෙවිකරුවන්

බෙද හැරිමේ ආයතනයට සේවකයින් අවශ්‍යයි. 30,000/- මාකොල අවට විශේෂයි. 0715837351, 0702589863 L284105-3

වතුවැඩ

කුකුළු ගොවිපළකට පවුල් අවශ්‍යයි. කුලියාපිටිය. 0778065800. L289138-2

පොල් ගස් සහ වල් කැපීමට දක්ෂ කෙනෙක් අවශ්‍යයි. නවාතැන් පහසුකම් ඇත. 0771618813 L289622-1

හෝමාගම වත්තක වගාකටයුතු කිරීමට මත්ද්‍රව්‍යවලින් තොර පිරිමි සේවකයෙකු අවශ්‍යයි. කෑම නවාතැන් ඇත. 0711958848 L289656-1

පරිගණක

WANTED Computer Typist (English, Sinhalese) Urgently 1200/- per day or monthly salary 0760734110 Apply with in This Week only. L289650-1

ආරක්ෂක සේවා

00 ඒකල, කොටුගොඩ ගබඩා කාර්යාල සඳහා OIC - 1300, SSO - 1200, CSO - 1100 - 1200 (පැය 12 සේවා මුරයන් සඳහා පමණි) EPF + ETF ණය පහසුකම්, සුභසාධක, අතිකාල පැයකට රු. 150/- සිට රු. 175/- උප්පැන්න, ග්‍රාමසේවා, අධ්‍යාපන මුල් පිටපත් සමඟ පැමිණෙන්න. 0763035656, 0763075656. L287406-2

00 ජාඇල, කඳාන, පෑලියගොඩ, කැළණිය, හුණුපිටිය, සපුගස්කන්ද හෙයියන්තුඩුව, හෝමාගම, කඩුවෙල, මාලඹේ යන ප්‍රදේශයන් සඳහා ආරක්ෂක නිලධාරීන් වහාම බඳවා ගැනේ. වැටුප SSO - 1000 සිට 1300 දක්වා LSO 1000 සිට 1200 දක්වා EPF, ETF, ණය සහන පහසුකම්, සුභසාධක, රක්ෂණ පහසුකම් සහ ආහාර නවාතැන් සහන මිලට. 0763035656, 0763055656. L286553-2

0717090055 ආරක්ෂක නිලධාරීන් නිලධාරිනීන් පුරප්පාඩු : 0717090048 කොළඹ, 0717002818 බියගම, කැළණිය, 0712615781 වත්තල, ඒකල කොටුගොඩ, මීගමුව. වැටුප රු. 75,000/-. L289566-1

VO - Marketing Manager OIC 1200 SSO JSO LSO වත්තල ජාඇල සිදුව ගම්පහ ඉහළම වැටුප්. 0776142760. L289546-1

අතිමානවත් ආරක්ෂක රැකියාවක් සඳහා ඇබෑර්තු (වත්තල, කෙරවලපිටිය අවට) පැය 12 මුරයකට මසකට රු. 50,000.00 වැඩි වැටුප්. ප්‍රධාන ආරක්ෂක නිලධාරී (CSO) රු. 1300.00, ස්ථාන භාර නිලධාරී (OIC) රු. 1200.00 ආරක්ෂක නිලධාරී (SO) රු. 1150.00 කාන්තා ආරක්ෂක නිලධාරී (LSO) රු. 1150.00 විමසන්න. 0760953420, 0778355655, 0760953422. L262661-7

ආරක්ෂක ඇබෑර්තු ගම්පහ, ඒකල, අනුරාධපුර, වවුනියා, දෙහිවල, මොරටුව, වරකාපොල, දඹුල්ල, තිස්සමහාරාම, බොරැල්ල, නාරාහේන්පිට විමසීම්. 0761353914. L289599-1

ආහාර අපනයන ආයතනයක් සඳහා දිවුලපිටිය, වේයන්ගොඩ, මිනුවන්ගොඩ අවට්න් සියලු ආරක්ෂක නිළධාරීන් කඩිනමින් බඳවා ගනේ. දීමනා සහිත ඉහල වැටුප්. නවාතැන් නොමිලේ. ආහාර නොමිලේ/ සහනදයී මිලට 0703505069, 0753227201, 0112245506. L289123-3

ඇබෑර්තු ප්‍රදේශයේ පිහිටි කර්මාන්තශාලාවක් සඳහා ආරක්ෂක නිලධාරීන් අවශ්‍යයි. OIC/ LSO/ SO ඉහළ වැටුප්. විමසීම් 0750300333, 0759100002. L285478-3

මල්වානට ස්ථානභාර නිලධාරියෙකු ද (1300/-) ආරක්ෂක නිලධාරියෙකු ද පෑලියගොඩට රාත්‍රියට අයෙක් ද මාකොළට පළපුරුදු ආරක්ෂක නිලධාරියෙකු ද වත්තලට වාහන ස්ථානයට ආරක්ෂකයෙකු ද නිවසක් බලාගැනීමටද අවශ්‍යයි. 0777186087. L289674-1

රාජගිරියේ පිහිටි කාර්යාලයක් සඳහා ආරක්ෂක නිලධාරීන් කඩිනමින් බඳවා ගනේ. ඉහළ වැටුප්. නවාතැන් නොමිලේ. ආහාර නොමිලේ/ ස

අඛණ්ඩවම 15 වසරක් ජනප්‍රියතම මහජන සම්මානයෙන් පිදුම් ලද දිනපතා ජාතික පුවත්පත

ලංකාදීප 2

2021 අගෝස්තු මස 17 වැනිදා අඟහරුවාදා

අන්තර්ජාල ලිපිනය - www.lankadeepa.lk

බීල මෝටර් රථ පැදවූ දෙන්නගෙ ලයිසන් 'කැන්සල්'

(මීගමුව අධිකරණ ඩබ්ලිව්. කීර්ති - මීගමුව නියුබට් ප්‍රනාන්දු)

අපරික්ෂාකාරිව යතුරුපැදියක් සහ මෝටර් රථයක් ධාවනය කිරීම සම්බන්ධයෙන් වරද පිළිගත් දෙදෙනෙකුට මීගමුව වැඩ බලන මහේස්ත්‍රාත් පීමාල් අමරසිංහ මහතා එක් අයෙකුට රුපියල් 30,000 බැගින් රුපියල් 60,000 ක දඩ නියම කරනු ලැබ රිය ධාවන බලපත්‍ර මාස තුන බැගින් තාවකාලිකව අත්හිටුවීමට නියෝග කළේය.

වරද පිළිගත් චූදිතයන් චූයේ කොච්චිකඩේ, පෝරුතොට පදිංචි මොහොමඩ් ඩිනල් මොහොමඩ් රම්සි සහ මීගමුව වැල්ලවිදිය පදිංචි මෙරිල් ක්‍රිස්ටෝපර් ප්‍රනාන්දු නමැත්තන්ය. මීගමුව පොලිසියේ රථ වාහන අංශයේ සැරයන් (41380) තිලකරත්න මහතා පැමිණිල්ල මෙහෙයවීය.

ඇප පිට ඇවිත් මාසයයි; ආයෙත් කඩු විකුණද්දී මාට්ටු

(මල්වාන ඩබ්ලිව්.ඩී.එම්. විතානගේ හා දෙල්ගොඩ සුදත් පුබුදු කීර්ති)

හෙරොයින් ජාවාරම් කිරීම් සම්බන්ධව රක්ෂිත බන්ධනාගාර ගතව සිට ඇපපිට පැමිණ මාසයකට පමණ පසුව නැවත හෙරොයින් ජාවාරමේ යෙදුණු තරුණයෙකු පෙරේදා (14) ගල්වලගොඩ රබර් කඩේ අසලදී අත්අඩංගුවට ගත් බව දෙමිපේ පොලිසිය පවසයි.

මොහු ළඟ තිබී හෙරොයින් ග්‍රෑම් පහයි මිලි ග්‍රෑම් දෙසියක් සමඟ ඉලෙක්ට්‍රොනික් තරාදියක් හා හෙරොයින් ඔතන දවටන කපන කුඩා කතුරක් පොලිස් භාරයට ගත් බවද පොලිසිය සඳහන් කරයි.

මේ වනවිට මොහුට හෙරොයින් ජාවාරම් කිරීම් සම්බන්ධව මහාධිකරණයේ නඩු හතරක් හා රන් මාල මංකොල්ලකෑම් සම්බන්ධව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු හයක් පවතින බවත් පොලිසිය කියයි.

දෙමිපේ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ආර්.ජී.ඒ. ප්‍රියන්ත මහතාගේ උපදෙස් අනුව, උපපොලිස් පරීක්ෂක ඊ.ඒ.එම්.එම්. එදිරිසිංහ, පො.කො. වීරරත්න (70702), සම්පත් (79964) හා පො.කො. රියැදුරු චන්දරත්න (20169) යන නිලධාරීහු සහභාගී වූහ.

අනතුරේ! කොළඹ එන්න එපා

කොළඹ නගරාධිපතිනියගෙන් ඉල්ලීමක්

(ඔයනා උදයංගනී)

කොවිඩ් වසංගතයේ ශීඝ්‍ර ව්‍යාප්තියක් පවතින බැවින් අත්‍යවශ්‍ය කරුණකට හැර කොළඹ නගරයට පැමිණීමෙන් වළකින්නැයි කොළඹ නගරාධිපතිනි රෝසි සේනානායක මහත්මිය ජනතාවගෙන් ඉල්ලීමක් කරයි.

මේ දිනවල කොළඹ නගරයට පැමිණීම දැඩි පීවිත අවදානමකට ලක්වීමක් බැවින් කොළඹට එන්න පෙර වරක්, දෙවරක් නොවෙයි කිහිප වරක්ම එය අත්‍යවශ්‍ය දැයි සිතා බලා හැකිතාක් නිවෙස්වලටම වී සිටින ලෙස ඇය ඉල්ලා සිටී.

කොළඹ නගරය පුරා කොරෝනා වයිරසය ඉතා වේගයෙන් ව්‍යාප්ත වී සෑම ප්‍රදේශයකින්ම මෙන්ම ව්‍යාපාරික ස්ථානවලින්ද ආසාදිතයන් වාර්තා වන බවත් කොරෝනා ආසාදිතයන් ඉතා විශාල පිරිසක් දෙනිකව මියයන බවත් සඳහන් කරයි.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ උපදෙස් මත කොරෝනා මර්දනයට ක්‍රියාමාර්ග රැසක් ගෙන තිබුණත් රට දිනෙන් දින ඉතිහාසයේ කවදාවත් නොදැකපු නොසිතපු තරම් භයානක තත්ත්වයකට ගමන් කරමින් ඇතැයි ද ඇය ප්‍රකාශ කරයි.

පළාත් අතර දැඩි සංචරණ සීමා පනවා ඇති නමුත් දිස්ත්‍රික්ක සහ නගර සභා බල ප්‍රදේශයේ සංචරණ සීමා නැතැයි සිතා නිවෙසින් බැහැරව ගමන් නොකරන ලෙස කොළඹ පදිංචිකරුවන්ගෙන් සහ කොළඹට පැමිණෙන සියලු දෙනාගෙන් ඉල්ලා සිටින බව රෝසි සේනානායක මහත්මිය කියයි.

පවතින දරුණු වසංගතය පාලනය කිරීමට නම් ජනතාව සෞඛ්‍ය උපදෙස් පිළිපැදීම අත්‍යවශ්‍ය බව ද ඇය සඳහන් කරයි.

එබැවින් කොළඹින් ලබාගැනීමට අවශ්‍ය සේවා හැකිතාක් මාර්ගගත ක්‍රමයට ලබාගැනීම, සෞඛ්‍ය උපදෙස් පිළිපැදීම, හැකි තරම් නිවසේ සිට රාජකාරි කටයුතු කිරීම, ආපනශාලා, සුපිරි වෙළෙඳසල් ආදියට ඇතුළුවීමේදී ඒවාගේ ඇති ඉඩ පහසුකම් හා සෞඛ්‍යාරක්ෂිත බව පිළිබඳ සැලකිලි මත්වීම, වැදගත් බව ද ඇය පවසයි.

සූම් ඉගෙන ගන්න දැරියට අසැබි දසුන් එවූ දෙදරූ පියා දැලේ

(ගම්පහ තිලකරත්න දිසානායක)

දහතුන් හැවිරිදි පාසල් දැරියකගේ ජංගම දුරකතනයට අසභ්‍ය දසුන් එවීමෙන් පසු දැරිය මානසික පීඩනයට පත්ව ඇති බවට ගණේමුල්ල පොලිසියට කළ පැමිණිල්ලකට අනුව දෙදරූ පියකු අත්අඩංගුවට ගත් බව පොලිසිය කියයි.

මෙම දැරිය තම මවගේ ජංගම දුරකතනයෙන් සූම් තාක්ෂණය ඔස්සේ අධ්‍යාපන කටයුතු සිදු කරමින් සිටින අතරතුර අසභ්‍ය දසුන් සහ අසභ්‍ය වැකි අවස්ථා කිහිපයකදී ලැබී ඇති බවත් මේ සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීමෙන් පසු ජංගම දුරකතන අංකය අනුව සැකකරු අත්අඩංගුවට ගත් බවත් පොලිසිය පවසයි.

සැකකරු රාගම ප්‍රදේශයේ පදිංචි 35 හැවිරිදි දෙදරූ පියකු වන බවද පොලීසිය සඳහන් කරයි.

ජාත්‍යන්තර පාසලක අධ්‍යාපනය ලබන මෙම දැරිය අසභ්‍ය දසුන් දැකීමෙන් මානසික පීඩනයට ලක්වීම මත වෛද්‍ය ප්‍රතිකාර ලබන බවට පොලිස් ළමා හා කාන්තා කාර්යාංශයට පැමිණිලි කර ඇත.

සිද්ධිය සම්බන්ධයෙන් ගණේමුල්ල පොලිස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඒ.කේ. දේවප්‍රිය මහතාගේ උපදෙස් පරිදි ළමා හා කාන්තා කාර්යාංශය පරීක්ෂණ සිදු කරන අතර සැකකරු ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයට ඊයේ (16) ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

පුතාගේ පහර කෑමෙන් අසාධ්‍යව සිටි අම්මා රෝහලේදී මියගිහින්

(මාකේවිට අර්නස්ට් ජයතිලක)

පුතාගේ පහර කෑමට ලක්වූ නිවසේ අසාධ්‍යව සිටි මහලු මවක ගම්පහ රෝහලට ඇතුළත් කිරීමෙන් පසු, වැඩිදුර ප්‍රතිකාර සඳහා කොළඹ මහ රෝහලට ඇතුළත් කර සිටියදී මියගොස් ඇතැයි ගම්පහ පොලිසිය පවසයි.

ගම්පහ පොලිස් හදිසි ඇමතුම් අංකයට ලැබුණු තොරතුරකට අනුව පොලිස් නිලධාරීහු මව රෝහල් ගත කළහ.

මියගොස් ඇත්තේ, මාකේවිට උතුර ග්‍රාමසේවා වසමේ වහකුල්ලගමගේ සොපිනෝනා (76) නමැති වයෝවෘද්ධ මවකි.

මියගිය තැනැත්තියගේ පුත්‍රයා වන වහප්පුලිගේ නිශාන්ත පෙරේරා (50) නමැත්තා මෙම මරණය සම්බන්ධයෙන් සැකපිට පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන ඇති අතර, මූලික පරීක්ෂණවලින් අනතුරුව, සැකකරු ගම්පහ අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය.

ගම්පහ මූලස්ථාන පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සමන් කේ. ජයසිංහ මහතාගේ උපදෙස් පරිදි, අපරාධ විමර්ශන අංශයේ ප්‍රධාන පොලිස් පරීක්ෂක කල්‍යාණතුංග මහතාගේ මෙහෙයවීමෙන් උප පොලිස් පරීක්ෂක චතුරංග, පොලිස් කොස්තාපල් (70567) තරංග, (87428) හේරත් යන නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ මෙහෙයවති.

යතුරුපැදිය ඉස්සර කරද්දී ට්‍රිපරයේ හැපී කොස්තාපල් මරුට

(මීරිගම විශේෂ පුෂ්පකුමාර මල්ලවආරච්චි)

පස්යාල මීරිගම මාර්ගයේ කණ්ඩලම හන්දියේ දී පෙරේදා (15) එකම අවස්ථාවේ සිදු වූ රිය අනතුරු දෙකකින් තුවාල ලැබූ පොලිස් කොස්තාපල්වරයකු මරණයට පත්වී තවත් පුද්ගලයෙකු රෝහල් ගතකර ඇතැයි මීරිගම පොලිසියේ රථවාහන අංශය කියයි.

මියගොස් ඇත්තේ මහව, කම්මිටගම පදිංචිව සිටි නිවටඹුව පොලිසියට අනුයුක්තව සේවය කළ සුජීව කුමාර බණ්ඩාරනායක නමැති පනස් දෙහැවිරිදි පොලිස් කොස්තාපල්වරයෙකි.

කොස්තාපල්වරයා ගිරිඋල්ල දෙස සිට පස්යාල දෙසට යතුරුපැදියෙන් ගමන් කරමින් සිටියදී ඉදිරියෙන් ගමන් කළ ට්‍රිපර් රථයකට ඉස්සර කර ඇත. ඒ අවස්ථාවේ ඔහු ගමන් ගත් යතුරුපැදිය ඉදිරියෙන් පැමිණි ලොරියක මුහුණට මුහුණලා ගැටී කොස්තාපල්වරයා බරපතළ තුවාල ලබා ඇති බවත් ඒ අවස්ථාවේදීම එම ලොරිය හා පස්යාල දෙසට ගමන් කරමින් තිබූ ට්‍රිපර් රිය ද එකිනෙක ගැටීමෙන් ලොරියේ රියැදුරුද තුවාල ලබා ඇති බවත් පොලිසිය කියයි.

පොලිස් කොස්තාපල්වරයා හා ලොරියේ රියදුරා මීරිගම මූලික රෝහලට ඇතුළත් කිරීමෙන් පසු එහිදී කොස්තාපල්වරයා මරණයට පත්වී ඇත.

මීරිගම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක එස්.ඩී.ආර්. ප්‍රියන්ත මහතාගේ අධීක්ෂණය යටතේ රථවාහන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ගාමිණී වීරවර්ධන, උපපොලිස් පරීක්ෂක රණතුංග යන නිලධාරීහු අනතුර පිළිබඳව පරීක්ෂණ පවත්වති.

මිනුවන්ගොඩ කොරෝනා සුවවූ කත බාරගන්න කවුරුත් නෑ

(ගම්පහ අධිකරණ ටෝනි කරුණානායක)

කොරෝනා රෝගය වැළඳීම හේතුවෙන් මිනුවන්ගොඩ රෝහලේ ප්‍රතිකාර ලබමින් සිට සුව වී සිටින එක්දරු මවක්, සිය සැමියා සහ දියණිය විසින් බාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම නිසා දැඩි අසරණභාවයට පත්ව සිටින්නිය. මෙසේ බාර ගැනීම ප්‍රතික්ෂේප කර ඇත්තේ ධම්මිකා රණවීර (58) නමැති එක් දරු මවකි.

වැලිකඩ ප්‍රදේශයේ දී උපත ලබා ඇති ධම්මිකා මහත්මියට සහෝදරයන් 13 ක් සහ සහෝදරියන් දෙදෙනකු සිටින බවත් එම පහළොස් දෙනාගෙන් දෙළොස් දෙනකු මිය ගොස් ඇති බවත් එක් බාල සහෝදරයකු ප්‍රසිද්ධ ව්‍යාපාරිකයකු බවත් පවසයි.

වසර 19ක් ලෙබනන් හි සේවය කළ බව කියන ධම්මිකා මහත්මිය උපයා ගත් මුදලින් සැමියාට අයත් ඉඩමක නිවෙසක් තැනූ බවත් දින දෙකක් දියණියගේ මංගල්‍යය සඳහා මුදල් වියදම් කළ බවත් සඳහන් කළාය. ධම්මිකා මහත්මියගේ සැමියා වෙනම ජීවත් වන බව පවසන ඇය නිවාසවල ගෘහ සේවිකාවක ලෙස ද කටයුතු කර ඇති බව පවසා සිටියාය.

අප කළ විමසීමක දී ධම්මිකා මහත්මිය කියා සිටියේ පිනක් දහමක් කරගෙන නැවතී සිටීමට සුදුසු වැඩිහිටි නිවාසයක් කඩිනමින් සොයා දෙන ලෙසය.

දෙනෝ දාහක් බලාසිටියදී දොස්තරට මරණ තර්ජන කළැයි රිමාන්ඩ්

(වාරණ ආනන්ද ඉ. ජයකොඩි)

මීරිගම රජයේ රෝහලේ බාහිර රෝගී අංශයේ දී එහි ජ්‍යෙෂ්ඨ වෛද්‍යවරයෙකුට මරණීය තර්ජන එල්ල කළ බව කියන සැකකරුවකු අනිද්ද (19) දක්වා රිමාන්ඩ් බාරයේ රඳවා තැබීමට අත්තනගල්ල වැඩ බලන මහේස්ත්‍රාත් සසිකලා වනිගසුන්දර මහත්මිය පෙරේදා (15) නියෝග කළාය.

පුරාණ මීරිගම පදිංචි කිරාපන්ඩිතගේ ප්‍රියන්ත නමැත්තෙකු එසේ රිමාන්ඩ් කෙරුණි.

මීරිගම රජයේ රෝහලේ බාහිර රෝගී අංශයේ දී පෙරේදා (15) උදෑසන එහි ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරියෙකු වන ආර්.ඒ. නිලූක සංජය රාජපක්ෂ මහතා රාජකාරියේ නියැලී සිටියදී ඇති කාන්තාවකගේ දින ඉකුත් වීමට නියමිත වෛද්‍ය සහතිකයක් දීර්ඝ කර නොදුන් බව කියමින් රෝගීන් ඇතුළු විශාල පිරිසක් බලා සිටියදී වෛද්‍යවරයාට අසභ්‍ය වචනයෙන් බැන වැදී මරණීය තර්ජනය එල්ල කළ බව කියන සිද්ධියක් සම්බන්ධව මීරිගම පොලීසිය ක්ෂණිකව ක්‍රියාත්මක වී සැකකරු අත්අඩංගුවට ගත් බව විවෘත අධිකරණයේදී අනාවරණය විය.

මීරිගම පොලීසියේ නඩු මෙහෙයුම් අංශයේ පොලිස් සැරයන් නිශාන්ත රූපසිංහ මහතා සැකකරුගේ ඥාති කාන්තාවකට නිකුත් කොට ඇති වෛද්‍ය සහතිකයක් ඊයේ (16) ට කල් ඉකුත් වන බව කියමින් එම කාන්තාව බාහිර රෝගී අංශයට පැමිණ එය දීර්ඝ කර දෙන ලෙසට වෛද්‍යවරයා ගෙන් ඉල්ලා ඇති බවත් එම ඉල්ලීම ඉටු කිරීමට නොහැකි බව පවසා එසේ වෛද්‍ය සහතිකය දීර්ඝ කිරීමට නම් විශේෂඥ වෛද්‍යවරයාගේ සහතිකය අවශ්‍ය බවට වෛද්‍යවරයා ප්‍රකාශ කොට ඇති බව කියා සිටියේය.

පසුව සැකකරු රෝහලට කඩා වැදී රෝගීන් ඇතුළු විශාල පිරිසක් බලා සිටියදී වෛද්‍යවරයාට මරණීය තර්ජන එල්ල කොට පලා ගොස් සිටියදී අත්අඩංගුවට ගත් බවද පොලිස් සැරයන්වරයා කීය.

නැවත කැඳවීම අනිද්ද (19) වනදට කල් තැබිණ. සැකකරු වෙනුවෙන් නීතිඥ සුසන්ත වනිගනෙත්ති මහතා පෙනී සිටියේය.

මීරිගම පොලීසියේ නඩු මෙහෙයුම් අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ඊ.ජී.ඇස්.පී. සුබසිංහ මහතාගේ උපදෙස් පරිදි එහි පොලිස් සැරයන් නිශාන්ත රූපසිංහ (60567) මහතා පැමිණිල්ල මෙහෙය වීය.



කුඩු ජාවාරමේ රිමාන්ඩ් බාරයට

(ගම්පහ අධිකරණ - ටෝනි කරුණානායක)

මිනුවන්ගොඩ අවට ප්‍රදේශවලට හෙරොයින් බෙදා හැරීමේ නිරත වූ දෙදෙනෙකු මෙම (25) වැනිද දක්වා රිමාන්ඩ් බාරයේ තබන ලෙස මිනුවන්ගොඩ මහේස්ත්‍රාත් සහ දිසා විනිසුරු කේසර සී.ඒ. සමරදිවාකර මහතා පෙරේදා (15) නියම කළේය.

හෙරොයින් මිලිග්‍රෑම් 5100ක් සහ මිලිග්‍රෑම් 5060 ක් ළඟ තබා ගැනීමේ චෝදනා මත මිනුවන්ගොඩ පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරන ලද මිනුවන්ගොඩ, වැගොඩ්වේ බී. ජයනාත් නදීර මෙන්ඩිස් සහ කලවානේ චමින්ද මහේස් විජේසිංහ යන සැකකරුවන් දෙදෙනා මෙසේ රිමාන්ඩ් කෙරුණි.

මිනුවන්ගොඩ පොලිස් ස්ථානාධිපති ප්‍ර. පො.ප. රොහාන් මහේෂ් මහතාට ලද තොරතුරක් මත මිනුවන්ගොඩ පොලිසේය් දූෂණ මර්දන අංශයේ උප.පො.ප. නිපුන කරුණාරත්න සහ පොලිස් කොස්තාපල්වරුන් වන බංඩාර (53170), ප්‍රියන්ත (95344) යන නිලධාරීන් සැකකරුවන් දෙදෙනාව හෙරොයින් සමඟ අත්අඩංගුවට ගෙන තිබුණි.

ලංකාදීප ලහුඩු දැන්වීම්

ඕනෑකර නිමේ

යතුරුපැදි ත්‍රිරෝද රථ ඩිමෝ බට්ටා ලක්ෂ 20 ට අඩු කාර් වෑන් නිවසටම පැමිණ මිලට ගනු ලැබේ. ලියනගේ 0718937286, 0778324826, 0767793229, 0766974826. L285386-2

කුලියට බද්දට උවමනායි

කියුබ් 3, 4 ටිපර් රථ අවශ්‍යයි. දිනපතා මුදල්. 0773344149. L289667-1

මෝටර් සයිකල් උවමනායි

ත්‍රීවිල් යතුරුපැදි කාර්, වෑන් ෆිනෑන්ස් පියවා ඉහළ මිලට Bajaj Honda Hero, TVS, Yamaha 0716222339, 0773680594. L289113-2

විකිණිමට

ඔබ සොයන්නේ ඉඩමක් ද නිවසක් ද කොට්ටාව මහරගම හෝමාගම බත්තරමුල්ල විශ්වාසව අපට කතා කරන්න. 0704536631. L289659-1

වතුපිටි උවමනායි

මහියංගනය නගරයේ සිට 15Km පමණ ඇතුළතින් කුඹුරු අක්කර 10ක් පමණ අත්පිට මුදලට ගැනීමට අවශ්‍යයි. 0777637636 L1021609297-1

ගේදොර ඉඩකඩම් සේවා

කඩවත අධිවේගයට නගරයට ඉතා ආසන්න වටිනා දේපලක් විකුණා ගැනීමට දිවයින වටා දක්ෂ වෘත්තියමය ඉඩම්, දේපල, බ්‍රෝකර් මහතුන් කිහිප දෙනෙකුගේ සේවය අවශ්‍යයි. 0722401400, 0787695911. L289632-1

නම් වෙනස් කිරීම

අංක.31/3B නුවරතැන්න පාර, අළුත්වත්ත, වත්තේගම 595 වත්තේගම උතුර ග්‍රාම නිලධාරී වසමේ පදිංචි සාහුල් හමීඩ් සමන්ත වන මම අද සිට හේරත් මුදියන්සේලාගේ සැමියන් සමන්ත වශයෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් දැනුම් දෙමි. L289660-1

අකුරැස්සෙ ගෙදර මාර්ගොඩ මත්තක පදිංචි විතානාච්චි ධාර්මිකා වන මම මින් ඉදිරියට විතානාච්චි ධම්මිකා ලෙස භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි. L289617-1

අනුරාධපුර නාච්චාදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 272, සුභදගම ග්‍රාමනිලධාරී කොට්ඨාසයේ 75, 5 ඇල, සුභදගම, හිදෝගම ලිපිනයේ පදිංචි අනුලා ඕපාත වන මා මින් ඉදිරියට ඕපාත කංකානම්ලාගේ අනුලාවතී ලෙස භාවිතා කරන බවට ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි. L289577-1

කළුතර දිස්ත්‍රික්කයේ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 704/ මොල්ලිගොඩ ග්‍රාම නිලධාරී වසමේ අංක 30 ශාන්ත පැට්‍රික් මාවත, මොල්ලිගොඩ යන ලිපිනයෙහි පදිංචි දෙහිපාවල අංගල කුඹුරේ රුවන්දිකා ඉෂාදිනි මධුෂානි නමැති මා මෙතැන් පටන් විජේරූප රුවන්දිකා ඉෂාදිනි මධුෂානි යන නාමය භාවිතා කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ සැමට ගෞරවයෙන් දැනුම් දෙමි. මෙයට, විජේරූප රුවන්දිකා ඉෂාදිනි මධුෂානි. L289588-1

කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හල්පිට ග්‍රාමසේවා වසමේ අංක 29 සෞම්‍ය උයන හල්පිට පොල්ගස්ඕවිට යන ලිපිනයේ පදිංචි උපේජා හංසලී තේනුවර වන මා මින් ඉදිරියට උත්තරා සෙව්මිණී තේනුවර යනුවෙන් භාවිතා කරන බවට ලක්වැසි සැමට මෙයින් දැනුම් දෙමි. මෙයට උත්තරා සෙව්මිණී තේනුවර. L289547-1

කැගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 22C පත්තම්පිටිය ග්‍රාම නිලධාරී වසමේ අංක 219, පත්තම්පිටිය, රඹුක්කන ලිපිනයේ පදිංචි සිල්වෙස්ටර් ජනක සුරේෂ් කුමාර, සිල්වෙස්ටර් වජිර සුරේෂ් කුමාර වන අප මින් ඉදිරියට පිළිවෙලින් සූරියආරච්චිලාගේ ජනක සුරේෂ් කුමාර, සූරියආරච්චිලාගේ වජිර සුරේෂ් කුමාර යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමු. L289646-1

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රා.ලේ. කොට්ඨාසයේ 517, දෙහෙල්ගමුව ග්‍රාම නිලධාරී වසමේ ඉහළගම, මහගෙදර, දෙහෙල්ගමුව, ඉබ්බාගමුව ලිපිනයෙහි පදිංචි මිල්ලවානේ ගෙදර දුනීදු මැණිකේ තිලකරත්න ඉහලගම වන මම මෙතැන් පටන් මිල්ලවානේ ගෙදර දුනීෂා මධුෂානි තිලකරත්න ඉහලගම යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි. L289591-1

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බමුණුගෙදර ග්‍රාම නිලධාරී වසමේ 797 අංකයෙහි පදිංචි මොහම්මඩ් හුවාඩ් ශෙයිමා ෂාන් වන මම මෙතැන් පටන් හේරත් මුදියන්සේලාගේ ලක්වාසී ජනතාවටත් මෙයින් දන්වා සිටිමු. මෙයට, හේරත් මුදියන්සේලාගේ මලීනා ශෙයිමා ෂානු හේරත් යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් සියලු ලක්වාසී ජනතාවටත් මෙයින් දන්වා සිටිමි. L289593-1

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 1589 දරණ මාකඳුර පහළ ග්‍රාම නිලධාරී වසමේ 200/1, මීගමුව පාර, මාකඳුර, ගෝනවිල යන ලිපිනයේ පදිංචි අංක 725301804V දරණ ජාතික හැඳුනුම්පත හිමි රන්දෙනි ආරච්චිගේ ඉන්ද්‍රානි වන මම අද පටන් රන්දෙනි ආරච්චිගේ ඉන්ද්‍රානි රන්දෙනි යන නම භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයේ සියළු පුරවැසියන් වෙත දන්වා සිටිමි. L289587-1

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 388 දෙරවේරුව ග්‍රාම නිලධාරී වසමේ දෙරවේරුව වත්ත මාවිළිය පදිංචි හංගිලි ගුරුන්නැහැල ගෙදර තුසාන් පුෂ්ප කුමාර ලියනගේ වන මම අද පටන් හංගිලි ගුරුන්නැහැලාගේ තුෂාන් පුෂ්ප කුමාර ලියනගේ නම භාවිතා කරන බවට ශ්‍රී ලංකා පුරවැසියන්ට මෙයින් දන්වා සිටිමි. L289594-1

කුරුණෑගල දිස්ත්‍රික්කයේ රදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 562 හිනිහිරිය ග්‍රාම නිලධාරී වසමේ 359 අංකයෙහි පදිංචි බන්දුවා දේවගේ අජිත් ශාන්ත වන මම මෙතැන් පටන් බන්දුවා දේවයලාගේ අජිත් ශාන්ත යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් සියලු ලක්වාසී ජනතාවටත් මෙයින් දන්වා සිටිමු. මෙයට, බන්දුවා දේවයලාගේ අජිත් ශාන්ත. L289595-1

ගම්පහ දිස්ත්‍රික්කයේ කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 155 ඒ. වල්පොල ග්‍රාම නිලධාරී වසමේ නො. 10/1, වල්පල, ආඬිඅම්බලම යන ලිපිනයේ පදිංචි සිංහ මහමුදලිගේ ලඝන්ත සඳුනෙත් යන මාගේ පුතාගේ නම මින් ඉදිරියට සිංහ මහමුදලිගේ ලක්මිණ සඳුනෙත් යනුවෙන් භාවිතා කරන බවට ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. L289599-1

ගාල්ල දිස්ත්‍රික්කයේ ඉමදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 153 B රංගොඩ ග්‍රාම නිලධාරී වසමේ, අංක 460, ගල්ලලවත්ත, රංගොඩ, අඟුළොහ ලිපිනයේ පදිංචි, පාතික හැඳුනුම්පත් අංක 665011569V හිමි දෙරපෙ විතානගේ සියන්ති රේණුකා නමින් හැඳින් වූ මා මෙතැන් පටන් අබේගොඩ ලියන ආරච්චිගේ ශ්‍රියන්ති රේණුකා යන නමින් හඳුන්වනු ලබන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. L1021609302-1

ගාල්ල දිස්ත්‍රික්කයේ මාදම්පාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් 79 A - උස්මුදුලාව ග්‍රාම නිලධාරී වසමේ නො : 271/2, පන්සල පාර, උස්මුදුලාව, කුලීගොඩ යන ලිපිනයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 200307711964 හිමි ලද්දු පිනාස් සඳරුවන් යන නම භාවිතා කළ මා මෙතැන් පටන් ලද්දු පීනාත් සඳරුවන් යන නම භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. මෙයට, ලද්දු පීනාත් සඳරුවන්. L289676-1

නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 468 - A කඩදොරපිටිය ග්‍රාම නිලධාරී වසමේ පාසැල් මාවත පුඹළුඔය ලිපිනයේ පදිංචි උප්පන්න සහතිකයේ සඳහන් වැලිගම්පල වික්‍රම ගෙදර දයානන්ද වන මම මින් ඉදිරියට වික්‍රම ගෙදර දයානන්ද යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. L289673-1

නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රකිල්ලගස්කඩ ග්‍රාම නිලධාරී වසමේ අංක.1/38, සිසිල, රත්මැටිය පාර, රකිල්ලගස්කඩ ලිපිනයේ පදිංචි නයිමලේ ගෙදර මහින්ද බණ්ඩාර වන මම මින් ඉදිරියට දිසානායක මුදියන්සේලාගේ මහින්ද බණ්ඩාර යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි. L289627-1

බස්නාහිර පළාතේ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 490, අතුරුගිරිය ග්‍රාම නිලධාරී වසමේ අංක 211/A, මොරටුවාතේන පාර, අතුරුගිරිය ලිපිනයේ පදිංචි දම්මික චරන්දින දෙනවක වන මම මෙතැන් සිට දෙනවක දෙන් ධම්මික චරන්දින ලෙසට භාවිතා කරන බව ලක්වාසී ජනතාවට හා ලක්රජයට මෙයින් දන්වා සිටිමි. L289619-1

මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාළිගාතැන්න ග්‍රාම නිළධාරී වසමේ එම්.සී පාරේ පදිංචි රණසිංහ ආරච්චිගේ උසද එම්පි විතුෂණී පෙරේරා වන මම මින් ඉදිරියට රණසිංහ ආරච්චිගේ ළඝද එම්පි විතුෂණී පෙරේරා යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයට දන්වා සිටිමි. L289561-1

මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 102 - A දෙලියද්ද ග්‍රාම නිලධාරී වසමේ දුම්දු දෙලියද්ද බිබිල යන ලිපිනයේ පදිංචි හෝරාප පතිගේ දුම්දු මාලිංග වසන්ත කුමාර, හෝරාප පතිගේ නෙත්මී රංගනා වසන්ත කුමාර, හෝරාප පතිගේ රවිඳු කේනක වසන්ත කුමාර යන තිදෙනා දැනට රාජකාරී කිරීමේදී හා වෙනත් කටයුතු සඳහා පහත නම් භාවිතා කරන බව සහතික කරමි. ඒ අනුව මේ නම් දැන්වීම් ප්‍රසිද්ධ කිරීමට අවසර ලබාදීම සුදුසු බවට නිර්දේශ කරමි. 1. හෙට්ටි ආරච්චිගේ දුම්දු මාලිංග 2. හෙට්ටි ආරච්චිගේ නෙත්මී රංගනා 3. හෙට්ටි ආරච්චිගේ රවිඳු කේනක. L289615-1

මොණරාගල දිස්ත්‍රික්කයේ මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 110/H පොල්ගහපිටිය ග්‍රාම සේවා වසමේ පොල්ගහපිටිය, කිරමානාහෙල යන ලිපිනයේ පදිංචි ජා.හැ. අංක 996951820V හිමි ජයසිංහ මුදියන්සේලාගේ චන්දිමා මල්කාන්ති වන මම මින් ඉදිරියට ජයසිංහ මුදියන්සේලාගේ චන්දිමා මල්ෂා සමරකෝන් යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි. L289563-1

රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 262/A කරදියමුල්ල ග්‍රාමසේවා වසමේ පදිංචි පොන්නසාමි මංජුලා වන මම මෙතැන් පටන් ගෙදර අරාවේ ගෙදර මංජුලා මධුවන්ති ලෙස වෙනස් කර භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් ප්‍රකාශ කරමි. L289643-1

රත්නපුර පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 162B බැරැන්ඩුව වසමේ පදිංචි කහංගම මනන්නලාගේ සුමුදු දිලීප් ප්‍රේමසිරි වන මා මින් ඉදිරියට කහංගම මනන්නලාගේ එනිදු රඟේන් හිමංෂු රණදේව යනුවෙන් භාවිතා කරන බව ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි. L289559-1

වාසගම වෙනස් කිරීම. රත්නපුර දිස්ත්‍රික්කයේ වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හදගිරිගොඩ වසමේ පදිංචි කුමුදප්පුලාගේ චම්පා ප්‍රියදර්ශනී වන මම මෙතැන් පටන් කුරුප්පුලාගේ චම්පා ප්‍රියදර්ශනී යනුවෙන් භාවිතා කරන බව ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි. L289589-1

සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 445, පහළ හංවැල්ල ග්‍රාම නිලධාරී වසමේ ගෘහ අංක 175/D, පහළ හංවැල්ල හංවැල්ල යන ලිපිනයෙහි පදිංචි විජේපුලි හේවගේ සුනන්දා ශ්‍රීපාලි රෝහිණී කුමාරි වන මම මින් ඉදිරියට, වීරප්පුලි හේවගේ සුනන්දා ශ්‍රීපාලි රෝහිණී කුමාරි වශයෙන් භාවිතා කරන බවට ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. L289585-1

රියදුරන්

011-2825719, 071-5179662 සහැල්ලු බරවාහන රියදුරන් සහයකයින් පැමිණි දිනම සේවයට අවශ්‍යයි. රැකියාව මත 65000/- වැටුප්. 0776349650 L289574-1

අප ආයතනයට කොළඹ පළපුරුදු බර වාහන රියදුරන් පොලිස් වර්තාව සමඟ අවශ්‍යයි. (කොළඹ අවට විශේෂයි) ටෙලි :- 0714808109. L289576-1

බරවාහන (අඩි 20) රියදුරන් සහ අත්දැදිකරුවන් අවශ්‍යයි (ප්‍රධාන පෙළේ ආයතනයකට) දුරකතන 0779484371, 0777155762. L289672-1

වයස අවුරුදු 50-60 අතර කොළඹ නගරයේ මාර්ග පිළිබඳව මනා අවබෝධයක් ඇති රියදුරු වෘත්තියේ අවුරුදු 10ට වඩා පළපුරුද්දක් සහිත විනීත රියදුරෙකු කාර්යාල කටයුතු සඳහා වහාම අවශ්‍යයි. නවාතැන් පහසුකම් සපයනු ලැබේ. වැටුප සාකච්ඡා කරගත හැක. විමසීම් 0705-988454, 0713-387661. L289551-1

හෝටල් සහ බේකරි

011-2825719, 071-5179662 හොටෙල් රෙස්ටුරන්ට් බේකරි සමූහයට පුහුණු නුපුහුණු සියළුම සේවකයින් පැමිණි දිනම සේවයට අවශ්‍යයි. ආහාර නවාතැන් සමඟ රැකියාව මත 65000/- වැටුප්. 077-6349650 L289575-1

අලුත පටන් ගත් අවන් බේකරියට වැඩකරුවෙක් සහ චූන්පාන් ත්‍රීවිලර් වැඩට සේවකයන් අවශ්‍යයි. විමසන්න. 0779824311 L289648-1

කළුතර හෝටලයට කෝකිවරයෙකු සහ අත්දැදිකරුවෙක් අවශ්‍යයි. (හොටෙල් රෝසි). Te. 077-8718739, 077-5813112. L289597-1

කොත්තු බාස් කෙනෙකු අවශ්‍යයි. 0762779869, 0704634413. L289670-1

චයිනීස්, රයිස් ඇන්ඩ් කරි කුක්, හෙල්පර්වරුන් අවශ්‍යයි. හෝමාගම. 0777743612. L289160-3

මහනුවර බේකරි වැඩ දන්නා බාස්වරු අවශ්‍යයි. කෑම, නවාතැන් නොමිලේ. වඩියට 1500-2000 අතර. 0773496312, 0715496312, 0812217505. L289564-1

මහරගම හෝටලයකට කොත්තු බාස් කෙනෙකු වහාම අවශ්‍යයයි. වැටුප 75000/-. 0714483505, 0714167642. L289684-1

රත්තනපිටියේ පිහිටි Grill war රෙස්ටුරන්ට් ආයතනය සඳහා ෂාප්ප, කොත්තු, සෝපීස් වර්ග සෑදීමට දන්නා කෝකිවරයෙකු අවශ්‍යව ඇත. විමසීම් 0763036187, 0112048999. L283158-5

හවායි බේකර්ස් සඳහා බේකරි බාස් කෙනෙකු සහ බේකරි උදව්කරුවෙකු අවශ්‍ය වී ඇත. පඩිය පිළිවෙලින් රු. 75000ක් සහ රු. 45000ක් වේ. විමසීම්. 0773658648. L270588-13

මේසන්වරු සහ වඩුබාස්වරු

L289365-2

071-7262680 කොළඹ අවට වැඩකිරීම් සඳහා දක්ෂ මේසන්වරුන් හා ගෝලයින් අවශ්‍යයි. ඉහළ වැටුප්. L284250-3

071-8780930 මීරිගමට ෂටරින් බාස්වරු 2800/- අත්දැදිකරුවන් 2000/- ඉතා ඉක්මනින් අවශ්‍යයි. දිනපතා වියදම් මුදල්, සතිපතා වැටුප්. L289620-1

0759900778 කඩවත වැඩබිමකට මේසන් බාස්වරුන් සහ ගෝලයින් අවශ්‍යයි. වැටුප සාකච්ඡා කරගත හැක. 075-9063065. L289615-1

0766589702 පන්නිපිටිය වැඩබිම් සඳහා මේසන්වරු, කම්කරුවන් අවශ්‍යයි. ගෙවීම් 3000/- - 2200/- ටාගට් OT ඇත. L289612-1

අංගොඩ ෂටරින් බාස්වරු 2800/- ගෝලයන් 2000/- OT ඇත. සති පඩි. 0773376747, 0717123444 L289614-1

කඳනේ වැඩබිමක් සඳහා දක්ෂ කපාරාරුකරුවන් අවශ්‍යයි. දෛනික වැටුප්. 077-4543153 L289625-1

කපරාරුවට දක්ෂ බාස් කෙනෙකු අවශ්‍යයි. මත්තේගොඩ නවාතැන් නොමැත. 0714758757 L289644-1

කොරෝනාවෙන් ආරක්ෂිත වැඩබිම් සඳහා උපකොන්ත්‍රාත්කරුවන්, මේසන් බාස්වරු සහ ගෝලයින් අවශ්‍යයි. ඉහළ වැටුප්. 076-9926484, 077-3815906. L1021609300-1

කොළඹ ප්‍රධාන පෙළේ නිවාස ඉදිකිරීම් ආයතනයකට අත්තිවාරම් හා බිත්ති, සැටලිම්, ටයිල්, පේන්ට් සඳහා උපකොන්ත්‍රාත්කරුවන් අවශ්‍යයි. 0706800500 L289526-2

කොළඹ රාජගිරිය ඉදිකිරීම් ආයතනයක් සඳහා කනු, බීම් දක්ෂ ලෙස කපරාරු කල හැකි මේසන් බාස්වරු (වැටුප 3000/-), දක්ෂ ලෙස පොට් අදිය හැකි පේන්ට් බාස්වරු (2500/-) දිනපතා වියදම් මුදල්, දින 7 වැටුප්, නවාතැන් පහසුකම්. 071-4345444, 071-2105176. L285421-2

කොළඹ වැඩබිම් සඳහා මේසන්වරු (2700/-) ගෝලයන් (2000/-) වහාම අවශ්‍යයි. සති වැටුප්. 0764960757. L286121-2

ගොනවුව වැඩබිමක් සඳහා දක්ෂ මේසන්වරු පුරුදු ගෝලයින් ඉක්මණින් අවශ්‍යයි. කෑම දෙනු ලැබේ. දිනපතා වියදම් මුදල්. 0763476694, 0740952877. L289567-1

ගෝලයින් (1800/-) මේසන් බාස්වරු (2800/-) සහ සැටලිම් බාස්වරු කම්බි (2800/-) අවශ්‍ය කෙරේ. නවාතැන් සැපයේ. (පන්නිපිටිය ආසන්නයි) 0777745143 L284787-2

දක්ෂ මේසන් බාස්වරු සහ ගෝලයින් අවශ්‍යයි. මේසන් බාස් වැටුප රු. 2500 සිට 3000 දක්වා ගෝල වැටුප රු. 2000 දිනපතා වැටුප් දෙනු ලැබේ. නවාතැන් පහසුකම් ඇත. දිවා ආහාරය නොමිලේ. මහරගම. 0714758531 L289611-1

දක්ෂ මේසන්වරු අවශ්‍යයි. වැටුප 3000/- පේන්ට් බාස්වරු අවශ්‍යයි. 2800/- අත්දැදිකරුවන් අවශ්‍යයි. වැටුප 2000/- දවස් පඩි. 0702175433 L289571-1

දක්ෂ සැටලින් බාස්වා ගෝලයෝ ඉක්මනින් අවශ්‍යයි. කෑම නවාතැන් නොමිලේ. බාස්ට 2500/- ගෝලයන්ට 1500/- හොරණ. 0717363061, 0777214315 L289580-1

දිනපතා වැටුප් මේසන් 3000/-, අත්දැදිකරු 2200/-, දිවා ආහාර නොමිලේ බණ්ඩාරගම වැඩබිම්. 0714107575 L289576-1

නුගේගොඩ අලුතින් පටන්ගන්නා වැඩබිමක් සඳහා මේසන්වරුන් ගෝලයන් සැටර්න් ගෝලයන් උවමනාය. 0789976154. L289675-1

පළපුරුදු සැටලිම් බාස්වා 2700 සිට ගෝලයෝ 2000 සිට 2500 දක්වා අවශ්‍යයි. කටුබැද්ද. 0760200337 L289657-1

පුද්ගලික වැඩබිමක් සඳහා දක්ෂ මේසන්වරයකු සහ දක්ෂ ගෝලයකු අවශ්‍යයි. බීම් කපරාදු සඳහා නවාතැන් පහසුකම් ඇත. සතිපඩි දක්ෂ අය පමණක් අමතන්න. 0770078794 L289661-1

බියගම අවට වැඩබිම් සඳහා මේසන් බාස්වරු අවශ්‍යයි. ඉහළ වැටුප්. නවාතැන් නොමිලේ. 0773561596, 0719962727 L289519-2

මීගොඩ අවට වැඩබිම් සඳහා මේසන්වරු අවශ්‍යයි. මේසන් 2800/-, අත්දැදිකරුවන් 2000/- දිනපතා වැටුප්. 0750902491, 0712781043 L289583-1

මේසන් කම්බි, සැටලින් පේන්ට් බාස්වරුන් ගෝලයෝ අවශ්‍යයි. නවීන්. 0773470324 L284346-3

මේසන් බාස්වරු සහ ෂටරින් බාස්වරු, ගෝලයින් දක්ෂ අය පමණක් කතා කරන්න. 3000/-, 2500/-, 2000/- සති පතා වැටුප්. මාලඹේ. 0779756193, 0715605193 L289554-1

මේසන් බාස්වරුන් හා අත්දැදිකරුවන් අවශ්‍යයි. කොළඹ අවට වැඩබිම්වලට. 0723312461, 0766861090 L289570-1

ගේදොර ඉඩකඩම් සේවා

කඩවත අධිවේගයට නගරයට ඉතා ආසන්න වටිනා දේපලක් විකුණා ගැනීමට දිවයින වටා දක්ෂ වෘත්තියමය ඉඩම්, දේපල, බ්‍රෝකර් මහතුන් කිහිප දෙනෙකුගේ සේවය අවශ්‍යයි. 0722401400, 0787695911. L289632-1

නම් වෙනස් කිරීම

අංක.31/3B නුවරතැන්න පාර, අළුත්වත්ත, වත්තේගම 595 වත්තේගම උතුර ග්‍රාම නිලධාරී වසමේ පදිංචි සාහුල් හමීඩ් සමන්ත වන මම අද සිට හේරත් මුදියන්සේලාගේ සැමියන් සමන්ත වශයෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් දැනුම් දෙමි. L289660-1

අකුරැස්සෙ ගෙදර මාර්ගොඩ මත්තක පදිංචි විතානාච්චි ධාර්මිකා වන මම මින් ඉදිරියට විතානාච්චි ධම්මිකා ලෙස භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි. L289617-1

අනුරාධපුර නාච්චාදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 272, සුභදගම ග්‍රාමනිලධාරී කොට්ඨාසයේ 75, 5 ඇල, සුභදගම, හිදෝගම ලිපිනයේ පදිංචි අනුලා ඕපාත වන මා මින් ඉදිරියට ඕපාත කංකානම්ලාගේ අනුලාවතී ලෙස භාවිතා කරන බවට ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි. L289577-1

කළුතර දිස්ත්‍රික්කයේ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 704/ මොල්ලිගොඩ ග්‍රාම නිලධාරී වසමේ අංක 30 ශාන්ත පැට්‍රික් මාවත, මොල්ලිගොඩ යන ලිපිනයෙහි පදිංචි දෙහිපාවල අංගල කුඹුරේ රුවන්දිකා ඉෂාදිනි මධුෂානි නමැති මා මෙතැන් පටන් විජේරූප රුවන්දිකා ඉෂාදිනි මධුෂානි යන නාමය භාවිතා කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ සැමට ගෞරවයෙන් දැනුම් දෙමි. මෙයට, විජේරූප රුවන්දිකා ඉෂාදිනි මධුෂානි. L289588-1

කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හල්පිට ග්‍රාමසේවා වසමේ අංක 29 සෞම්‍ය උයන හල්පිට පොල්ගස්ඕවිට යන ලිපිනයේ පදිංචි උපේජා හංසලී තේනුවර වන මා මින් ඉදිරියට උත්තරා සෙව්මිණී තේනුවර යනුවෙන් භාවිතා කරන බවට ලක්වැසි සැමට මෙයින් දැනුම් දෙමි. මෙයට උත්තරා සෙව්මිණී තේනුවර. L289547-1

කැගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 22C පත්තම්පිටිය ග්‍රාම නිලධාරී වසමේ අංක 219, පත්තම්පිටිය, රඹුක්කන ලිපිනයේ පදිංචි සිල්වෙස්ටර් ජනක සුරේෂ් කුමාර, සිල්වෙස්ටර් වජිර සුරේෂ් කුමාර වන අප මින් ඉදිරියට පිළිවෙලින් සූරියආරච්චිලාගේ ජනක සුරේෂ් කුමාර, සූරියආරච්චිලාගේ වජිර සුරේෂ් කුමාර යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමු. L289646-1

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රා.ලේ. කොට්ඨාසයේ 517, දෙහෙල්ගමුව ග්‍රාම නිලධාරී වසමේ ඉහළගම, මහගෙදර, දෙහෙල්ගමුව, ඉබ්බාගමුව ලිපිනයෙහි පදිංචි මිල්ලවානේ ගෙදර දුනීදු මැණිකේ තිලකරත්න ඉහලගම වන මම මෙතැන් පටන් මිල්ලවානේ ගෙදර දුනීෂා මධුෂානි තිලකරත්න ඉහලගම යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි. L289591-1

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බමුණුගෙදර ග්‍රාම නිලධාරී වසමේ 797 අංකයෙහි පදිංචි මොහම්මඩ් හුවාඩ් ශෙයිමා ෂාන් වන මම මෙතැන් පටන් හේරත් මුදියන්සේලාගේ ලක්වාසී ජනතාවටත් මෙයින් දන්වා සිටිමු. මෙයට, හේරත් මුදියන්සේලාගේ මලීනා ශෙයිමා ෂානු හේරත් යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් සියලු ලක්වාසී ජනතාවටත් මෙයින් දන්වා සිටිමි. L289593-1

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 1589 දරණ මාකඳුර පහළ ග්‍රාම නිලධාරී වසමේ 200/1, මීගමුව පාර, මාකඳුර, ගෝනවිල යන ලිපිනයේ පදිංචි අංක 725301804V දරණ ජාතික හැඳුනුම්පත හිමි රන්දෙනි ආරච්චිගේ ඉන්ද්‍රානි වන මම අද පටන් රන්දෙනි ආරච්චිගේ ඉන්ද්‍රානි රන්දෙනි යන නම භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයේ සියළු පුරවැසියන් වෙත දන්වා සිටිමි. L289587-1

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 388 දෙරවේරුව ග්‍රාම නිලධාරී වසමේ දෙරවේරුව වත්ත මාවිළිය පදිංචි හංගිලි ගුරුන්නැහැල ගෙදර තුසාන් පුෂ්ප කුමාර ලියනගේ වන මම අද පටන් හංගිලි ගුරුන්නැහැලාගේ තුෂාන් පුෂ්ප කුමාර ලියනගේ නම භාවිතා කරන බවට ශ්‍රී ලංකා පුරවැසියන්ට මෙයින් දන්වා සිටිමි. L289594-1

කුරුණෑගල දිස්ත්‍රික්කයේ රදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 562 හිනිහිරිය ග්‍රාම නිලධාරී වසමේ 359 අංකයෙහි පදිංචි බන්දුවා දේවගේ අජිත් ශාන්ත වන මම මෙතැන් පටන් බන්දුවා දේවයලාගේ අජිත් ශාන්ත යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් සියලු ලක්වාසී ජනතාවටත් මෙයින් දන්වා සිටිමු. මෙයට, බන්දුවා දේවයලාගේ අජිත් ශාන්ත. L289595-1

ගම්පහ දිස්ත්‍රික්කයේ කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 155 ඒ. වල්පොල ග්‍රාම නිලධාරී වසමේ නො. 10/1, වල්පල, ආඬිඅම්බලම යන ලිපිනයේ පදිංචි සිංහ මහමුදලිගේ ලඝන්ත සඳුනෙත් යන මාගේ පුතාගේ නම මින් ඉදිරියට සිංහ මහමුදලිගේ ලක්මිණ සඳුනෙත් යනුවෙන් භාවිතා කරන බවට ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. L289599-1

ගාල්ල දිස්ත්‍රික්කයේ ඉමදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 153 B රංගොඩ ග්‍රාම නිලධාරී වසමේ, අංක 460, ගල්ලලවත්ත, රංගොඩ, අඟුළොහ ලිපිනයේ පදිංචි, පාතික හැඳුනුම්පත් අංක 665011569V හිමි දෙරපෙ විතානගේ සියන්ති රේණුකා නමින් හැඳින් වූ මා මෙතැන් පටන් අබේගොඩ ලියන ආරච්චිගේ ශ්‍රියන්ති රේණුකා යන නමින් හඳුන්වනු ලබන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. L1021609302-1

ගාල්ල දිස්ත්‍රික්කයේ මාදම්පාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් 79 A - උස්මුදුලාව ග්‍රාම නිලධාරී වසමේ නො : 271/2, පන්සල පාර, උස්මුදුලාව, කුලීගොඩ යන ලිපිනයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 200307711964 හිමි ලද්දු පිනාස් සඳරුවන් යන නම භාවිතා කළ මා මෙතැන් පටන් ලද්දු පීනාත් සඳරුවන් යන නම භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. මෙයට, ලද්දු පීනාත් සඳරුවන්. L289676-1

නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 468 - A කඩදොරපිටිය ග්‍රාම නිලධාරී වසමේ පාසැල් මාවත පුඹළුඔය ලිපිනයේ පදිංචි උප්පන්න සහතිකයේ සඳහන් වැලිගම්පල වික්‍රම ගෙදර දයානන්ද වන මම මින් ඉදිරියට වික්‍රම ගෙදර දයානන්ද යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. L289673-1

නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රකිල්ලගස්කඩ ග්‍රාම නිලධාරී වසමේ අංක.1/38, සිසිල, රත්මැටිය පාර, රකිල්ලගස්කඩ ලිපිනයේ පදිංචි නයිමලේ ගෙදර මහින්ද බණ්ඩාර වන මම මින් ඉදිරියට දිසානායක මුදියන්සේලාගේ මහින්ද බණ්ඩාර යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි. L289627-1

බස්නාහිර පළාතේ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 490, අතුරුගිරිය ග්‍රාම නිලධාරී වසමේ අංක 211/A, මොරටුවාතේන පාර, අතුරුගිරිය ලිපිනයේ පදිංචි දම්මික චරන්දින දෙනවක වන මම මෙතැන් සිට දෙනවක දෙන් ධම්මික චරන්දින ලෙසට භාවිතා කරන බව ලක්වාසී ජනතාවට හා ලක්රජයට මෙයින් දන්වා සිටිමි. L289619-1

මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාළිගාතැන්න ග්‍රාම නිළධාරී වසමේ එම්.සී පාරේ පදිංචි රණසිංහ ආරච්චිගේ උසද එම්පි විතුෂණී පෙරේරා වන මම මින් ඉදිරියට රණසිංහ ආරච්චිගේ ළඝද එම්පි විතුෂණී පෙරේරා යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයට දන්වා සිටිමි. L289561-1

මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 102 - A දෙලියද්ද ග්‍රාම නිලධාරී වසමේ දුම්දු දෙලියද්ද බිබිල යන ලිපිනයේ පදිංචි හෝරාප පතිගේ දුම්දු මාලිංග වසන්ත කුමාර, හෝරාප පතිගේ නෙත්මී රංගනා වසන්ත කුමාර, හෝරාප පතිගේ රවිඳු කේනක වසන්ත කුමාර යන තිදෙනා දැනට රාජකාරී කිරීමේදී හා වෙනත් කටයුතු සඳහා පහත නම් භාවිතා කරන බව සහතික කරමි. ඒ අනුව මේ නම් දැන්වීම් ප්‍රසිද්ධ කිරීමට අවසර ලබාදීම සුදුසු බවට නිර්දේශ කරමි. 1. හෙට්ටි ආරච්චිගේ දුම්දු මාලිංග 2. හෙට්ටි ආරච්චිගේ නෙත්මී රංගනා 3. හෙට්ටි ආරච්චිගේ රවිඳු කේනක. L289615-1

මොණරාගල දිස්ත්‍රික්කයේ මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 110/H පොල්ගහපිටිය ග්‍රාම සේවා වසමේ පොල්ගහපිටිය, කිරමානාහෙල යන ලිපිනයේ පදිංචි ජා.හැ. අංක 996951820V හිමි ජයසිංහ මුදියන්සේලාගේ චන්දිමා මල්කාන්ති වන මම මින් ඉදිරියට ජයසිංහ මුදියන්සේලාගේ චන්දිමා මල්ෂා සමරකෝන් යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි. L289563-1

රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 262/A කරදියමුල්ල ග්‍රාමසේවා වසමේ පදිංචි පොන්නසාමි මංජුලා වන මම මෙතැන් පටන් ගෙදර අරාවේ ගෙදර මංජුලා මධුවන්ති ලෙස වෙනස් කර භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් ප්‍රකාශ කරමි. L289643-1

රත්නපුර පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 162B බැරැන්ඩුව වසමේ පදිංචි කහංගම මනන්නලාගේ සුමුදු දිලීප් ප්‍රේමසිරි වන මා මින් ඉදිරියට කහංගම මනන්නලාගේ එනිදු රඟේන් හිමංෂු රණදේව යනුවෙන් භාවිතා කරන බව ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි. L289559-1

වාසගම වෙනස් කිරීම. රත්නපුර දිස්ත්‍රික්කයේ වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හදගිරිගොඩ වසමේ පදිංචි කුමුදප්පුලාගේ චම්පා ප්‍රියදර්ශනී වන මම මෙතැන් පටන් කුරුප්පුලාගේ චම්පා ප්‍රියදර්ශනී යනුවෙන් භාවිතා කරන බව ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි. L289589-1

සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 445, පහළ හංවැල්ල ග්‍රාම නිලධාරී වසමේ ගෘහ අංක 175/D, පහළ හංවැල්ල හංවැල්ල යන ලිපිනයෙහි පදිංචි විජේපුලි හේවගේ සුනන්දා ශ්‍රීපාලි රෝහිණී කුමාරි වන මම මින් ඉදිරියට, වීරප්පුලි හේවගේ සුනන්දා ශ්‍රීපාලි රෝහිණී කුමාරි වශයෙන් භාවිතා කරන බවට ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. L289585-1

රියදුරන්

011-2825719, 071-5179662 සහැල්ලු බරවාහන රියදුරන් සහයකයින් පැමිණි දිනම සේවයට අවශ්‍යයි. රැකියාව මත 65000/- වැටුප්. 0776349650 L289574-1

අප ආයතනයට කොළඹ පළපුරුදු බර වාහන රියදුරන් පොලිස් වර්තාව සමඟ අවශ්‍යයි. (කොළඹ අවට විශේෂයි) ටෙලි :- 0714808109. L289576-1

බරවාහන (අඩි 20) රියදුරන් සහ අත්දැදිකරුවන් අවශ්‍යයි (ප්‍රධාන පෙළේ ආයතනයකට) දුරකතන 0779484371, 0777155762. L289672-1

වයස අවුරුදු 50-60 අතර කොළඹ නගරයේ මාර්ග පිළිබඳව මනා අවබෝධයක් ඇති රියදුරු වෘත්තියේ අවුරුදු 10ට වඩා පළපුරුද්දක් සහිත විනීත රියදුරෙකු කාර්යාල කටයුතු සඳහා වහාම අවශ්‍යයි. නවාතැන් පහසුකම් සපයනු ලැබේ. වැටුප සාකච්ඡා කරගත හැක. විමසීම් 0705-988454, 0713-387661. L289551-1

හෝටල් සහ බේකරි

011-2825719, 071-5179662 හොටෙල් රෙස්ටුරන්ට් බේකරි සමූහයට පුහුණු නුපුහුණු සියළුම සේවකයින් පැමිණි දිනම සේවයට අවශ්‍යයි. ආහාර නවාතැන් සමඟ රැකියාව මත 65000/- වැටුප්. 077-6349650 L289575-1

අලුත පටන් ගත් අවන් බේකරියට වැඩකරුවෙක් සහ චූන්පාන් ත්‍රීවිලර් වැඩට සේවකයන් අවශ්‍යයි. විමසන්න. 0779824311 L289648-1

කළුතර හෝටලයට කෝකිවරයෙකු සහ අත්දැදිකරුවෙක් අවශ්‍යයි. (හොටෙල් රෝසි). Te. 077-8718739, 077-5813112. L289597-1

කොත්තු බාස් කෙනෙකු අවශ්‍යයි. 0762779869, 0704634413. L289670-1

චයිනීස්, රයිස් ඇන්ඩ් කරි කුක්, හෙල්පර්වරුන් අවශ්‍යයි. හෝමාගම. 0777743612. L289160-3

මහනුවර බේකරි වැඩ දන්නා බාස්වරු අවශ්‍යයි. කෑම, නවාතැන් නොමිලේ. වඩියට 1500-2000 අතර. 0773496312, 0715496312, 0812217505. L289564-1

මහරගම හෝටලයකට කොත්තු බාස් කෙනෙකු වහාම අවශ්‍යයයි. වැටුප 75000/-. 0714483505, 0714167642. L289684-1

රත්තනපිටියේ පිහිටි Grill war රෙස්ටුරන්ට් ආයතනය සඳහා ෂාප්ප, කොත්තු, සෝපීස් වර්ග සෑදීමට දන්නා කෝකිවරයෙකු අවශ්‍යව ඇත. විමසීම් 0763036187, 0112048999. L283158-5

හවායි බේකර්ස් සඳහා බේකරි බාස් කෙනෙකු සහ බේකරි උදව්කරුවෙකු අවශ්‍ය වී ඇත. පඩිය පිළිවෙලින් රු. 75000ක් සහ රු. 45000ක් වේ. විමසීම්. 0773658648. L270588-13

මේසන්වරු සහ වඩුබාස්වරු

L289365-2

071-7262680 කොළඹ අවට වැඩකිරීම් සඳහා දක්ෂ මේසන්වරුන් හා ගෝලයින් අවශ්‍යයි. ඉහළ වැටුප්. L284250-3

071-8780930 මීරිගමට ෂටරින් බාස්වරු 2800/- අත්දැදිකරුවන් 2000/- ඉතා ඉක්මනින් අවශ්‍යයි. දිනපතා වියදම් මුදල්, සතිපතා වැටුප්. L289620-1

0759900778 කඩවත වැඩබිමකට මේසන් බාස්වරුන් සහ ගෝලයින් අවශ්‍යයි. වැටුප සාකච්ඡා කරගත හැක. 075-9063065. L289615-1

0766589702 පන්නිපිටිය වැඩබිම් සඳහා මේසන්වරු, කම්කරුවන් අවශ්‍යයි. ගෙවීම් 3000/- - 2200/- ටාගට් OT ඇත. L289612-1

අංගොඩ ෂටරින් බාස්වරු 2800/- ගෝලයන් 2000/- OT ඇත. සති පඩි. 0773376747, 0717123444 L289614-1

කඳනේ වැඩබිමක් සඳහා දක්ෂ කපාරාරුකරුවන් අවශ්‍යයි. දෛනික වැටුප්. 077-4543153 L289625-1

කපරාරුවට දක්ෂ බාස් කෙනෙකු අවශ්‍යයි. මත්තේගොඩ නවාතැන් නොමැත. 0714758757 L289644-1

කොරෝනාවෙන් ආරක්ෂිත වැඩබිම් සඳහා උපකොන්ත්‍රාත්කරුවන්, මේසන් බාස්වරු සහ ගෝලයින් අවශ්‍යයි. ඉහළ වැටුප්. 076-9926484, 077-3815906. L1021609300-1

කොළඹ ප්‍රධාන පෙළේ නිවාස ඉදිකිරීම් ආයතනයකට අත්තිවාරම් හා බිත්ති, සැටලිම්, ටයිල්, පේන්ට් සඳහා උපකොන්ත්‍රාත්කරුවන් අවශ්‍යයි. 0706800500 L289526-2

කොළඹ රාජගිරිය ඉදිකිරීම් ආයතනයක් සඳහා කනු, බීම් දක්ෂ ලෙස කපරාරු කල හැකි මේසන් බාස්වරු (වැටුප 3000/-), දක්ෂ ලෙස පොට් අදිය හැකි පේන්ට් බාස්වරු (2500/-) දිනපතා වියදම් මුදල්, දින 7 වැටුප්, නවාතැන් පහසුකම්. 071-4345444, 071-2105176. L285421-2

කොළඹ වැඩබිම් සඳහා මේසන්වරු (2700/-) ගෝලයන් (2000/-) වහාම අවශ්‍යයි. සති වැටුප්. 0764960757. L286121-2

ගොනවුව වැඩබිමක් සඳහා දක්ෂ මේසන්වරු පුරුදු ගෝලයින් ඉක්මණින් අවශ්‍යයි. කෑම දෙනු ලැබේ. දිනපතා වියදම් මුදල්. 0763476694, 0740952877. L289567-1

ගෝලයින් (1800/-) මේසන් බාස්වරු (2800/-) සහ සැටලිම් බාස්වරු කම්බි (2800/-) අවශ්‍ය කෙරේ. නවාතැන් සැපයේ. (පන්නිපිටිය ආසන්නයි) 0777745143 L284787-2

දක්ෂ මේසන් බාස්වරු සහ ගෝලයින් අවශ්‍යයි. මේසන් බාස් වැටුප රු. 2500 සිට 3000 දක්වා ගෝල වැටුප රු. 2000 දිනපතා වැටුප් දෙනු ලැබේ. නවාතැන් පහසුකම් ඇත. දිවා ආහාරය නොමිලේ. මහරගම. 0714758531 L289611-1

දක්ෂ මේසන්වරු අවශ්‍යයි. වැටුප 3000/- පේන්ට් බාස්වරු අවශ්‍යයි. 2800/- අත්දැදිකරුවන් අවශ්‍යයි. වැටුප 2000/- දවස් පඩි. 0702175433 L289571-1

දක්ෂ සැටලින් බාස්වා ගෝලයෝ ඉක්මනින් අවශ්‍යයි. කෑම නවාතැන් නොමිලේ. බාස්ට 2500/- ගෝලයන්ට 1500/- හොරණ. 0717363061, 0777214315 L289580-1

දිනපතා වැටුප් මේසන් 3000/-, අත්දැදිකරු 2200/-, දිවා ආහාර නොමිලේ බණ්ඩාරගම වැඩබිම්. 0714107575 L289576-1

නුගේගොඩ අලුතින් පටන්ගන්නා වැඩබිමක් සඳහා මේසන්වරුන් ගෝලයන් සැටර්න් ගෝලයන් උවමනාය. 0789976154. L289675-1

පළපුරුදු සැටලිම් බාස්වා 2700 සිට ගෝලයෝ 2000 සිට 2500 දක්වා අවශ්‍යයි. කටුබැද්ද. 0760200337 L289657-1

පුද්ගලික වැඩබිමක් සඳහා දක්ෂ මේසන්වරයකු සහ දක්ෂ ගෝලයකු අවශ්‍යයි. බීම් කපරාදු සඳහා නවාතැන් පහසුකම් ඇත. සතිපඩි දක්ෂ අය පමණක් අමතන්න. 0770078794 L289661-1

බියගම අවට වැඩබිම් සඳහා මේසන් බාස්වරු අවශ්‍යයි. ඉහළ වැටුප්. නවාතැන් නොමිලේ. 0773561596, 0719962727 L289519-2

මීගොඩ අවට වැඩබිම් සඳහා මේසන්වරු අවශ්‍යයි. මේසන් 2800/-, අත්දැදිකරුවන් 2000/- දිනපතා වැටුප්. 0750902491, 0712781043 L289583-1

මේසන් කම්බි, සැටලින් පේන්ට් බාස්වරුන් ගෝලයෝ අවශ්‍යයි. නවීන්. 0773470324 L284346-3

මේසන් බාස්වරු සහ ෂටරින් බාස්වරු, ගෝලයින් දක්ෂ අය පමණක් කතා කරන්න. 3000/-, 2500/-, 2000/- සති පතා වැටුප්. මාලඹේ. 0779756193, 0715605193 L289554-1

මේසන් බාස්වරුන් හා අත්දැදිකරුවන් අවශ්‍යයි. කොළඹ අවට වැඩබිම්වලට. 0723312461, 0766861090 L289570-1

මේසන් බාසුන්නැ අවශ්‍යයි. ගෝලයන් අවශ්‍යයි. නවාතැන් ඇත. 078-8969403, 072-3319372 L289553-1

මේසන් වැඩ සඳහා ගෝලයින් අවශ්‍ය. දිනපතා වැටුප් නැවතීමේ පහසුකම් ඇත. 0750435130, 0762970639 L289639-1

මේසන්වරුන් අවශ්‍යයි. වැටුප දිනපතා 3000/- මීගමුව. 0775333597. L289091-3

රාගම පිහිටි ඉන්ටර්ලොක් ගල් ආයතනයක් සඳහා අත්දැදිකරුවන් උවමනාකර ඇත. නවාතැන් පහසුකම් සහිතයි. 0714465817, 0770744319 L289605-1

වඩු බාස්වරු අවශ්‍යයි (දවස් පඩිය) නවාතැන් පහසුකම් ඇත. 0771618813 L289621-1

වත්තල කඳන කඩවත වැඩබිම් සඳහා මේසන් හා ගෝලයින් අවශ්‍යයි. 2000-3000/- අතර වැටුප් නවාතැන් ඇත. 0710363630 L289607-1

වැටුප් 3800/- සිට 2000/- දක්වා මේසන්, ටයිල්, බිත්ති පේන්ටර්, කම්කරු, ගල්කිස්ස වැඩබිම් දුර පළාත් දිනපතා වැටුප් ආහාර නවාතැන්. 071-3307264, 077-4020678, 078-4396219. L289668-1

ෂටරින් කම්බි මේසන්වරු අත්දැදිකරුවන් අවශ්‍යයි. 3000/ 2000 නවාතැන් ඇත. කොළඹ අවට වැඩබිම් සඳහා පිට පළාත්වලින්. 0716539058, 0763255275. L289658-1

මේසන්, සටලින්, බාස්වරුන් ගෝලයින් අවශ්‍යයි. දිනපතා වැටුප්. 0769492736 L289584-1

ගෘහ සේවකයෝ

මිරිහානේ වෛද්‍යවරයෙකුගේ නිවසේ ගෘහ සේවිකාවක් ලෙස නැවතී සේවය කිරීමට වසර 2 පළපුරුදු අවු. 40-50 අතර කාන්තාවක් අවශ්‍යයි. වැටුප 35,000-40,000 අතර. 0777-704887. L289629-1

කාර්මිකයෝ

ඉදිකිරිමි ආයතනයක වැඩ කිරීමට වැල්ඩින්කරුවන් සහ අත්දැදිකරුවන් අවශ්‍යයි. නැවතීමේ පහසුකම් දිනපතා/ වියදම් මුදල් (කොළඹ). 0778102657, 0776432768 L282069-3

ටයර් වැඩ කිරීමට අය අවශ්‍යයි. වැඩි වැටුප්. 0777743612. L289284-2

ටයර් වැඩට දක්ෂ සේවකයින් අවශ්‍යයි. නවාතැන් සමඟ ඉහළ වැටුප් පිළියන්දල (අලුතින් පටන්ගන්නා). 0779510144, 0779709288 L288438-1

අලෙවිකරුවන්

බෙද හැරිමේ ආයතනයට සේවකයින් අවශ්‍යයි. 30,000/- මාකොල අවට විශේෂයි. 0715837351, 0702589863 L284105-3

වතුවැඩ

කුකුළු ගොවිපළකට පවුල් අවශ්‍යයි. කුලියාපිටිය. 0778065800. L289138-2

පොල් ගස් සහ වල් කැපීමට දක්ෂ කෙනෙක් අවශ්‍යයි. නවාතැන් පහසුකම් ඇත. 0771618813 L289622-1

හෝමාගම වත්තක වගාකටයුතු කිරීමට මත්ද්‍රව්‍යවලින් තොර පිරිමි සේවකයෙකු අවශ්‍යයි. කෑම නවාතැන් ඇත. 0711958848 L289656-1

පරිගණක

WANTED Computer Typist (English, Sinhalese) Urgently 1200/- per day or monthly salary 0760734110 Apply with in This Week only. L289650-1

ආරක්ෂක සේවා

00 ඒකල, කොටුගොඩ ගබඩා කාර්යාල සඳහා OIC - 1300, SSO - 1200, CSO - 1100 - 1200 (පැය 12 සේවා මුරයන් සඳහා පමණි) EPF + ETF ණය පහසුකම්, සුභසාධක, අතිකාල පැයකට රු. 150/- සිට රු. 175/- උප්පැන්න, ග්‍රාමසේවා, අධ්‍යාපන මුල් පිටපත් සමඟ පැමිණෙන්න. 0763035656, 0763075656. L287406-2

00 ජාඇල, කඳාන, පෑලියගොඩ, කැළණිය, හුණුපිටිය, සපුගස්කන්ද හෙයියන්තුඩුව, හෝමාගම, කඩුවෙල, මාලඹේ යන ප්‍රදේශයන් සඳහා ආරක්ෂක නිලධාරීන් වහාම බඳවා ගැනේ. වැටුප SSO - 1000 සිට 1300 දක්වා LSO 1000 සිට 1200 දක්වා EPF, ETF, ණය සහන පහසුකම්, සුභසාධක, රක්ෂණ පහසුකම් සහ ආහාර නවාතැන් සහන මිලට. 0763035656, 0763055656. L286553-2

0717090055 ආරක්ෂක නිලධාරීන් නිලධාරිනීන් පුරප්පාඩු : 0717090048 කොළඹ, 0717002818 බියගම, කැළණිය, 0712615781 වත්තල, ඒකල කොටුගොඩ, මීගමුව. වැටුප රු. 75,000/-. L289566-1

VO - Marketing Manager OIC 1200 SSO JSO LSO වත්තල ජාඇල සිදුව ගම්පහ ඉහළම වැටුප්. 0776142760. L289546-1

අතිමානවත් ආරක්ෂක රැකියාවක් සඳහා ඇබෑර්තු (වත්තල, කෙරවලපිටිය අවට) පැය 12 මුරයකට මසකට රු. 50,000.00 වැඩි වැටුප්. ප්‍රධාන ආරක්ෂක නිලධාරී (CSO) රු. 1300.00, ස්ථාන භාර නිලධාරී (OIC) රු. 1200.00 ආරක්ෂක නිලධාරී (SO) රු. 1150.00 කාන්තා ආරක්ෂක නිලධාරී (LSO) රු. 1150.00 විමසන්න. 0760953420, 0778355655, 0760953422. L262661-7

ආරක්ෂක ඇබෑර්තු ගම්පහ, ඒකල, අනුරාධපුර, වවුනියා, දෙහිවල, මොරටුව, වරකාපොල, දඹුල්ල, තිස්සමහාරාම, බොරැල්ල, නාරාහේන්පිට විමසීම්. 0761353914. L289599-1

ආහාර අපනයන ආයතනයක් සඳහා දිවුලපිටිය, වේයන්ගොඩ, මිනුවන්ගොඩ අවට්න් සියලු ආරක්ෂක නිළධාරීන් කඩිනමින් බඳවා ගනේ. දීමනා සහිත ඉහල වැටුප්. නවාතැන් නොමිලේ. ආහාර නොමිලේ/ සහනදයී මිලට 0703505069, 0753227201, 0112245506. L289123-3

ඇබෑර්තු ප්‍රදේශයේ පිහිටි කර්මාන්තශාලාවක් සඳහා ආරක්ෂක නිලධාරීන් අවශ්‍යයි. OIC/ LSO/ SO ඉහළ වැටුප්. විමසීම් 0750300333, 0759100002. L285478-3

මල්වානට ස්ථානභාර නිලධාරියෙකු ද (1300/-) ආරක්ෂක නිලධාරියෙකු ද පෑලියගොඩට රාත්‍රියට අයෙක් ද මාකොළට පළපුරුදු ආරක්ෂක නිලධාරියෙකු ද වත්තලට වාහන ස්ථානයට ආරක්ෂකයෙකු ද නිවසක් බලාගැනීමටද අවශ්‍යයි. 0777186087. L289674-1

රාජගිරියේ පිහිටි කාර්යාලයක් සඳහා ආරක්ෂක නිලධාරීන් කඩිනමින් බඳවා ගනේ. ඉහළ වැටුප්. නවාතැන් නොමිලේ. ආහාර නොමිලේ/ ස

යාපනය පොලිස් ස්ථානාධිපතිගෙන් බුත්තල රෝහලට වෛද්‍ය උපකරණ

බුත්තල රෝහලේ කොවිඩ් ප්‍රතිකාර ඒකකයට අත්‍යවශ්‍යව තිබූ උපකරණ තොගයක් ලබාදීමට යාපනයේ පොලිස්ථානයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක නිශාන්ත කුමාරසිරි රත්නායක මහතා ඉකුත්ද (09) කටයුතු කළේය.

හුමාලය අල්ලන මැෂින් 18ක්, පොළව පිරිසිදු කරන උපකරණයක් ජලය උණු කරන බොයිලේරු දෙකක්, විෂබීජහරණය කිරීම සඳහා යොදගන්නා දියර ඉසින යන්ත්‍රයක් ඇතුළු උපකරණ රැසක් මෙහිදී පරිත්‍යාග කරන ලදි.

රුපියල් ලක්ෂ එක හමාරකට අධික වියදමක් දරා මෙම උපකරණ තොගය ලබා දීමට ඒ මහතා කටයුතු කළ අතර එම උපකරණ තොගය බුත්තල රෝහලේ වෛද්‍ය අධිකාරි පිරිස් මහතා ඇතුළු හෙද කාර්ය මණ්ඩලය වෙත බාරදුන් අයුරු මෙහි දැක්වේ.

(වැල්ලවාය - අයි.ආර්. ඉන්දික)

පැනමා රබර් කඳන් ට්‍රැක්ටරයකින් අදිද්දී අත්අඩංගුවට

(මොරොන්තොට - එන් ආරච්චි)

දෙහිඕවිට අඩවි වන කාර්යාලයේ නිලධාරීන්ට ලැබුණු තොරතුරක් මත දෙහිඕවිට, දංගම්පල මාර්ගයේ අල්ගොඩ ප්‍රදේශයේ දී අනවසරයෙන් පැනමා රබර් කඳන් 9 ක් ප්‍රවාහනය කළ ට්‍රැක්ටර් රථයක් අත්අඩංගුවට ගත් බව දෙහිඕවිට අඩවි වන කාර්යාලය පවසයි.

ඒ සමග එහි රියැදුරු ද අත්අඩංගුවට ගෙන ඇති අතර අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් අධිකරණයට සැකකරු, දැව හා අදාළ ට්‍රැක්ටර් රථය ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි. සැකකාර රියැදුරු රුවන්වැල්ල කුරුපැත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

මෙම වැටලීමට දෙහිඕවිට අඩවි වන කාර්යාලයේ අඩවි වන නිලධාරී ප්‍රදීප් වෛද්‍යසේකර, රුවන්වැල්ල බීට්ටු වන නිලධාරී බී.ඒ.ඊ. උදේසිරි, දැරණියගල බීට්ටු වන නිලධාරී දමින්ද ගුණසේකර, මාලිබොඩ බීට්ටු වන නිලධාරී එච්.එම්.සී.කේ. හේරත්, වන ක්ෂේත්‍ර සහකාර එස් අමරසූරිය, වන ක්ෂේත්‍ර සහකාර එස්. කුමාරතුංග, වගා මුරකරු ජේ.ආර්. රත්නායක හා රියැදුරු පී. නිමල්සිරි යන මහත්වරු සහභාගි වූහ.

අත්අඩංගුවට ගත් දැව හා ලොරි රථය, වැටලීමට සහභාගි වූ නිලධාරීන්.

කසිප්පු බූලියක් එක්ක කොටු

(හිඟුරාන නවරත්න සමරතුංග)

කසිප්පු බෝතල් 20 ක් අඩංගු බූලියක් සමග සැකකරුවකු 31 වැනිදා අත්අඩංගුවට ගත් බව වාලච්චේන පොලිසිය පවසයි.

පොලීසියට ලැබුණ තොරතුරක් මත ස්ථානාධිපතිවරයා ඇතුළු දූෂණ මර්දන අංශයේ නිලධාරීන් පිරිසක් කුලත්තමඩු වටුලවේලි මංසන්ධියේ දී රැකවල් යොදා සිට මෙම සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරු වතුර ගෙන යන ආකාරයට කසිප්පු බූලිය කරමත තබාගෙන පයින් යමින් සිටිය දී පරීක්ෂා කළ අවස්ථාවේ අත්අඩංගුවට පත්විය. මෙම සැකකරු වාලච්චේන අධිකරණයට ඉදිරිපත් කිරීමට පියවර ගන්නා බව උසස් පොලිස් නිලධාරියෙක් ලංකාදීප යට පැවසීය.

මඩකලපුව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සුදත් මාසිංහ මහතාගේ අධීක්ෂණය මත සහකාර පොලිස් අධිකාරී ජී.එස්. ජයසුන්දර මහතාගේ උපදෙස් අනුව වාලච්චේන පොලීසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ධනංජය පෙරුමණ මහතාගේ මෙහෙයැවීමෙන් දූෂණ මර්දන අංශයේ පොලිස් සැරයන් 44415 අසංක, පොලිස් කොස්තාපල්වරුන් වන 88808 නිලන්ත සහ 37021 රත්නායක යන නිලධාරීහු වැටලීමට සහභාගි වූහ.

ට්‍රැක්ටර්-යතුරුපැදි මුහුණට මුහුණ ගැටී යතුරුපැදිකරු මරුට

(බිබිල විශේෂ කේෂර ගුණතිලක)

සියඹලාණ්ඩුව පොලිස් බල ප්‍රදේශයට අයත් අම්පාර පාර, 01 කණුව (අසලදී) ඉකුත්ද (11) සවස ට්‍රැක්ටර් රථයක් සහ යතුරුපැදියක් මුහුණට මුහුණලා ගැටීමෙන් යතුරුපැදිකරු මියගොස් ඇතැයි සියඹලාණ්ඩුව පොලීසිය පවසයි.

මෙලෙස මියගොස් ඇත්තේ සියඹලාණ්ඩුව, අම්පාර පාර, 02 කණුව අසල (පදිංචි) අලුත්ගෙදර විජේසිරි බණ්ඩාර (42) නමැති දෙදරු පියෙකි.

හෙතෙම සිය යතුරුපැදියෙන් අම්පාර දෙසට යන විටදී ඉදිරියෙන් පැමිණි ට්‍රැක්ටර් රථයක් යතුරුපැදියේ ගැටී ඇත.

සිද්ධියෙන් බරපතළ තුවාල ලැබූ යතුරුපැදිකරු සියඹලාණ්ඩුව මූලික රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුව මියගොස් තිබේ. ට්‍රැක්ටර් රථයේ රියැදුරු පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇති අතර සියඹලාණ්ඩුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

සියඹලාණ්ඩුව පොලීසියේ සැරයන් ඒ. මහින්දපාල මහතා පරීක්ෂණ පවත්වයි.

යාපනය පොලිස් ස්ථානාධිපතිගෙන් බුත්තල රෝහලට වෛද්‍ය උපකරණ

බුත්තල රෝහලේ කොවිඩ් ප්‍රතිකාර ඒකකයට අත්‍යවශ්‍යව තිබූ උපකරණ තොගයක් ලබාදීමට යාපනයේ පොලිස්ථානයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක නිශාන්ත කුමාරසිරි රත්නායක මහතා ඉකුත්ද (09) කටයුතු කළේය.

හුමාලය අල්ලන මැෂින් 18ක්, පොළව පිරිසිදු කරන උපකරණයක් ජලය උණු කරන බොයිලේරු දෙකක්, විෂබීජහරණය කිරීම සඳහා යොදගන්නා දියර ඉසින යන්ත්‍රයක් ඇතුළු උපකරණ රැසක් මෙහිදී පරිත්‍යාග කරන ලදි.

රුපියල් ලක්ෂ එක හමාරකට අධික වියදමක් දරා මෙම උපකරණ තොගය ලබා දීමට ඒ මහතා කටයුතු කළ අතර එම උපකරණ තොගය බුත්තල රෝහලේ වෛද්‍ය අධිකාරි පිරිස් මහතා ඇතුළු හෙද කාර්ය මණ්ඩලය වෙත බාරදුන් අයුරු මෙහි දැක්වේ.

(වැල්ලවාය - අයි.ආර්. ඉන්දික)

භාවිතයට ගත නොහැකි කසළ ටොන් 33 ක් පාරවල් හැඳීමට ගැනේ

සබරගමු ආණ්ඩුකාර සාකච්ඡාවකදී තීරණයක්

(රත්නපුර ලසන්ත නිරෝෂණ පෙරේරා)

රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්ක දෙකේ දෛනිකව එකතු වෙන කසළ ටොන් 143 අතුරින් යළි භාවිතයට ගත නොහැකි ඝන කසළ ටොන් 33 ක් මාර්ග ඉදිකිරීමට යොදා ගැනීමට පියවර ගැනීමට සබරගමු පළාත් ආණ්ඩුකාරවරයාගේ ප්‍රධානත්වයෙන් පැවැති සාකච්ඡාවකදී තීරණය කෙරුණි.

රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්කයේ දෛනික කසළ ටොන් 143 ක් එකතුවෙන බව අනාවරණය වී තිබේ.

වීඩියෝ තාක්ෂණය ඔස්සේ පැවැති කසළ කළමනාකරණය පිළිබඳ පැවැති සාකච්ඡා හමුවේදී මේ බව හෙළි විය.

මෙම සාකච්ඡාව සබරගමු පළාත් ආණ්ඩුකාර ටිකිරි කොබ්බැකඩුව මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි.

රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්ක දෙකේ එකතු වන කැළිකසළ කාබනික පොහොර සහ දියර පොහොර නිෂ්පාදනයට භාවිතා කිරීමට සියලු පළාත් පාලන ආයතන කටයුතු කිරීමට උපදෙස් ලබා දී තිබෙනවා. යැයි ආණ්ඩුකාරවරයා කියයි.

නොදිරන කසළ ප්‍රතිචක්‍රීයකරණය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසත් අදාළ පළාත් පාලන ආයතන දැනුවත් කර තිබෙනවා යැයි ද කලවාන, අයගම, ගොඩකවෙල, ඕපනායක, නිවිතිගල, කුරුවිට, බලංගොඩ යන ප්‍රාදේශීය සභා ද කැලිකසළ කළමනාකරණයට එක්කර ගන්නවා යැයි ද ආණ්ඩුකාරවරයා කීය.

දඩයමේ යද්දී වෙඩ් වැදී යුද සෙබළා මියයාම: සැකකරු යළි රිමාන්ඩ්

(හිඟුරානේ නවරත්න සමරතුංග)

අම්පාර නාමල්තලාව ප්‍රදේශයේ සතුන් දඩයමේ ගිය නිදෙනකු සමග සිටි යුද සෙබළෙකු වෙඩි වැදී මියගිය සිද්ධිය සම්බන්ධව රිමාන්ඩ් භාරයේ පසු වූ සැකකරු මෙම මස 26 වැනිදා දක්වා තවදුරටත් රිමාන්ඩ් භාරයේ තැබීමට අම්පාර වැඩබලන මහේස්ත්‍රාත් ඒ.යූ.පී. උක්වත්ත මහතා නියම කළේය.

ඉඟිනියාගල පොලිසිය මඟින් අත්අඩංගුවට ගත් මෙම සැකකරු ඉකුත් මස 29 වැනිදා අම්පාර අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසුව මෙම මස 12 වැනිදා දක්වා රිමාන්ඩ් භාරයට පත් කර තිබිණි.

මෙම සිද්ධිය සම්බන්ධව තවදුරටත් විමර්ශන සිදුකරගෙන යන බව පොලීසිය වැඩිදුර වාර්තාවක් ඉදිරිපත් කිරීමෙන් පසුව මෙම සැකකරු සහ තවත් පුද්ගලයකු සමග රාත්‍රී 10.30 ට පමණ නාමල්තලාව ප්‍රදේශයට දඩයමේ ගොස් ඇති අතර, එහි දී මුවෙකු පසුපස ලුහුබැඳ යද්දී මුවා යැයි සිතා බෙහෙත් කොටන තුවක්කුවකින් මෙම වෙඩි තැබීම සිදුකළ බව සැකකරු විසින් කරුණු හෙළිකළ බව පොලිසිය අධිකරණයට කීය.

ඒ අනුව මෙම නඩුව නැවත කැඳවනු ලැබීය.

පැමිණිල්ල වෙනුවෙන් ඉඟිනියාගල පොලිසියේ නඩු මෙහෙයුම් අංශයේ පොලිස් සැරයන් 45635 රංජිත් මහතා අධිකරණයේ පෙනී සිටියේය.

අම්පාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ජයන්ත රත්නායක මහතාගේ අධීක්ෂණය මත සහකාර පොලිස් අධිකාරී පී.එම්. ජයරත්න මහතාගේ සහ ඉඟිනියාගල පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක බර්ටි උඩුකුඹුර මහතාගේ උපදෙස් අනුව උප පොලිස් පරීක්ෂක නිශ්ශංක සහ කාන්තා පොලිස් සැරයන් 2816 නාලිකා යන නිලධාරීහු පරීක්ෂණ පැවැත් වූහ.

වතු කම්කරුවන්ටත් කාබනික පොහොර පාඩම කියාදෙන්න

බදුල්ල ගොවි සංවිධානය ඉල්ලයි

(බදුල්ල විශේෂ පියල් කිත්සිරි)

වතුකරයේ සත්ව පාලනය කරනු ලබන වතුකම්කරුවන්ට කාබනික පොහොර නිෂ්පාදනය කරන ආකාරය පිළිබඳව තාක්ෂණික දැනුම ලබා දීමට පියවර ගන්නැයි බදුල්ල දිස්ත්‍රික් ගොවි අයිතීන් සුරැකීමේ සංවිධානය රජයෙන් ඉල්ලයි.

බදුල්ල දිස්ත්‍රික්කයේ සියලු වතුවල වතු කම්කරුවන් අතිරේක ආදායම් මාර්ගයක් ලෙස ගව, එළු සහ කුකුළු පාලනය සිදුකරන නමුත් මෙම සත්ව අපද්‍රව්‍ය බොහෝ පිරිසක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ඉවත් කරන බවට තොරතුරු හෙළිවී ඇතැයි දිස්ත්‍රික් ගොවි අයිතීන් සුරැකීමේ සංවිධානය ප්‍රකාශ කරයි.

මෙම සත්ව අපද්‍රව්‍ය කාබනික පොහොර නිපදවීමට අවශ්‍ය ප්‍රධාන අමුද්‍රව්‍යයක් වන නිසා එය නිසි පරිදි ගුණාත්මක කාබනික පොහොර නිපදවීමට යොදගත හැකි බව පෙන්වා දෙන බදුල්ල දිස්ත්‍රික් ගොවි අයිතීන් සුරැකීමේ සංවිධානයේ උපදේශක හිටපු ඌව පළාත් සභා මන්ත්‍රී ජයන්ත කන්නන්ගර මහතා නිසි තාක්ෂණික දැනුම වතු කම්කරුවන්ට ලබා දීමට පියවර ගතහොත් විශාල කාබනික පොහොර ප්‍රමාණයක් පහසුවෙන් නිපදවා ගැනීමට හැකියාව ලැබෙනු ඇතැයි පවසයි.

මේ පිළිබඳව අවධානය යොමුකර කාබනික පොහොර නිපදවීමේ තාක්ෂණය වතුකරයේ සත්ව පාලනයේ යෙදී සිටින පුද්ගලයන්ට ලබා දීමට මැදිහත් වන ලෙස කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතාගෙන් ඉල්ලීමට සිය සංවිධානය පියවර ගත් බව ද හෙතෙම වැඩිදුරටත් කීය.

ගෑස් හිඟයට පිළියමක් නැත්නම් හෝටල් වහන්න වේවි

බදුල්ල හෝටල් හිමියෝ කියති

(බදුල්ල විශේෂ පියල් කිත්සිරි)

පවතින ගෑස් හිඟයට කඩිනම් විසඳුම් නොලැබුණහොත් තම වෙළෙඳ ආයතන වසා දැමීමට සිදුවනු ඇතැයි බදුල්ල නගරයේ හෝටල් හිමියෝ ප්‍රකාශ කරති.

මේ දිනවල වෙළඳපොළේ හටගෙන ඇති උග්‍ර ගෑස් හිඟය තමන්ට දැඩිව බලපා ඇති ඇතැයි ප්‍රකාශ කරන බදුල්ල නගරයේ ආපනශාලා හිමියෝ අවශ්‍ය පරිදි ගෑස් මිලදී ගැනීමට නොමැති වීමෙන් තවදුරටත් තම ආපනශාලා පවත්වාගන යෑම බරපතළ ගැටලුවක් වී ඇතැයි ප්‍රකාශ කරයි.

තම ආපනශාලාවල කෑම පිසීමේ කටයුතු ගෑස් වලින්ම සිදුකිරීම නිසා පවතින ගෑස් හිඟය තමන්ට දැඩිව බලපා ඇතැයි ප්‍රකාශ කරන බදුල්ල නගරයේ ආපන ශාලා හිමියෝ අවශ්‍ය පරිදි ගෑස් මිලදී ගැනීමට නොමැති වීමෙන් තවදුරටත් තම ආපනශාලා පවත්වාගෙන යෑම බරපතළ ගැටලුවක් වී ඇතැයි ප්‍රකාශ කරති.

වෙනදා මෙන් ඉල්ලුම් කරන ගෑස් සිලින්ඩර් ප්‍රමාණය අදාළ ආයතන මගින් සපයන නමුත් දැනට දින කිහිපයක සිට එම ආයතන තම සැපයුම නිසි පරිදි සිදු නොකිරීම නිසා තමන් ද දැඩි දුෂ්කර තත්ත්වයට පත්ව ඇතැයි පවසන බදුල්ල නගරයේ ගෑස් අලෙවිකරුවෝ විශාල පිරිසක් දෛනිකව ගෑස් මිලදී ගැනීමට පැමිණෙන නමුත් අලෙවියට අවශ්‍ය ගෑස් ප්‍රමාණය තමන් සතුව නැතැයි පවසති.

මේ පිළිබඳව සිදුකළ විමසීමේදී ගෑස් අලෙවි සමාගමක වෙළඳ නියෝජිතවරයකු ප්‍රකාශ කළේ ගෑස් නිකුත් කිරීම සීමා කිරීම මෙම හිඟයට හේතුව බවයි.

ත්‍රී'මලේ පොලිසිවලට ත්‍රිරෝද රථ

(ත්‍රිකුණාමලය අමදෝරු අමරජීව)

ත්‍රිකුණාමල පොලිස් කොට්ඨාසයේ දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල සිවිල් පරිපාලන කටයුතු පහසුකරලීම සඳහා කොට්ඨාසයේ අදාළ සෙසු අංශවලට ත්‍රිරෝද රථ 18 ක් ලබා දීම ත්‍රිකුණාමල මූලස්ථාන පොලිසියේ දී සිදු කෙරිණි.

ත්‍රිකුණාමලය කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී උදය හේමන්ත මහතා විසින් අදාළ පොලිස් ස්ථානවල හා අංශවල ස්ථානාධිපතිවරුන් වෙත ත්‍රිරෝද රථවල නිල ලේඛන බාර දීම සිදු කළේය. ත්‍රිකුණාමල පොලිස් කොට්ඨාසය තුළ පොලිස් වසම් 11 ක් ඇති අතර මේ අනුව තෝරාගත් දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශ හඳුනාගෙන මෙම ත්‍රිරෝද රථ බෙදා දුන්නේය.

කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී උදය හේමන්ත මහතා උප්පුවේලි පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ගයාන් ප්‍රසන්න මහතාට ත්‍රිරෝද රථයක ලේඛන භාර දෙමින්.

අලුත්වැව දෘශ්‍යාබාධිත 300 කට කණ්ණාඩි

තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොටවෙහෙරමංකඩ, උස්ගල සහ අලුත්වැව ප්‍රදේශවල ජීවත්වෙන අඩු ආදායම්ලාභී පවුල්වල දෘශ්‍යාබාධිත 300 දෙනෙකුට පමණ ඇස් කණ්ණාඩි ලබා දීම පසුගියදා සිදු කෙරිණි.

දහම් පාසල්, භික්ෂු අධ්‍යාපන, පිරිවෙන් කටයුතු පිළිබඳව රාජ්‍ය අමාත්‍යාංශය මඟින් තණමල්විල ගල්ඉරාමංකඩ සහ අලුත්වැව පාසල්වල දී සහ අඟුණකොළපැලැස්ස විහාරස්ථානයේ දී පැවති අක්ෂි කඳවුරුවල දී ඇස් පරීක්ෂා කිරීමෙන් අනතුරුව දෘශ්‍යාබාධිතයන් තෝරාගෙන ඇස්කන්නාඩි පිරිනැමීම සිදු කෙරිණි.

මෙම අවස්ථාවට සහභාගී වූ දහම් පාසල්, භික්ෂු අධ්‍යාපන, පිරිවෙන් කටයුතු පිළිබඳ රාජ්‍ය ඇමැති විජිත බේරුගොඩ මහතා කාන්තාවකට උපැස් යුවලක් පැළඳු අයුරු මෙහි දැක්වේ.

මෙම අවස්ථාවට ඌව පළාත් සභාවේ හිටපු උප සභාපති විමල්ගලගම ආරච්චි මහතා ද සහභාගී විය.

(බිබිල විශේෂ කේෂර ගුණතිලක)

රත්නපුර රාජ්‍ය නිලධාරීන්ට සනීපාරක්ෂක ද්‍රව්‍ය පිරිනමයි

(බෙලිහුල්ඔය ප්‍රින්ස් රත්නායක)

කොවිඩ් 19 රෝගයෙන් සුරක්ෂිත වෙමින් රාජකාරී කටයුතු ඉටු කිරීම සඳහා රත්නපුර දිස්ත්‍රික්කයේ රාජ්‍ය නිලධාරීන්ගේ භාවිතයට සනීපාරක්ෂක ද්‍රව්‍ය තොගයක් ඉකුත් 11 වැනිදා රත්නපුර අතිරේක දිස්ත්‍රික් ලේකම් ජී.ඩී.එල්. උදය කුමාර මෙනවිය වෙත රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ දී පරිත්‍යාග කරන ලදී.

ශ්‍රී ලංකා ජාතික සාම මණ්ඩලය හා එම මණ්ඩලය යටතේ ක්‍රියාත්මක රත්නපුර දිස්ත්‍රික් අන්තර් ආගමික කමිටුව එක්ව මෙම පරිත්‍යාගය සිදු කරන ලදී.

කොවිඩ් 19 රෝගයෙන් ආරක්ෂා වීමට අවශ්‍ය ආරක්ෂිත ඇඳුම්, දියර ඉසින යන්ත්‍ර ඇතුළු සනීපාරක්ෂක ද්‍රව්‍ය මෙහි දී පරිත්‍යාග කළ අතර, අතිරේක දිස්ත්‍රික් ලේකම් ජී.ඩී.එල්. උදය කුමාරි මෙනවිය මේ අවස්ථාවේ දී, රත්නපුර දිස්ත්‍රික් ලේකම් මාලනී ලොකුපෝතාගම මහත්මිය වෙනුවෙන් මෙම සද්කාර්යයට දායක වූ සැමට ස්තූතිය පළ කළාය.

මෙම අවස්ථාවට මහා සංඝරත්නය ඇතුළු අනෙකුත් ආගමික පූජකතුමන්ලා, රත්නපුර රාජ්‍ය නොවන සංවිධාන දිස්ත්‍රික් සම්බන්ධීකාරක ශ්‍රී.ජී. කරුණාරත්න මහතා, රත්නපුර ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකාරක පී.කේ.එස්.එන්. ආරියවංශ මහතා ඇතුළු රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයෝද සහභාගී වූහ.

නිවසක වඩුවැඩ කළ කාර්මිකයා විදුලි සැර වැදී මරුට

(බිබිල විශේෂ කේෂර ගුණතිලක)

ඇතිමලේ පොලිස් වසමට අයත් කොටියාගල ප්‍රදේශයේ නිවසක වඩුවැඩ කරමින් සිටි කාර්මිකයෙකු විදුලිසැර වැදීමෙන් ඉකුත්ද (11) සවස මියගොස් ඇතැයි පොලිසිය පවසයි.

මෙලෙස මියගොස් ඇත්තේ කොටියාගල, වත්තේගම 10 කණුව අසල පදිංචිව සිටි ළිදේගෙදර ජානක විජේසූරිය (29) නමැති දෙදරු පියෙකි.

හෙතෙම විදුලි බලයෙන් ක්‍රියාත්මක වන වඩු මැෂිම ක්‍රියාත්මක කිරීමට යාමේදී විදුලිසැර වැදීමෙන් ඇතිමලේ ප්‍රාදේශීය රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුව මියගොස් ඇත. සිද්ධිය පිළිබඳව ඇතිමලේ පොලිසිය පරීක්ෂණ පවත්වයි.

සණස ව්‍යාපාරය ජාත්‍යන්තර සමූපකාර දිනය සමරයි

ලොව පුරා ව්‍යාප්තව පවතින ප්‍රමුඛතම සමාජ සුබසාධන ව්‍යාපාරයක් වන සමූපකාර ව්‍යාපාරය සිය 99 වැනි සංවත්සරය පසුගියදා උත්සවාකාරයෙන් සැමරූ අතර ඊට සමගාමීව සණස සමිති, සණස ලයිෆ් ඉන්ෂුවරන්ස්, සණස ජෙනරල් ඉන්ෂුවරන්ස්, සණස සංවර්ධන බැංකුව ඇතුළු මෙරට සණස සමූහ ව්‍යාපාරයට අයත් ආයතනද, ජාත්‍යන්තර සමූපකාර දිනය අභිමානවත් ලෙස සැමරිය.

'එක්වී මනාව යළි ගොඩ නැගෙමු' යන තේමාව ඔස්සේ මෙවර ජාත්‍යන්තර සමූපකාර දිනය පැවැත්විණි. රටවල් 112ක් ජාත්‍යන්තර සමූපකාර සන්ධානයේ සාමාජිකත්වය ලබා ඇත. කාර්මික විප්ලවය සමග ඇති වුණ සාමාජීය සහ ආර්ථික වෙනස්කම් සමග පීඩනයට පත් වුණ ගොවියා සහ කම්කරුවා නගා සිටුවීමේ අරමුණින් සමූපකාර ව්‍යාපාරය මූලිකව අරඹන ලදී. 1923දී ප්‍රථම වරට ජාත්‍යන්තර සමූපකාර දිනය සැමරීමට තීරණය කරන ලදී. ඒ අනුව සෑම වසරකම ජූලි මස පළමු



වැනි සෙනසුරාදා ජාත්‍යන්තර සමූපකාර දිනය ලෙස නම් විය.

ආචාර්ය පී.ඒ. කිරිවන්දෙණිය මහතාගේ මූලිකත්වයෙන් ඇරැඹුණු සණස ව්‍යාපාරය සාමාජිකයන් ලක්ෂ 30කට ආසන්න ගණනකින් සමන්විත වන අතර සණස ප්‍රාථමික, දිස්ත්‍රික්, ජාතික සහ ජාත්‍යන්තර ලෙස මට්ටම් කිහිපයකින් ක්‍රියාත්මක වේ. එහි ප්‍රාථමික මට්ටමේ මූලික කාර්යයන් වන්නේ සාමාජිකයන්ගේ සකසුරුවම් බව වර්ධනය කිරීම, ආර්ථික වර්ධනයට මූල්‍ය සම්පත් සැපයීම, සාමාජිකයන්ට අධ්‍යාපනය සැපයීම ආදියයි. "සමූපකාර ව්‍යාපාරය නිර්මාණය වූණේ ලෝකයේ අර්බුද පවතින අවස්ථාවක. එනිසා ඉතාම අර්බුදකාරී අවස්ථාවල ප්‍රමුඛ බලපෑමක් කරන්න සමත් ශක්තිමත් ව්‍යාපාරයක් ලෙස සමූපකාර ව්‍යාපාරය සෑම විටම ක්‍රියාත්මක වුණා. වර්තමන් කොරෝනා අර්බුදය ඇති කළ ගැටලු විසඳ ගෙන ජන ජීවිත ජය ගන්න අවශ්‍ය මඟ පෙන්වීම සිදු කරන්න අප සූදානම්." සණස නිර්මාතෘ ආචාර්ය පී.ඒ. කිරිවන්දෙණිය මහතා පැවසීය.

සංචිත අර්බුදයට පිළියමක්

ඇමෙරිකානු ඩොලර් බිලියනයක විදේශ ණය නැවත ගෙවීමත් සමඟ ආණ්ඩුව තුළත් රට තුළත් ඒ සම්බන්ධයෙන් කතාබහක් ඇති විය. එම ණය මුදල ගෙවීමට නියමිතව තිබුණේ ජූලි 27 වැනිදා වන අතර ඊට දිනකට පෙර එය ගෙවා දැමීමට ආණ්ඩුවට හැකියාව ලැබිණි. ඒ අනුව ණය මඟ නොහැර නියමිත දිනට ගෙවීමේ මෙරට වාර්තාව ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යෑමට මේ ආණ්ඩුව ද සමත් විය. මේත් සමඟ රටේ විදේශ මූල්‍යයේ තිබෙන අවදානම් තත්ත්වය විසඳූ ගනු ඇතැයි විශ්වාසය ද ඇති වී තිබේ. විදේශ සංචිත කඩිනමින් නැවත පුරවා ගනිමින් දීර්ඝකාලීනව විදෙස් සංචිත ශක්තිමත් කරගන්නේ කෙසේ ද?

සංචිත නැවත පුරවා ගන්නේ කෙසේ ද?

ඇමෙරිකානු ඩොලර් බිලියන තුනකටත් අඩු අගයකට පහත වැටී තිබෙන විදේශ සංචිත ප්‍රමාණය මේ වසර අවසන් වන විටදී සෑහීමකට පත්වීමට හැකි අගයකට ගෙන ඒමට හැකියාව ලැබෙනු ඇතැයි ආණ්ඩුව විශ්වාස කරයි. මිත්‍ර රටවල් සමඟ මුදල් හුවමාරු (ස්වැප්)වලට එළැඹීමටත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රධාන සහ මේ වසරේ ඉදිරි මාසවලදී සේවාවලින් ඉහළ ආදායම් ලබාගත හැකි වනු ඇති බවටත් ආණ්ඩුව බලාපොරොත්තු තබා ඇත.

කෙසේ නමුත් විදේශ සංචිතවල තිබෙන මෙම භයානක සහ අස්ථිර ස්වභාවය මේ වසර අවසානයේදීත් පවතිනු ඇති බවත් ලබන වසරේ දී මෙම තත්ත්වය තවදුරටත් උග්‍ර වනු ඇති බවටත් විශ්ලේෂකයෝ/ විශේෂඥයෝ පෙන්වාදෙති. ලබන වසරේ දී තවදුරටත් විදේශ ණය ගෙවීම් කිරීමට තිබෙන බැවින් සහ ආනයන වියදම් වැඩිවීමත් යන කරුණු මුල් කරගනිමින් මේ තත්ත්වය උග්‍ර වනු ඇතැයි ඔවුහු පෙන්වාදෙති.

මුදල් හුවමාරු (ස්වැප්)

ඉන්දියාව සහ බංග්ලාදේශය සමඟ මුදල් හුවමාරු පහසුකම් තුළින් සහ චීනයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 150ක යුවාන් ණය පහසුකම් ලැබීමට නියමිත අතර මේවා මඟින් විදේශ සංචිත ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් (එස්.ඩී.ආර්./ ජාත්‍යන්තර සංචිත වත්කම්) යටතේ මෙරටට ලැබීමට නියමිත ඇමෙරිකානු ඩොලර් මිලියන 780ක මුදල ද විදෙස් සංචිත ඉහළ යෑමට උපකාරී වනු ඇතැයි අපේක්ෂිත ය.

මුදල් හුවමාරු යනු සංචිත ඉහළ දමන තාවකාලික පහසුකම් වන අතර එම මුදල් නැවත ගෙවිය යුතු වේ. චීනයෙන් ලැබෙන ණය පහසුකම චීනයෙන් ආනයනය කිරීමට උපකාරී වනු ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලැබෙන මුදල ප්‍රදානයකි.

ඉන්දියාවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක් ද බංග්ලාදේශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 250ක් ද වශයෙන් මුදල් හුවමාරු පහසුකම් ලැබීමට නියමිත ය. මේවා කෙටිකාලීන පහසුකම් වන අතර අවිනිශ්චිත තත්ත්වයක තිබේ. චීනයෙන් ලැබෙන යුවාන් ණය පහසුකම ප්‍රයෝජනවත් වන්නේ චීනයෙන් භාණ්ඩ මිලදී ගැනීමට පමණි.

ප්‍රයෝජනවත් සහන

මුදල් හුවමාරු, ණය සහ අනෙකුත් මූල්‍ය පහසුකම් සියල්ල සහන වන නමුත් ඒවා විසඳුම් නොවේ. කෙසේ නමුත් මේවා දැනට විදේශ මූල්‍යයේ තිබෙන අර්බුදකාරී තත්ත්වය විසඳගැනීමට ප්‍රයෝජනවත් වේ. කෙසේ නමුත් මේවා ප්‍රශ්නයට විසඳුම් නොවේ.

විසඳුම්

දැඩි ආනයන සීමා පනවමින් වෙළෙඳ හිඟය අඩු කරගැනීම අත්‍යවශ්‍ය වේ. වෙළෙඳ භාණ්ඩ අපනයන ආදායම වැඩි කිරීමත් සේවාවලින් ආදායම් වැඩි කරගැනීමත් රටේ විදේශ මූල්‍යයේ තිබෙන අර්බුදකාරී තත්ත්වය පාලනය කරගැනීමට උපකාරී වේ. දැනට අපේක්ෂිත බොහෝ අරමුදල්/ පහසුකම් කෙටිකාලීන සහන පියවර ය.

සරල සත්‍යය සම් රට විදේශ විනිමය උපයාගත්තේ ආනයන මත වියදම් කිරීමෙන් පසු ඉතිරි වන මුදලිනි. කෙටියෙන්ම සඳහන් කරන්නේ නම් වෙළෙඳ හිඟය අඩු කරගැනීමට පියවර ගත යුතු ය. හැකියාවක් ඇති නම් 2019 වසරේ දී මෙන් ගෙවුම් ශේෂයේ අතිරික්තයක් උපයාගත යුතු ය. එම අවස්ථාවේදී වෙළෙඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන අටක් වූ අතර සේවාවලින් සහ ප්‍රාග්ධන ගලාඒම්වලින් එය පියවා ගැනීමට හැකියාව ලැබිණි.

ඉකුත් වසරේ දැඩි ආනයන සීමා පනවමින් ආනයන අඩු කරගැනීමටත් වෙළෙඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන හයක් දක්වා අඩු වුවත් ගෙවුම් ශේෂයේ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන 2.3ක් විය.

ඉහළ ආදායම්

මේ වසරේ සිවුවැනි කාර්තුවේ දී ප්‍රේෂණ, තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවාවලින් සහ සංචාරක කර්මාන්තයෙන් ලැබෙන ආදායම් ඉහළ යනු ඇතැයි අපේක්ෂිත ය. එමඟින් සංචිත ප්‍රමාණවත් ප්‍රමාණයට වැඩි වනු ඇතැයි අපේක්ෂිත ය. ඉහළ වටිනාකමකින් සමන්විත මැණික් සොයාගැනීම තවත් වාසියකි. ඒවා ඇමෙරිකානු ඩොලර් මිලියන 100ත් 200ත් අතර වනු ඇතැයි ගණන් බලා ඇත. මැණික්, ඒවායේ අයිතිකරුවන්ට වාසියක් වුවද රටේ විදේශ සංචිතවලට නම් එතරම් වටිනාකමක් නැත. අප සිටින්නේ දැඩි අර්බුදයක ය. එබැවින් මහ මුහුදකට

ආචාර්ය
නිමල් සඳරත්න PhD

වතුරු බිංදු කිහිපයක් දමන්නාක් මෙන් මේ මැණික් අපේ දුර්වල සංචිතවලට එක් කළ හැකි ය. කෙසේ නමුත් මේ මැණික්වල වටිනාකම අඩු බවද මේ වනවිට දැනගන්නට ලැබේ. ඉහත කී මේ ගලාඒම් මඟින් මේ වසර අග වනවිට විදෙස් සංචිත ඉහළ යනු ඇතැයි අපේක්ෂිත ය.

අතීත අත්දැකීම්

රටේ වෙළෙඳ ගිණුමේ අතිරික්තයක් පැවැතියේ වසර හතරක් හෝ පහක් පමණි. ව්‍යුහගත ගැටලු තිබෙන බව එයින් ඉතා හොඳින් පැහැදිලි ය. අවසාන වරට වෙළෙඳ හිඟයේ අතිරික්තයක් වාර්තා වූයේ මීට වසර 44කට පෙර එනම් 1977 වසරේ දී ය. එය ද ඉතා කුඩා අගයකි. එම අතිරික්තය ළඟා කරගත්තේ දැඩි ආනයන සීමා පනවමින් සහ අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල හිඟ පවතින තත්ත්වයක් තුළ ය. එම සමයේ දී ජීවනෝපායවලට දැඩි දුෂ්කරතා ඵල්ලා විය. එමෙන්ම ආර්ථික වර්ධන වේගය ද අඩු අගයක පැවතුණි.

මූලධර්ම හේතු

දිගින් දිගටම වෙළෙඳ හිඟ පැවැතීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ අපනයන වැඩි කිරීමට ඇති අසමත්කම ය. කෙසේ නමුත් අපනයන වැඩි නොවුණ ද ආනයන දිගින් දිගටම සැලකිය යුතු අගයකින් වැඩි විය. බොහෝ වසරවලදී ආනයන වියදම අපනයන ආදායම මෙන් දෙගුණයක් විය. ඉකුත් වසරේ දී (2020) වෙළෙඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන හයක අගයකට ගෙන ඒමට සමත් විය. කෙසේ නමුත් එම වසරේ ආනයන වියදම ඇමෙරිකානු ඩොලර් බිලියන 16ක් වූ අතර අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 10ක් විය.

2021 වෙළෙඳ ශේෂය මේ වසරේ වෙළෙඳ ශේෂය කුමක් වනු ඇති ද ?

ඉකුත් වසරේ දී වෙළෙඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන හයක් වූ අතර මේ වසරේ දී වෙළෙඳ හිඟය දෙගුණ වනු ඇත. මේ වසරේ මුල් අර්ධයේ දී අපනයන ආදායම ඉතා හොඳ තත්ත්වයක් පෙන්නුම් කළ ද දැඩි ආනයන සීමා පනවා තිබුණ ද ආනයන වැඩි වීම හේතුවෙන් මේ වසරේ දී වෙළෙඳ හිඟය පසුගිය වරට සාපේක්ෂව දෙගුණ වනු ඇත.

අපනයන

මේ වසරේ මුල් අර්ධයේ අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 5.6ක් වූ බව අපනයන සංවර්ධන මණ්ඩලය ඉකුත් ද සඳහන් කළේය. වෙළෙඳ භාණ්ඩ අපනයන ඇමෙරිකානු ඩොලර් බිලියන 12ක් වනු ඇතැයි එම මණ්ඩලය ඇස්තමේන්තු කර ඇත. එය එසේ වුවත් ඉහළ ආනයන වියදම හේතුවෙන් වෙළෙඳ හිඟය තවදුරටත් පුළුල් වනු ඇත.

මේ වසරේ මුල් අර්ධයේ දී වෙළෙඳ භාණ්ඩ අපනයන ඇමෙරිකානු ඩොලර් බිලියන 5.56ක් ලෙස දැක්වුණු අතර එය පසුගිය වසර හා සැසඳීමේදී සියයට 27.5ක වර්ධනය කි. පසුගිය වසරේ මුල් මාස හයේ දී වෙළෙඳ භාණ්ඩ අපනයන ඇමෙරිකානු ඩොලර් බිලියන 4.36ක් විය. කොවිඩ්-19 වසංගතය තෙවැනි රැල්ල මධ්‍යයේ වුවද එම අපනයන ආදායම ලබාගත හැකි වූයේ දැඩි සීමා සහ බාධක මධ්‍යයේ ය. ජාත්‍යන්තර ඉල්ලුම ක්‍රමයෙන් වැඩි වීමත් සමඟ නිෂ්පාදිත අපනයන ද ක්‍රමයෙන් වැඩි විය.

ඉල්ලුම

ආනයන මත දැඩි සීමා පනවා තිබුණ ද ආනයන වියදම් වැඩි වීම හේතුවෙන් මේ වසරේ ගෙවුම් ශේෂයට අහිතකර ලෙස බලපෑම් ඵල්ල වනු ඇත. ආහාර, අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සහ අමුද්‍රව්‍ය සහ කෘෂිකාර්මික අපනයන ඇඳු වීම යනාදිය හේතුවෙන් මේ වසරේ දෙවැනි අර්ධයේ දී වෙළෙඳ හිඟය තවදුරටත් පුළුල් වනු ඇත. පොහොර ආනයනය මත සීමා පැනවීම හේතුවෙන් මීට ප්‍රතිචාර දක්වනු ඇති අතර විමඟින් වෙළෙඳ ශේෂයේ තත්ත්වය උග්‍ර වනු ඇත. ඊට ප්‍රධානම හේතුව ආහාර නිෂ්පාදන අඩු වීම යි.

ගෙවුම් ශේෂය

වෙළෙඳ ශේෂය පුළුල් වීම යන තත්ත්වය මධ්‍යයේ සේවා අංශවලින් ලැබෙන ආදායම් ඉතා වැදගත් වේ. පසුගිය වසරේ දී එය ඉතා වැදගත් විය. කෙසේ නමුත් මේ මොහොතේ තිබෙන වැදගත්ම ප්‍රශ්නය වන්නේ සේවක ප්‍රේෂණ, තොරතුරු සන්නිවේදන සහ තාක්ෂණ ක්ෂේත්‍රයෙන් ලැබෙන ආදායම් සහ ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් වෙළෙඳ හිඟය ඉක්මවා ගොස් ගෙවුම් ශේෂයේ අතිරික්තයක් නිර්මාණය කරනු ඇත්ද යන්න යි.

සාරාංශය

ඉකුත් මාසයේ දී විදේශ සංචිත ඇමෙරිකානු ඩොලර් බිලියන තුනටත් අඩු අගයකට අඩු විය. මෙය ඉතාමත් අඩු අගයක් වන මෙය භයානක තත්ත්වයකි. මේ වසරේ ආනයන අවශ්‍යතා ද ඉතා ඉහළ බැවින් පවතින්නේ අවදානම් සහගත තත්ත්වයකි. මුදල් හුවමාරු සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලැබෙන ප්‍රදානය මේ කඩිනම් දුෂ්කරතාවලින් රටට තාවකාලික සහන සහ පිළියම් සපයනු ඇත. මේවා මේ අවස්ථාවේ අවශ්‍ය සහන/පහසුකම් වන අතර කෙසේ නමුත් මේවා විසඳුම් නොවේ. විදේශ මූල්‍යයේ තිබෙන ව්‍යුහගත අර්බුදවලට විසඳුම් අවශ්‍ය වේ.

නිගමනය

රටේ විදේශ මූල්‍යයේ තිබෙන ප්‍රශ්නයට තිබෙන ඇති එකම ප්‍රායෝගික විසඳුම වන්නේ අපනයන වැඩි කරමින් වෙළෙඳ හිඟය අඩු කිරීමත් සේවාවලින් ආදායම් උපයමින් ගෙවුම් ශේෂයේ අතිරික්තයක් ඇති කරගැනීමත් ය.

සන්ඩේ ටයිම්ස් පුවත්පතේ පළවූ ලිපියේ පරිවර්තනය

හර්ෂණ තුෂාර සිල්වා

හම්බන්තොට වරායේ තොග නාණ්ඩ හැසිරවීම් ඉහළට



හම්බන්තොට ජාත්‍යන්තර වරාය (HIP) විසින් මුද හරින ලද ඉහළතම තොග ප්‍රමාණය වාර්තා කරමින් මැතකදී ඉන්සි සිමෙන්ති සඳහා ගෙන ආ පිප්සම් තොග දිනකට මෙට්‍රික් ටොන් 24,000 බැගින් හසුරුවන ලදී.

ඉන්සි සිමෙන්ති සමාගමේ ප්‍රසම්පාදන හා සැපයුම්හි අධ්‍යක්ෂ තුසිත් ගුණවර්ණසූරිය මහතා පවසන්නේ මෙය ශ්‍රී ලංකාවේ වරායකට වේගය සහ කාර්යක්ෂමතාව අනුව හිමිවූ සුවිශේෂී ජයග්‍රහණයක් බවයි. ඒ මහතා මෙසේද පැවසීය. "ශ්‍රී ලංකාවේ අංක 1 සිමෙන්ති නිෂ්පාදන සමාගම ලෙස අප විශාල යාත්‍රාවලින් අමුද්‍රව්‍ය ආනයනය කරනවා. එම යාත්‍රා රටට පැමිණි පසු හම්බන්තොට ජාත්‍යන්තර වරාය සමූහය (HIPG) සහ හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝර්ට් සර්විසස් සමාගම (HIPS) , වේගයෙන් තොග මුදහැරීමේ කටයුතු සිදු කරනවා. වරාය මෙහෙයුම් වේගවත් වන තරමට අපට පමණක් නොව රටටත් වැඩි වාසියක් ලැබෙනු ඇත. මහද්‍වයත් යාත්‍රාව වරායේ රැඳී සිටින දින 2 1/2 සඳහා අප, රඳවා තබා ගැනීමේ හා ප්‍රමාද ගාස්තු ලෙස ඇමෙරිකානු ඩොලර් 75,000කට ආසන්න මුදලක් ගෙවයි. එබැවින්, අප මෙවර සිදු කළ ආකාරයට මෙන් දින දෙකහමාරකට කලින් මුදහැරීමේ කටයුතු නිමා කළ නිසා, සැලකිය යුතු ලෙස පිරිවැය ඉතිරි කර ගැනීමට අපට හැකි වුණා. එය අපගේ සමාගමට වාසියක් වන අතර රට සඳහාද විදේශ විනිමය සැලකිය යුතු ලෙස ඉතිරි කිරීමකි".

HCL ශ්‍රී ලංකා මධ්‍යස්ථානයට සිනමන් Life තෝරාගනී



කොළඹ නගරයේ අභිනවින පහසුකම් වලින් සමන්විත නවතම කාර්යාලයීය කුලුන වන Cinnamon Life ව්‍යාපෘති 'The Offices' තම ශ්‍රී ලංකා මධ්‍යස්ථානය ලෙස තෝරාගැනීමට, ලොව ප්‍රමුඛතම තාක්ෂණ සමාගමක් වන HCL Technologies තීරණය කර තිබේ.

ඒ අනුව එම සමාගම 'The Offices' හි කාර්යාල අවකාශ අතරින් සියයට 80ක ප්‍රමාණයක් භාවිත කරනු ඇත. ජාත්‍යන්තර සමාගමක් මේ ආකාරයක මෙරට A ශ්‍රේණියේ කාර්යාලයීය කුලුනක කාර්යාල අතරින් බහුතරය වෙන්කරවා ගත් ප්‍රථම අවස්ථාව මෙයයි.

මේ සඳහා වන ගිවිසුමට HCL Technologies සහ පෝන් කිල්ස් හෝල්ඩින්ස් (JKH) යන සමාගම් වල නියෝජිතයන් විසින් පසුගියදා අත්සන් තබන ලදී. මේ ඔස්සේ තවත් දේශීය හා ජාත්‍යන්තර සමාගම් රැසක් මෙම ව්‍යාපෘතිය වෙත ආකර්ෂණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එමෙන්ම ජාත්‍යන්තර සමාගමක් මේ ආකාරයට මෙරට තුළ තම ව්‍යාපාර කටයුතු පුළුල් කිරීමට සැලසුම් කිරීම, දකුණු ආසියාවේ ව්‍යාපාරික කේන්ද්‍රයක් බවට පත්වීමට කොළඹ නගරය සතු හැකියාව පිළිබිඳ මනා සාක්ෂියක් ලෙසද සැලකිය හැකි ය.

කොළඹ නගරයේ සුවිශේෂී ස්ථානයක පිහිටා තිබීම, නවීනතම පහසුකම් වලින් සමන්විතවීම සහ උසස් ප්‍රමිතිය සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමුකරමින් ඉදිකර තිබීම යනාදිය, Cinnamon Life ව්‍යාපෘතියේ The Offices තෝරාගැනීමට HCL සමාගම යොමුකරවූ ප්‍රධානතම සාධක ලෙස සැලකේ.

එමිරේට්ස් මඟින්ට නොමිලේ Expo නරඹන්න අවස්ථාවක්

කළාපයේ දැවැන්තම වෙළෙඳ ප්‍රදර්ශනයක් වන 2020 ඩුබායි Expo වෙළෙඳ ප්‍රදර්ශනයේ ප්‍රමුඛතම පාර්ශ්වකරුවා සහ නිල ගුවන් සමාගම ලෙස එමිරේට්ස් මෙම ප්‍රදර්ශනය නැරඹීමට සමාගමේ ගුවන් මඟින්ට සුවිශේෂී ප්‍රතිලාභයක් ඉදිරිපත් කර තිබේ.

මේ අනුව, මෙම වැඩසටහන පැවැත්වෙන 2021 ඔක්තෝම්බර් 01 වැනිදා සිට 2022 මාර්තු 31 වන දක්වා කාල සීමාව තුළදී ඕනෑම අවස්ථාවක ඩුබායි වෙත පැමිණෙන සහ ඩුබායි හරහා ගමන් කරන එමිරේට්ස් මඟින්ට ඔවුන්ගේ සියලුම ගුවන් ටිකට්පත් වලට නොමිලේ Emirates Expo Day Pass එකක් ලබාදීමට ගුවන් සමාගම කටයුතු කර ඇතැයි එම සමාගම සඳහන් කරයි.

එමිරේට්ස් සඳහන් කරන්නේ 2021 ඔක්තෝම්බර් 01 වැනිදා සිට 2022 මාර්තු 31 වැනිදා දක්වා ඩුබායි වෙත හෝ ඩුබායි හරහා ගමන් කරන සියලුම එමිරේට්ස් ගුවන් මඟින්ගේ ටිකට් පත් සඳහා මෙම විශේෂ දීමනාව ලබාදෙන බවයි. මීට අමතරව, චක්සත් අරාබි එමීර් රාජ්‍යයට පිටත සිට පැමිණෙන එක් දිගාවකට පමණක් ගමන් කරන ගුවන් මඟින් ඩුබායි වෙත පැමිණීමේදී හෝ ඩුබායි හි අවම රැඳී සිටීමේ කාලය සම්පූර්ණ කරමින් වෙනත් ගමනාන්ත වෙත ගමන් කිරීමේදී ත්‍යාගයක් ලෙස Expo Day Pass එකක් ප්‍රදානය කිරීමටද එමිරේට්ස් කටයුතු කර තිබේ.

ස්පාර්ක්ලින්ක් හතළිස් දෙවසරක විශිෂ්ටත්වය සමරයි

දශක හතරකට අධික කාලයක් පුරා මෙරට සංචාරක ක්ෂේත්‍රය තුළ විශිෂ්ට සහ කැපිපෙනෙන කාර්යභාරයක් සිදුකළ ස්පාර්ක්ලින්ක් ට්‍රැවල්ස් (Sparklink Travels) ආයතනය පසුගියදා සිය 42වැනි සංවත්සරය සමරනු ලැබිය. වර්ෂ 1979දී නිහාල් පෙරේරා මහතාගේ මූලිකත්වයෙන් පවුලේ ව්‍යාපාරයක් ලෙස ආරම්භ වූ Sparklink Travels අද දක්වාම ඒකාබද්ධතාව, සක්‍රියතා සහ ගුවන් සවාරි, නෞකා සවාරි සහ සංචාරවල විශිෂ්ටත්වය තුළින් සුවිශේෂී සේවාවක් සංචාරකයන්ට ලබාදීමට කැපවී සිටියි. එම සුවිශේෂත්වය හේතුවෙන් ප්‍රතිඵල සහතිකය ලත් සංචාර ආයතනයක් බවට පත්වීමට ද එම ආයතනයට හැකිවී තිබේ.

මෙරට සංචාරක කර්මාන්තය තුළ සිටින ප්‍රවීණ චරිතයක් වන නිහාල් පෙරේරා මහතා ලංකා සංචාරක මණ්ඩලයේ සංවර්ධන හා ප්‍රචාරණ අංශයේ අධ්‍යක්ෂවරයා ලෙස ද සේවය කළේය. ඔහු මේ වනවිට ප්‍රකී පෙරේරා සමඟ එක්ව ඕස්ට්‍රේලියාවේ සිට ස්පාර්ක්ලින්ක් ට්‍රැවල්ස් Australia ආයතනය ද මෙහෙයවනු ලබයි. ස්පාර්ක්ලින්ක් ට්‍රැවල්ස් සතු පළපුරුදු සහ වෘත්තීය කාර්යමණ්ඩලය වර්තමානයේදී සිය සංචාරක සේවා, කොල්ලුපිටිය, ලිබර්ටි ආර්කේඩ්හි පිහිටි සිය කාර්යාලයේ මෙන්ම දුරස්ථ වශයෙන් ද ක්‍රියාත්මක වෙමින් ලබාදෙන අතර, සඳුදා සිට සිකුරාදා දක්වා දූරකථනය ඔස්සේ ද ඔවුන්ගේ සේවා පිළිබඳ තොරතුරු ලබාගත හැක. මේ අතර කොරෝනා විසංගත තත්ත්වය හමුවේ අවලංගු වූ සංචාරවලට අදළව සංචාරකයන් විසින් ගෙවා තිබූ මුදල්වලින් රුපියල් මිලියන 10කට වැඩි ගණනක් නැවත ගෙවීමට ද සමාගම විසින් දැනටමත් පියවර ගෙන තිබේ. නැවතත් ජාත්‍යන්තර දේශසීමා විවෘත වීමත් සමඟ තම සුපුරුදු සේවා සංචාරකයන්ට ලබාදීමට ස්පාර්ක්ලින්ක් ට්‍රැවල්ස් සමාගම සූදානම්ව සිටියි.

ඛයලොග් ක්‍රීඩා අමාත්‍යාංශය සමඟ youth Can දියත් කරයි

ශ්‍රී ලාංකික තාරුණ්‍යයට තම කුසලතා ඔප් නැංවීමට මඟ පෙන්වීම හා සහයෝගය ලබා දීම අරමුණකර ගනිමින්, අන්තර්ජාතික තරුණ දිනයට සමගාමීව ඛයලොග් ආෂ්ආථා සමාගම තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය සමඟින් එක්ව Youth Can වැඩසටහන පසුගිය දා දියත් කළේය.

මෙම වැඩසටහන තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය හා ජාතික තරුණ සේවා සභාව සමඟින් එක්ව, මිනිස් බල හා රැකියා දෙපාර්තමේන්තුවේ, කුඩා ව්‍යවසාය සංවර්ධන අංශයේ සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව, සුවිශේෂී හැකියාවන් සහිත තරුණ තරුණියන්ට ඔවුන්ගේ කැමති ක්ෂේත්‍රවල ඉදිරියට යාමට අවශ්‍ය අවස්ථාව උදකර දෙයි. ඔවුන්ගේ සිහින සැබෑ කර ගැනීමට අවස්ථාව උදෙ වේ.

මෙම තුන් අවුරුදු වැඩසටහන වයස අවුරුදු 14

ත් 35 ත් අතර වයස් සීමාවන් තුළ සිටින තරුණ තරුණියන්ගේ හැකියාවන් සහ දක්ෂතාව ක්‍රීඩා, නව ව්‍යාපාර අදහස්, ශිල්ප කලා, මෝස්තර නිර්මාණකරණය, සූපවේදය සහ කෝපි චිත්‍රපට යන අංශ 6ක් ඔස්සේ තරඟකාරීව එළිදැක්වීම කෙරෙහි අවධානය යොමු කෙරේ. තෝරාගත් අයදුම්කරුවන් සඳහා වැඩමුළුව, අදළ මෙවලම් හා පුහුණුව ලබා දී, දැනුමින් සහ හැකියාවන්ගෙන් බලගැන්වීමත් සිදුවනු ඇත. ජාතික තරුණ සේවා සභාව, මිනිස්බල හා රැකියා දෙපාර්තමේන්තුව, කුඩා ව්‍යවසාය සංවර්ධන අංශය සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් පත්කළ ඒ ඒ ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගෙන් තේරීම් කමිටුව සමන්විත වනු ඇති අතර, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ තේරීම් සිදුවනු ඇත. මේ පිළිබඳව වැඩි විස්තර ලබා ගැනීම් සහ අයදුම්පත් යොමු කිරීම www.youthcan.lk කෘන වෙබ් අඩවිය ඔස්සේ සිදුකළ හැකිය.

සිංගර් වෙතින් අති නවීන ස්මාර්ට් බෝඩ්

සිංගර් විසින් ඩිජිටල් අධ්‍යාපනය සඳහා ස්මාර්ට්බෝඩ් නිෂ්පාදන පෙළක් වෙළඳපොළට හඳුන්වා දෙනු ලැබ ඇත. මාර්ගගත අධ්‍යාපනික කටයුතු සහ ව්‍යාපාරික රැස්වීම්/සම්මන්ත්‍රණ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම මෙහි මූලික අරමුණයි.

සිංගර්, දැනට ලොව නවීනතම LED තිර නිෂ්පාදනය කරන Skyworth සමාගමේ ස්මාර්ට්බෝඩ් නිෂ්පාදන පෙළක් හඳුන්වාදී ඇත. පරිගණකය, රූපවාහිනිය, ප්‍රොජෙක්ටරය සහ වයිට්බෝඩ් සතු සියලු විශේෂාංග වලින් සමන්විත වන ලෙස මෙම ස්මාර්ට්බෝඩ් නිර්මාණය කරඇත.



කාර්යන් කිහිපයක් එකවර කරගත හැකි මෙම ස්මාර්ට්බෝඩ් වර්තමාන ඔන්ලයින් අධ්‍යාපන කටයුතු සඳහා පවතින හොඳම විකල්පය බව එම සමාගම කියයි.

මෙය අඟල් 55, 65 සහ 75 ලෙස ප්‍රමාණයන් තුනකින් සහ ඇන්ඩ්‍රොයිඩ් හෝ වින්ඩෝස් 10 යන මෙහෙයුම් පද්ධති වලින් ලබාගත හැක. මෙම ස්මාර්ට්බෝඩ් නිෂ්පාදන පෙළ මඟින් වයිට්බෝඩ් හි සටහන් ලිවීම, අනෙක් පාර්ශ්වයට නැරඹිය හැකිලෙස වීඩියෝ සහ තිරය පෙන්විය හැකිවීම වැනි ප්‍රතිලාභ රැසක් හිමිකරදෙයි. ගුරුවරුන්ට ඉගැන්වීමට අවශ්‍ය දෑ මෙහි ගබඩා කර තබාගත හැකි බැවින් ඉදිරි ඉගැන්වීම් කටයුතු වලදී ඒවා පහසුවෙන් භාවිත කළ හැකිය.

ඩබ්ලිව් ආයුර්වේද රෝහලෙන් පොත් බෙදාදීමක්

**ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයුර්වේද රෝහලක් වන ඩබ්ලිව් ආයුර්වේද රෝහල සිය ආයතනික සමාජ වගකීම මනාව හඳුනා ගනිමින් පාසල් සහ දහම් පාසල් දරුවන් වෙනුවෙන් පොත් පත් බෙදා දෙමින් සමාජ සත්කාර රැසක් දියත් කළේය. එහි සුවිශේෂ පියවරක් සනිටුහන් කරමින් පසුගියදා මැදිරිගිරිය පෙ/දමෙය්පුර ප්‍රාථමික විද්‍යාලයට, මොරටුව ශ්‍රී ආරියවංශ දහම් පාස

බස් රථ සේවකයන් කොරෝනා පතුරනවා

විද්‍යාසේකර භාණු (පොජපෙ)

(කුලියාපිටිය දිනේෂ් උපේන්ද්‍ර)

කුලියාපිටිය බස් නැවතුමේ සිටි ආරක්ෂක නිලධාරීන් දෙදෙනා නොමැති බවත් කිසි ලෙසකින් බස් රථ සේවකයන් මුහුණු ආවරණ පළඳ සිටිනු දක්නට නොලැබෙන බවත් නාගරික මන්ත්‍රී විද්‍යාසේකර භාණු මහතා (පොජපෙ) චෝදනා කළේය.

කුලියාපිටිය නගර සභාව එහි නගර සභාපති ලක්ෂ්මන් අධිකාරි මහතාගේ ප්‍රධානත්වයෙන් රැස්විය.

කුලියාපිටිය නගරසභාවේ ජූලි මස සැසිවාරයේ කොවිඩ් සම්බන්ධව සාකච්ඡාවට බඳුන් වූ අවස්ථාවේදී භානු මහතා මේ බව කීය.

විද්‍යාසේකර භාණු මහතා (පොජපෙ) -

බස් නැවතුමේ සෑම තැනම බුලත් කෙළ ගහනවා. පිටින් එන අය නෙවෙයි සේරම කරන්නෙ බස් රථ රියැදුරන් හා කොන්දෙස්තරවරුන්. ඒ වගේමයි ඔවුන් මුහුණු ආවරණ නිසි ලෙස පළඳ නැහැ. එහෙම තියාගෙන තමන්ගෙ මාර්ගය කියමින් කෑගහනවා. රෝගය පැතිරවීමට විශාල කාර්යභාරයක් කරනවා ඒ අය. අපි දැක්කා කළින් බස් නැවතුමේ ආරක්ෂක නිලධාරීන් සිටිනවා. අද වෙන කොට ඒ අය නැහැ. අපි දකින විදිහට ආරක්ෂක නිලධාරීන් සිටියයුතුම ස්ථානයක් තමයි බස් නැවතුම.

සභාපති ලක්ෂමන් අදිකාරි මහතා (එ.ජා.ප.) -

හොඳ කාලෝචිත මාතෘකාවක්. අපි හැම මාර්ගයකම බෝඩ් ගහලා තියනවා. ආයෙ අමුතුවෙන් කෑගහන්න අවශ්‍ය නැහැ. පරිසර නීතිය අනුවත් පොලිසියට අත්අඩංගුවට ගන්න පුළුවන්. හරිම අමිහිරි කටයුත්තක් තමයි ඒක. ඒ වගේම බුලත් කෙළ ගැසීම පිළිබඳවත් නීතිරීති සම්පාදනය කරන්න අතුරු ව්‍යවස්ථාවක අවශ්‍යතාව නිසා ඒ පිළිබඳ පළාත් පාලනයෙන් උපදෙස් ගන්නවා. ඒ වගේම නගරයේ සෑම මාර්ගයකම ගාල් කරන වාහන වලින් නැවතුම් කුලියක් ගන්න අපි වැඩපිළිවෙළ සකස්කරනවා. පැය ගාණට ගන්නවාද, නැතහොත් නවතා යන කාලයට අයකරනවාද යන්න තීරණයක් ගතයුතුයි.

විපක්ෂනායක ගිහාන් ජීවන්ත මහතා (පොජපෙ) -

රට විවෘත කිරීමත් එක්ක ජංගම වෙළෙන්දන්ගේ අවශ්‍යතාවයක් නැති වුණත් ඒ අය කඩ ඉස්සරහම නවත්වාගෙන වෙළඳම් කරනවා. මාස ගණනාවක් වහලා තියලා විවෘත කළ වෙලාවෙ බදුගෙවන කඩ හිමියන්ට කියක්හරි හොයා හම්බකරගන්න තියන අවස්ථාවක් අහිමිවෙන්නෙ. අනික් කරුණ කොවිඩ් රෝගීන් හඳුනාගත්තහම රෝගීන් ගෙනයාම බොහෝ ප්‍රමාදයි. ඒ කාලය තුළ තවත් කෙනෙක් රෝගයට ගොදුරු වෙන්න පුලුවන්.

සභාපති ලක්ෂමන් අදිකාරි මහතා (එ.ජා.ප.) -

පාං කරත්ත පොලිමේ නගරයේ තියනවා. මම ආදයම් පරිපාලකයින්ට කිව්වා. ලේකම්තුමත් ඒ පිළිබඳ දැනුම්දෙන්න. අපේ නගරයේ ස්ථිර වෙළෙන්දන්ට ඒක තර්ජනයක් වෙලා තියනවා. නිලධාරින් එයි කියන බලාපොරොත්තුවෙන් කුඨ වෙළෙන්දන් කාර්යාලයීය කාලයෙන් පස්සෙයි දන්නෙ. අනපේක්ෂිත වෙලාවට නිල ඇඳුම් අන්දවලා යවන්න. ඒ වගේම නාරද මාවතේ නිරෝධායන මධ්‍යස්ථානවල නිටපු ජනතාවට එන්න වාහන නොමැතිව අතින් වියදම් කරගෙන තමයි වාහන අරගන දෙතුන් පාරකටයි ඇවිල්ලා තියෙන්නෙ. ඒ ස්ථානවල වැසිකිළි අපිරිසුදුයිලු. ආහාරපාන හොඳනැහැ කියලත් අපිට කිව්වා.

ශර්ලි ජයකොඩි මහතා (එ.ජා.ප.) -

ඇතැම් අය සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලයෙන් පී.සී.ආර්. කරනවා. පස්සෙ ප්‍රතිඵල එනකල් හැමතැනම ඇවිදිනවා. නෙගෙටිව් වුණොත් හොඳයි.

සභාපති ලක්ෂමන් අදිකාරි මහතා (එ.ජා.ප.) -

නාරද මාවතේ කොවිඩ් හැදිල තියනකොට රෝගීන් ගෙදර තියාගෙන බොහෝ දෙනෙක් මුහුණු ආවරණවත් නැතිව ගමන් කළා අපි දැක්කා. තමනුත් පුද්ගලිකව දැනුම්වත් වියයුතුයි ආරක්ෂා වෙන ආකාරය ගැන.

විපක්ෂනායක ගිහාන් ජීවන්ත මහතා (පොජපෙ) -

මේ වනවිටත් කුලියාපිටිය ශික්ෂණ රෝහලේ ස්ථාපිත කරන්න නිටපු මහාචාර්ය ඒකකය මේ වනවිටත් කුරුණෑගල ස්ථාපිත කරන්න කියලා යෝජනා කරලා. අපි මේ වෙනුවෙන් සියලු දෙනා ඉන්නෙ එම ඒකකය කුලියාපිටියේ ස්ථාපිත කළයුතුයි කියලා. විශාල මුදලක් වෛද්‍ය පීඨය සඳහා වියදම් කරලා තියනවා. දැං ඒ මුදල නාස්තියක්ද නිතෙනවා. ඒ මදිවට දැන් ඒ සඳහා වෙනත් පීඨ යෝජනා කරලා. එහෙම අවශ්‍ය නම් ඒ සඳහා ඕන තරම් ඉඩ තියනවා. මේකට අවශ්‍ය නම් පාරට බැහැලා විරෝධය පාන්න ඕනනම් විරෝධය පාමු.

කුඩාබණ්ඩාර තෙන්නකෝන් මහතා (ශ්‍රී ල.නි.ප.) -

දැවැන්ත උද්ඝෝෂණයක් සූදානම් වෙලා තියනවා. අපි පක්ෂ භේදයකින් තොරව සියලුදෙනා ශික්ෂණ රෝහල රැකගන්න පෙරට ආ යුතුයි.

සෝභිත තේනුවර මහතා (පොජපෙ) -

ලජ්ජයි කියන්න, අපේ පක්ෂයෙම මන්ත්‍රී කෙනකුගෙන් අහපුවහම එතුමා කියනවා ඕවා කතා කළාම විනය පරීක්ෂණ එනවලු. හරිදේ කතා කළයුතුයි. අපි ආණ්ඩුපක්ෂය විසින් මේ ශික්ෂණ රෝහල පිළිබඳ කතා කළයුතුයි. පොඩිකාලෙ ඉඳලා අම්ම තාත්ත, ගුරුවරුන්ට, ධර්මයට බයයි. ඒව වියයුතු වුවත් ලොකුවෙලා දේශපාලනඥයින්ටත් බයේ කතානොකර සිටිය යුතුයි කියලා අපි හිතන්නෙ නැහැ. එයා පළාත් සභා ඉල්ලන්නත් බලං ඉන්නෙ. එහෙව් එකේ ඇයි ජනතා ප්‍රශ්න මග හරින්නෙ.

විද්‍යාසේකර භාණු මහතා (පොජපෙ) -

ජයන්ති මාවත ආදී මාවත්වල බෝඩ් ගලවලා තියනවා. ජනතාව අහනවා වෙන නම් දන්න හඳනවාද කියලා.

සභාපති ලක්ෂමන් අදිකාරි මහතා (එ.ජා.ප.) -

ඒවා සියල්ල අලුත්වැඩියා කළයුතු මට්ටමේ නිබුණෙ. ඒ නිසා අලුත්වැඩියා කරලා ඒ නම් තමයි දන්නෙ. මගෙ නම දැමි කියලා බයවෙලාද?

කුලියාපිටිය නගර සභාව

මාවතගමට තවත් පොලිසි දෙකක්



(මාවතගම කාන්චනමාලා බණ්ඩාර)

මාවතගම ප්‍රධාන පොලිස් ස්ථානයට අමතරව මාවතගම පොලිස් බල ප්‍රදේශය තුළ තවත් පොලිසි දෙකක් විවෘත කෙරිණි.

ඉඟුරුවත්ත සහ වෙලගෙදර යන ගම්මානවල පිහිට වූ මෙම පොලිස් ස්ථාන වයඹ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සංජීව ධර්මරත්න, කුරුණෑගල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වයි.බී. ක්‍රිෂාන්ත, පොලිස් අධිකාරී - (i) දියකෙලිනාවල, පොලිස් අධිකාරී - (ii) චන්ද්‍රසේන බණ්ඩාර, සහකාර පොලිස් අධිකාරී - (iii) නිශාන්ත හේරත්, මාවතගම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක නිශාන්ත හෙට්ටිආරච්චි, පොලිස් පරීක්ෂක ගුණසේකර, මාවතගම ප්‍රාදේශීය මහලේකම් එම්.එස්. ජානක යන මහත්වරුන් ඉඟුරුවත්ත නව පොලිස් ස්ථානය විවෘත කළ අවස්ථාවට සහභාගිවූ අයුරු මෙහි දැක්වේ.

මඩාටුගමට මුරුංගා ගම්මානයක්

(අනුරාධපුර-දයාරත්න ඇඹෝගම)

අනුරාධපුර දිස්ත්‍රික්කයේ 16 වැනි සෞභාග්‍ය නිෂ්පාදන ගම්මානය ලෙස මුරුංගා නිෂ්පාදන පොකුරු ගම්මානය කැකිරාව, මඩාටුගම ප්‍රදේශයේදී ඉකුත්ද (07) සමෘද්ධි රාජ්‍ය අමාත්‍ය ශෙහාන් සේමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කෙරුණි.

දේශීය වගාවක් වන මුරුංගා ශාකය වගාකර මුරුංගා කොළ අලෙවි කිරීමේ අරමුණින් මෙම පොකුරු ගම්මානය ආරම්භ වේ. මඩාටුගම, දුණුමඩලාව, කණ්ඩලම, කොටාගල, කිතුල්හිටියාව යනාදී ගම්මාන මීට අයත්ය.

දේශීය බෝගයක් වන මුරුංගා වගාව, එහි කොළ පරිභෝජනය සඳහා අලෙවි කිරීමෙන් විශාල මුදලක් උපයා ගැනීමට හැකිවනවා මෙන්ම එය බෙහෙත් ඖෂධයක් වශයෙන්ද භාවිත කළ හැකිය.

රට පුරා සෞභාග්‍ය නිෂ්පාදන ගම්මාන ඇරඹීමේ සාර්ථකත්වයක් පවතින බවත්, ඒ නිසාම මේ වසර අවසාන වනවිට ඉලක්ක ගත නිෂ්පාදන ගම්මාන 500 අරඹා අවසන් කරන බවත් සමෘද්ධි රාජ්‍ය අමාත්‍ය ශෙහාන් සේමසිංහ මහතා පැවසීය.

එමෙන්ම ඉදිරියේ දී නිෂ්පාදන ගම්මාන සංඛ්‍යාව 1000 දක්වා වැඩිකිරීමේ බලාපොරොත්තුවෙන් පසුවන බව ද රාජ්‍ය අමාත්‍යවරයා මෙහිදී පැවසීය.

පළමු අදියර යටතේ එක් නිෂ්පාදකයකුට අක්කර භාගයක දේශීය මුරුංගා වගා කිරීමට ප්‍රතිපාදන සැපයේ. එහිදී පළමුව ලබාදෙන මුදල රුපියල් 20,000 කි. ඒ අනුව පවුල් 75ක් සඳහා පළමු අදියරේ මුදල් ලබාදීමට නියමිතය.

අක්කර භාගයක මුරුංගා වගාකිරීමෙන් වසරකට ලක්ෂ පහකට ආසන්න මුදලක් උපයාගත හැකිවන අතර ඒ සඳහා වැයවන්නේ ඉතා සුළු මුදලකි. මෙම වගාවන්ගෙන් මුරුංගා කොළ කිලෝවක් රුපියල් 35ක මුදලකට ලබා ගැනීමට දැනටමත් ගැනුම්කරුවෝ ඉදිරිපත්ව සිටිති.

දිස්ත්‍රික් සැලසුම් අධ්‍යක්ෂ සුගත් නයනානන්ද, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ ඩබ්ලිව්.ඒ. වසන්ත, කැකිරාව ප්‍රාදේශීය ලේකම් දමිත් කනකරත්න යන මහත්වරුන් ඇතුළු නිලධාරීහු පිරිසක් ද මෙම අවස්ථාවට එක්වූහ.

අමාත්‍යවරයා මුරුංගා ගම්මානයේ නාම පුවරුව විවෘත කිරීම

සහභාගිවූ ජනතාව

පියදසුන සමාජ සත්කාර වැඩසටහනේදී

පියදසුන සමාජ සත්කාර වැඩසටහන යටතේ ඉකුත් 12 වැනිදා පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රය විෂබීජහරණයට ලක්කෙරිණි.

කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී රාජ්‍ය මුදල් කාරක සභාවේ සභාපති නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමන්ගේ මගපෙන්වීම යටතේ පියදසුන පදනමේ සාමාජිකයෝ විෂබීජහරණ කටයුතු සිදුකළහ.

(අලව්ව අධිකාරි මුදියන්සේ)

අම්බලම් ඇළේ මාළු මැරිලා

මසුන් මිය ගොස් ඇති අයුරු.

(හලාවත ඔගස්ටින් ප්‍රනාන්දු)

දන්කොටුව අම්බලම් ඇළේ ජලය දැඩි ලෙසින් අපවිත්‍රවී ඇති අතර මේ නිසා එම ඇළේ වාසය කරනු ලබන මසුන් විශාල වශයෙන් මිය යමින් සිටින බව ප්‍රදේශවාසීහු පෙන්වා දෙති.

ගතවූ දින දෙක තුනක පමණ කාලයක සිට මෙම තත්ත්වය ඇතිවී ඇති බවත් මෙයට ප්‍රධාන හේතුව මෙම ඇළේ ජලයට කිසියම් විෂ රසායන ද්‍රව්‍යයක් එකතුව තිබීම නිසා බවටත් සැක කෙරේ.

මෙම තත්ත්වය මත මෙම ඇළේ ජලය යොද සිය ගොවිතැන් කටයුතු කර ගැනීමේ බියකට තමන් මුහුණදී සිටින බවත් මේ සම්බන්ධයෙන් සොයා බලා සුදුසු පියවරක් ගන්නා ලෙසත් බලධාරීන්ගෙන් ඉල්ලා සිටිති.

කාබනික පොහොර නිෂ්පාදක කුරුණෑගල හමුවේදී

කාබනික පොහොර නිෂ්පාදකයන්ගේ හමුවට පිරිස පැමිණ සිටි අයුරු.

(බමුණාකොටුව - එච්.එම්.එන්. හේරත්)

කුරුණෑගල දිස්ත්‍රික්කයේ විසිරී සිටින කාබනික පොහොර නිෂ්පාදකයන්ගේ හමුවක් වාරියපොල, කීනගස්පිටිය ග්‍රීන් සෙන්ඩවරි හෝටලයේ දී පශු සම්පත්, ගොවිපළ ප්‍රවර්ධන, කිරි, බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය ඩී.බී. හේරත් මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

මෙම අවස්ථාවට පශු සම්පත්, ගොවිපළ ප්‍රවර්ධන, කිරි, බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය ඩී.බී. හේරත් මහතා ඇතුළු කෘෂි නිලධාරිහු කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ගොවිජන සේවා නිලධාරිහු, සෙසු නිලධාරිහු සහ කාබනික පොහොර නිෂ්පාදකයෝ මෙම අවස්ථාවට එක්ව සිටියහ.

මහව දිසා රෝහල කොවිඩ් රෝහලක් කරයි

(මහව - සජීවා කෝට්ටගොඩ)

කාලීන අවශ්‍යතාව මත මහව දිසාරෝහල කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස ප්‍රතිසංස්කරණ කර දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරිවරයා වෙත බාරදීම ජාත්‍යන්තර සිංහ සමාජයේ 306 B2 සිංහ දිස්ත්‍රික් සිංහාධිපති ඉන්ද්‍ර කේ. රාජපක්ෂ මහතාගේ සුරතින් ඉකුත් 6 වැනිදා සිදුවිය.

මහව දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරිවරයා විසින් කළ ඉල්ලීමකට අනුව යාපහුව කිංඩම් සිංහල සමාජය විසින් මෙම සත්කාරය සඳහා දායකත්වය දක්වා තිබුණි. ඒ සඳහා වැය කළ මුදල රුපියල් ලක්ෂ 20කි.

2020/ 2021 සිංහ වර්ෂයේ වසරේ විශිෂ්ටතම සිංහයා ලෙස යාපහුව සිංහ සමාජයේ සිංහ පුෂ්ප කුමාර දිසානායක මහතා පිදුම් ලැබීම නිමිති කොට ගෙන එය සැමරීම වස් මහව දිසා රෝහල නවීකරණය කර බාරදීම සිදුවිය.

''අවැසි මොහොතේ අවැසි සත්කාරය'' තේමා කර ගනිමින් යාපහුව කිංඩම් සිංහ සමාජය මගින් මහව දිසා රෝහලට නවීන උපකරණ සහිත කොවිඩ් ප්‍රතිකාර සඳහා අවශ්‍ය උපකරණ මෙහිදී පරිත්‍යාග කෙරිණි.

මෙම අවස්ථාවට මහව දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී ජී.ජී.එන්.ඩී. ගමගේ, මහව ප්‍රාදේශීය ලේකම් නදුන් රසික සම්පත් මහතා මෙන්ම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු, ප්‍රජා සංවිධාන, රෝහල් කමිටුව ඇතුළු මහව කිංඩම් සිංහ සමාජයේ සාමාජිකයෝ විශාල පිරිසක්ද සහභාගිව සිටියහ.

කුඩඩෝ 7 ක් සඳගලදී අත්අඩංගුවට

(කුරුණෑගල විශේෂ අතුල පී. බණ්ඩාරනායක)

හෙරොයින් ජාවාරමේ යෙදුන තරුණයන් තිදෙනකු හා හෙරොයින් ළඟ තබාගෙන සිටි තරුණයන් සිව්දෙනකු ඇතුළු සැකකරුවන් හත් දෙනකු හෙරොයින් ග්‍රෑම් 8 යි මිලිග්‍රෑම් 620 ක් සමග ඉකුත්ද (11) සඳගල ප්‍රදේශයේදී අත්අඩංගුවට ගත් බව වීරඹුගෙදර පොලිසිය පවසයි.

හෙරොයින් ජාවාරම් කළ තරුණයන් තිදෙනා ළඟ හෙරොයින් මිලිග්‍රෑම් 3030, 2840 හා 2120 බැගින් තිබුණ බවත් හෙරොයින් මිලදී ගෙන ළඟ තබාගෙන සිටිය සැකකරුවන් සිව්දෙනාගෙන් එක් අයෙකු ළඟ මිලිග්‍රෑම් 180 ක් තිබුණු බවත් අනෙක් තිදෙනා ළඟ හෙරොයින් මිලිග්‍රෑම් 150 බැගින් තිබී සැකකරුවන් සමග අත්අඩංගුවට ගත් බව පොලිසිය කීය.

අත්අඩංගුවට ගත් සැකකරුවන් වීරඹුගෙදර සඳගල ප්‍රදේශයේ පදිංචිකරුවන් වන අවුරුදු 20-21 වයසේ පසුවන තරුණයන් සිවු දෙනෙකු බවත් අනෙක් සැකකරුවන් තිදෙනා අවුරුදු 28 ට අඩු තරුණයන් තිදෙනෙකු බවත් මොවුන් සියලු දෙනාම පාසල් වියේ සිටම හෙරොයින්වලට ඇබ්බැහි වී ඇති බවත් හෙරොයින් ජාවාරම් කළ තිදෙනාගෙන් එක් සැකකරුවෙකුට පෙර වැරදි ඇති බවද පරීක්ෂණවලදී අනාවරණය වූ බව පොලිසිය කීය.

කුරුණෑගල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ක්‍රිෂාන්ත ජයවර්ධන, සහකාර පොලිස් අධිකාරී නිශාන්ත හේරත් මහත්වරුන්ගේ උපදෙස් මත වීරඹුගෙදර පොලිසියේ වැඩබලන ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක දිල්රුක් පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් පොලිස් පරීක්ෂක ද්‍රේමලාල් හා උපපොලිස් පරීක්ෂක සේනාරත්න මහත්වරුන් ඇතුළු පොලිස් නිලධාරිහු පිරිසක් හාණ්ඩ සමග සැකකරුවන් අත්අඩංගුවට ගත්හ.

කප්පම් ගත්තැයි පොලිසියේ දෙදෙනාට ඇප

(රාජාංගණය - නුවන් කුමාර)

පුත්තලම් දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ ආධාරකරුවන් පිරිසකගෙන් කප්පම් මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් රිමාන්ඩ් කර සිටි සැකකාර පොලිස් නිලධාරීන් දෙදෙනා රුපියල් ලක්ෂය බැගින් වූ ශරීර ඇප මත මුදහැරීමට තඹුත්තේගම මහේස්ත්‍රාත් නුවන් කෞෂල්‍ය මහතා නියෝග කළේය.

මෙලෙස ඇප මත මුදු හැරියේ නොච්චියාගම පොලිසියට අනුයුක්තව සේවය කළ මාර්ග රථවාහන සංචාරක රාජකාරියේ නිරත වූ පොලිස් නිලධාරීන් දෙදෙනකුය.

පුත්තලම් ප්‍රදේශයේ පදිංචි ධීවරයන් දස දෙනකු එරාවුර් ප්‍රදේශයේ සිට පුත්තලමට මාළු ගෙන එන අතරවාරයේ මාර්ග සංචාරයේ නිරතව සිටි නිලධාරීන් දෙදෙනා නොච්චියාගමදී ධීවරයන් ගමන් ගත් ලොරි රථය පරීක්ෂාකර ඇති බවත්, එහිදී ගමන් ගත් දස දෙනාගෙන් තිදෙනකුට සංචරණ සීමා බලපත්‍ර නොමැති බවටත් හඳුනාගෙන ඇති බව පොලිසිය අධිකරණයට පැවසීය.

සංචරණ නීති උල්ලංඝනය කළ තිදෙනා නිදහස් කළ නොහැකි බවත් ඔවුන් තිදෙනාට නීති මඟින් කටයුතු නොකිරීමට රුපියල් දෙදහසක මුදලක් පොලිස් නිලධාරීන් ඉල්ලා සිටි බවත් ලොරියේ සිටි එක් ධීවරයකුගෙන් රුපියල් 200 බැගින් එකතු කර පොලිස් නිලධාරීන්ට ලබාදුන් බවටත් පවසා ලොරි රථයේ රියැදුරු පැමිණිලි කර ඇති බව පොලිසිය පැවසීය.

අදළ මුදල ලබාදීමෙන් පසු ඔවුන් නිදහස් කර ඇති බවත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට සිද්ධිය පවසා මන්ත්‍රීවරයා විසින් අනුරාධපුර නියෝජ්‍ය පොලිස්පතිවරයා දැනුවත් කර ඇති අතර ඒ අනුව සිදුකළ විමර්ශනයෙන් පසුව සැකකාර පොලිස් නිලධාරීන් දෙදෙනාගේ වැඩ තහනම් කළ බවත් පොලිසිය අධිකරණයට කියා සිටියේය.

තම සේවා දායකයන් කිසි විටක මුදල් ඉල්ලා නොසිටි බවත්, මෙය නීතා මතා ගොතන ලද චෝදනාවක් බවත්, එබැවින් සැකකරුවන් දෙදෙනා සුදුසු ඇප මත මුදහරින ලෙස සැකකරුවන් වෙනුවෙන් පෙනීසිටි නීතිඥ ශ්‍රී ලාල් මහේෂ් තලංගල්ල මහතා අධිකරණයෙන් ඉල්ලා සිටියේය.

නොච්චියාගම පොලිසිය සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කළේය.

සණස ව්‍යාපාරය ජාත්‍යන්තර සමූපකාර දිනය සමරයි

ලොව පුරා ව්‍යාප්තව පවතින ප්‍රමුඛතම සමාජ සුබසාධන ව්‍යාපාරයක් වන සමූපකාර ව්‍යාපාරය සිය 99 වැනි සංවත්සරය පසුගියදා උත්සවාකාරයෙන් සැමරූ අතර ඊට සමගාමීව සණස සමිති, සණස ලයිෆ් ඉන්ෂුවරන්ස්, සණස ජෙනරල් ඉන්ෂුවරන්ස්, සණස සංවර්ධන බැංකුව ඇතුළු මෙරට සණස සමූහ ව්‍යාපාරයට අයත් ආයතනද, ජාත්‍යන්තර සමූපකාර දිනය අභිමානවත් ලෙස සැමරිය.

'එක්වී මනාව යළි ගොඩ නැගෙමු' යන තේමාව ඔස්සේ මෙවර ජාත්‍යන්තර සමූපකාර දිනය පැවැත්විණි. රටවල් 112ක් ජාත්‍යන්තර සමූපකාර සන්ධානයේ සාමාජිකත්වය ලබා ඇත. කාර්මික විප්ලවය සමග ඇති වුණ සාමාජීය සහ ආර්ථික වෙනස්කම් සමග පීඩනයට පත් වුණ ගොවියා සහ කම්කරුවා නගා සිටුවීමේ අරමුණින් සමූපකාර ව්‍යාපාරය මූලිකව අරඹන ලදී. 1923දී ප්‍රථම වරට ජාත්‍යන්තර සමූපකාර දිනය සැමරීමට තීරණය කරන ලදී. ඒ අනුව සෑම වසරකම ජූලි මස පළමු



වැනි සෙනසුරාදා ජාත්‍යන්තර සමූපකාර දිනය ලෙස නම් විය.

ආචාර්ය පී.ඒ. කිරිවන්දෙණිය මහතාගේ මූලිකත්වයෙන් ඇරැඹුණු සණස ව්‍යාපාරය සාමාජිකයන් ලක්ෂ 30කට ආසන්න ගණනකින් සමන්විත වන අතර සණස ප්‍රාථමික, දිස්ත්‍රික්, ජාතික සහ ජාත්‍යන්තර ලෙස මට්ටම් කිහිපයකින් ක්‍රියාත්මක වේ. එහි ප්‍රාථමික මට්ටමේ මූලික කාර්යයන් වන්නේ සාමාජිකයන්ගේ සකසුරුවම් බව වර්ධනය කිරීම, ආර්ථික වර්ධනයට මූල්‍ය සම්පත් සැපයීම, සාමාජිකයන්ට අධ්‍යාපනය සැපයීම ආදියයි. "සමූපකාර ව්‍යාපාරය නිර්මාණය වූණේ ලෝකයේ අර්බුද පවතින අවස්ථාවක. එනිසා ඉතාම අර්බුදකාරී අවස්ථාවල ප්‍රමුඛ බලපෑමක් කරන්න සමත් ශක්තිමත් ව්‍යාපාරයක් ලෙස සමූපකාර ව්‍යාපාරය සෑම විටම ක්‍රියාත්මක වුණා. වර්තමන් කොරෝනා අර්බුදය ඇති කළ ගැටලු විසඳ ගෙන ජන ජීවිත ජය ගන්න අවශ්‍ය මඟ පෙන්වීම සිදු කරන්න අප සූදානම්." සණස නිර්මාතෘ ආචාර්ය පී.ඒ. කිරිවන්දෙණිය මහතා පැවසීය.

සංචිත අර්බුදයට පිළියමක්

ඇමෙරිකානු ඩොලර් බිලියනයක විදේශ ණය නැවත ගෙවීමත් සමඟ ආණ්ඩුව තුළත් රට තුළත් ඒ සම්බන්ධයෙන් කතාබහක් ඇති විය. එම ණය මුදල ගෙවීමට නියමිතව තිබුණේ ජූලි 27 වැනිදා වන අතර ඊට දිනකට පෙර එය ගෙවා දැමීමට ආණ්ඩුවට හැකියාව ලැබිණි. ඒ අනුව ණය මඟ නොහැර නියමිත දිනට ගෙවීමේ මෙරට වාර්තාව ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යෑමට මේ ආණ්ඩුව ද සමත් විය. මේත් සමඟ රටේ විදේශ මූල්‍යයේ තිබෙන අවදානම් තත්ත්වය විසඳූ ගනු ඇතැයි විශ්වාසය ද ඇති වී තිබේ. විදේශ සංචිත කඩිනමින් නැවත පුරවා ගනිමින් දීර්ඝකාලීනව විදෙස් සංචිත ශක්තිමත් කරගන්නේ කෙසේ ද?

සංචිත නැවත පුරවා ගන්නේ කෙසේ ද?

ඇමෙරිකානු ඩොලර් බිලියන තුනකටත් අඩු අගයකට පහත වැටී තිබෙන විදේශ සංචිත ප්‍රමාණය මේ වසර අවසන් වන විටදී සෑහීමකට පත්වීමට හැකි අගයකට ගෙන ඒමට හැකියාව ලැබෙනු ඇතැයි ආණ්ඩුව විශ්වාස කරයි. මිත්‍ර රටවල් සමඟ මුදල් හුවමාරු (ස්වැප්)වලට එළැඹීමටත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රධාන සහ මේ වසරේ ඉදිරි මාසවලදී සේවාවලින් ඉහළ ආදායම් ලබාගත හැකි වනු ඇති බවටත් ආණ්ඩුව බලාපොරොත්තු තබා ඇත.

කෙසේ නමුත් විදේශ සංචිතවල තිබෙන මෙම භයානක සහ අස්ථිර ස්වභාවය මේ වසර අවසානයේදීත් පවතිනු ඇති බවත් ලබන වසරේ දී මෙම තත්ත්වය තවදුරටත් උග්‍ර වනු ඇති බවටත් විශ්ලේෂකයෝ/ විශේෂඥයෝ පෙන්වාදෙති. ලබන වසරේ දී තවදුරටත් විදේශ ණය ගෙවීම් කිරීමට තිබෙන බැවින් සහ ආනයන වියදම් වැඩිවීමත් යන කරුණු මුල් කරගනිමින් මේ තත්ත්වය උග්‍ර වනු ඇතැයි ඔවුහු පෙන්වාදෙති.

මුදල් හුවමාරු (ස්වැප්)

ඉන්දියාව සහ බංග්ලාදේශය සමඟ මුදල් හුවමාරු පහසුකම් තුළින් සහ චීනයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 150ක යුවාන් ණය පහසුකම් ලැබීමට නියමිත අතර මේවා මඟින් විදේශ සංචිත ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් (එස්.ඩී.ආර්./ ජාත්‍යන්තර සංචිත වත්කම්) යටතේ මෙරටට ලැබීමට නියමිත ඇමෙරිකානු ඩොලර් මිලියන 780ක මුදල ද විදෙස් සංචිත ඉහළ යෑමට උපකාරී වනු ඇතැයි අපේක්ෂිත ය.

මුදල් හුවමාරු යනු සංචිත ඉහළ දමන තාවකාලික පහසුකම් වන අතර එම මුදල් නැවත ගෙවිය යුතු වේ. චීනයෙන් ලැබෙන ණය පහසුකම චීනයෙන් ආනයනය කිරීමට උපකාරී වනු ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලැබෙන මුදල ප්‍රදානයකි.

ඉන්දියාවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක් ද බංග්ලාදේශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 250ක් ද වශයෙන් මුදල් හුවමාරු පහසුකම් ලැබීමට නියමිත ය. මේවා කෙටිකාලීන පහසුකම් වන අතර අවිනිශ්චිත තත්ත්වයක තිබේ. චීනයෙන් ලැබෙන යුවාන් ණය පහසුකම ප්‍රයෝජනවත් වන්නේ චීනයෙන් භාණ්ඩ මිලදී ගැනීමට පමණි.

ප්‍රයෝජනවත් සහන

මුදල් හුවමාරු, ණය සහ අනෙකුත් මූල්‍ය පහසුකම් සියල්ල සහන වන නමුත් ඒවා විසඳුම් නොවේ. කෙසේ නමුත් මේවා දැනට විදේශ මූල්‍යයේ තිබෙන අර්බුදකාරී තත්ත්වය විසඳගැනීමට ප්‍රයෝජනවත් වේ. කෙසේ නමුත් මේවා ප්‍රශ්නයට විසඳුම් නොවේ.

විසඳුම්

දැඩි ආනයන සීමා පනවමින් වෙළෙඳ හිඟය අඩු කරගැනීම අත්‍යවශ්‍ය වේ. වෙළෙඳ භාණ්ඩ අපනයන ආදායම වැඩි කිරීමත් සේවාවලින් ආදායම් වැඩි කරගැනීමත් රටේ විදේශ මූල්‍යයේ තිබෙන අර්බුදකාරී තත්ත්වය පාලනය කරගැනීමට උපකාරී වේ. දැනට අපේක්ෂිත බොහෝ අරමුදල්/ පහසුකම් කෙටිකාලීන සහන පියවර ය.

සරල සත්‍යය සම් රට විදේශ විනිමය උපයාගත්තේ ආනයන මත වියදම් කිරීමෙන් පසු ඉතිරි වන මුදලිනි. කෙටියෙන්ම සඳහන් කරන්නේ නම් වෙළෙඳ හිඟය අඩු කරගැනීමට පියවර ගත යුතු ය. හැකියාවක් ඇති නම් 2019 වසරේ දී මෙන් ගෙවුම් ශේෂයේ අතිරික්තයක් උපයාගත යුතු ය. එම අවස්ථාවේදී වෙළෙඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන අටක් වූ අතර සේවාවලින් සහ ප්‍රාග්ධන ගලාඒම්වලින් එය පියවා ගැනීමට හැකියාව ලැබිණි.

ඉකුත් වසරේ දැඩි ආනයන සීමා පනවමින් ආනයන අඩු කරගැනීමටත් වෙළෙඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන හයක් දක්වා අඩු වුවත් ගෙවුම් ශේෂයේ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන 2.3ක් විය.

ඉහළ ආදායම්

මේ වසරේ සිවුවැනි කාර්තුවේ දී ප්‍රේෂණ, තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවාවලින් සහ සංචාරක කර්මාන්තයෙන් ලැබෙන ආදායම් ඉහළ යනු ඇතැයි අපේක්ෂිත ය. එමඟින් සංචිත ප්‍රමාණවත් ප්‍රමාණයට වැඩි වනු ඇතැයි අපේක්ෂිත ය. ඉහළ වටිනාකමකින් සමන්විත මැණික් සොයාගැනීම තවත් වාසියකි. ඒවා ඇමෙරිකානු ඩොලර් මිලියන 100ත් 200ත් අතර වනු ඇතැයි ගණන් බලා ඇත. මැණික්, ඒවායේ අයිතිකරුවන්ට වාසියක් වුවද රටේ විදේශ සංචිතවලට නම් එතරම් වටිනාකමක් නැත. අප සිටින්නේ දැඩි අර්බුදයක ය. එබැවින් මහ මුහුදකට

ආචාර්ය
නිමල් සඳරත්න PhD

වතුරු බිංදු කිහිපයක් දමන්නාක් මෙන් මේ මැණික් අපේ දුර්වල සංචිතවලට එක් කළ හැකි ය. කෙසේ නමුත් මේ මැණික්වල වටිනාකම අඩු බවද මේ වනවිට දැනගන්නට ලැබේ. ඉහත කී මේ ගලාඒම් මඟින් මේ වසර අග වනවිට විදෙස් සංචිත ඉහළ යනු ඇතැයි අපේක්ෂිත ය.

අතීත අත්දැකීම්

රටේ වෙළෙඳ ගිණුමේ අතිරික්තයක් පැවැතියේ වසර හතරක් හෝ පහක් පමණි. ව්‍යුහගත ගැටලු තිබෙන බව එයින් ඉතා හොඳින් පැහැදිලි ය. අවසාන වරට වෙළෙඳ හිඟයේ අතිරික්තයක් වාර්තා වූයේ මීට වසර 44කට පෙර එනම් 1977 වසරේ දී ය. එය ද ඉතා කුඩා අගයකි. එම අතිරික්තය ළඟා කරගත්තේ දැඩි ආනයන සීමා පනවමින් සහ අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල හිඟ පවතින තත්ත්වයක් තුළ ය. එම සමයේ දී ජීවනෝපායවලට දැඩි දුෂ්කරතා ඵල්ලා විය. එමෙන්ම ආර්ථික වර්ධන වේගය ද අඩු අගයක පැවතුණි.

මූලධර්ම හේතු

දිගින් දිගටම වෙළෙඳ හිඟ පැවැතීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ අපනයන වැඩි කිරීමට ඇති අසමත්කම ය. කෙසේ නමුත් අපනයන වැඩි නොවුණ ද ආනයන දිගින් දිගටම සැලකිය යුතු අගයකින් වැඩි විය. බොහෝ වසරවලදී ආනයන වියදම අපනයන ආදායම මෙන් දෙගුණයක් විය. ඉකුත් වසරේ දී (2020) වෙළෙඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන හයක අගයකට ගෙන ඒමට සමත් විය. කෙසේ නමුත් එම වසරේ ආනයන වියදම ඇමෙරිකානු ඩොලර් බිලියන 16ක් වූ අතර අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 10ක් විය.

2021 වෙළෙඳ ශේෂය මේ වසරේ වෙළෙඳ ශේෂය කුමක් වනු ඇති ද ?

ඉකුත් වසරේ දී වෙළෙඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන හයක් වූ අතර මේ වසරේ දී වෙළෙඳ හිඟය දෙගුණ වනු ඇත. මේ වසරේ මුල් අර්ධයේ දී අපනයන ආදායම ඉතා හොඳ තත්ත්වයක් පෙන්නුම් කළ ද දැඩි ආනයන සීමා පනවා තිබුණ ද ආනයන වැඩි වීම හේතුවෙන් මේ වසරේ දී වෙළෙඳ හිඟය පසුගිය වරට සාපේක්ෂව දෙගුණ වනු ඇත.

අපනයන

මේ වසරේ මුල් අර්ධයේ අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 5.6ක් වූ බව අපනයන සංවර්ධන මණ්ඩලය ඉකුත් ද සඳහන් කළේය. වෙළෙඳ භාණ්ඩ අපනයන ඇමෙරිකානු ඩොලර් බිලියන 12ක් වනු ඇතැයි එම මණ්ඩලය ඇස්තමේන්තු කර ඇත. එය එසේ වුවත් ඉහළ ආනයන වියදම හේතුවෙන් වෙළෙඳ හිඟය තවදුරටත් පුළුල් වනු ඇත.

මේ වසරේ මුල් අර්ධයේ දී වෙළෙඳ භාණ්ඩ අපනයන ඇමෙරිකානු ඩොලර් බිලියන 5.56ක් ලෙස දැක්වුණු අතර එය පසුගිය වසර හා සැසඳීමේදී සියයට 27.5ක වර්ධනය කි. පසුගිය වසරේ මුල් මාස හයේ දී වෙළෙඳ භාණ්ඩ අපනයන ඇමෙරිකානු ඩොලර් බිලියන 4.36ක් විය. කොවිඩ්-19 වසංගතය තෙවැනි රැල්ල මධ්‍යයේ වුවද එම අපනයන ආදායම ලබාගත හැකි වූයේ දැඩි සීමා සහ බාධක මධ්‍යයේ ය. ජාත්‍යන්තර ඉල්ලුම ක්‍රමයෙන් වැඩි වීමත් සමඟ නිෂ්පාදිත අපනයන ද ක්‍රමයෙන් වැඩි විය.

ඉල්ලුම

ආනයන මත දැඩි සීමා පනවා තිබුණ ද ආනයන වියදම් වැඩි වීම හේතුවෙන් මේ වසරේ ගෙවුම් ශේෂයට අහිතකර ලෙස බලපෑම් ඵල්ල වනු ඇත. ආහාර, අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සහ අමුද්‍රව්‍ය සහ කෘෂිකාර්මික අපනයන ඇඳු වීම යනාදිය හේතුවෙන් මේ වසරේ දෙවැනි අර්ධයේ දී වෙළෙඳ හිඟය තවදුරටත් පුළුල් වනු ඇත. පොහොර ආනයනය මත සීමා පැනවීම හේතුවෙන් මීට ප්‍රතිචාර දක්වනු ඇති අතර විමඟින් වෙළෙඳ ශේෂයේ තත්ත්වය උග්‍ර වනු ඇත. ඊට ප්‍රධානම හේතුව ආහාර නිෂ්පාදන අඩු වීම යි.

ගෙවුම් ශේෂය

වෙළෙඳ ශේෂය පුළුල් වීම යන තත්ත්වය මධ්‍යයේ සේවා අංශවලින් ලැබෙන ආදායම් ඉතා වැදගත් වේ. පසුගිය වසරේ දී එය ඉතා වැදගත් විය. කෙසේ නමුත් මේ මොහොතේ තිබෙන වැදගත්ම ප්‍රශ්නය වන්නේ සේවක ප්‍රේෂණ, තොරතුරු සන්නිවේදන සහ තාක්ෂණ ක්ෂේත්‍රයෙන් ලැබෙන ආදායම් සහ ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් වෙළෙඳ හිඟය ඉක්මවා ගොස් ගෙවුම් ශේෂයේ අතිරික්තයක් නිර්මාණය කරනු ඇත්ද යන්න යි.

සාරාංශය

ඉකුත් මාසයේ දී විදේශ සංචිත ඇමෙරිකානු ඩොලර් බිලියන තුනටත් අඩු අගයකට අඩු විය. මෙය ඉතාමත් අඩු අගයක් වන මෙය භයානක තත්ත්වයකි. මේ වසරේ ආනයන අවශ්‍යතා ද ඉතා ඉහළ බැවින් පවතින්නේ අවදානම් සහගත තත්ත්වයකි. මුදල් හුවමාරු සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලැබෙන ප්‍රදානය මේ කඩිනම් දුෂ්කරතාවලින් රටට තාවකාලික සහන සහ පිළියම් සපයනු ඇත. මේවා මේ අවස්ථාවේ අවශ්‍ය සහන/පහසුකම් වන අතර කෙසේ නමුත් මේවා විසඳුම් නොවේ. විදේශ මූල්‍යයේ තිබෙන ව්‍යුහගත අර්බුදවලට විසඳුම් අවශ්‍ය වේ.

නිගමනය

රටේ විදේශ මූල්‍යයේ තිබෙන ප්‍රශ්නයට තිබෙන ඇති එකම ප්‍රායෝගික විසඳුම වන්නේ අපනයන වැඩි කරමින් වෙළෙඳ හිඟය අඩු කිරීමත් සේවාවලින් ආදායම් උපයමින් ගෙවුම් ශේෂයේ අතිරික්තයක් ඇති කරගැනීමත් ය.

සන්ඩේ ටයිම්ස් පුවත්පතේ පළවූ ලිපියේ පරිවර්තනය

හර්ෂණ තුෂාර සිල්වා

හම්බන්තොට වරායේ තොග නාණ්ඩ හැසිරවීම් ඉහළට



හම්බන්තොට ජාත්‍යන්තර වරාය (HIP) විසින් මුද හරින ලද ඉහළතම තොග ප්‍රමාණය වාර්තා කරමින් මැතකදී ඉන්සි සිමෙන්ති සඳහා ගෙන ආ පිප්සම් තොග දිනකට මෙට්‍රික් ටොන් 24,000 බැගින් හසුරුවන ලදී.

ඉන්සි සිමෙන්ති සමාගමේ ප්‍රසම්පාදන හා සැපයුම්හි අධ්‍යක්ෂ තුසිත් ගුණවර්ණසූරිය මහතා පවසන්නේ මෙය ශ්‍රී ලංකාවේ වරායකට වේගය සහ කාර්යක්ෂමතාව අනුව හිමිවූ සුවිශේෂී ජයග්‍රහණයක් බවයි. ඒ මහතා මෙසේද පැවසීය. "ශ්‍රී ලංකාවේ අංක 1 සිමෙන්ති නිෂ්පාදන සමාගම ලෙස අප විශාල යාත්‍රාවලින් අමුද්‍රව්‍ය ආනයනය කරනවා. එම යාත්‍රා රටට පැමිණි පසු හම්බන්තොට ජාත්‍යන්තර වරාය සමූහය (HIPG) සහ හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝර්ට් සර්විසස් සමාගම (HIPS) , වේගයෙන් තොග මුදහැරීමේ කටයුතු සිදු කරනවා. වරාය මෙහෙයුම් වේගවත් වන තරමට අපට පමණක් නොව රටටත් වැඩි වාසියක් ලැබෙනු ඇත. මහද්‍වයත් යාත්‍රාව වරායේ රැඳී සිටින දින 2 1/2 සඳහා අප, රඳවා තබා ගැනීමේ හා ප්‍රමාද ගාස්තු ලෙස ඇමෙරිකානු ඩොලර් 75,000කට ආසන්න මුදලක් ගෙවයි. එබැවින්, අප මෙවර සිදු කළ ආකාරයට මෙන් දින දෙකහමාරකට කලින් මුදහැරීමේ කටයුතු නිමා කළ නිසා, සැලකිය යුතු ලෙස පිරිවැය ඉතිරි කර ගැනීමට අපට හැකි වුණා. එය අපගේ සමාගමට වාසියක් වන අතර රට සඳහාද විදේශ විනිමය සැලකිය යුතු ලෙස ඉතිරි කිරීමකි".

HCL ශ්‍රී ලංකා මධ්‍යස්ථානයට සිනමන් Life තෝරාගනී



කොළඹ නගරයේ අභිනවින පහසුකම් වලින් සමන්විත නවතම කාර්යාලයීය කුලුන වන Cinnamon Life ව්‍යාපෘති 'The Offices' තම ශ්‍රී ලංකා මධ්‍යස්ථානය ලෙස තෝරාගැනීමට, ලොව ප්‍රමුඛතම තාක්ෂණ සමාගමක් වන HCL Technologies තීරණය කර තිබේ.

ඒ අනුව එම සමාගම 'The Offices' හි කාර්යාල අවකාශ අතරින් සියයට 80ක ප්‍රමාණයක් භාවිත කරනු ඇත. ජාත්‍යන්තර සමාගමක් මේ ආකාරයක මෙරට A ශ්‍රේණියේ කාර්යාලයීය කුලුනක කාර්යාල අතරින් බහුතරය වෙන්කරවා ගත් ප්‍රථම අවස්ථාව මෙයයි.

මේ සඳහා වන ගිවිසුමට HCL Technologies සහ පෝන් කිල්ස් හෝල්ඩින්ස් (JKH) යන සමාගම් වල නියෝජිතයන් විසින් පසුගියදා අත්සන් තබන ලදී. මේ ඔස්සේ තවත් දේශීය හා ජාත්‍යන්තර සමාගම් රැසක් මෙම ව්‍යාපෘතිය වෙත ආකර්ෂණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එමෙන්ම ජාත්‍යන්තර සමාගමක් මේ ආකාරයට මෙරට තුළ තම ව්‍යාපාර කටයුතු පුළුල් කිරීමට සැලසුම් කිරීම, දකුණු ආසියාවේ ව්‍යාපාරික කේන්ද්‍රයක් බවට පත්වීමට කොළඹ නගරය සතු හැකියාව පිළිබිඳ මනා සාක්ෂියක් ලෙසද සැලකිය හැකි ය.

කොළඹ නගරයේ සුවිශේෂී ස්ථානයක පිහිටා තිබීම, නවීනතම පහසුකම් වලින් සමන්විතවීම සහ උසස් ප්‍රමිතිය සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමුකරමින් ඉදිකර තිබීම යනාදිය, Cinnamon Life ව්‍යාපෘතියේ The Offices තෝරාගැනීමට HCL සමාගම යොමුකරවූ ප්‍රධානතම සාධක ලෙස සැලකේ.

එමිරේට්ස් මඟින්ට නොමිලේ Expo නරඹන්න අවස්ථාවක්

කළාපයේ දැවැන්තම වෙළෙඳ ප්‍රදර්ශනයක් වන 2020 ඩුබායි Expo වෙළෙඳ ප්‍රදර්ශනයේ ප්‍රමුඛතම පාර්ශ්වකරුවා සහ නිල ගුවන් සමාගම ලෙස එමිරේට්ස් මෙම ප්‍රදර්ශනය නැරඹීමට සමාගමේ ගුවන් මඟින්ට සුවිශේෂී ප්‍රතිලාභයක් ඉදිරිපත් කර තිබේ.

මේ අනුව, මෙම වැඩසටහන පැවැත්වෙන 2021 ඔක්තෝම්බර් 01 වැනිදා සිට 2022 මාර්තු 31 වන දක්වා කාල සීමාව තුළදී ඕනෑම අවස්ථාවක ඩුබායි වෙත පැමිණෙන සහ ඩුබායි හරහා ගමන් කරන එමිරේට්ස් මඟින්ට ඔවුන්ගේ සියලුම ගුවන් ටිකට්පත් වලට නොමිලේ Emirates Expo Day Pass එකක් ලබාදීමට ගුවන් සමාගම කටයුතු කර ඇතැයි එම සමාගම සඳහන් කරයි.

එමිරේට්ස් සඳහන් කරන්නේ 2021 ඔක්තෝම්බර් 01 වැනිදා සිට 2022 මාර්තු 31 වැනිදා දක්වා ඩුබායි වෙත හෝ ඩුබායි හරහා ගමන් කරන සියලුම එමිරේට්ස් ගුවන් මඟින්ගේ ටිකට් පත් සඳහා මෙම විශේෂ දීමනාව ලබාදෙන බවයි. මීට අමතරව, චක්සත් අරාබි එමීර් රාජ්‍යයට පිටත සිට පැමිණෙන එක් දිගාවකට පමණක් ගමන් කරන ගුවන් මඟින් ඩුබායි වෙත පැමිණීමේදී හෝ ඩුබායි හි අවම රැඳී සිටීමේ කාලය සම්පූර්ණ කරමින් වෙනත් ගමනාන්ත වෙත ගමන් කිරීමේදී ත්‍යාගයක් ලෙස Expo Day Pass එකක් ප්‍රදානය කිරීමටද එමිරේට්ස් කටයුතු කර තිබේ.

ස්පාර්ක්ලින්ක් හතළිස් දෙවසරක විශිෂ්ටත්වය සමරයි

දශක හතරකට අධික කාලයක් පුරා මෙරට සංචාරක ක්ෂේත්‍රය තුළ විශිෂ්ට සහ කැපිපෙනෙන කාර්යභාරයක් සිදුකළ ස්පාර්ක්ලින්ක් ට්‍රැවල්ස් (Sparklink Travels) ආයතනය පසුගියදා සිය 42වැනි සංවත්සරය සමරනු ලැබිය. වර්ෂ 1979දී නිහාල් පෙරේරා මහතාගේ මූලිකත්වයෙන් පවුලේ ව්‍යාපාරයක් ලෙස ආරම්භ වූ Sparklink Travels අද දක්වාම ඒකාබද්ධතාව, සක්‍රියතා සහ ගුවන් සවාරි, නෞකා සවාරි සහ සංචාරවල විශිෂ්ටත්වය තුළින් සුවිශේෂී සේවාවක් සංචාරකයන්ට ලබාදීමට කැපවී සිටියි. එම සුවිශේෂත්වය හේතුවෙන් ප්‍රතිඵල සහතිකය ලත් සංචාර ආයතනයක් බවට පත්වීමට ද එම ආයතනයට හැකිවී තිබේ.

මෙරට සංචාරක කර්මාන්තය තුළ සිටින ප්‍රවීණ චරිතයක් වන නිහාල් පෙරේරා මහතා ලංකා සංචාරක මණ්ඩලයේ සංවර්ධන හා ප්‍රචාරණ අංශයේ අධ්‍යක්ෂවරයා ලෙස ද සේවය කළේය. ඔහු මේ වනවිට ප්‍රකී පෙරේරා සමඟ එක්ව ඕස්ට්‍රේලියාවේ සිට ස්පාර්ක්ලින්ක් ට්‍රැවල්ස් Australia ආයතනය ද මෙහෙයවනු ලබයි. ස්පාර්ක්ලින්ක් ට්‍රැවල්ස් සතු පළපුරුදු සහ වෘත්තීය කාර්යමණ්ඩලය වර්තමානයේදී සිය සංචාරක සේවා, කොල්ලුපිටිය, ලිබර්ටි ආර්කේඩ්හි පිහිටි සිය කාර්යාලයේ මෙන්ම දුරස්ථ වශයෙන් ද ක්‍රියාත්මක වෙමින් ලබාදෙන අතර, සඳුදා සිට සිකුරාදා දක්වා දූරකථනය ඔස්සේ ද ඔවුන්ගේ සේවා පිළිබඳ තොරතුරු ලබාගත හැක. මේ අතර කොරෝනා විසංගත තත්ත්වය හමුවේ අවලංගු වූ සංචාරවලට අදළව සංචාරකයන් විසින් ගෙවා තිබූ මුදල්වලින් රුපියල් මිලියන 10කට වැඩි ගණනක් නැවත ගෙවීමට ද සමාගම විසින් දැනටමත් පියවර ගෙන තිබේ. නැවතත් ජාත්‍යන්තර දේශසීමා විවෘත වීමත් සමඟ තම සුපුරුදු සේවා සංචාරකයන්ට ලබාදීමට ස්පාර්ක්ලින්ක් ට්‍රැවල්ස් සමාගම සූදානම්ව සිටියි.

ඛයලොග් ක්‍රීඩා අමාත්‍යාංශය සමඟ youth Can දියත් කරයි

ශ්‍රී ලාංකික තාරුණ්‍යයට තම කුසලතා ඔප් නැංවීමට මඟ පෙන්වීම හා සහයෝගය ලබා දීම අරමුණකර ගනිමින්, අන්තර්ජාතික තරුණ දිනයට සමගාමීව ඛයලොග් ආෂ්ආථා සමාගම තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය සමඟින් එක්ව Youth Can වැඩසටහන පසුගිය දා දියත් කළේය.

මෙම වැඩසටහන තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය හා ජාතික තරුණ සේවා සභාව සමඟින් එක්ව, මිනිස් බල හා රැකියා දෙපාර්තමේන්තුවේ, කුඩා ව්‍යවසාය සංවර්ධන අංශයේ සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව, සුවිශේෂී හැකියාවන් සහිත තරුණ තරුණියන්ට ඔවුන්ගේ කැමති ක්ෂේත්‍රවල ඉදිරියට යාමට අවශ්‍ය අවස්ථාව උදකර දෙයි. ඔවුන්ගේ සිහින සැබෑ කර ගැනීමට අවස්ථාව උදෙ වේ.

මෙම තුන් අවුරුදු වැඩසටහන වයස අවුරුදු 14

ත් 35 ත් අතර වයස් සීමාවන් තුළ සිටින තරුණ තරුණියන්ගේ හැකියාවන් සහ දක්ෂතාව ක්‍රීඩා, නව ව්‍යාපාර අදහස්, ශිල්ප කලා, මෝස්තර නිර්මාණකරණය, සූපවේදය සහ කෝපි චිත්‍රපට යන අංශ 6ක් ඔස්සේ තරඟකාරීව එළිදැක්වීම කෙරෙහි අවධානය යොමු කෙරේ. තෝරාගත් අයදුම්කරුවන් සඳහා වැඩමුළුව, අදළ මෙවලම් හා පුහුණුව ලබා දී, දැනුමින් සහ හැකියාවන්ගෙන් බලගැන්වීමත් සිදුවනු ඇත. ජාතික තරුණ සේවා සභාව, මිනිස්බල හා රැකියා දෙපාර්තමේන්තුව, කුඩා ව්‍යවසාය සංවර්ධන අංශය සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් පත්කළ ඒ ඒ ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගෙන් තේරීම් කමිටුව සමන්විත වනු ඇති අතර, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ තේරීම් සිදුවනු ඇත. මේ පිළිබඳව වැඩි විස්තර ලබා ගැනීම් සහ අයදුම්පත් යොමු කිරීම www.youthcan.lk කෘන වෙබ් අඩවිය ඔස්සේ සිදුකළ හැකිය.

සිංගර් වෙතින් අති නවීන ස්මාර්ට් බෝඩ්

සිංගර් විසින් ඩිජිටල් අධ්‍යාපනය සඳහා ස්මාර්ට්බෝඩ් නිෂ්පාදන පෙළක් වෙළඳපොළට හඳුන්වා දෙනු ලැබ ඇත. මාර්ගගත අධ්‍යාපනික කටයුතු සහ ව්‍යාපාරික රැස්වීම්/සම්මන්ත්‍රණ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම මෙහි මූලික අරමුණයි.

සිංගර්, දැනට ලොව නවීනතම LED තිර නිෂ්පාදනය කරන Skyworth සමාගමේ ස්මාර්ට්බෝඩ් නිෂ්පාදන පෙළක් හඳුන්වාදී ඇත. පරිගණකය, රූපවාහිනිය, ප්‍රොජෙක්ටරය සහ වයිට්බෝඩ් සතු සියලු විශේෂාංග වලින් සමන්විත වන ලෙස මෙම ස්මාර්ට්බෝඩ් නිර්මාණය කරඇත.



කාර්යන් කිහිපයක් එකවර කරගත හැකි මෙම ස්මාර්ට්බෝඩ් වර්තමාන ඔන්ලයින් අධ්‍යාපන කටයුතු සඳහා පවතින හොඳම විකල්පය බව එම සමාගම කියයි.

මෙය අඟල් 55, 65 සහ 75 ලෙස ප්‍රමාණයන් තුනකින් සහ ඇන්ඩ්‍රොයිඩ් හෝ වින්ඩෝස් 10 යන මෙහෙයුම් පද්ධති වලින් ලබාගත හැක. මෙම ස්මාර්ට්බෝඩ් නිෂ්පාදන පෙළ මඟින් වයිට්බෝඩ් හි සටහන් ලිවීම, අනෙක් පාර්ශ්වයට නැරඹිය හැකිලෙස වීඩියෝ සහ තිරය පෙන්විය හැකිවීම වැනි ප්‍රතිලාභ රැසක් හිමිකරදෙයි. ගුරුවරුන්ට ඉගැන්වීමට අවශ්‍ය දෑ මෙහි ගබඩා කර තබාගත හැකි බැවින් ඉදිරි ඉගැන්වීම් කටයුතු වලදී ඒවා පහසුවෙන් භාවිත කළ හැකිය.

ඩබ්ලිව් ආයුර්වේද රෝහලෙන් පොත් බෙදාදීමක්

**ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයුර්වේද රෝහලක් වන ඩබ්ලිව් ආයුර්වේද රෝහල සිය ආයතනික සමාජ වගකීම මනාව හඳුනා ගනිමින් පාසල් සහ දහම් පාසල් දරුවන් වෙනුවෙන් පොත් පත් බෙදා දෙමින් සමාජ සත්කාර රැසක් දියත් කළේය. එහි සුවිශේෂ පියවරක් සනිටුහන් කරමින් පසුගියදා මැදිරිගිරිය පෙ/දමෙය්පුර ප්‍රාථමික විද්‍යාලයට, මොරටුව ශ්‍රී ආරියවංශ දහම් පාස

කුඹුර මැද ව්‍යාපාරික ඉදිකිරීමක්:

වගා අයිතිය ඉල්ලා කහල්ලේ ගොවීහු උද්ඝෝෂණයේ

ගොවීන් තම වගා අයිතිය ඉල්ලමින් උද්ඝෝෂණයේ නිරතව සිටි අයුරු.

(කටුගස්තොට ධම්මික ගුණවර්ධන)

යල මහ දෙකන්නය අස්වැද්දූ 'ඒ' ශ්‍රේණියේ, කහල්ල ගොවි රජා පවා බිහිකළ කටුගස්තොට කහල්ල බැට්ටංගදෙණිය කුඹුරුයාය මධ්‍යයේ ව්‍යාපාරිකයකු විසින් සිදුකරන ඉදිකිරීමකට එරෙහිව ඉකුත් 11 වැනිදා පස්වරුවේ ගොවීන් පිරිසක් තම වගා කිරීමේ අයිතිය ඉල්ලා උද්ඝෝෂණයක නිරත වූහ.

අදාළ ඉදිකිරීම් සම්බන්ධයෙන් ජනාධිපති කාර්යාලය මඟින් මහනුවර ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් නියෝජ්‍ය කොමසාරිස්වරිය වෙත වාර්තාවක් සපයන ලෙසට දන්වා තිබියදී මෙම ඉදිකිරීම් සිදුකරමින් ඇති බවට චෝදනා කළ ගොවි උද්ඝෝෂකයන්, ඒ සඳහා සිය විරෝධය පළකිරීමට ගත් උත්සාහයේදී එහි පැමිණ සිටි පොලිස් නිලධාරීන් අතර සංවාදාත්මක තත්ත්වයක් ද ඇතිවිය.

වෙල්යාය මධ්‍යයේ සිදුවන ඉදිකිරීම හමුවේ යායේ ඉහළ කොටසේ පමණක් වී වගා කිරීමට හැකිව තිබුණ ද අදාළ ඉදිකිරීමට පහළ කොටසට නිසි ජල සම්පාදනයක් හෝ ලබාදීමට පවතින නොහැකියාව නිසා යායේ පහළ කොටස මේ වනවිට මුළුමනින්ම පාහේ පුරන්ව ඇතැයි ද ඔවුහු පෙන්වා දුන්හ.

පොලිස් නිලධාරීන් හා මතභේදයකට මැදිව

චර්තමානයේ පොහොර හෝ කෘෂි රසායන හිඟකමින් බැටකමින් රටට බත සපයන ගොවියාට එරෙහිව තම වගා බිම් අත්තනෝමතික ලෙස ගොඩකිරීම් හා විවිධ ඉදිකිරීම් සිදුකිරීමට ඉඩහැරීම හමුවේ ඉදිරියේදී රටේ විශාල ආහාර හිඟයකට පවා මුහුණ දීමට සිදුවෙතැයි පෙන්වා දුන් ඔවුහු, රටේ සිදුවන ගොවි බිම් විනාශයට එරෙහිව දිවි හිමියෙන් සටන් වදින බව ද එහිදී වැඩිදුරටත් අවධාරණය කළහ.

රත්තොටට නව ව්‍යාපෘති 3 ක්

(මාතලේ මහේෂ් කීර්තිරත්න)

සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ රත්තොට කොට්ඨාසය තුළ ලාක්ෂා කර්මාන්තයට අදළ ප්‍රතිලාභීන් 64 දෙනකු සඳහා ව්‍යාපෘති තුනක් ක්‍රියාත්මක කිරීමට නියමිත බව රත්තොට ප්‍රාදේශීය ලේකම් නිශාන්ත දිනිප්‍රිය හේරත් මහතා පවසයි.

ගමට සීමා වී තිබූ මෙම කර්මාන්ත ජාත්‍යන්තරයට ගෙන යෑමේ මහා ප්‍රයත්නයක් වශයෙන් මෙම සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක වන අතර, ඒ පිළිබඳව නිෂ්පාදකයන්ගේ දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය කර නිෂ්පාදකයන් දිරිමත් කිරීම මෙහි එක් අරමුණක් වේ.

මෙම වැඩසටහනේ සම්පත් දායකත්වය ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් ලබාදෙන ලදී.

මේ සඳහා සම්බන්ධ වන එක් එක් ප්‍රතිලාභීන් සඳහා රුපියල් ලක්ෂයක මුදලක් ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතාව මත එනම්, මඩුව සකසා ගැනීමට හෝ උපකරණ මිලදී ගැනීමට ලබා දේ.

එහි පළමු ව්‍යාපෘතිය පහළ හපුවිද වසමේදී පසුගියදා ප්‍රතිලාභීන් 25ක සහභාගිත්වයෙන් පැවැත්වුණු අතර, සමාරම්භක අවස්ථාවට රත්තොට ප්‍රාදේශීය මහලේකම් නිශාන්ත දිනිප්‍රිය හේරත්, සහකාර ප්‍රාදේශීය ලේකම් අංජලා දිසානායක, රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) ලක්මිණි තිලකරත්න යන මහත්ම මහත්මිහු සම්බන්ධ වූහ.

තරුණ සේවා සභාවෙන් දික්ඔය රෝහලට ඇඳන් 25 ක්

(මස්කෙළිය ගාමිණී බණ්ඩාර ඉලංගන්තිලක)

යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ මහතාගේ සංකල්පයක් අනුව ක්‍රියාත්මක කර ඇති කොවිඩ් රෝගීන්ගේ නේවාසික පහසුකම් සඳහා ඇඳන් ලබාදෙන වැඩසටහනට සමගාමීව දික්ඔය මූලික රෝහලට ඇඳන් 25ක් ජාතික තරුණ සේවා සභාව මඟින් පරිත්‍යාග කිරීම ඉකුත් 12 වැනිද එම රෝහල් පරිශ්‍රයේදී සිදු කෙරිණි.

තරුණ සේවා නිලධාරීන් විසින් ඇඳන් තොගය වෛද්‍ය අරුල් කුමාරන් මහතාට බාරදුන් අයුරු.

ජාතික තරුණ සේවා සභාවේ, අඹගමුව යෞවන සමාජ ප්‍රාදේශීය සම්මේලනයේ සාමාජිකයන් විසින් සාදන ලද ඇඳන් මෙසේ පරිත්‍යාග කරන ලදී.

මෙම අවස්ථාවට දික්ඔය මූලික රෝහලේ වෛද්‍ය අරුල් කුමාරන්, ජාතික තරුණ සේවා සභාවේ නුවරඑළිය දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ සුමිත් කොටිකඩුව මහතාගේ උපදෙස් හා මග පෙන්වීම යටතේ, අඹගමුව සහකාර තරුණ සේවා නිලධාරී ආර්. කනකරාජ්, කොත්මලේ තරුණ සේවා නිලධාරී ඒ. බාලසුබ්‍රමණියම්, ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයේ ජාතික මණ්ඩල නියෝජිත ජී. සරත් හා අඹගමුව යෞවන සමාජ ප්‍රාදේශීය සම්මේලනයේ නිලධාරීන් ඇතුළු පිරිසක් සහභාගි වූහ.

මහවැලි අස්වනු නංවන්න විශ්ව විද්‍යාලත් එක්වේ

(මාතලේ මහේෂ් කීර්තිරත්න)

මහවැලි කලාපයන්හි කෘෂි ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා සෑම කලාපයකටම විශ්වවිද්‍යාල කෘෂිකර්ම පීඨ සම්බන්ධ කර ගැනීමට මහවැලි අධ්‍යක්ෂ ජනරාල් කීර්ති කොටගම මහතාගේ උපදෙස් පරිදි ක්‍රියාත්මක කර තිබේ.

ඒ අනුව මොරගහකන්ද කලාපයේ කෘෂි ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය තෝරාගෙන ඇති අතර, එහි පීඨාධිපති මහාචාර්ය සමන් හේරත් මහතා ඇතුළු ආචාර්ය මණ්ඩලය පසුගියදා මොරගහකන්ද කලාපයේ ක්ෂේත්‍ර චාරිකාවක නිරත වූහ.

මෙම අවස්ථාව සඳහා කෘෂිකර්ම අධ්‍යක්ෂ නෙවිල් රාජපක්ෂ මහතා ඇතුළු නිලධාරීහු පිරිසක් එක්වී සිටියහ.

ඉන්දියානු සහකාර කොමසාරිස් මධ්‍යම ආණ්ඩුකාර හමුවේදී

(කුණ්ඩසාලේ පී.එම්. රාජපක්ෂ)

ඉන්දියා සහකාර මහකොමසාරිස් වශයෙන් පත් වූ වෛද්‍ය එස්. ආත්රා මහත්මිය සහ මධ්‍යම පළාත් ආණ්ඩුකාර නීතිඥ ලලිත් යූ. ගමගේ මහතා අතර සුහද සාකච්ඡාවක් මහනුවර පිහිටි ආණ්ඩුකාර කාර්යාලයේදී ඉකුත් 12 වැනිද පැවැත්විණි.

මෙහිදී දෙරට අතර රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා යටතේ මධ්‍යම පළාත තුළ සිදු වූ හා සිදුවෙමින් පවතින ව්‍යාපෘති පිළිබඳව වැදගත් වන කරුණු රැසක් සම්බන්ධයෙන් සාකච්ඡා වූ අතර, කොවිඩ් වසංගත තත්ත්වයත් සමග ඉන්දියාව සහ ශ්‍රී ලංකාව වර්තමානයේදී මුහුණ දෙන තත්ත්වයත්, වසංගත තත්ත්ව ව්‍යාප්තිය වැළැක්වීම සඳහා සෞඛ්‍ය අංශ ප්‍රධාන අනෙකුත් අංශවල සේවයත් සම්බන්ධව මෙහිදී අවධානයට ලක්විය.

මෙම සුහද සාකච්ඡාවෙන් අනතුරුව දෙරටෙහි මිත්‍රත්වය සංකේතවත් කරමින් සමරු ඵලක හුවමාරුවක් ද සිදුවිණි.

මෙම අවස්ථාවට ආණ්ඩුකාර සම්බන්ධීකරණ ලේකම් උපුල් මහින්දරත්න, මහජන සම්බන්ධීකරණ නිලධාරී එස්.බී. රත්නායක, ආණ්ඩුකාර සහකාර ලේකම් මිහිරාන් බණ්ඩාර යන මහත්වරු ද එක්වූහ.

කොටගල කඩයකින් සල්ලි ඉස්සූ දෙදෙනෙක් කැමරාවෙන් කොටු

කොටගල නගරයේ ඇල්මිනියම් හා ප්ලාස්ටික් භාණ්ඩ වෙළෙඳසලකින් රුපියල් 18,000 ක මුදල් සොරා ගැනීමේ සිද්ධියට සම්බන්ධ දෙදෙනකු (11) ද සැකපිට අත්අඩංගුවට ගත් බව දිඹුල-පතන පොලිසිය පවසයි.

කොටගල නගරයේ පිහිටි මෙම වෙළෙඳසලට ඉකුත් (10) ද රාත්‍රී 08.30 ට පමණ පැමිණි කීපදෙනකු මුදල් සොරාගන්නා අයුරු එම වෙළෙඳසලේ සවිකර තිබූ සී.සී.ටී.වී. කැමරා පද්ධතියේ සටහන්වී ඇති දර්ශන පරීක්ෂා කිරීමෙන් අනතුරුව මෙම දෙදෙනා අත්අඩංගුවට ගෙන ඇත.

වෙළෙඳසල් හිමියා විසින් පොලිසියට කරන ලද පැමිණිල්ලක් අනුව මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් ආරම්භ කළ බවත්, සැකකරුවන් හැටන් දිසා හා මහේස්ත්‍රාත් අධිකරණය හමුවට පැමිණවීමට නියමිත බවත් පොලිසිය කියයි.

(මස්කෙළිය ගාමිණී බණ්ඩාර ඉලංගන්තිලක)

රත්තොට පෙර පාසල් පාලිකාවන්ට වැඩසටහනක්

'ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ උපදේශන' මැයෙන් පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන පාලක පාලිකාවන් සඳහා විශේෂ වැඩසටහනක් රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පැවැත්විණි.

රත්තොට වනිතා සංවර්ධන ඒකකය මඟින් මෙය සංවිධානය කර තිබුණි.

චාන්දනී පුෂ්පලතා සහ ඉන්දික රත්නායක යන මහත්ම මහත්මිහු මේ සඳහා සම්පත් දායකත්වය ලබාදුන්හ.

(මාතලේ මහේෂ් කීර්තිරත්න)

වැවේ බාග වැඩවලින් නිත්තවෙල ගමම දැඩි අසීරුවේ

(හසලක සුනිල් ඒකනායක)

සරුසාර වෙල්යායකට අතීතයේ දියවර සැපැයූ, අද ප්‍රදේශවාසීන්ට අපහසුතා ගෙන දෙන අබලන් තත්ත්වයේ පවතින 'නිත්තවෙල පතහා' නමින් හැඳින්වෙන කුඩා වැව නැවත ගොවීන්ට ප්‍රයෝජනවත් වන ආකාරයට සකස් කරදෙන ලෙස ප්‍රදේවාසීහු අදළ අංශ වෙතින් ඉල්ලා සිටිති.

"නිත්තවෙල පතහා කියන්නේ එදා ගමට වටිනා සම්පතක්. මෙය පවුල් දහසකට ආසන්න සංඛ්‍යාවක් පදිංචිව සිටින නිත්තවෙල ග්‍රාම නිලධාරී වසමට තිබෙන එකම වැව. මෙය නිත්තවෙල රජමහා විහාරයට පහළින් ගම්මානය මැද පිහිටා තිබීම ගැමියන්ට ආශීර්වාදයකි."

මෙම පතහා ආසන්නයේ පදිංචි සාමවිනිසුරු ඩී. දයානන්ද මහතා මෙසේ කීය.

"මෙම වැව පිළිසකර කරදෙන්නැයි කියා මීට වසර හතරකට පමණ ඉහතදී ප්‍රදේශවාසීන් සහ ජනමාධ්‍ය අදළ අංශ දැනුවත් කිරීමෙන් පසු රුපියල් ලක්ෂ දෙකකට ආසන්න මුදලකට සැකසූ ඇස්තමේන්තුවක් යටතේ වැව පිළිසකර කරන්න මුදල් ලබාදුන්නා.

නමුත් එය නිසි අයුරින් පිළිසකර නොකිරීම නිසා පතහා නැවතත් වසර තුනක් යන්නටත් පෙර පැවැති තත්ත්වයට පත්ව ඇති බව කනගාටුවෙන් වුවත් කියන්න වෙනවා. මේ පතහා පිහිටි කොටසේ වල් ඌරන්, ඉත්තෑවන්, මීමින්නන්, විවිධ විෂකුරු සර්පයින් සිටිනවා. මේ සතුන් රාත්‍රී කාලයට ගම්වැදී ගැමියන්ගේ ජන ජීවිතයට අහිතකර බලපෑම් කරනවා. ඒ නිසා මේ පතහා නිසි සැලැස්මකට අනුව සකස් කරදෙන්න කියලා තමයි අසල්වැසි ගැමියන් වශයෙන් අපි ඉල්ලා සිටින්නේ. ඒ වගේම තමයි මේ පතහා ළඟින් ගැමියන් ප්‍රයෝජන ගන්නා කුඩා පාරක් තිබෙනවා. ඒකත් සංවර්ධනය කරදෙන ලෙස ඉල්ලා සිටිනවා."

නිත්තවෙල ග්‍රාම සංවර්ධන සමිතියේ සභාපති සනත් රෝයි ගුණරත්න මහතා මෙසේ කීය.

"මෙම පතහා අතීතයේ නිත්තවෙල පහළ කොටසේ වෙල්යායකට ජලය සපයපු වටිනා කුඩා වැවක්. ඒ කාලේ මේ පතහා ප්‍රදේශයට ආලෝකයක් වුණා. මෙය අද පරිසරයට මෙන්ම මිනිස් ජීවිතවලට අහිතකර බලපෑම් එල්ල කරන දුර්ගන්ධයෙන් පිරුණු මැසි මදුරුවන් ඇතුළු ගැමියන්ට අහිතකර සතුන් බෝවෙන සහ ළඟින ස්ථානයක් බවට පත්වී තිබෙනවා.

මේ පතහා පිහිටලා තියෙන්නේ ගල්කඩුව නිත්තවෙල මාර්ගයේ රජමහා විහාරයට පහළිනුයි. වර්ෂා කාලයට ඉහළින් පාරේ කාණුවල සහ ඉහළ ඉඩම්වලින් පහළට ගලා යන මඩ සහිත ජලය කෙළින්ම එන්නේ කාණුවක් හරහා පතහටයි. ඒවා ඉවත් කිරීමක් කරන්න ගොවීන් පතහට බහින්න අකැමැත්තක් දක්වනවා. ඒකට හේතුව මෙහි විවිධ සර්පයින් ඇතුළු අහිතකර සතුන් සිටින නිසා.

අනෙක තමයි වැවේ තිබෙන විෂබීජවලින් පිරුණු අපවිත්‍ර ජලය ශරීරයේ ගෑවීමෙන් මිනිසුන්ගේ ඇඟ කැසීමටත් පලු දැමීමටත් සිදුවෙනවා. ඒ වගේම තමයි පහළ වෙල්යායට ජලය රැගෙන යන අතුරු ඇළ මාර්ගත් අබලන් තත්ත්වයේ පවතිනවා. මෙහි තිබෙන සොරොව්වත් සකස් කළ යුතුයි. ඇළ මාර්ග අබලන් නිසා කුඹුරුවලට ප්‍රමාණවත් ජලයක් රැගෙන යෑම අපහසුයි. එම නිසා මෙම කුඩා වැව පිළිසකර කිරීම ඉතාම වැදගත් වගේම ඇළ මාර්ගත් සංවර්ධනය කිරීමත් බව කියන්නම වෙනවා.

ඒ වගේම තමයි දැන් මේ සංවර්ධනය කිරීමෙන් පසු විසිතුරු මසුන් ඇති කිරීමටත් හැකි වෙනවා. දැනටමත් විසිතුරු මසුන් මෙහි විශාල ගණනක් සිටිනවා. ඒ ගැනත් අවධානය යොමු කරනවා නම් වැදගත්."

නිත්තවෙල කෘෂි නිෂ්පාදන හා පරිරක්ෂණ සහකාර මංජුල ආරියරත්න මහතා මෙසේ කීය.

"මා දැනට මාස කිහිපයක් තමයි මේ වසමට ඇවිල්ලා. ගොවීන්ගේ ඉල්ලීමකට මම මේ පතහා බලන්න ගියා. කතාව ඇත්ත. මෙය වහාම පිළිසකර කරලා ගොවි ජනතාවට යල මහ දෙකන්න වැඩ කරන්න පුළුවන් විදිහට වැව සකස් කරන්න ඕනෑ. මේ පතහා යටතේ ගොවි පවුල් පනහක කුඹුරු අක්කර හතළිස් දෙකක් පමණ වගා වෙනවා.

මීට පෙර යම් මුදලක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ලැබිලා මෙය යම් තරමක් දුරට සංවර්ධනය කරලා තිබෙනවා. තව වැඩ කොටසක් කරන්න තිබෙනවා. මේ ගැන මම අපේ ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරිතුමාත් දැනුවත් කරලා තිබෙනවා. එපමණක් නොවෙයි වසමේ ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇති සංවර්ධන යෝජනාවලට මෙය ඇතුළත් කර තිබෙනවා. ඉතා ඉක්මනින්ම නිත්තවෙල පතහා පෙර පරිදි ගොවීන්ට අවශ්‍ය ජලය ලබාගැනීමට සරිලන පරිදි සකස් කරදීමටත් අබලන් අතුරු ඇළ මාර්ගත් සකස් කරදීමටත් අපි පියවර ගන්නවා.

සැකසිය යුතු සොරොව්ව

රෝයි ගුණරත්න

ඩී. දයානන්ද

මංජුල ආරියරත්න

අබලන් ඇළ මාර්ගයක්

සණස ව්‍යාපාරය ජාත්‍යන්තර සමූපකාර දිනය සමරයි

ලොව පුරා ව්‍යාප්තව පවතින ප්‍රමුඛතම සමාජ සුබසාධන ව්‍යාපාරයක් වන සමූපකාර ව්‍යාපාරය සිය 99 වැනි සංවත්සරය පසුගියදා උත්සවාකාරයෙන් සැමරූ අතර ඊට සමගාමීව සණස සමිති, සණස ලයිෆ් ඉන්ෂුවරන්ස්, සණස ජෙනරල් ඉන්ෂුවරන්ස්, සණස සංවර්ධන බැංකුව ඇතුළු මෙරට සණස සමූහ ව්‍යාපාරයට අයත් ආයතනද, ජාත්‍යන්තර සමූපකාර දිනය අභිමානවත් ලෙස සැමරිය.

'එක්වී මනාව යළි ගොඩ නැගෙමු' යන තේමාව ඔස්සේ මෙවර ජාත්‍යන්තර සමූපකාර දිනය පැවැත්විණි. රටවල් 112ක් ජාත්‍යන්තර සමූපකාර සන්ධානයේ සාමාජිකත්වය ලබා ඇත. කාර්මික විප්ලවය සමග ඇති වුණ සාමාජීය සහ ආර්ථික වෙනස්කම් සමග පීඩනයට පත් වුණ ගොවියා සහ කම්කරුවා නගා සිටුවීමේ අරමුණින් සමූපකාර ව්‍යාපාරය මූලිකව අරඹන ලදී. 1923දී ප්‍රථම වරට ජාත්‍යන්තර සමූපකාර දිනය සැමරීමට තීරණය කරන ලදී. ඒ අනුව සෑම වසරකම ජූලි මස පළමු



වැනි සෙනසුරාදා ජාත්‍යන්තර සමූපකාර දිනය ලෙස නම් විය.

ආචාර්ය පී.ඒ. කිරිවන්දෙණිය මහතාගේ මූලිකත්වයෙන් ඇරැඹුණු සණස ව්‍යාපාරය සාමාජිකයන් ලක්ෂ 30කට ආසන්න ගණනකින් සමන්විත වන අතර සණස ප්‍රාථමික, දිස්ත්‍රික්, ජාතික සහ ජාත්‍යන්තර ලෙස මට්ටම් කිහිපයකින් ක්‍රියාත්මක වේ. එහි ප්‍රාථමික මට්ටමේ මූලික කාර්යයන් වන්නේ සාමාජිකයන්ගේ සකසුරුවම් බව වර්ධනය කිරීම, ආර්ථික වර්ධනයට මූල්‍ය සම්පත් සැපයීම, සාමාජිකයන්ට අධ්‍යාපනය සැපයීම ආදියයි. "සමූපකාර ව්‍යාපාරය නිර්මාණය වූණේ ලෝකයේ අර්බුද පවතින අවස්ථාවක. එනිසා ඉතාම අර්බුදකාරී අවස්ථාවල ප්‍රමුඛ බලපෑමක් කරන්න සමත් ශක්තිමත් ව්‍යාපාරයක් ලෙස සමූපකාර ව්‍යාපාරය සෑම විටම ක්‍රියාත්මක වුණා. වර්තමන් කොරෝනා අර්බුදය ඇති කළ ගැටලු විසඳ ගෙන ජන ජීවිත ජය ගන්න අවශ්‍ය මඟ පෙන්වීම සිදු කරන්න අප සූදානම්." සණස නිර්මාතෘ ආචාර්ය පී.ඒ. කිරිවන්දෙණිය මහතා පැවසීය.

සංචිත අර්බුදයට පිළියමක්

ඇමෙරිකානු ඩොලර් බිලියනයක විදේශ ණය නැවත ගෙවීමත් සමඟ ආණ්ඩුව තුළත් රට තුළත් ඒ සම්බන්ධයෙන් කතාබහක් ඇති විය. එම ණය මුදල ගෙවීමට නියමිතව තිබුණේ ජූලි 27 වැනිදා වන අතර ඊට දිනකට පෙර එය ගෙවා දැමීමට ආණ්ඩුවට හැකියාව ලැබිණි. ඒ අනුව ණය මඟ නොහැර නියමිත දිනට ගෙවීමේ මෙරට වාර්තාව ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යෑමට මේ ආණ්ඩුව ද සමත් විය. මේත් සමඟ රටේ විදේශ මූල්‍යයේ තිබෙන අවදානම් තත්ත්වය විසඳූ ගනු ඇතැයි විශ්වාසය ද ඇති වී තිබේ. විදේශ සංචිත කඩිනමින් නැවත පුරවා ගනිමින් දීර්ඝකාලීනව විදෙස් සංචිත ශක්තිමත් කරගන්නේ කෙසේ ද?

සංචිත නැවත පුරවා ගන්නේ කෙසේ ද?

ඇමෙරිකානු ඩොලර් බිලියන තුනකටත් අඩු අගයකට පහත වැටී තිබෙන විදේශ සංචිත ප්‍රමාණය මේ වසර අවසන් වන විටදී සෑහීමකට පත්වීමට හැකි අගයකට ගෙන ඒමට හැකියාව ලැබෙනු ඇතැයි ආණ්ඩුව විශ්වාස කරයි. මිත්‍ර රටවල් සමඟ මුදල් හුවමාරු (ස්වැප්)වලට එළැඹීමටත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රධාන සහ මේ වසරේ ඉදිරි මාසවලදී සේවාවලින් ඉහළ ආදායම් ලබාගත හැකි වනු ඇති බවටත් ආණ්ඩුව බලාපොරොත්තු තබා ඇත.

කෙසේ නමුත් විදේශ සංචිතවල තිබෙන මෙම භයානක සහ අස්ථිර ස්වභාවය මේ වසර අවසානයේදීත් පවතිනු ඇති බවත් ලබන වසරේ දී මෙම තත්ත්වය තවදුරටත් උග්‍ර වනු ඇති බවටත් විශ්ලේෂකයෝ/ විශේෂඥයෝ පෙන්වාදෙති. ලබන වසරේ දී තවදුරටත් විදේශ ණය ගෙවීම් කිරීමට තිබෙන බැවින් සහ ආනයන වියදම් වැඩිවීමත් යන කරුණු මුල් කරගනිමින් මේ තත්ත්වය උග්‍ර වනු ඇතැයි ඔවුහු පෙන්වාදෙති.

මුදල් හුවමාරු (ස්වැප්)

ඉන්දියාව සහ බංග්ලාදේශය සමඟ මුදල් හුවමාරු පහසුකම් තුළින් සහ චීනයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 150ක යුවාන් ණය පහසුකම් ලැබීමට නියමිත අතර මේවා මඟින් විදේශ සංචිත ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් (එස්.ඩී.ආර්./ ජාත්‍යන්තර සංචිත වත්කම්) යටතේ මෙරටට ලැබීමට නියමිත ඇමෙරිකානු ඩොලර් මිලියන 780ක මුදල ද විදෙස් සංචිත ඉහළ යෑමට උපකාරී වනු ඇතැයි අපේක්ෂිත ය.

මුදල් හුවමාරු යනු සංචිත ඉහළ දමන තාවකාලික පහසුකම් වන අතර එම මුදල් නැවත ගෙවිය යුතු වේ. චීනයෙන් ලැබෙන ණය පහසුකම චීනයෙන් ආනයනය කිරීමට උපකාරී වනු ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලැබෙන මුදල ප්‍රදානයකි.

ඉන්දියාවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක් ද බංග්ලාදේශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 250ක් ද වශයෙන් මුදල් හුවමාරු පහසුකම් ලැබීමට නියමිත ය. මේවා කෙටිකාලීන පහසුකම් වන අතර අවිනිශ්චිත තත්ත්වයක තිබේ. චීනයෙන් ලැබෙන යුවාන් ණය පහසුකම ප්‍රයෝජනවත් වන්නේ චීනයෙන් භාණ්ඩ මිලදී ගැනීමට පමණි.

ප්‍රයෝජනවත් සහන

මුදල් හුවමාරු, ණය සහ අනෙකුත් මූල්‍ය පහසුකම් සියල්ල සහන වන නමුත් ඒවා විසඳුම් නොවේ. කෙසේ නමුත් මේවා දැනට විදේශ මූල්‍යයේ තිබෙන අර්බුදකාරී තත්ත්වය විසඳගැනීමට ප්‍රයෝජනවත් වේ. කෙසේ නමුත් මේවා ප්‍රශ්නයට විසඳුම් නොවේ.

විසඳුම්

දැඩි ආනයන සීමා පනවමින් වෙළෙඳ හිඟය අඩු කරගැනීම අත්‍යවශ්‍ය වේ. වෙළෙඳ භාණ්ඩ අපනයන ආදායම වැඩි කිරීමත් සේවාවලින් ආදායම් වැඩි කරගැනීමත් රටේ විදේශ මූල්‍යයේ තිබෙන අර්බුදකාරී තත්ත්වය පාලනය කරගැනීමට උපකාරී වේ. දැනට අපේක්ෂිත බොහෝ අරමුදල්/ පහසුකම් කෙටිකාලීන සහන පියවර ය.

සරල සත්‍යය සම් රට විදේශ විනිමය උපයාගත්තේ ආනයන මත වියදම් කිරීමෙන් පසු ඉතිරි වන මුදලිනි. කෙටියෙන්ම සඳහන් කරන්නේ නම් වෙළෙඳ හිඟය අඩු කරගැනීමට පියවර ගත යුතු ය. හැකියාවක් ඇති නම් 2019 වසරේ දී මෙන් ගෙවුම් ශේෂයේ අතිරික්තයක් උපයාගත යුතු ය. එම අවස්ථාවේදී වෙළෙඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන අටක් වූ අතර සේවාවලින් සහ ප්‍රාග්ධන ගලාඒම්වලින් එය පියවා ගැනීමට හැකියාව ලැබිණි.

ඉකුත් වසරේ දැඩි ආනයන සීමා පනවමින් ආනයන අඩු කරගැනීමටත් වෙළෙඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන හයක් දක්වා අඩු වුවත් ගෙවුම් ශේෂයේ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන 2.3ක් විය.

ඉහළ ආදායම්

මේ වසරේ සිවුවැනි කාර්තුවේ දී ප්‍රේෂණ, තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවාවලින් සහ සංචාරක කර්මාන්තයෙන් ලැබෙන ආදායම් ඉහළ යනු ඇතැයි අපේක්ෂිත ය. එමඟින් සංචිත ප්‍රමාණවත් ප්‍රමාණයට වැඩි වනු ඇතැයි අපේක්ෂිත ය. ඉහළ වටිනාකමකින් සමන්විත මැණික් සොයාගැනීම තවත් වාසියකි. ඒවා ඇමෙරිකානු ඩොලර් මිලියන 100ත් 200ත් අතර වනු ඇතැයි ගණන් බලා ඇත. මැණික්, ඒවායේ අයිතිකරුවන්ට වාසියක් වුවද රටේ විදේශ සංචිතවලට නම් එතරම් වටිනාකමක් නැත. අප සිටින්නේ දැඩි අර්බුදයක ය. එබැවින් මහ මුහුදකට

ආචාර්ය
නිමල් සඳරත්න PhD

වතුරු බිංදු කිහිපයක් දමන්නාක් මෙන් මේ මැණික් අපේ දුර්වල සංචිතවලට එක් කළ හැකි ය. කෙසේ නමුත් මේ මැණික්වල වටිනාකම අඩු බවද මේ වනවිට දැනගන්නට ලැබේ. ඉහත කී මේ ගලාඒම් මඟින් මේ වසර අග වනවිට විදෙස් සංචිත ඉහළ යනු ඇතැයි අපේක්ෂිත ය.

අතීත අත්දැකීම්

රටේ වෙළෙඳ ගිණුමේ අතිරික්තයක් පැවැතියේ වසර හතරක් හෝ පහක් පමණි. ව්‍යුහගත ගැටලු තිබෙන බව එයින් ඉතා හොඳින් පැහැදිලි ය. අවසාන වරට වෙළෙඳ හිඟයේ අතිරික්තයක් වාර්තා වූයේ මීට වසර 44කට පෙර එනම් 1977 වසරේ දී ය. එය ද ඉතා කුඩා අගයකි. එම අතිරික්තය ළඟා කරගත්තේ දැඩි ආනයන සීමා පනවමින් සහ අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල හිඟ පවතින තත්ත්වයක් තුළ ය. එම සමයේ දී ජීවනෝපායවලට දැඩි දුෂ්කරතා ඵල්ලා විය. එමෙන්ම ආර්ථික වර්ධන වේගය ද අඩු අගයක පැවතුණි.

මූලධර්ම හේතු

දිගින් දිගටම වෙළෙඳ හිඟ පැවැතීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ අපනයන වැඩි කිරීමට ඇති අසමත්කම ය. කෙසේ නමුත් අපනයන වැඩි නොවුණ ද ආනයන දිගින් දිගටම සැලකිය යුතු අගයකින් වැඩි විය. බොහෝ වසරවලදී ආනයන වියදම අපනයන ආදායම මෙන් දෙගුණයක් විය. ඉකුත් වසරේ දී (2020) වෙළෙඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන හයක අගයකට ගෙන ඒමට සමත් විය. කෙසේ නමුත් එම වසරේ ආනයන වියදම ඇමෙරිකානු ඩොලර් බිලියන 16ක් වූ අතර අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 10ක් විය.

2021 වෙළෙඳ ශේෂය මේ වසරේ වෙළෙඳ ශේෂය කුමක් වනු ඇති ද ?

ඉකුත් වසරේ දී වෙළෙඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන හයක් වූ අතර මේ වසරේ දී වෙළෙඳ හිඟය දෙගුණ වනු ඇත. මේ වසරේ මුල් අර්ධයේ දී අපනයන ආදායම ඉතා හොඳ තත්ත්වයක් පෙන්නුම් කළ ද දැඩි ආනයන සීමා පනවා තිබුණ ද ආනයන වැඩි වීම හේතුවෙන් මේ වසරේ දී වෙළෙඳ හිඟය පසුගිය වරට සාපේක්ෂව දෙගුණ වනු ඇත.

අපනයන

මේ වසරේ මුල් අර්ධයේ අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 5.6ක් වූ බව අපනයන සංවර්ධන මණ්ඩලය ඉකුත් ද සඳහන් කළේය. වෙළෙඳ භාණ්ඩ අපනයන ඇමෙරිකානු ඩොලර් බිලියන 12ක් වනු ඇතැයි එම මණ්ඩලය ඇස්තමේන්තු කර ඇත. එය එසේ වුවත් ඉහළ ආනයන වියදම හේතුවෙන් වෙළෙඳ හිඟය තවදුරටත් පුළුල් වනු ඇත.

මේ වසරේ මුල් අර්ධයේ දී වෙළෙඳ භාණ්ඩ අපනයන ඇමෙරිකානු ඩොලර් බිලියන 5.56ක් ලෙස දැක්වුණු අතර එය පසුගිය වසර හා සැසඳීමේදී සියයට 27.5ක වර්ධනය කි. පසුගිය වසරේ මුල් මාස හයේ දී වෙළෙඳ භාණ්ඩ අපනයන ඇමෙරිකානු ඩොලර් බිලියන 4.36ක් විය. කොවිඩ්-19 වසංගතය තෙවැනි රැල්ල මධ්‍යයේ වුවද එම අපනයන ආදායම ලබාගත හැකි වූයේ දැඩි සීමා සහ බාධක මධ්‍යයේ ය. ජාත්‍යන්තර ඉල්ලුම ක්‍රමයෙන් වැඩි වීමත් සමඟ නිෂ්පාදිත අපනයන ද ක්‍රමයෙන් වැඩි විය.

ඉල්ලුම

ආනයන මත දැඩි සීමා පනවා තිබුණ ද ආනයන වියදම් වැඩි වීම හේතුවෙන් මේ වසරේ ගෙවුම් ශේෂයට අහිතකර ලෙස බලපෑම් ඵල්ල වනු ඇත. ආහාර, අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සහ අමුද්‍රව්‍ය සහ කෘෂිකාර්මික අපනයන ඇඳු වීම යනාදිය හේතුවෙන් මේ වසරේ දෙවැනි අර්ධයේ දී වෙළෙඳ හිඟය තවදුරටත් පුළුල් වනු ඇත. පොහොර ආනයනය මත සීමා පැනවීම හේතුවෙන් මීට ප්‍රතිචාර දක්වනු ඇති අතර විමඟින් වෙළෙඳ ශේෂයේ තත්ත්වය උග්‍ර වනු ඇත. ඊට ප්‍රධානම හේතුව ආහාර නිෂ්පාදන අඩු වීම යි.

ගෙවුම් ශේෂය

වෙළෙඳ ශේෂය පුළුල් වීම යන තත්ත්වය මධ්‍යයේ සේවා අංශවලින් ලැබෙන ආදායම් ඉතා වැදගත් වේ. පසුගිය වසරේ දී එය ඉතා වැදගත් විය. කෙසේ නමුත් මේ මොහොතේ තිබෙන වැදගත්ම ප්‍රශ්නය වන්නේ සේවක ප්‍රේෂණ, තොරතුරු සන්නිවේදන සහ තාක්ෂණ ක්ෂේත්‍රයෙන් ලැබෙන ආදායම් සහ ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් වෙළෙඳ හිඟය ඉක්මවා ගොස් ගෙවුම් ශේෂයේ අතිරික්තයක් නිර්මාණය කරනු ඇත්ද යන්න යි.

සාරාංශය

ඉකුත් මාසයේ දී විදේශ සංචිත ඇමෙරිකානු ඩොලර් බිලියන තුනටත් අඩු අගයකට අඩු විය. මෙය ඉතාමත් අඩු අගයක් වන මෙය භයානක තත්ත්වයකි. මේ වසරේ ආනයන අවශ්‍යතා ද ඉතා ඉහළ බැවින් පවතින්නේ අවදානම් සහගත තත්ත්වයකි. මුදල් හුවමාරු සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලැබෙන ප්‍රදානය මේ කඩිනම් දුෂ්කරතාවලින් රටට තාවකාලික සහන සහ පිළියම් සපයනු ඇත. මේවා මේ අවස්ථාවේ අවශ්‍ය සහන/පහසුකම් වන අතර කෙසේ නමුත් මේවා විසඳුම් නොවේ. විදේශ මූල්‍යයේ තිබෙන ව්‍යුහගත අර්බුදවලට විසඳුම් අවශ්‍ය වේ.

නිගමනය

රටේ විදේශ මූල්‍යයේ තිබෙන ප්‍රශ්නයට තිබෙන ඇති එකම ප්‍රායෝගික විසඳුම වන්නේ අපනයන වැඩි කරමින් වෙළෙඳ හිඟය අඩු කිරීමත් සේවාවලින් ආදායම් උපයමින් ගෙවුම් ශේෂයේ අතිරික්තයක් ඇති කරගැනීමත් ය.

සන්ඩේ ටයිම්ස් පුවත්පතේ පළවූ ලිපියේ පරිවර්තනය

හර්ෂණ තුෂාර සිල්වා

හම්බන්තොට වරායේ තොග නාණ්ඩ හැසිරවීම් ඉහළට



හම්බන්තොට ජාත්‍යන්තර වරාය (HIP) විසින් මුද හරින ලද ඉහළතම තොග ප්‍රමාණය වාර්තා කරමින් මැතකදී ඉන්සි සිමෙන්ති සඳහා ගෙන ආ පිප්සම් තොග දිනකට මෙට්‍රික් ටොන් 24,000 බැගින් හසුරුවන ලදී.

ඉන්සි සිමෙන්ති සමාගමේ ප්‍රසම්පාදන හා සැපයුම්හි අධ්‍යක්ෂ තුසිත් ගුණවර්ණසූරිය මහතා පවසන්නේ මෙය ශ්‍රී ලංකාවේ වරායකට වේගය සහ කාර්යක්ෂමතාව අනුව හිමිවූ සුවිශේෂී ජයග්‍රහණයක් බවයි. ඒ මහතා මෙසේද පැවසීය. "ශ්‍රී ලංකාවේ අංක 1 සිමෙන්ති නිෂ්පාදන සමාගම ලෙස අප විශාල යාත්‍රාවලින් අමුද්‍රව්‍ය ආනයනය කරනවා. එම යාත්‍රා රටට පැමිණි පසු හම්බන්තොට ජාත්‍යන්තර වරාය සමූහය (HIPG) සහ හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝර්ට් සර්විසස් සමාගම (HIPS) , වේගයෙන් තොග මුදහැරීමේ කටයුතු සිදු කරනවා. වරාය මෙහෙයුම් වේගවත් වන තරමට අපට පමණක් නොව රටටත් වැඩි වාසියක් ලැබෙනු ඇත. මහද්‍වයත් යාත්‍රාව වරායේ රැඳී සිටින දින 2 1/2 සඳහා අප, රඳවා තබා ගැනීමේ හා ප්‍රමාද ගාස්තු ලෙස ඇමෙරිකානු ඩොලර් 75,000කට ආසන්න මුදලක් ගෙවයි. එබැවින්, අප මෙවර සිදු කළ ආකාරයට මෙන් දින දෙකහමාරකට කලින් මුදහැරීමේ කටයුතු නිමා කළ නිසා, සැලකිය යුතු ලෙස පිරිවැය ඉතිරි කර ගැනීමට අපට හැකි වුණා. එය අපගේ සමාගමට වාසියක් වන අතර රට සඳහාද විදේශ විනිමය සැලකිය යුතු ලෙස ඉතිරි කිරීමකි".

HCL ශ්‍රී ලංකා මධ්‍යස්ථානයට සිනමන් Life තෝරාගනී



කොළඹ නගරයේ අභිනවින පහසුකම් වලින් සමන්විත නවතම කාර්යාලයීය කුලුන වන Cinnamon Life ව්‍යාපෘති 'The Offices' තම ශ්‍රී ලංකා මධ්‍යස්ථානය ලෙස තෝරාගැනීමට, ලොව ප්‍රමුඛතම තාක්ෂණ සමාගමක් වන HCL Technologies තීරණය කර තිබේ.

ඒ අනුව එම සමාගම 'The Offices' හි කාර්යාල අවකාශ අතරින් සියයට 80ක ප්‍රමාණයක් භාවිත කරනු ඇත. ජාත්‍යන්තර සමාගමක් මේ ආකාරයක මෙරට A ශ්‍රේණියේ කාර්යාලයීය කුලුනක කාර්යාල අතරින් බහුතරය වෙන්කරවා ගත් ප්‍රථම අවස්ථාව මෙයයි.

මේ සඳහා වන ගිවිසුමට HCL Technologies සහ පෝන් කිල්ස් හෝල්ඩින්ස් (JKH) යන සමාගම් වල නියෝජිතයන් විසින් පසුගියදා අත්සන් තබන ලදී. මේ ඔස්සේ තවත් දේශීය හා ජාත්‍යන්තර සමාගම් රැසක් මෙම ව්‍යාපෘතිය වෙත ආකර්ෂණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එමෙන්ම ජාත්‍යන්තර සමාගමක් මේ ආකාරයට මෙරට තුළ තම ව්‍යාපාර කටයුතු පුළුල් කිරීමට සැලසුම් කිරීම, දකුණු ආසියාවේ ව්‍යාපාරික කේන්ද්‍රයක් බවට පත්වීමට කොළඹ නගරය සතු හැකියාව පිළිබිඳ මනා සාක්ෂියක් ලෙසද සැලකිය හැකි ය.

කොළඹ නගරයේ සුවිශේෂී ස්ථානයක පිහිටා තිබීම, නවීනතම පහසුකම් වලින් සමන්විතවීම සහ උසස් ප්‍රමිතිය සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමුකරමින් ඉදිකර තිබීම යනාදිය, Cinnamon Life ව්‍යාපෘතියේ The Offices තෝරාගැනීමට HCL සමාගම යොමුකරවූ ප්‍රධානතම සාධක ලෙස සැලකේ.

එමිරේට්ස් මඟින්ට නොමිලේ Expo නරඹන්න අවස්ථාවක්

කළාපයේ දැවැන්තම වෙළෙඳ ප්‍රදර්ශනයක් වන 2020 ඩුබායි Expo වෙළෙඳ ප්‍රදර්ශනයේ ප්‍රමුඛතම පාර්ශ්වකරුවා සහ නිල ගුවන් සමාගම ලෙස එමිරේට්ස් මෙම ප්‍රදර්ශනය නැරඹීමට සමාගමේ ගුවන් මඟින්ට සුවිශේෂී ප්‍රතිලාභයක් ඉදිරිපත් කර තිබේ.

මේ අනුව, මෙම වැඩසටහන පැවැත්වෙන 2021 ඔක්තෝම්බර් 01 වැනිදා සිට 2022 මාර්තු 31 වන දක්වා කාල සීමාව තුළදී ඕනෑම අවස්ථාවක ඩුබායි වෙත පැමිණෙන සහ ඩුබායි හරහා ගමන් කරන එමිරේට්ස් මඟින්ට ඔවුන්ගේ සියලුම ගුවන් ටිකට්පත් වලට නොමිලේ Emirates Expo Day Pass එකක් ලබාදීමට ගුවන් සමාගම කටයුතු කර ඇතැයි එම සමාගම සඳහන් කරයි.

එමිරේට්ස් සඳහන් කරන්නේ 2021 ඔක්තෝම්බර් 01 වැනිදා සිට 2022 මාර්තු 31 වැනිදා දක්වා ඩුබායි වෙත හෝ ඩුබායි හරහා ගමන් කරන සියලුම එමිරේට්ස් ගුවන් මඟින්ගේ ටිකට් පත් සඳහා මෙම විශේෂ දීමනාව ලබාදෙන බවයි. මීට අමතරව, චක්සත් අරාබි එමීර් රාජ්‍යයට පිටත සිට පැමිණෙන එක් දිගාවකට පමණක් ගමන් කරන ගුවන් මඟින් ඩුබායි වෙත පැමිණීමේදී හෝ ඩුබායි හි අවම රැඳී සිටීමේ කාලය සම්පූර්ණ කරමින් වෙනත් ගමනාන්ත වෙත ගමන් කිරීමේදී ත්‍යාගයක් ලෙස Expo Day Pass එකක් ප්‍රදානය කිරීමටද එමිරේට්ස් කටයුතු කර තිබේ.

ස්පාර්ක්ලින්ක් හතළිස් දෙවසරක විශිෂ්ටත්වය සමරයි

දශක හතරකට අධික කාලයක් පුරා මෙරට සංචාරක ක්ෂේත්‍රය තුළ විශිෂ්ට සහ කැපිපෙනෙන කාර්යභාරයක් සිදුකළ ස්පාර්ක්ලින්ක් ට්‍රැවල්ස් (Sparklink Travels) ආයතනය පසුගියදා සිය 42වැනි සංවත්සරය සමරනු ලැබිය. වර්ෂ 1979දී නිහාල් පෙරේරා මහතාගේ මූලිකත්වයෙන් පවුලේ ව්‍යාපාරයක් ලෙස ආරම්භ වූ Sparklink Travels අද දක්වාම ඒකාබද්ධතාව, සක්‍රියතා සහ ගුවන් සවාරි, නෞකා සවාරි සහ සංචාරවල විශිෂ්ටත්වය තුළින් සුවිශේෂී සේවාවක් සංචාරකයන්ට ලබාදීමට කැපවී සිටියි. එම සුවිශේෂත්වය හේතුවෙන් ප්‍රතිඵල සහතිකය ලත් සංචාර ආයතනයක් බවට පත්වීමට ද එම ආයතනයට හැකිවී තිබේ.

මෙරට සංචාරක කර්මාන්තය තුළ සිටින ප්‍රවීණ චරිතයක් වන නිහාල් පෙරේරා මහතා ලංකා සංචාරක මණ්ඩලයේ සංවර්ධන හා ප්‍රචාරණ අංශයේ අධ්‍යක්ෂවරයා ලෙස ද සේවය කළේය. ඔහු මේ වනවිට ප්‍රකී පෙරේරා සමඟ එක්ව ඕස්ට්‍රේලියාවේ සිට ස්පාර්ක්ලින්ක් ට්‍රැවල්ස් Australia ආයතනය ද මෙහෙයවනු ලබයි. ස්පාර්ක්ලින්ක් ට්‍රැවල්ස් සතු පළපුරුදු සහ වෘත්තීය කාර්යමණ්ඩලය වර්තමානයේදී සිය සංචාරක සේවා, කොල්ලුපිටිය, ලිබර්ටි ආර්කේඩ්හි පිහිටි සිය කාර්යාලයේ මෙන්ම දුරස්ථ වශයෙන් ද ක්‍රියාත්මක වෙමින් ලබාදෙන අතර, සඳුදා සිට සිකුරාදා දක්වා දූරකථනය ඔස්සේ ද ඔවුන්ගේ සේවා පිළිබඳ තොරතුරු ලබාගත හැක. මේ අතර කොරෝනා විසංගත තත්ත්වය හමුවේ අවලංගු වූ සංචාරවලට අදළව සංචාරකයන් විසින් ගෙවා තිබූ මුදල්වලින් රුපියල් මිලියන 10කට වැඩි ගණනක් නැවත ගෙවීමට ද සමාගම විසින් දැනටමත් පියවර ගෙන තිබේ. නැවතත් ජාත්‍යන්තර දේශසීමා විවෘත වීමත් සමඟ තම සුපුරුදු සේවා සංචාරකයන්ට ලබාදීමට ස්පාර්ක්ලින්ක් ට්‍රැවල්ස් සමාගම සූදානම්ව සිටියි.

ඛයලොග් ක්‍රීඩා අමාත්‍යාංශය සමඟ youth Can දියත් කරයි

ශ්‍රී ලාංකික තාරුණ්‍යයට තම කුසලතා ඔප් නැංවීමට මඟ පෙන්වීම හා සහයෝගය ලබා දීම අරමුණකර ගනිමින්, අන්තර්ජාතික තරුණ දිනයට සමගාමීව ඛයලොග් ආෂ්ආථා සමාගම තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය සමඟින් එක්ව Youth Can වැඩසටහන පසුගිය දා දියත් කළේය.

මෙම වැඩසටහන තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය හා ජාතික තරුණ සේවා සභාව සමඟින් එක්ව, මිනිස් බල හා රැකියා දෙපාර්තමේන්තුවේ, කුඩා ව්‍යවසාය සංවර්ධන අංශයේ සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව, සුවිශේෂී හැකියාවන් සහිත තරුණ තරුණියන්ට ඔවුන්ගේ කැමති ක්ෂේත්‍රවල ඉදිරියට යාමට අවශ්‍ය අවස්ථාව උදකර දෙයි. ඔවුන්ගේ සිහින සැබෑ කර ගැනීමට අවස්ථාව උදෙ වේ.

මෙම තුන් අවුරුදු වැඩසටහන වයස අවුරුදු 14

ත් 35 ත් අතර වයස් සීමාවන් තුළ සිටින තරුණ තරුණියන්ගේ හැකියාවන් සහ දක්ෂතාව ක්‍රීඩා, නව ව්‍යාපාර අදහස්, ශිල්ප කලා, මෝස්තර නිර්මාණකරණය, සූපවේදය සහ කෝපි චිත්‍රපට යන අංශ 6ක් ඔස්සේ තරඟකාරීව එළිදැක්වීම කෙරෙහි අවධානය යොමු කෙරේ. තෝරාගත් අයදුම්කරුවන් සඳහා වැඩමුළුව, අදළ මෙවලම් හා පුහුණුව ලබා දී, දැනුමින් සහ හැකියාවන්ගෙන් බලගැන්වීමත් සිදුවනු ඇත. ජාතික තරුණ සේවා සභාව, මිනිස්බල හා රැකියා දෙපාර්තමේන්තුව, කුඩා ව්‍යවසාය සංවර්ධන අංශය සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් පත්කළ ඒ ඒ ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගෙන් තේරීම් කමිටුව සමන්විත වනු ඇති අතර, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ තේරීම් සිදුවනු ඇත. මේ පිළිබඳව වැඩි විස්තර ලබා ගැනීම් සහ අයදුම්පත් යොමු කිරීම www.youthcan.lk කෘන වෙබ් අඩවිය ඔස්සේ සිදුකළ හැකිය.

සිංගර් වෙතින් අති නවීන ස්මාර්ට් බෝඩ්

සිංගර් විසින් ඩිජිටල් අධ්‍යාපනය සඳහා ස්මාර්ට්බෝඩ් නිෂ්පාදන පෙළක් වෙළඳපොළට හඳුන්වා දෙනු ලැබ ඇත. මාර්ගගත අධ්‍යාපනික කටයුතු සහ ව්‍යාපාරික රැස්වීම්/සම්මන්ත්‍රණ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම මෙහි මූලික අරමුණයි.

සිංගර්, දැනට ලොව නවීනතම LED තිර නිෂ්පාදනය කරන Skyworth සමාගමේ ස්මාර්ට්බෝඩ් නිෂ්පාදන පෙළක් හඳුන්වාදී ඇත. පරිගණකය, රූපවාහිනිය, ප්‍රොජෙක්ටරය සහ වයිට්බෝඩ් සතු සියලු විශේෂාංග වලින් සමන්විත වන ලෙස මෙම ස්මාර්ට්බෝඩ් නිර්මාණය කරඇත.



කාර්යන් කිහිපයක් එකවර කරගත හැකි මෙම ස්මාර්ට්බෝඩ් වර්තමාන ඔන්ලයින් අධ්‍යාපන කටයුතු සඳහා පවතින හොඳම විකල්පය බව එම සමාගම කියයි.

මෙය අඟල් 55, 65 සහ 75 ලෙස ප්‍රමාණයන් තුනකින් සහ ඇන්ඩ්‍රොයිඩ් හෝ වින්ඩෝස් 10 යන මෙහෙයුම් පද්ධති වලින් ලබාගත හැක. මෙම ස්මාර්ට්බෝඩ් නිෂ්පාදන පෙළ මඟින් වයිට්බෝඩ් හි සටහන් ලිවීම, අනෙක් පාර්ශ්වයට නැරඹිය හැකිලෙස වීඩියෝ සහ තිරය පෙන්විය හැකිවීම වැනි ප්‍රතිලාභ රැසක් හිමිකරදෙයි. ගුරුවරුන්ට ඉගැන්වීමට අවශ්‍ය දෑ මෙහි ගබඩා කර තබාගත හැකි බැවින් ඉදිරි ඉගැන්වීම් කටයුතු වලදී ඒවා පහසුවෙන් භාවිත කළ හැකිය.

ඩබ්ලිව් ආයුර්වේද රෝහලෙන් පොත් බෙදාදීමක්

**ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයුර්වේද රෝහලක් වන ඩබ්ලිව් ආයුර්වේද රෝහල සිය ආයතනික සමාජ වගකීම මනාව හඳුනා ගනිමින් පාසල් සහ දහම් පාසල් දරුවන් වෙනුවෙන් පොත් පත් බෙදා දෙමින් සමාජ සත්කාර රැසක් දියත් කළේය. එහි සුවිශේෂ පියවරක් සනිටුහන් කරමින් පසුගියදා මැදිරිගිරිය පෙ/දමෙය්පුර ප්‍රාථමික විද්‍යාලයට, මොරටුව ශ්‍රී ආරියවංශ දහම් පාස

කතරගමට ෆයිසර් එන්නත

කොරෝනා රෝගීන් රැසක් වාර්තා වූ කතරගම ප්‍රදේශයේ ජනයා සඳහා කොරෝනා ෆයිසර් එන්නත ලබාදීම කතරගම දේවාලයේ දාන ශාලාවේදී සිදු කරන ලදී.

කතරගම ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ 14796 ක පිරිසක් සඳහා වයස අවුරුදු 18 ඉහළ සෑම දෙනා වෙත මෙම එන්නත දීම සිදු කිරීමට නියමිතය.

ශ්‍රී ලංකා යුද හමුදා වෛද්‍ය බළකායේ නිලධාරීන් විසින් මෙම එන්නත ලබාදීම සිදු කරන ලදී.

මෙම අවස්ථාව සඳහා රුහුණු මාගම්පත්තුවේ ප්‍රධාන අධිකරණ සංඝනායක කතරගම ශ්‍රී අභිනවාරාම විහාරාධිපති ශාස්ත්‍රපති කප්පුගම සරණතිස්ස නිමියන් ආගමික වතාවත් සිදු කළ අතර කතරගම දේවාලයේ බස්නායක නිලමේ ඩිෂන් ගුණසේකර, කතරගම ප්‍රදේශීය සභාවේ සභාපති චානක අමිල රංගන යන මහත්වරු මෙම අවස්ථාව ට එක්වූහ.

(කතරගම කේ.ඩී. දේවප්‍රිය)

රාජ්‍ය ඇමැති විදුර ගාලු කොටුව බලන්න ගිහින්

අමාත්‍යවරයා ගාල්ල අධිකරණ සංකීර්ණය ඉදිරිපිට ඇති පැරණි අම්බලම නිරීක්ෂණය කළ අයුරු

(උණවටුන ඩී.ජී. සුගතපාල)

ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය විදුර වික්‍රමනායක මහතා ඉකුත් 13 වැනිදා ගාල්ල කොටුවේ සංචාරයක නිරතවූයේය.

එහිදී රාජ්‍ය අමාත්‍යවරයා ගාලු කොටුවේ සංවර්ධන කටයුතු පිළිබඳ ගාලු උරුමය පදනමේ නිලධාරීන් සමග සාකච්ඡා කිරීමෙන් පසු කොටුවේ සංචාරයකද නිරතවිය.

කොටුවේ පිහිටි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ දකුණු පළාත් කාර්යාලයටද පැමිණි ඒ මහතා එහි අඩු පාඩු සොයා බැලුවේය.

මෙම අවස්ථාවට අමාත්‍යාංශයේ ලේකම් කේ.ඒ.ඩී.ආර්. නිශාන්ති ජයසිංහ මහත්මියද එක්ව සිටියාය.

ජීවිතේ ගැටගහගන්න අමාරු කාලයක නගරාධිපතිනිය අපේ බඩට ගහනවා

තාවකාලික කඩ ඉවත්කිරීමෙන් වැලිගම ජංගම වෙළෙන්දෝ කබලෙන් ළිපට

වෙළෙඳුන්ගෙන් දෝස්මුරයක්

වෙරළ පාරේ වෙළෙඳමට ඉඩ ලබාදී නිබෙනවා

නගර සභාපතිනිය

(කඹුරුගමුව තරංග ගුණරත්න)

වැලිගම නගරයේ පවත්වාගෙන ගිය ජංගම වෙළෙඳසල් ඉවත් කිරීමට වැලිගම නගර සභාව මගින් පියවර ගැනීම නිසා ජංගම වෙළෙඳමේ යෙදුණු ව්‍යාපාරිකයන්ට ජීවන උපාය මාර්ග අහිමිවීමෙන් අසරණ වී ඇතැයි එම ව්‍යාපාරිකයෝ පෙන්වා දෙති.

වැලිගම නගරය කේන්ද්‍රකරගෙන ජංගම වෙළෙඳම යටතේ පවත්වාගෙන ගිය මුදවපු කිරි හට්ටි වෙළෙඳම කඩල කරත්ත, එළවළු වෙළෙඳම, පලතුරු වෙළෙඳම, කෑම පාර්සල් අලෙවි කිරීම ඇතුළු බොහොමයක් වසර ගණනාවක් තිස්සේ පවත්වාගෙන ගිය බවත් දින කිහිපයක සිට වැලිගම නගර සභාව මගින් ජංගම වෙළෙඳමේ යෙදුණු පිරිස එම ස්ථානවලින් ඉවත් කිරීමට පියවර ගැනීම නිසා ජංගම වෙළෙඳමේ යෙදුණු විශාල පිරිසකට ජීවත්වීමේ ආදයම් මාර්ග කඩා වැටී ඇතැයි ඔවුහු පෙන්වා දෙති

මෙහිදී මුදවපු කිරි හට්ටි වෙළඳමේ යෙදෙන කේ.ඩබ්ලිව්. ලලිතා මිය (48)

වැලිගම නගරයේ මාර ගහයට ලොරි රථයක තබාගෙන මුදවපු කිරි විකුණන්න පටන් අරගෙන වසර තිස් අටක් පමණ වෙනවා. දැන් දින කිහිපයක් තිස්සේ වැලිගම නගර සභාවට පත් වෙච්ච නව නගරාධිපති තුමිය විසින් ජංගම වෙළෙඳමට බාධා කරනවා, අඩුම තරමේ අපි රජයෙන් කියලා සමෘද්ධි දීමනාවවත් වෙනත් දීමනාවක් අරගෙන නෑ. කාටවත් අත නොපා ජීවත් වෙනවා. අද කාලයේ කීයක් හරි හොයාගන්න එක විශාල අභියෝගයක්. එහෙම කාලෙකදි තමයි වැලිගම නගර සභාව විසින් ජංගම වෙළෙඳමේ යෙදුණු පිරිස ඉවත් කරන්න කටයුතු කරන්නේ.

මේ රෝද හතර උඩ කරන ජංගම වෙළඳම කාටවත් කරදරයක් නෑ නේද? අපි බලධාරීන්ගෙන් ඉල්ලා සිටින්නේ අපි වෙනුවෙන් සාධාරණයක් කරන්න කියා ඉල්ලා සිටිනවා.

ඒ.එච්. අසෝකමාලා මහත්මිය (39) මෙසේ කීවාය.

ජංගම වෙළෙඳම ලෙස පලතුරු තමයි කරන්නේ. දැනට අවුරුදු හතරක් පමණ වෙනවා. මෙයින් ලැබෙන සොච්චමෙන් තමයි දරු පවුලක් ජීවත් වන්නේ.

වැලිගම නගර සභාවේ නගරාධිපතිතුමිය පත් වෙලා දින තුනයි. අපිට මේ ජංගම වෙළෙඳම කරන්න ඉඩ දෙන්නෙ නෑ, නගර අලංකාරයට අපේ කිසිදු බාධාවක් වුණේ නෑ. අඩුම තරමෙන් කුණු කාලක්වත් අපි දලා යන්නේ නෑ. හැමදාමත් අපි පිරිසිදු කරල කුණු ටික ගෙදර අරගෙන යනවා. එහෙමයි අපි මෙතන පිරිසුදුව තියා ගන්නේ.

ඒත් අපිට රැකියාව නැති වුණා. කබලෙන් ළිපට වැටුනා වගේ වැඩක් වුණේ. නගර සභාව කියන විදියට වෙරළ මාර්ගයේ මිනිස්සු ඇත්තෙ නෑ, කාට වෙළෙඳමක් කරන්නද? දැන් ඉතින් වෙලා තියෙන්නෙ මුහුදු දිහා බලාගෙන ඉන්න.

එ.එච් අසෝකමාලා

ප්‍රභාත් රංගන

කේ.ඩබ්ලිව් ලලිතා

අපි හිටපු තැන නගර සභාවට අයිතියක් නෑ. එතැන අයිතිය දුම්රිය දෙපාර්තමේන්තුවට තමයි. කමක් නෑ, අපි කියන්නේ දරාගන්න පුළුවන් විදියට පුංචි මුදලක් හරි අය කරලා අපිට වෙළඳම කරන්න ඉඩ දෙන්න කියලා යැයි කීවාය.

කඩල කරත්ත හිමියකු වන ප්‍රභාත් රංගන මහතා (46) මෙසේ කීය.

අවුරුදු පහළොවක් විතර වෙනවා කඩල කරත්ත වෙළඳමට. (11) රාත්‍රී හතයි තිහට පමණ නගර සභාවේ නිලධාරීන් හා නගරාධිපති පැමිණ මගේ කඩල කරත්තය රැගෙන යන්න හැදුවා. අඩුම තරමින් අපිට ලිඛිතව හෝ වාචිකව පෙර දැනුම් දීමක් කරල තිබුණෙ නැහැ. හරිම අසාධාරණයි මේ වැඩ. ඇත්තම කියනවා නම් වැලිගම නගර සභාව හිටපු නගරාධිපතිවරු ලෙස මොහොමඩ් මහතා, අරින්ද සනත් කුමාර මහතා, රෙහාන් ජයවික්‍රම මහතා ආදී බොහෝ දෙනෙක් නගරාධිපතිධුරය දැරුවා. ඒ අය ජංගම වෙළඳමට කවදාවත් බාධා කළේ නෑ. අපි ඉල්ලා සිටින්නේ අපිට ජීවත්වෙන්න තිබුණු ආදයම නැති කරන්න එපා, අපි අහිංසක මිනිස්සු. මේ පිළිබඳව බලධාරීන්ගේ අවධානය යොමුකරලා සහනයක් දෙන්න යැයි කීය.

වැලිගම නගර සභාවේ නව නගර සභාපතිනිය යමුනා කාන්ති පුංචිහේවා මහත්මිය (ව.ජ.ප.) මෙසේ පැවසීය.

ජංගම වෙළෙඳමේ යෙදෙන ව්‍යාපාරිකයන්ට ජංගම වෙළෙඳම ඉවත්කර ගැනීම සඳහා වැලිගම නගර සභාව මගින් නිවේදන මගින් සහ වාචිකව දැනුවත් කිරීම් කරල තිබුණා. ඒ අනුව තමයි කටයුතු කළේ. විශේෂයෙන්ම වැලිගම නගරයේ කඩ නිමියන් සහ නගරයට පැමිණෙන ජනතාවගෙන් පැමිණිලි ලැබී තිබුණා. එම කරුණු කාරණා මත පසුගිය නගරාධිපතිතුමාගේ පාලන කාලයේදී සභා යෝජනාවක් අනුව සභා සම්මත වුණා. ජංගම වෙළෙඳම ඉවත් කිරීම සඳහා ඒ අනුව තමයි කටයුතු කළේ. කෙසේ නමුත් මෙම ව්‍යාපාරිකයන්ට අවස්ථාව ලබා දිය යුතු නිසා තාවකාලිකව නව ගාලු පාරේ (වෙරළ මාර්ගයේ) වෙළෙඳමී කිරීමට අවස්ථාව ලබා දී තිබෙනවා.

වසර 35 ක සමුප සේවයෙන් ඉසිඹු ලබා....



බලපිටිය විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපති ඩබ්ලිව්. කුසුම්සිරි ද සිල්වා මහතා විශ්‍රාමික සාමාන්‍යාධිකාරිණී ඩී. පුෂ්පානි ද සොයිසා මහත්මියට මුදල් තිළිණයක් ප්‍රදානය කළ අයුරුයි මේ.

(කරන්දෙණිය එම්. සුසිල් ප්‍රියන්ත)

ලිපිකාරිණියක් ලෙස බලපිටිය විවිධ සේවා සමුපකාර සමිතියට බැඳී පොත් තබන්නා, ගණකාධිකාරි හා අවසානයේදී එම සමුපකාර සමිතියේ ඉහළම තනතුර වන සාමාන්‍යාධිකාරි දක්වා උසස්වීම් ලබා වසර 35කට වැඩි කාලයක් සමුපකාර සේවයට සිය දිවිය කැප කොට විශ්‍රාම ගිය ඩී. පුෂ්පානි ද සොයිසා මහත්මියට උපහාර පිදීමේ උත්සවයක් සභාපති ඩබ්ලිව්. කුසුම්සිරි ද සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් බලපිටිය විවිධ සේවා සමුපකාර සමිති දෙමහල් ශ්‍රවණාගාරයේදී ඉකුත්දා පැවැත්විණි.

බලපිටිය විවිධ සේවා සමුපකාර සමිතියේ උපසභාපති පී. සුසිල් තිලකරත්න මහතා ඇතුළු එම සමුපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය හා වත්මන් සාමාන්‍යාධිකාරිණී අයේෂා දුල්හානි, බැංකු සේවා නිලධාරිණී චන්දිකා දමයන්ති යන මහත්මීන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට සහභාගී වූහ.

තලල්ල වෙල්යායේ ගැටලු පරීක්ෂාවට

(දෙවිනුවර දමිසිරි කරුණානායක)

තලල්ල කළපුව හා මෝය කට නුදුරින් ඇති තලල්ල මහා වෙල්යායට සම්බන්ධ වාරිමාර්ග ගැටලු, කෘෂිකාර්මික ගැටලු සහ ඒ පිළිබඳ පැමිණිලි ගැන ස්ථාන පරීක්ෂාවක් සහිතව නිරීක්ෂණය කිරීමට ඉකුත් දා දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තලල්ල ගොවිජන සේවා කාර්යාලයේ නිලධාරීහු සහ කෘෂිකර්ම හා වාරිමාර්ග නිලධාරීහු පැමිණියහ.

එක් පසෙකින් වෙල්යායත්, අනෙක් පසින් පැරණි කළපු භූමියත් ඒ අතරින් දිවෙන මහාමාර්ගය හා කළපු ඇළත් සහිත සුවිශේෂී පරිසර කලාපයක් මෙහි පවතී. කළපු ඇළේ ජලය ගලා යාමට බාධා ඇතිවන පරිදි අනවසර ගොඩ කිරීම් සිදුවීම, හැම වසරකම මහවැලි තට්ටුවකින් මහා සයුරට සම්බන්ධ මෝය කට සිරවීම, අධික වැසි සමයේ ඉක්මනින් ජලය නොබැසීම හේතුවෙන් කුඹුරු යට වීම, කරදිය ගේට්ටුව අවහිර වීම ආදී ගැටලු රැසක් මෙහි පවතින බව එහිදී හෙළි විය.

මහාමාර්ග, වාරිමාර්ග, පරිසර, කෘෂිකර්ම, වෙරළ සංරක්ෂණ යන රාජ්‍ය ආයතනවලට අයත් භූමි භාගයන් වසර ගණනාවක් තිස්සේ මෙහි අවභාවිතයට ලක්වෙමින් පවතී. දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් ඩී.ජී. ලියනපටබැඳි, ගොවිජන සංවර්ධන කාර්යාලයේ කාර්යභාර නිලධාරිනී ජානකී රත්නායක යන මහත්ම මහත්මීන් ඇතුළු පිරිසක් එම ගැටලු නිරීක්ෂණයට ලක්කළහ.

තිස්සමහාරාමයට අලුත් ප්‍රා.ලේකම්වරියක්

තිස්සමහාරාම නව ප්‍රාදේශීය ලේකම්වරිය ලෙස චන්දිමා මනම්පේරි මහත්මිය ඉකුත් (11) වැඩ බාරගත්තාය.

මෙම අවස්ථාවට අතිරේක දිස්ත්‍රික් ලේකම් සුනෙත් ලෝචන, අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම්වරිය, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම්තුමා, තිස්සමහාරාම සහකාර ප්‍රාදේශීය ලේකම්වරිය ඇතුළු කාර්ය මණ්ඩලය මෙම අවස්ථාවට එක්ව සිටියහ.

චන්දිමා මනම්පේරි මහත්මිය 2013.05.02 දින ශ්‍රී ලංකා පරිපාලන සේවයට එක්වූ අතර අනුරාධපුර දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ ලෙස 2017 වසර දක්වා රාජකාරී කර ඇත.

පසුව අඟුණුකොළපැලැස්ස සහකාර ප්‍රාදේශීය ලේකම් ලෙස 2021 වර්ෂය දක්වා රාජකාරී කටයුතු කර ඇත.

ඇඹිලිපිටිය, මොදරවාන විද්‍යාලයෙන් හා බෙලිඅත්ත ධම්මපාල බාලිකා විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් උපාධිය ලබා පසුව, කෘෂිකර්ම තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ විශේෂ උපාධියත්, රුහුණ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධියත් නිමිකර ගෙන ඇත.

(වලස්මුල්ල - තිලක් මනම්පේරි)

මදුරුවන් බෝකළ නිවෙස් හිමිට දඩ

(දෙයියන්දර ජයන්ත ජයවර්ධන)

සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ අවවාද පිළිනොපදිමින් මහජන ජීවිතවලට අනතුරුදායක ලෙස තම නිවෙස අවට පරිසරය ඉතාම අපිරිසුදු ලෙස යෝගට් කෝප්ප පොලිතීන් ඇතුළු අපද්‍රව්‍ය තුළ ඩෙංගු මදුරුවන් බෝවන ආකාරයට පවත්වාගෙන යාම පිළිබඳව අතිරේක මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා තිබූ නඩුවක ආරම්භයේදීම වරදකරු බවට පිළිගත් නිවෙස් හිමියකුට මාතර අතිරේක මහේස්ත්‍රාත් අතිරේක දිසා විනිසුරු සමන් ඩී.කේ. පරණ ලියනගේ මහතා රුපියල් එක් දහස් පන්සියයක දඩයක් ගෙවන ලෙසට නියෝග කළේය.

දඩ ගෙවීමට නියම වූයේ තිහගොඩ කිරල ගහ වත්ත වැල්ලවත්ත ආරච්චිගේ ගුණසිංහ යන අයටය.

පැමිණිල්ල වෙනුවෙන් තිහගොඩ මහජන සෞඛ්‍ය පරීක්ෂක ආර්.එස්. රත්නායක මහතා සමග පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක එල්.ජී.එල්. පුෂ්ප කුමාර, සංවර්ධන නිලධාරී එ.එම්.ටී. වඩුගේ යන මහත්වරු පෙනී සිටියහ.

නෙළුව-නියාගම රෝහල්වල පහසුකම් නංවන්න හදයි

(නාගොඩ හේමපාල ලියනගේ)

හිනිදුම මැතිවරණ කොට්ඨාසයේ නෙළුව සහ නියාගම රෝහල්වල පහසුකම් ඉහළ නැංවීමට පියවර ගැනේ.

ඒ අනුව නියාගම රෝහල සඳහා නවවාට්ටු සංකීර්ණයක් සහ හදිසි ප්‍රතිකාර ඒකකය සඳහා නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කටයුතු කෙරේ. මේ සඳහා වැයකෙරෙන මුදල රුපියල් ලක්ෂ 180 කි.

මේ අතර නෙළුව රෝහල සඳහාද දෙමහල් හදිසි ප්‍රතිකාර ඒකකයක් ඉදිකිරීම සඳහාද රුපියල් ලක්ෂ 90 වෙන්කරදී ඇතැයි ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සම්පත් අතුකෝරළ මහතා පැවසීය.

කාබනික පොහොර හදන දෙවිනුවර ගොවීන් 230 ක් හඳුනාගනී

(දෙවිනුවර දමිසිරි කරුණානායක)

දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාබනික පොහොර නිෂ්පාදනය කරන ගොවීන් 230ක් මේ වනවිට හඳුනාගෙන ඇතැයි ගොවිජන සංවර්ධන නිලධාරී ජානකී රත්නායක මහත්මිය දෙවිනුවර ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු රැස්වීමේදී පැවසුවාය.

ඒ අනුව තමන්ගේ වගාවන්ට පමණක් පොහොර නිෂ්පාදනය කරන ගොවීන් 150ක්ද, සුළු පරිමාණ පොහොර නිෂ්පාදකයන් 72ක්ද, මහා පරිමාණ පොහොර නිපැයුම්කරුවන් 7ක්ද කොට්ඨාසය තුළ සිටී. එම ගොවීන් ලියාපදිංචිය සඳහා කටයුතු යොදා තිබේ. කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය පිළිබඳ දැනුවත් කිරීම සහ පුහුණුව මේ වනවිට සිදුකරගෙන යයි.

පරිසර හිතකාමී පොහොර නිෂ්පාදනය කරන නිෂ්පාදකයන්ට ඒ සඳහා රාජ්‍ය ආයතන හතරක් (කෘෂි සහ පොහොර) සම්බන්ධ වී තිබිණි. ප්‍රාදේශීය කෘෂි කමිටුව පැවතියේ දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් ඩී.පී. ලියන පටබැඳි මහත්මියගේ ප්‍රධානත්වයෙනි.

අම්බලන්තොට මාර්ග 55 ක් කොන්ක්‍රීට් ගල් අතුරන්න යයි

(අම්බලන්තොට විශේෂ ඩී.ජී. ජයසුන්දර)

අම්බලන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ග්‍රාම සේවා වසම් 55 ක මාර්ග 55ක් කොන්ක්‍රීට් ගල් ඇල්ලීම සඳහා රුපියල් මිලියන 110ක් ලැබී ඇතැයි එම සභාවේ එම්.ආර්.පී. දර්ශන සංජීව මහතා පැවසීය.

මෙහිදී එක් මාර්ගයක් සඳහා රුපියල් ලක්ෂ 20 බැගින් වෙන්කර ඇති අතර මේ සඳහා ප්‍රතිපාදන දී ඇත්තේ ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයෙනි.

සණස ව්‍යාපාරය ජාත්‍යන්තර සමූපකාර දිනය සමරයි

ලොව පුරා ව්‍යාප්තව පවතින ප්‍රමුඛතම සමාජ සුබසාධන ව්‍යාපාරයක් වන සමූපකාර ව්‍යාපාරය සිය 99 වැනි සංවත්සරය පසුගියදා උත්සවාකාරයෙන් සැමරූ අතර ඊට සමගාමීව සණස සමිති, සණස ලයිෆ් ඉන්ෂුවරන්ස්, සණස ජෙනරල් ඉන්ෂුවරන්ස්, සණස සංවර්ධන බැංකුව ඇතුළු මෙරට සණස සමූහ ව්‍යාපාරයට අයත් ආයතනද, ජාත්‍යන්තර සමූපකාර දිනය අභිමානවත් ලෙස සැමරිය.

'එක්වී මනාව යළි ගොඩ නැගෙමු' යන තේමාව ඔස්සේ මෙවර ජාත්‍යන්තර සමූපකාර දිනය පැවැත්විණි. රටවල් 112ක් ජාත්‍යන්තර සමූපකාර සන්ධානයේ සාමාජිකත්වය ලබා ඇත. කාර්මික විප්ලවය සමග ඇති වුණ සාමාජීය සහ ආර්ථික වෙනස්කම් සමග පීඩනයට පත් වුණ ගොවියා සහ කම්කරුවා නගා සිටුවීමේ අරමුණින් සමූපකාර ව්‍යාපාරය මූලිකව අරඹන ලදී. 1923දී ප්‍රථම වරට ජාත්‍යන්තර සමූපකාර දිනය සැමරීමට තීරණය කරන ලදී. ඒ අනුව සෑම වසරකම ජූලි මස පළමු



වැනි සෙනසුරාදා ජාත්‍යන්තර සමූපකාර දිනය ලෙස නම් විය.

ආචාර්ය පී.ඒ. කිරිවන්දෙණිය මහතාගේ මූලිකත්වයෙන් ඇරැඹුණු සණස ව්‍යාපාරය සාමාජිකයන් ලක්ෂ 30කට ආසන්න ගණනකින් සමන්විත වන අතර සණස ප්‍රාථමික, දිස්ත්‍රික්, ජාතික සහ ජාත්‍යන්තර ලෙස මට්ටම් කිහිපයකින් ක්‍රියාත්මක වේ. එහි ප්‍රාථමික මට්ටමේ මූලික කාර්යයන් වන්නේ සාමාජිකයන්ගේ සකසුරුවම් බව වර්ධනය කිරීම, ආර්ථික වර්ධනයට මූල්‍ය සම්පත් සැපයීම, සාමාජිකයන්ට අධ්‍යාපනය සැපයීම ආදියයි. "සමූපකාර ව්‍යාපාරය නිර්මාණය වූණේ ලෝකයේ අර්බුද පවතින අවස්ථාවක. එනිසා ඉතාම අර්බුදකාරී අවස්ථාවල ප්‍රමුඛ බලපෑමක් කරන්න සමත් ශක්තිමත් ව්‍යාපාරයක් ලෙස සමූපකාර ව්‍යාපාරය සෑම විටම ක්‍රියාත්මක වුණා. වර්තමන් කොරෝනා අර්බුදය ඇති කළ ගැටලු විසඳ ගෙන ජන ජීවිත ජය ගන්න අවශ්‍ය මඟ පෙන්වීම සිදු කරන්න අප සූදානම්." සණස නිර්මාතෘ ආචාර්ය පී.ඒ. කිරිවන්දෙණිය මහතා පැවසීය.

සංචිත අර්බුදයට පිළියමක්

ඇමෙරිකානු ඩොලර් බිලියනයක විදේශ ණය නැවත ගෙවීමත් සමඟ ආණ්ඩුව තුළත් රට තුළත් ඒ සම්බන්ධයෙන් කතාබහක් ඇති විය. එම ණය මුදල ගෙවීමට නියමිතව තිබුණේ ජූලි 27 වැනිදා වන අතර ඊට දිනකට පෙර එය ගෙවා දැමීමට ආණ්ඩුවට හැකියාව ලැබිණි. ඒ අනුව ණය මඟ නොහැර නියමිත දිනට ගෙවීමේ මෙරට වාර්තාව ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යෑමට මේ ආණ්ඩුව ද සමත් විය. මේත් සමඟ රටේ විදේශ මූල්‍යයේ තිබෙන අවදානම් තත්ත්වය විසඳූ ගනු ඇතැයි විශ්වාසය ද ඇති වී තිබේ. විදේශ සංචිත කඩිනමින් නැවත පුරවා ගනිමින් දීර්ඝකාලීනව විදෙස් සංචිත ශක්තිමත් කරගන්නේ කෙසේ ද?

සංචිත නැවත පුරවා ගන්නේ කෙසේ ද?

ඇමෙරිකානු ඩොලර් බිලියන තුනකටත් අඩු අගයකට පහත වැටී තිබෙන විදේශ සංචිත ප්‍රමාණය මේ වසර අවසන් වන විටදී සෑහීමකට පත්වීමට හැකි අගයකට ගෙන ඒමට හැකියාව ලැබෙනු ඇතැයි ආණ්ඩුව විශ්වාස කරයි. මිත්‍ර රටවල් සමඟ මුදල් හුවමාරු (ස්වැප්)වලට එළැඹීමටත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රධාන සහ මේ වසරේ ඉදිරි මාසවලදී සේවාවලින් ඉහළ ආදායම් ලබාගත හැකි වනු ඇති බවටත් ආණ්ඩුව බලාපොරොත්තු තබා ඇත.

කෙසේ නමුත් විදේශ සංචිතවල තිබෙන මෙම භයානක සහ අස්ථිර ස්වභාවය මේ වසර අවසානයේදීත් පවතිනු ඇති බවත් ලබන වසරේ දී මෙම තත්ත්වය තවදුරටත් උග්‍ර වනු ඇති බවටත් විශ්ලේෂකයෝ/ විශේෂඥයෝ පෙන්වාදෙති. ලබන වසරේ දී තවදුරටත් විදේශ ණය ගෙවීම් කිරීමට තිබෙන බැවින් සහ ආනයන වියදම් වැඩිවීමත් යන කරුණු මුල් කරගනිමින් මේ තත්ත්වය උග්‍ර වනු ඇතැයි ඔවුහු පෙන්වාදෙති.

මුදල් හුවමාරු (ස්වැප්)

ඉන්දියාව සහ බංග්ලාදේශය සමඟ මුදල් හුවමාරු පහසුකම් තුළින් සහ චීනයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 150ක යුවාන් ණය පහසුකම් ලැබීමට නියමිත අතර මේවා මඟින් විදේශ සංචිත ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් (එස්.ඩී.ආර්./ ජාත්‍යන්තර සංචිත වත්කම්) යටතේ මෙරටට ලැබීමට නියමිත ඇමෙරිකානු ඩොලර් මිලියන 780ක මුදල ද විදෙස් සංචිත ඉහළ යෑමට උපකාරී වනු ඇතැයි අපේක්ෂිත ය.

මුදල් හුවමාරු යනු සංචිත ඉහළ දමන තාවකාලික පහසුකම් වන අතර එම මුදල් නැවත ගෙවිය යුතු වේ. චීනයෙන් ලැබෙන ණය පහසුකම චීනයෙන් ආනයනය කිරීමට උපකාරී වනු ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලැබෙන මුදල ප්‍රදානයකි.

ඉන්දියාවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක් ද බංග්ලාදේශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 250ක් ද වශයෙන් මුදල් හුවමාරු පහසුකම් ලැබීමට නියමිත ය. මේවා කෙටිකාලීන පහසුකම් වන අතර අවිනිශ්චිත තත්ත්වයක තිබේ. චීනයෙන් ලැබෙන යුවාන් ණය පහසුකම ප්‍රයෝජනවත් වන්නේ චීනයෙන් භාණ්ඩ මිලදී ගැනීමට පමණි.

ප්‍රයෝජනවත් සහන

මුදල් හුවමාරු, ණය සහ අනෙකුත් මූල්‍ය පහසුකම් සියල්ල සහන වන නමුත් ඒවා විසඳුම් නොවේ. කෙසේ නමුත් මේවා දැනට විදේශ මූල්‍යයේ තිබෙන අර්බුදකාරී තත්ත්වය විසඳගැනීමට ප්‍රයෝජනවත් වේ. කෙසේ නමුත් මේවා ප්‍රශ්නයට විසඳුම් නොවේ.

විසඳුම්

දැඩි ආනයන සීමා පනවමින් වෙළෙඳ හිඟය අඩු කරගැනීම අත්‍යවශ්‍ය වේ. වෙළෙඳ භාණ්ඩ අපනයන ආදායම වැඩි කිරීමත් සේවාවලින් ආදායම් වැඩි කරගැනීමත් රටේ විදේශ මූල්‍යයේ තිබෙන අර්බුදකාරී තත්ත්වය පාලනය කරගැනීමට උපකාරී වේ. දැනට අපේක්ෂිත බොහෝ අරමුදල්/ පහසුකම් කෙටිකාලීන සහන පියවර ය.

සරල සත්‍යය සම් රට විදේශ විනිමය උපයාගත්තේ ආනයන මත වියදම් කිරීමෙන් පසු ඉතිරි වන මුදලිනි. කෙටියෙන්ම සඳහන් කරන්නේ නම් වෙළෙඳ හිඟය අඩු කරගැනීමට පියවර ගත යුතු ය. හැකියාවක් ඇති නම් 2019 වසරේ දී මෙන් ගෙවුම් ශේෂයේ අතිරික්තයක් උපයාගත යුතු ය. එම අවස්ථාවේදී වෙළෙඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන අටක් වූ අතර සේවාවලින් සහ ප්‍රාග්ධන ගලාඒම්වලින් එය පියවා ගැනීමට හැකියාව ලැබිණි.

ඉකුත් වසරේ දැඩි ආනයන සීමා පනවමින් ආනයන අඩු කරගැනීමටත් වෙළෙඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන හයක් දක්වා අඩු වුවත් ගෙවුම් ශේෂයේ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන 2.3ක් විය.

ඉහළ ආදායම්

මේ වසරේ සිවුවැනි කාර්තුවේ දී ප්‍රේෂණ, තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවාවලින් සහ සංචාරක කර්මාන්තයෙන් ලැබෙන ආදායම් ඉහළ යනු ඇතැයි අපේක්ෂිත ය. එමඟින් සංචිත ප්‍රමාණවත් ප්‍රමාණයට වැඩි වනු ඇතැයි අපේක්ෂිත ය. ඉහළ වටිනාකමකින් සමන්විත මැණික් සොයාගැනීම තවත් වාසියකි. ඒවා ඇමෙරිකානු ඩොලර් මිලියන 100ත් 200ත් අතර වනු ඇතැයි ගණන් බලා ඇත. මැණික්, ඒවායේ අයිතිකරුවන්ට වාසියක් වුවද රටේ විදේශ සංචිතවලට නම් එතරම් වටිනාකමක් නැත. අප සිටින්නේ දැඩි අර්බුදයක ය. එබැවින් මහ මුහුදකට

ආචාර්ය
නිමල් සඳරත්න PhD

වතුරු බිංදු කිහිපයක් දමන්නාක් මෙන් මේ මැණික් අපේ දුර්වල සංචිතවලට එක් කළ හැකි ය. කෙසේ නමුත් මේ මැණික්වල වටිනාකම අඩු බවද මේ වනවිට දැනගන්නට ලැබේ. ඉහත කී මේ ගලාඒම් මඟින් මේ වසර අග වනවිට විදෙස් සංචිත ඉහළ යනු ඇතැයි අපේක්ෂිත ය.

අතීත අත්දැකීම්

රටේ වෙළෙඳ ගිණුමේ අතිරික්තයක් පැවැතියේ වසර හතරක් හෝ පහක් පමණි. ව්‍යුහගත ගැටලු තිබෙන බව එයින් ඉතා හොඳින් පැහැදිලි ය. අවසාන වරට වෙළෙඳ හිඟයේ අතිරික්තයක් වාර්තා වූයේ මීට වසර 44කට පෙර එනම් 1977 වසරේ දී ය. එය ද ඉතා කුඩා අගයකි. එම අතිරික්තය ළඟා කරගත්තේ දැඩි ආනයන සීමා පනවමින් සහ අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල හිඟ පවතින තත්ත්වයක් තුළ ය. එම සමයේ දී ජීවනෝපායවලට දැඩි දුෂ්කරතා ඵල්ලා විය. එමෙන්ම ආර්ථික වර්ධන වේගය ද අඩු අගයක පැවතුණි.

මූලධර්ම හේතු

දිගින් දිගටම වෙළෙඳ හිඟ පැවැතීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ අපනයන වැඩි කිරීමට ඇති අසමත්කම ය. කෙසේ නමුත් අපනයන වැඩි නොවුණ ද ආනයන දිගින් දිගටම සැලකිය යුතු අගයකින් වැඩි විය. බොහෝ වසරවලදී ආනයන වියදම අපනයන ආදායම මෙන් දෙගුණයක් විය. ඉකුත් වසරේ දී (2020) වෙළෙඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන හයක අගයකට ගෙන ඒමට සමත් විය. කෙසේ නමුත් එම වසරේ ආනයන වියදම ඇමෙරිකානු ඩොලර් බිලියන 16ක් වූ අතර අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 10ක් විය.

2021 වෙළෙඳ ශේෂය මේ වසරේ වෙළෙඳ ශේෂය කුමක් වනු ඇති ද ?

ඉකුත් වසරේ දී වෙළෙඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන හයක් වූ අතර මේ වසරේ දී වෙළෙඳ හිඟය දෙගුණ වනු ඇත. මේ වසරේ මුල් අර්ධයේ දී අපනයන ආදායම ඉතා හොඳ තත්ත්වයක් පෙන්නුම් කළ ද දැඩි ආනයන සීමා පනවා තිබුණ ද ආනයන වැඩි වීම හේතුවෙන් මේ වසරේ දී වෙළෙඳ හිඟය පසුගිය වරට සාපේක්ෂව දෙගුණ වනු ඇත.

අපනයන

මේ වසරේ මුල් අර්ධයේ අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 5.6ක් වූ බව අපනයන සංවර්ධන මණ්ඩලය ඉකුත් ද සඳහන් කළේය. වෙළෙඳ භාණ්ඩ අපනයන ඇමෙරිකානු ඩොලර් බිලියන 12ක් වනු ඇතැයි එම මණ්ඩලය ඇස්තමේන්තු කර ඇත. එය එසේ වුවත් ඉහළ ආනයන වියදම හේතුවෙන් වෙළෙඳ හිඟය තවදුරටත් පුළුල් වනු ඇත.

මේ වසරේ මුල් අර්ධයේ දී වෙළෙඳ භාණ්ඩ අපනයන ඇමෙරිකානු ඩොලර් බිලියන 5.56ක් ලෙස දැක්වුණු අතර එය පසුගිය වසර හා සැසඳීමේදී සියයට 27.5ක වර්ධනය කි. පසුගිය වසරේ මුල් මාස හයේ දී වෙළෙඳ භාණ්ඩ අපනයන ඇමෙරිකානු ඩොලර් බිලියන 4.36ක් විය. කොවිඩ්-19 වසංගතය තෙවැනි රැල්ල මධ්‍යයේ වුවද එම අපනයන ආදායම ලබාගත හැකි වූයේ දැඩි සීමා සහ බාධක මධ්‍යයේ ය. ජාත්‍යන්තර ඉල්ලුම ක්‍රමයෙන් වැඩි වීමත් සමඟ නිෂ්පාදිත අපනයන ද ක්‍රමයෙන් වැඩි විය.

ඉල්ලුම

ආනයන මත දැඩි සීමා පනවා තිබුණ ද ආනයන වියදම් වැඩි වීම හේතුවෙන් මේ වසරේ ගෙවුම් ශේෂයට අහිතකර ලෙස බලපෑම් ඵල්ල වනු ඇත. ආහාර, අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සහ අමුද්‍රව්‍ය සහ කෘෂිකාර්මික අපනයන ඇඳු වීම යනාදිය හේතුවෙන් මේ වසරේ දෙවැනි අර්ධයේ දී වෙළෙඳ හිඟය තවදුරටත් පුළුල් වනු ඇත. පොහොර ආනයනය මත සීමා පැනවීම හේතුවෙන් මීට ප්‍රතිචාර දක්වනු ඇති අතර විමඟින් වෙළෙඳ ශේෂයේ තත්ත්වය උග්‍ර වනු ඇත. ඊට ප්‍රධානම හේතුව ආහාර නිෂ්පාදන අඩු වීම යි.

ගෙවුම් ශේෂය

වෙළෙඳ ශේෂය පුළුල් වීම යන තත්ත්වය මධ්‍යයේ සේවා අංශවලින් ලැබෙන ආදායම් ඉතා වැදගත් වේ. පසුගිය වසරේ දී එය ඉතා වැදගත් විය. කෙසේ නමුත් මේ මොහොතේ තිබෙන වැදගත්ම ප්‍රශ්නය වන්නේ සේවක ප්‍රේෂණ, තොරතුරු සන්නිවේදන සහ තාක්ෂණ ක්ෂේත්‍රයෙන් ලැබෙන ආදායම් සහ ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් වෙළෙඳ හිඟය ඉක්මවා ගොස් ගෙවුම් ශේෂයේ අතිරික්තයක් නිර්මාණය කරනු ඇත්ද යන්න යි.

සාරාංශය

ඉකුත් මාසයේ දී විදේශ සංචිත ඇමෙරිකානු ඩොලර් බිලියන තුනටත් අඩු අගයකට අඩු විය. මෙය ඉතාමත් අඩු අගයක් වන මෙය භයානක තත්ත්වයකි. මේ වසරේ ආනයන අවශ්‍යතා ද ඉතා ඉහළ බැවින් පවතින්නේ අවදානම් සහගත තත්ත්වයකි. මුදල් හුවමාරු සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලැබෙන ප්‍රදානය මේ කඩිනම් දුෂ්කරතාවලින් රටට තාවකාලික සහන සහ පිළියම් සපයනු ඇත. මේවා මේ අවස්ථාවේ අවශ්‍ය සහන/පහසුකම් වන අතර කෙසේ නමුත් මේවා විසඳුම් නොවේ. විදේශ මූල්‍යයේ තිබෙන ව්‍යුහගත අර්බුදවලට විසඳුම් අවශ්‍ය වේ.

නිගමනය

රටේ විදේශ මූල්‍යයේ තිබෙන ප්‍රශ්නයට තිබෙන ඇති එකම ප්‍රායෝගික විසඳුම වන්නේ අපනයන වැඩි කරමින් වෙළෙඳ හිඟය අඩු කිරීමත් සේවාවලින් ආදායම් උපයමින් ගෙවුම් ශේෂයේ අතිරික්තයක් ඇති කරගැනීමත් ය.

සන්ඩේ ටයිම්ස් පුවත්පතේ පළවූ ලිපියේ පරිවර්තනය

හර්ෂණ තුෂාර සිල්වා

හම්බන්තොට වරායේ තොග නාණ්ඩ හැසිරවීම් ඉහළට



හම්බන්තොට ජාත්‍යන්තර වරාය (HIP) විසින් මුද හරින ලද ඉහළතම තොග ප්‍රමාණය වාර්තා කරමින් මැතකදී ඉන්සි සිමෙන්ති සඳහා ගෙන ආ පිප්සම් තොග දිනකට මෙට්‍රික් ටොන් 24,000 බැගින් හසුරුවන ලදී.

ඉන්සි සිමෙන්ති සමාගමේ ප්‍රසම්පාදන හා සැපයුම්හි අධ්‍යක්ෂ තුසිත් ගුණවර්ණසූරිය මහතා පවසන්නේ මෙය ශ්‍රී ලංකාවේ වරායකට වේගය සහ කාර්යක්ෂමතාව අනුව හිමිවූ සුවිශේෂී ජයග්‍රහණයක් බවයි. ඒ මහතා මෙසේද පැවසීය. "ශ්‍රී ලංකාවේ අංක 1 සිමෙන්ති නිෂ්පාදන සමාගම ලෙස අප විශාල යාත්‍රාවලින් අමුද්‍රව්‍ය ආනයනය කරනවා. එම යාත්‍රා රටට පැමිණි පසු හම්බන්තොට ජාත්‍යන්තර වරාය සමූහය (HIPG) සහ හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝර්ට් සර්විසස් සමාගම (HIPS) , වේගයෙන් තොග මුදහැරීමේ කටයුතු සිදු කරනවා. වරාය මෙහෙයුම් වේගවත් වන තරමට අපට පමණක් නොව රටටත් වැඩි වාසියක් ලැබෙනු ඇත. මහද්‍වයත් යාත්‍රාව වරායේ රැඳී සිටින දින 2 1/2 සඳහා අප, රඳවා තබා ගැනීමේ හා ප්‍රමාද ගාස්තු ලෙස ඇමෙරිකානු ඩොලර් 75,000කට ආසන්න මුදලක් ගෙවයි. එබැවින්, අප මෙවර සිදු කළ ආකාරයට මෙන් දින දෙකහමාරකට කලින් මුදහැරීමේ කටයුතු නිමා කළ නිසා, සැලකිය යුතු ලෙස පිරිවැය ඉතිරි කර ගැනීමට අපට හැකි වුණා. එය අපගේ සමාගමට වාසියක් වන අතර රට සඳහාද විදේශ විනිමය සැලකිය යුතු ලෙස ඉතිරි කිරීමකි".

HCL ශ්‍රී ලංකා මධ්‍යස්ථානයට සිනමන් Life තෝරාගනී



කොළඹ නගරයේ අභිනවින පහසුකම් වලින් සමන්විත නවතම කාර්යාලයීය කුලුන වන Cinnamon Life ව්‍යාපෘති 'The Offices' තම ශ්‍රී ලංකා මධ්‍යස්ථානය ලෙස තෝරාගැනීමට, ලොව ප්‍රමුඛතම තාක්ෂණ සමාගමක් වන HCL Technologies තීරණය කර තිබේ.

ඒ අනුව එම සමාගම 'The Offices' හි කාර්යාල අවකාශ අතරින් සියයට 80ක ප්‍රමාණයක් භාවිත කරනු ඇත. ජාත්‍යන්තර සමාගමක් මේ ආකාරයක මෙරට A ශ්‍රේණියේ කාර්යාලයීය කුලුනක කාර්යාල අතරින් බහුතරය වෙන්කරවා ගත් ප්‍රථම අවස්ථාව මෙයයි.

මේ සඳහා වන ගිවිසුමට HCL Technologies සහ පෝන් කිල්ස් හෝල්ඩින්ස් (JKH) යන සමාගම් වල නියෝජිතයන් විසින් පසුගියදා අත්සන් තබන ලදී. මේ ඔස්සේ තවත් දේශීය හා ජාත්‍යන්තර සමාගම් රැසක් මෙම ව්‍යාපෘතිය වෙත ආකර්ෂණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එමෙන්ම ජාත්‍යන්තර සමාගමක් මේ ආකාරයට මෙරට තුළ තම ව්‍යාපාර කටයුතු පුළුල් කිරීමට සැලසුම් කිරීම, දකුණු ආසියාවේ ව්‍යාපාරික කේන්ද්‍රයක් බවට පත්වීමට කොළඹ නගරය සතු හැකියාව පිළිබිඳ මනා සාක්ෂියක් ලෙසද සැලකිය හැකි ය.

කොළඹ නගරයේ සුවිශේෂී ස්ථානයක පිහිටා තිබීම, නවීනතම පහසුකම් වලින් සමන්විතවීම සහ උසස් ප්‍රමිතිය සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමුකරමින් ඉදිකර තිබීම යනාදිය, Cinnamon Life ව්‍යාපෘතියේ The Offices තෝරාගැනීමට HCL සමාගම යොමුකරවූ ප්‍රධානතම සාධක ලෙස සැලකේ.

එමිරේට්ස් මඟින්ට නොමිලේ Expo නරඹන්න අවස්ථාවක්

කළාපයේ දැවැන්තම වෙළෙඳ ප්‍රදර්ශනයක් වන 2020 ඩුබායි Expo වෙළෙඳ ප්‍රදර්ශනයේ ප්‍රමුඛතම පාර්ශ්වකරුවා සහ නිල ගුවන් සමාගම ලෙස එමිරේට්ස් මෙම ප්‍රදර්ශනය නැරඹීමට සමාගමේ ගුවන් මඟින්ට සුවිශේෂී ප්‍රතිලාභයක් ඉදිරිපත් කර තිබේ.

මේ අනුව, මෙම වැඩසටහන පැවැත්වෙන 2021 ඔක්තෝම්බර් 01 වැනිදා සිට 2022 මාර්තු 31 වන දක්වා කාල සීමාව තුළදී ඕනෑම අවස්ථාවක ඩුබායි වෙත පැමිණෙන සහ ඩුබායි හරහා ගමන් කරන එමිරේට්ස් මඟින්ට ඔවුන්ගේ සියලුම ගුවන් ටිකට්පත් වලට නොමිලේ Emirates Expo Day Pass එකක් ලබාදීමට ගුවන් සමාගම කටයුතු කර ඇතැයි එම සමාගම සඳහන් කරයි.

එමිරේට්ස් සඳහන් කරන්නේ 2021 ඔක්තෝම්බර් 01 වැනිදා සිට 2022 මාර්තු 31 වැනිදා දක්වා ඩුබායි වෙත හෝ ඩුබායි හරහා ගමන් කරන සියලුම එමිරේට්ස් ගුවන් මඟින්ගේ ටිකට් පත් සඳහා මෙම විශේෂ දීමනාව ලබාදෙන බවයි. මීට අමතරව, චක්සත් අරාබි එමීර් රාජ්‍යයට පිටත සිට පැමිණෙන එක් දිගාවකට පමණක් ගමන් කරන ගුවන් මඟින් ඩුබායි වෙත පැමිණීමේදී හෝ ඩුබායි හි අවම රැඳී සිටීමේ කාලය සම්පූර්ණ කරමින් වෙනත් ගමනාන්ත වෙත ගමන් කිරීමේදී ත්‍යාගයක් ලෙස Expo Day Pass එකක් ප්‍රදානය කිරීමටද එමිරේට්ස් කටයුතු කර තිබේ.

ස්පාර්ක්ලින්ක් හතළිස් දෙවසරක විශිෂ්ටත්වය සමරයි

දශක හතරකට අධික කාලයක් පුරා මෙරට සංචාරක ක්ෂේත්‍රය තුළ විශිෂ්ට සහ කැපිපෙනෙන කාර්යභාරයක් සිදුකළ ස්පාර්ක්ලින්ක් ට්‍රැවල්ස් (Sparklink Travels) ආයතනය පසුගියදා සිය 42වැනි සංවත්සරය සමරනු ලැබිය. වර්ෂ 1979දී නිහාල් පෙරේරා මහතාගේ මූලිකත්වයෙන් පවුලේ ව්‍යාපාරයක් ලෙස ආරම්භ වූ Sparklink Travels අද දක්වාම ඒකාබද්ධතාව, සක්‍රියතා සහ ගුවන් සවාරි, නෞකා සවාරි සහ සංචාරවල විශිෂ්ටත්වය තුළින් සුවිශේෂී සේවාවක් සංචාරකයන්ට ලබාදීමට කැපවී සිටියි. එම සුවිශේෂත්වය හේතුවෙන් ප්‍රතිඵල සහතිකය ලත් සංචාර ආයතනයක් බවට පත්වීමට ද එම ආයතනයට හැකිවී තිබේ.

මෙරට සංචාරක කර්මාන්තය තුළ සිටින ප්‍රවීණ චරිතයක් වන නිහාල් පෙරේරා මහතා ලංකා සංචාරක මණ්ඩලයේ සංවර්ධන හා ප්‍රචාරණ අංශයේ අධ්‍යක්ෂවරයා ලෙස ද සේවය කළේය. ඔහු මේ වනවිට ප්‍රකී පෙරේරා සමඟ එක්ව ඕස්ට්‍රේලියාවේ සිට ස්පාර්ක්ලින්ක් ට්‍රැවල්ස් Australia ආයතනය ද මෙහෙයවනු ලබයි. ස්පාර්ක්ලින්ක් ට්‍රැවල්ස් සතු පළපුරුදු සහ වෘත්තීය කාර්යමණ්ඩලය වර්තමානයේදී සිය සංචාරක සේවා, කොල්ලුපිටිය, ලිබර්ටි ආර්කේඩ්හි පිහිටි සිය කාර්යාලයේ මෙන්ම දුරස්ථ වශයෙන් ද ක්‍රියාත්මක වෙමින් ලබාදෙන අතර, සඳුදා සිට සිකුරාදා දක්වා දූරකථනය ඔස්සේ ද ඔවුන්ගේ සේවා පිළිබඳ තොරතුරු ලබාගත හැක. මේ අතර කොරෝනා විසංගත තත්ත්වය හමුවේ අවලංගු වූ සංචාරවලට අදළව සංචාරකයන් විසින් ගෙවා තිබූ මුදල්වලින් රුපියල් මිලියන 10කට වැඩි ගණනක් නැවත ගෙවීමට ද සමාගම විසින් දැනටමත් පියවර ගෙන තිබේ. නැවතත් ජාත්‍යන්තර දේශසීමා විවෘත වීමත් සමඟ තම සුපුරුදු සේවා සංචාරකයන්ට ලබාදීමට ස්පාර්ක්ලින්ක් ට්‍රැවල්ස් සමාගම සූදානම්ව සිටියි.

ඛයලොග් ක්‍රීඩා අමාත්‍යාංශය සමඟ youth Can දියත් කරයි

ශ්‍රී ලාංකික තාරුණ්‍යයට තම කුසලතා ඔප් නැංවීමට මඟ පෙන්වීම හා සහයෝගය ලබා දීම අරමුණකර ගනිමින්, අන්තර්ජාතික තරුණ දිනයට සමගාමීව ඛයලොග් ආෂ්ආථා සමාගම තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය සමඟින් එක්ව Youth Can වැඩසටහන පසුගිය දා දියත් කළේය.

මෙම වැඩසටහන තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය හා ජාතික තරුණ සේවා සභාව සමඟින් එක්ව, මිනිස් බල හා රැකියා දෙපාර්තමේන්තුවේ, කුඩා ව්‍යවසාය සංවර්ධන අංශයේ සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව, සුවිශේෂී හැකියාවන් සහිත තරුණ තරුණියන්ට ඔවුන්ගේ කැමති ක්ෂේත්‍රවල ඉදිරියට යාමට අවශ්‍ය අවස්ථාව උදකර දෙයි. ඔවුන්ගේ සිහින සැබෑ කර ගැනීමට අවස්ථාව උදෙ වේ.

මෙම තුන් අවුරුදු වැඩසටහන වයස අවුරුදු 14

ත් 35 ත් අතර වයස් සීමාවන් තුළ සිටින තරුණ තරුණියන්ගේ හැකියාවන් සහ දක්ෂතාව ක්‍රීඩා, නව ව්‍යාපාර අදහස්, ශිල්ප කලා, මෝස්තර නිර්මාණකරණය, සූපවේදය සහ කෝපි චිත්‍රපට යන අංශ 6ක් ඔස්සේ තරඟකාරීව එළිදැක්වීම කෙරෙහි අවධානය යොමු කෙරේ. තෝරාගත් අයදුම්කරුවන් සඳහා වැඩමුළුව, අදළ මෙවලම් හා පුහුණුව ලබා දී, දැනුමින් සහ හැකියාවන්ගෙන් බලගැන්වීමත් සිදුවනු ඇත. ජාතික තරුණ සේවා සභාව, මිනිස්බල හා රැකියා දෙපාර්තමේන්තුව, කුඩා ව්‍යවසාය සංවර්ධන අංශය සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් පත්කළ ඒ ඒ ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගෙන් තේරීම් කමිටුව සමන්විත වනු ඇති අතර, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ තේරීම් සිදුවනු ඇත. මේ පිළිබඳව වැඩි විස්තර ලබා ගැනීම් සහ අයදුම්පත් යොමු කිරීම www.youthcan.lk කෘන වෙබ් අඩවිය ඔස්සේ සිදුකළ හැකිය.

සිංගර් වෙතින් අති නවීන ස්මාර්ට් බෝඩ්

සිංගර් විසින් ඩිජිටල් අධ්‍යාපනය සඳහා ස්මාර්ට්බෝඩ් නිෂ්පාදන පෙළක් වෙළඳපොළට හඳුන්වා දෙනු ලැබ ඇත. මාර්ගගත අධ්‍යාපනික කටයුතු සහ ව්‍යාපාරික රැස්වීම්/සම්මන්ත්‍රණ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම මෙහි මූලික අරමුණයි.

සිංගර්, දැනට ලොව නවීනතම LED තිර නිෂ්පාදනය කරන Skyworth සමාගමේ ස්මාර්ට්බෝඩ් නිෂ්පාදන පෙළක් හඳුන්වාදී ඇත. පරිගණකය, රූපවාහිනිය, ප්‍රොජෙක්ටරය සහ වයිට්බෝඩ් සතු සියලු විශේෂාංග වලින් සමන්විත වන ලෙස මෙම ස්මාර්ට්බෝඩ් නිර්මාණය කරඇත.



කාර්යන් කිහිපයක් එකවර කරගත හැකි මෙම ස්මාර්ට්බෝඩ් වර්තමාන ඔන්ලයින් අධ්‍යාපන කටයුතු සඳහා පවතින හොඳම විකල්පය බව එම සමාගම කියයි.

මෙය අඟල් 55, 65 සහ 75 ලෙස ප්‍රමාණයන් තුනකින් සහ ඇන්ඩ්‍රොයිඩ් හෝ වින්ඩෝස් 10 යන මෙහෙයුම් පද්ධති වලින් ලබාගත හැක. මෙම ස්මාර්ට්බෝඩ් නිෂ්පාදන පෙළ මඟින් වයිට්බෝඩ් හි සටහන් ලිවීම, අනෙක් පාර්ශ්වයට නැරඹිය හැකිලෙස වීඩියෝ සහ තිරය පෙන්විය හැකිවීම වැනි ප්‍රතිලාභ රැසක් හිමිකරදෙයි. ගුරුවරුන්ට ඉගැන්වීමට අවශ්‍ය දෑ මෙහි ගබඩා කර තබාගත හැකි බැවින් ඉදිරි ඉගැන්වීම් කටයුතු වලදී ඒවා පහසුවෙන් භාවිත කළ හැකිය.

ඩබ්ලිව් ආයුර්වේද රෝහලෙන් පොත් බෙදාදීමක්

**ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයුර්වේද රෝහලක් වන ඩබ්ලිව් ආයුර්වේද රෝහල සිය ආයතනික සමාජ වගකීම මනාව හඳුනා ගනිමින් පාසල් සහ දහම් පාසල් දරුවන් වෙනුවෙන් පොත් පත් බෙදා දෙමින් සමාජ සත්කාර රැසක් දියත් කළේය. එහි සුවිශේෂ පියවරක් සනිටුහන් කරමින් පසුගියදා මැදිරිගිරිය පෙ/දමෙය්පුර ප්‍රාථමික විද්‍යාලයට, මොරටුව ශ්‍රී ආරියවංශ දහම් පාස

කළුගල් සිංහරුවත් අතුරුදන්:

වත්තල ඇවිදින මං තීරුව කැලෑවට ඇරලා

ප්‍රදේශවාසීන්ගෙන් චෝදනා

(ජා-ඇල ප්‍රසංග පෙරේරා/ වත්තල සරත් චින්තක)

වත්තල කළු ඇළ වම් ඉවුරේ ඉදිකර තිබූ ඇවිදින මංතීරුව කැලෑවට යටවෙමින් අභාවයට පත්ව තිබෙන බව මෙම මංතීරුව භාවිත කළ ප්‍රදේශවාසීහු පෙන්වා දෙති.

මීට කලකට ඉහත දෙනිකව සිය ගණනක් ජනතාව මෙම ඇවිදින මංතීරුව සිය ව්‍යායාම් කටයුතු සඳහා භාවිත කළ අතර එම ජනතාව විසින් ශාරීරික යෝග්‍යතා සංගමයක් පවා පිහිටුවාගෙන තිබිණි. නමුත් පසුගිය කාල සීමාවේ රටේ ඇති වූ තත්ත්වයත් සමඟ මහජන මුදල් රුපියල් මිලියන ගණනක් යොදා ඉදිකළ මෙම වටිනා මං තීරුව ද අභාවයට යාම සිදු විය.

මෙම මංතීරුව ඉදිකර තිබූ විදුලි බුබුළු සේම ඒවාට සවිකර තිබූ ලක්ෂ ගණනක් වටිනා බැටරි ආදිය ද මේ වනවිට සොරුන් විසින් ගලවාගෙන ගොස් අවසන්ය. මංතීරුවට ඇතුළු වන ස්ථානයේ කළුගලින් නිමවා තිබූ ලක්ෂ ගණනක් වටිනා විශාල සිංහ රුව ද මේ වනවිට එම ස්ථානයෙන් අතුරුදහන්ව ඇතැයි ප්‍රදේශවාසීහු පවසති. ඇවිදින මං තීරුව මත ඇති වී තිබෙන කැලෑව තුළ කළු ඇළේ වෙසෙන කිඹුලන් සැඟව ඇතැයි පවතින බිය නිසා ද ජනතාව එම ස්ථානයට යෑමට මැලිකමක් දක්වති. ප්‍රදේශයේ ජනතාව චෝදනා කරන්නේ මහජන බදු මුදල් යොදවා කරන මෙවැනි ව්‍යාපෘති නිසි නඩත්තුවකට ලක් නොකිරීම නිසා එම ව්‍යාපෘතිවල ප්‍රයෝජනය ජනතාවට අහිමි වී යන බවයි.

සෙනෙහස සවිය ප්‍රජා සත්කාර නිමාවේදී

පවුල් 25 කට වියළි ආහාර බෙදීම සඳහා අවශ්‍ය සහල් ප්‍රමාණය පමුණුවිල සිරි කාර්යප්පෙරුම විහාරස්ථානයේ විහාරාධිපති ශාස්ත්‍රපති මොරටුවේ නන්දසිරි හිමියන් විසින් සෙනෙහස සවිය ප්‍රජා සත්කාර පදනමේ නිර්මාතෘ හා ප්‍රධාන සංවිධායක සචිත්‍ර නේරන්ජන ඇල්වලගේ මහතාට පිරිනැමූ අයුරු මෙහි දැක්වේ.

(මල්වාන - ඩබ්ලිව්.ඒ.එම්. විතානගේ හා දෙල්ගොඩ සුදත් පුබුදු කීර්ති)

කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් ආසාදිත වූ හා නිරෝධායනයට ලක් වූ පවුල් සඳහා මාකොළ, සපුගස්කන්ද සෙනෙහස සවිය පූජා සත්කාර පදනම හා සිංහ සවිය ක්‍රීඩා සමාජය එක් වී පුරා වසරක කාලයක් ගමින් ගමට ක්‍රියාත්මක කළ ප්‍රජා සත්කාර සේවා වැඩසටහන සාර්ථකව නිමාවට පත්කර ඇත.

සෙනෙහස සවිය පූජා සත්කාර පදනමේ හය වැනි සංවත්සරය නිමිත්තෙන් එහි ප්‍රධාන පැවිදි අනුශාසකවරුන් වන තැඹිලිගස්මුල්ල ශ්‍රී ධීරානන්ද විද්‍යායතන පිරිවෙන් විහාරස්ථානයේ විහාරාධිපති කොළඹ නව කෝරළයේ හා නව තොටමුණේ උප ප්‍රධාන සංඝනායක පානකාවෙ පේමරතන හා සපුගස්කන්ද පුරාණ රජමහා විහාරස්ථානයේ විහාරාධිපති සියනෑ, හාපිටිගම හා අලුත්කුරු යන කෝරළ තුනෙහි අධිකරණ සංඝනායක දරණාගම ඤාණසිරි යන නාහිමිවරුන්ගේ මගපෙන්වීම මත පසුගිය 2020 වසරේ අගෝස්තු මාසයේ සිට මේ 2021 වසරේ අගෝස්තු මාසය දක්වා මේ ප්‍රජා සත්කාර සේවා වැඩසටහන ක්‍රියාත්මක කෙරිණි.

මේ අනුව මෙම වැඩසටහන යටතේ බියගම හා කැලණිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙක තුළ කොවිඩ් පවුල් 100 කට වටිනා වියළි ආහාර පාර්සල් ප්‍රදානය කළ අතර එම පවුල්වල පාසල් සිසු දරුවන් 200 දෙනකුට ද වටිනා පාසල් උපකරණ ප්‍රදානය කරන ලදී.

වැරැදි කළ රියැදුරන් 13කට දඩ

(ගම්පහ අධිකරණ - ටෝනි කරුණානායක)

ගම්පහ පොලිස් වසමේ දී විවිධ වැරැදි කළ රියැදුරන් 13 දෙනකුට රුපියල් තුන් ලක්ෂ හතළිස් අටදහසක දඩයක් ගම්පහ මහේස්ත්‍රාත් මංජුල කරුණාරත්න මහතා 28 වැනිදා නියම කළේය.

බීමත්ව රිය ධාවනය කළ රියැදුරන් 06 දෙනකුගේ රියදුරු බලපත්‍රය මාස 06ක කාලයකට අත්හිටුවන ලෙසට ද නියම කෙරුණි.

වලංගු රියැදුරු බලපත්‍රයක් නොමැතිව බීමත්ව රිය ධාවනය කළ බුලත්සිංහල, ගම්පහ සහ නැදගමුව පදිංචි සංජය පුෂ්පකුමාර, රොෂාන් ඉන්දික, නිරෝෂන් නාමල් රාජපක්ෂ යන රියදුරන් තිදෙනාගෙන් එක් අයෙකුට රුපියල් 50,000 ක් බැගින් දඩ නියම විය.

බීමත්ව රිය ධාවනය කළ සිදුව, අස්ගිරිය, තවලම, පෙතියාගොඩ, පදිංචි ඩබ්.බී. උදර, ශ්‍යාමන් ප්‍රියංකර, සඳුන් නාලක, නිරෝස් විදර්ශන සහ ඩබ්. සමන්ත යන රියදුරන් 05 දෙනාගෙන් එක් අයකුට රුපියල් 25000 ක් බැගින් දඩ නියම වී රියදුරු බලපත්‍රය මාස 06 ක කාලයකට අත්හිටවන ලෙසට නියම කෙරුණි.

අපරික්ෂාකාරීව රිය ධාවනය කළ රියදුරන් තිදෙනකුගෙන් එක් අයකුට රුපියල් 15000 ක් බැගින් ද, අපරික්ෂාකාරීව ත්‍රීවිල් රථයක් ධාවනය කර අනතුරක් වළක්වා නොගත් රියදුරුට රුපියල් 18,000 ක දඩයක්ද ආදයම් සහ යෝග්‍යතා සහතිකය නොමැතිව රිය ධාවනය කළ රියදුරුට රුපියල් 10,000 ක දඩයක් ද නියම විය. ගම්පහ පොලිසියේ උ.පොප ඩී.පී. අනුරුද්ධ මහතා පැමිණිලි මෙහෙය විය.

ගංවතුරෙන් ගම්පහ බේරාගන්න වැඩ ගොඩක්

(ගම්පහ තිලකරත්න දිසානායක)

අත්තනගලු ඔය පිටාර ගැලීමෙන් ගම්පහ නගරය ඇතුළු අවට ප්‍රදේශ ජලයෙන් යටවීමට බලපාන අවහිරතා ඉවත් කිරීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි ගම්පහ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය පියවර ගෙන ඇත.

මෙහි කඩිනම් පියවරක් වශයෙන් අත්තනගලු ඔය ගම්පහ නගරය අසලින් ගලා බසින නව මිනුවන්ගොඩ මාර්ගයේ ජල බස්නා පාලම් අසල ගැඹුරු කිරීමට සහ එම පාලම් අසලින් ජලය බැස යාමට අවහිරවන අන්දමින් ඇති බිම් කොටස් කපා ඉවත් කිරීමට පියවර ගෙන ඇති බව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු චින්තක සුරවීර මහතා පැවසීය.

මීට අමතරව පසුගිය ගංවතුර ගැලීමෙන් හඳුනාගෙන ඇති ජලය බැස යාමට අවහිරවන ස්ථාන හතක් සැකසීමට මාර්ග සංවර්ධන අධිකාරිය සහ දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ එක්ව ක්‍රියා කරන බව ද ඉංජිනේරුවරයා සඳහන් කළේය.

ගම්පහ - ජාඇල මාර්ගය ආශ්‍රිතව වැසී ජලය බැස යාම අවහිරව පවතින ස්ථාන නිසියාකාරයෙන් සකස් කිරීමට පළාත් පාලන ආයතන, ගොවිජන සේවා සහ මාර්ග සංවර්ධන අධිකාරිය පියවර ගත යුතුව ඇති බව ද හෙතෙම සඳහන් කළේය.

පාලම අසල ජලය බැස යාමට අවහිර බිම් කොටස් ඉවත් කිරීම.

රඟහල ළඟ කානුව මරුකටක්

(වතුපිටිවල - එස්.යූ.ඛබිලිව්.කේ. ජයවර්ධන)

අද ගොවියෝ තැන් තැන්වල උද්ඝෝෂණය කරනවා. කාබනික පොහොර නිශය නිසා අත්තනගල්ල කොට්ඨාසයේ කුඹුරු ගොවීන් අසරණ වී සිටිනවා. පෙතියාකන්ද කසළ ව්‍යාපෘතියේ රුපියල් මිලියන ගණනක් වටිනා කාබනික පොහොර නිපදවිය හැකි යන්ත්‍ර සූත්‍ර රැසක් තියෙනවා. එම යන්ත්‍ර සූත්‍ර ලබාගෙන කාබනික පොහොර සැපයුම වැඩි කළ හැකි යැයි අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මන්ත්‍රී ප්‍රගීත් අනුරාධ ගුණතිලක මහතා ප්‍රාදේශීය සභාවේ ජූලි මස මාසික මන්ත්‍රී මහසභා රැස්වීම අමතමින් පැවැසීය.

ප්‍රාදේශීය සභාවේ සභාපති ප්‍රියන්ත පුෂ්ප කුමාර මහතාගේ ප්‍රධානත්වයෙන් අත්තනගල්ල ප්‍රාදේශීය සභා මූලස්ථාන ගොඩනැගිල්ලේ මන්ත්‍රී සභා ගර්භයේ දී ඉකුත් 29 වැනිදා මෙම මාසික මහසභා රැස්වීම පැවැත්විණි.

මෙය අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ හයවැනි සැසිවාරයේ තිස් හත්වැනි මන්ත්‍රී මහසභා රැස්වීම ද විය.

සභාපති ප්‍රියන්ත පුෂ්ප කුමාර මහතා (ශ්‍රීලපොපෙ):

ප්‍රජා අංශයේ වැඩසටහන් රාශියක් මේ වසරේ අයවැය ලේඛනයට ඇතුළත් කළා. මේ වසර තුළ ක්‍රියාත්මක කිරීමට කොවිඩ් වසංගතය නිසා එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබෙනවා. එම මුදල් ප්‍රජා මණ්ඩල මට්ටමින් කොඩි ලබා දීම සඳහා යොදවන ලෙස ප්‍රජා අංශයට උපදෙස් ලබා දී තිබෙනවා. ඒ සඳහා අයවැය ඇස්තමේන්තුවක් ඉදිරි සභා රැස්වීමක දී ඉදිපත් කරනවා.

හේමාල් මෙන්ඩිස් මහතා (ජවිපෙ) - ප්‍රාදේශීය සභාවෙන් සල්ලි දීලා කඩයක් ගත්තහම ඒකට කුලියක් අයකරන්නේ ඇයි ද කියා ප්‍රශ්නයක් තියෙනවා. කඩ කුළිය පැරණි තක්සේරු මත අයකරන ලෙස කඩහිමියන් ඉල්ලා සිටිනවා. කඩ කුලී අය කිරීමේ දී අපි මෙයට වඩා මානුෂීය විය යුතුයි.

සභාපති ප්‍රියන්ත පුෂ්ප කුමාර මහතා: අපේ වීදි පහන් නඩත්තු කටයුතු පසුගිය කාලයේ අක්‍රීය වුණා. දැන් ඒම කටයුතු යථා තත්ත්වයට පත්කර තිබෙනවා. නව වීදිපහන් ලබා ගැනීම පිළිබඳව ප්‍රශ්නයක් තිබුණා. යහපාලන කාලයේ පළාත් පාලන ආයතනවල ක්‍රියාකාරීත්වය දැන හිටියා. අත්තනගල්ල ප්‍රාදේශීය සභා සභාපති ධුරය දරා ඇති කිසිම සභාපතිවරයෙක් සභාවට අයත් කඩ තක්සේරු කිරීමට කටයුතු කර නැහැ. පළාත් පාලන ආයතනයකට අයත් කඩයක තිබෙන්නේ බදු අයිතියක් පමණයි. මිනිස්සු මා ගැන මොනවා හිතුවත් මේ ප්‍රාදේශීය සභාවේ නීතිය රකින්න මම බැඳී සිටිනවා. කඩ හිමියන් වෙනුවෙන් පෙනී සිටින මන්ත්‍රීතුමියන්ලා මේ කඩවලට තක්සේරුවක් දෙන්න.

එම්.ඒ. චන්ද්‍රසිරි මහතා (ශ්‍රී.ල.පො.පෙ): සභාපති කියපු දේවල් මම නැහැ කියන්නේ නැහැ. 1992 වර්ෂයේ මම නව වෙළෙඳ සංකීර්ණයට පැමිණියේ. සභාපතිතුමා කියන දේවල් සියල්ල සත්‍යයි. ව්‍යාපාරිකයන් කියන්නේ පරණ කුලිය අයකරන්න කියලා.

සභාපති ප්‍රියන්ත පුෂ්පකුමාර මහතා: නිට්ටඹුව වෙළෙඳ සංකීර්ණයේ කඩහිමියෝ වර්ග දෙකක් සිටිනවා. ඒ පිළිබඳව අවබෝධයෙන් කතා කරන්න. තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු මුදල අපිට අඩුකළ නොහැකියි.

ප්‍රගීත් අනුරාධ ගුණතිලක මහතා (ශ්‍රීලනිප): අපිට කට වචනෙට හෝ හිතවත්කමට මේ රෙගුලාසි වෙනස් කරන්න බැහැ. දෙන්න පුළුවන් සහන ලබා දිය යුතුයි.

තුෂාරි ප්‍රියංගා මහත්මිය (එජාප): මේ කඩ ප්‍රශ්නය 2002 වසරේ සිට තිබෙන්නේ වෙළෙඳ ප්‍රජාවට මේ කාලයේ බොහෝම අමාරුයි. අපි යෝජනාවක් ගෙනෙමු මේකට සුදුසු මොකක්ද කියලා. ඊළඟ තක්සේරුව එද්දී මේ කඩ කුලිය තවත් වැඩිවෙනවා.

සභාපති ප්‍රියන්ත පුෂ්පකුමාර මහතා: කඩ කුළිය තක්සේරු කිරීමේ බලයක් අපිට නැහැ. කඩ කුලී සම්බන්ධව තීරණය ගන්නේ තක්සේරු දෙපාර්තමේන්තුව කඩ කුලී වැඩියි කියලා ආණ්ඩුකාරතුමාට ලියලා යැව්වා. නමුත් ආණ්ඩුකාරතුමා අපිට දැනුම් දීලා තියෙනවා. කඩ කුලී අඩුකළ නොහැකියි කියා. දෙන්න පුළුවන් උපරිම සහනය අපි ලබා දී තියෙනවා.

එම්.ඒ. චන්ද්‍රසිරි (ශ්‍රීලපොපෙ): නිට්ටඹුව කන්දෙහේන පාර ජල ව්‍යාපෘති සඳහා කඩල දනවා. සභාවේ මුදල් වියදම් කරලා සැරෙන් සැරේ මේ පාර ප්‍රතිසංස්කරණය කරනවා. මේ පාර අද යන්න බැරි තරමට අබලන් වෙලා.

සභාපති ප්‍රියන්ත පුෂ්පකුමාර මහතා - ජල සම්පාදන මණ්ඩලය අපිව දැනුවත් කරලා නෙමෙයි කන්දහේන පාරේ ජලනළ එළීමේ කටයුතු කරන්නේ. මම ඒ පිළිබඳව ජලසම්පත් මණ්ඩලය දැනුවත් කළා. උපුල් මහේන්ද්‍ර පාර්ලිමේන්තු මන්ත්‍රීවරයත් මට ලිපියක් එවල තියෙනවා. එතුමා වසර 9 ක් මේ සභාවේ සභාපතිවරයෙක්ව සිටියා. ඒ ලිපිය පිළිබඳව මම කනගාටු වෙනවා. මම දේශපාලන වාසි ගන්න කටයුතු කරන දේශපාලනඥයෙක් නොවෙයි. ජනතාවට වගේම නීතියටත් මා ගරු කළ යුතුයි. මම ඉන්නේ ජනතාවගේ පැත්තේ. ඊළඟ මැතිවරණයෙන් මා ගෙදර යැව්වත් මට දුක නැහැ. මා කටයුතු කරන්නේ අත්තනගල්ල ප්‍රාදේශීය සභාව කියන උත්තරීතර ආයතනය වෙනුවෙන්.

ප්‍රගීත් අනුරාධ ගුණතිලක මහතා (ශ්‍රීලනිප): මේ ආයතනයේ දැවෙන ප්‍රශ්න පිළිබඳව සභාපති තුමා කටයුතු කරන ආකාරය පිළිබඳව සභාපතිතුමාට ස්තුතිය පුදකර සිටිනවා. අලවල ප්‍රදේශය 'කොවිඩ්' පිළිබඳව දැඩි අවදානම් ප්‍රදේශයක්. ඒ ප්‍රදේශයේ ජනතාවට එන්නත් ලබා දීම සඳහා කටයුතු කළ සභාපතිතුමාට ස්තුතිය පුදකර සිටිනවා.

තිලක් රණසිංහ මහතා (එජාප): වේයන්ගොඩ රංගශාලාව අසල කාණුවේ එක් ස්ථානයකට කොන්ක්‍රීට් ලෑල්ලක් දමා නැහැ. ඒ ස්ථානයේ අනතුරක් සිදුවිය හැකිය.

සභාපති ප්‍රියන්ත පුෂ්ප කුමාර මහතා: වේයන්ගොඩ කානුව සම්බන්ධව උප කාර්යාලයට මා දැනුම් දෙනවා

පසුගිය මාස දෙක පමණ කාලයක අපේ කටයුතු පසු බෑමකට ලක්වුණා.

මංජුල ප්‍රියන්ත නානායක්කාර මහතා (ශ්‍රීලපොපෙ) - මාස ගණනක සිට අපිට විදි ලාම්පු අලුත්වැඩියා කර ගැනීමේ හැකියාවක් තිබුණේ නැහැ.

චන්දික දුෂ්‍යන්ත මහතා (ශ්‍රීලපොපෙ):

වේයන්ගොඩ නිරිපිටිය දකුණ ග්‍රාම නිලධාරී වසම් නිවාස 5 කින් කොරෝනා රෝගීන් හමුවුණා. මගේ කොට්ඨාසයේ යම් යම් අඩුපාඩු තිබෙනවා. වේයන්ගොඩ නගරයේ රාත්‍රී 10 දක්වා සෙනඟ පැවසෙනවා. වේයන්ගොඩ නගරයට රථවාහන අංගණයක් නැහැ. සියනෑ සළු අංගණය ඒ සඳහා භාවිත කළ හැකියි. ඒ භූමිය ප්‍රාදේශීය සභාව බදුගත යුතුයි. වේයන්ගොඩ ගැමුණු මාවත පසුගිය වැස්සට කැඩුණා. ජනතාවට මේ මාර්ගයේ යන්න බැහැ. ගමේ මිනිස්සු බනින්නේ ප්‍රදේශයේ මන්ත්‍රීවරයාට. නිකාඩෝවත්ත ප්‍රදේශයට ජනතාවගේ ප්‍රශ්න මේ සභාවේ කතාකරන්න.

සරත් කුමාරසිරි මහතා (ශ්‍රීලපොපෙ) -

කිතුල්කොළදෙණිය වැවට වතුපිටිවල අපනයන සැකසුම් කලාපයේ අපද්‍රව්‍ය බැහැර කරනවා. වතුපිටිවල රෝහලේ අපවිත්‍ර ජලය තල්ගහදෙණිය වැවට ගලාගෙන යාම නිසා ඒ වැව අපවිත්‍ර වෙලා. අළුබෝගහදෙණිය වැව හාරන්න ගිහින් වැව අසල තියෙන ප්‍රාදේශීය සභා පාරෙ පැත්තක් කඩා වැටිලා.

උප සභාපති ලීල් ගුණසිංහ මහතා (ශ්‍රීලපොපෙ) -

නිට්ටඹුව නගරයේ කඩ ගැන අපි කතා කෙරුවා වැඩියි. අපිට මේ කඩවලින් ලැබෙන්නේ සොච්චම් මුදලක්.

අමා නවෝදනී කස්තුරිආරච්චි මහත්මිය (ශ්‍රීලපොපෙ) -

අත්තනගල්ල - අලවල මාර්ගය දැඩි ලෙස අබලන්වී තිබෙනවා. මේ මාර්ගයේ වළවල් වල ජලය පිරී තිබෙනවා. මේ මාර්ගයේ 'යකඹෙ පාලම' අසල විශාලම ජල නළය එළීම නිසා පාලම යටින් ජලය බැස යාමේ යම් ප්‍රශ්නයක් ඇති වී ඒ අවට ඉඩම් වැසී ජලයෙන් යට වුණා. ගොඩගම - පැල්පිට මාර්ගයේ නිතරම ජල බවුසර් ගමන් කිරීම නිසා ඒ මාර්ගය ගිලා බසිමින් පවතිනවා. නිට්ටඹුව වෙළෙඳ සංකීර්ණය අසල තිබෙන ප්‍රාදේශීය සභාවේ රථගාලට වාහන ඇතුළු කිරීමට කටයුතු කළ යුතුයි. ඒ රථගාල පිරිසිදු භාවයෙන් ද අඩුයි.

ශ්‍රීමාලි පුෂ්ප කුමාරි (එජාප), උපුල් ප්‍රසන්න පෙරේරා (ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ) සුනීතා හේමමාලි ඉද්දගොඩ (ශ්‍රී ලපොපෙ) සුදර්ශනී ගුණරත්න (ශ්‍රීලනිප) යන මහත්ම මහත්මිහු ද මෙම මහ සභා රැස්වීමේ දී අදහස් දැක්වූහ.

කොච්චිකඩේ පොලිසියේදී නීතිඥයාට තර්ජනය කිරීම: සැකකරුට දැඩි කොන්දේසි ඇප

(මීගමුව අධිකරණ - ඩබ්ලිව් කීර්ති, මීගමුව - හියුබට් ප්‍රනාන්දු)

තම සේවාදායකයා හමුවීමට කොච්චිකඩේ පොලිස් ස්ථානය වෙත ගිය නීතිඥවරයකුට එහි පොලිස් ස්ථානාධිපති හමුවේ දී තර්ජනය කිරීම, පොලීසියෙන් බලෙන් ඉවතට යැවීමට තැත් කිරීම ඇතුළු චෝදනා රැසක් ලබා රිමාන්ඩ් බාරයේ පසු වූ සැකකරුවකුට තරයේ අවවාද කළ මීගමුව ප්‍රධාන මහේස්ත්‍රාත් ටී.එන්.එල්. මහවත්ත මහත්මිය සැකකරුට රුපියල් ලක්ෂ දෙක බැගින් ශරීර ඇප 2 ක් 9 ද නියම කළාය.

දැඩි ඇප කොන්දේසි මත රිමාන්ඩ් භාරයෙන් මුදහැරීමට නියෝග කළ සැකකරු වූයේ පලගතුරේ පදිංචි හුසේන් මොහොමඩ් ලාෆීර් නමැත්තෙකි.

සැකකරු මීට පෙර පොලිස් ඇප මත මුදා හැර තිබූ අතර ඊට විරෝධය දක්වමින් ජ්‍යෙෂ්ඨ නීතිඥ දර්ශන කුරුප්පු මහතා ඇතුළු නීතිඥවරු රැසක් සහ ශ්‍රී ලංකා නීතිඥ සංගමය නියෝජනය කරමින් ජ්‍යෙෂ්ඨ නීතිඥ ඉන්දික සිල්වා මහතා විසින් ඉදිරිපත් කළ කරුණු අනුව සැකකරුට ලබා දී තිබූ පොලිස් ඇපය අවලංගුකර සැකකරු දෙවැනි වරට රිමාන්ඩ් භාරයට පත්කොට තිබිණි.

මෙම නඩුව 9 වැනිදා අධිකරණය හමුවේ කැඳ වූ අවස්ථාවේ සැකකරු විසින් පොලිස් ස්ථානය තුළ දී මැරයකු ලෙස හැසුරුණු ආකාරය පිළිබඳව අගතියට පත් පාර්ශ්වය වෙනුවෙන් නීතිඥවරු රැසක් කරුණු ඉදිරිපත් කළහ.

මෙහි දී විත්තිය වෙනුවෙන් පෙනී සිටි ජ්‍යෙෂ්ඨ නීතිඥ රෝස් ප්‍රනාන්දු මෙනවිය කරුණු දක්වමින් එකම ගම්මානයේ දෙපිරිසක් අතර වූ ගැටුමක් මෙම සිද්ධියට පසුබිම් වී ඇති බවත් සැකකරු ඉදිරියේ දී පීඩාවක් ඇති නොවන ලෙස කටයුතු කරන බවත් පැවැසුවාය.

ඒ අනුව සැකකරු රුපියල් ලක්ෂ 2 බැගින් ශරීර ඇප මත මුදා හැරීමට නියෝග කළ අධිකරණය වැඩිදුර විභාගය සැප්තැම්බර් මස 23 වැනිදාට කල් තැබිණි.

මෙහි පැමිණිල්ල කොච්චිකඩේ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ශ්‍රීනික ජයකොඩි මහතා ඇතුළු පොලිස් නිලධාරීන් පිරිසක් මෙහෙය විය.

අගතියට පත් පාර්ශවය වෙනුවෙන් නීතිඥ රංජන් ජයසිංහ, සුදේශ් අමරසිංහ, චාමර ජයසිංහ, බැස්ටියන් ජයවර්ධන, සුරාජ් ජයමාන්න, මහින්ද සුගතදාස, සකුල ගුණතිලක යන මහත්වරුන් ඇතුළු විශාල නීතිඥවරුන් රැසක් සමඟ අගතියට පත් පාර්ශ්වය වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ නීතිඥ ප්‍රිමාල් අමරසිංහ සංජීව ඇන්ටනී යන මහත්වරුන් සමඟ ජ්‍යෙෂ්ඨ නීතිඥ දර්ශන කුරුප්පු මහතා පෙනී සිටියේය.

ශ්‍රී ලංකා නීතිඥ සංගමය නියෝජනය කරමින් ජ්‍යෙෂ්ඨ නීතිඥ ඉන්දික සිල්වා මහතා පෙනී සිටියේය. වැඩිදුර විභාගය සැප්තැම්බර් මස 23 වැනිදා පැවැත්වේ.

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

සභාවෙන් සල්ලි දීලා කඩයක් ගනිද්දී ඒකට කුලිය ගන්නේ ඇයි ?

හේමාල් මෙන්ඩිස් (ජවිපෙ)

නිකාඩෝවත්තට හයර් යන්න ත්‍රිරෝද රියැදුරන් කැමැති නෑ

චන්දික දුෂ්‍යන්ත (පොජපෙ)

සණස ව්‍යාපාරය ජාත්‍යන්තර සමූපකාර දිනය සමරයි

ලොව පුරා ව්‍යාප්තව පවතින ප්‍රමුඛතම සමාජ සුබසාධන ව්‍යාපාරයක් වන සමූපකාර ව්‍යාපාරය සිය 99 වැනි සංවත්සරය පසුගියදා උත්සවාකාරයෙන් සැමරූ අතර ඊට සමගාමීව සණස සමිති, සණස ලයිෆ් ඉන්ෂුවරන්ස්, සණස ජෙනරල් ඉන්ෂුවරන්ස්, සණස සංවර්ධන බැංකුව ඇතුළු මෙරට සණස සමූහ ව්‍යාපාරයට අයත් ආයතනද, ජාත්‍යන්තර සමූපකාර දිනය අභිමානවත් ලෙස සැමරිය.

'එක්වී මනාව යළි ගොඩ නැගෙමු' යන තේමාව ඔස්සේ මෙවර ජාත්‍යන්තර සමූපකාර දිනය පැවැත්විණි. රටවල් 112ක් ජාත්‍යන්තර සමූපකාර සන්ධානයේ සාමාජිකත්වය ලබා ඇත. කාර්මික විප්ලවය සමග ඇති වුණ සාමාජීය සහ ආර්ථික වෙනස්කම් සමග පීඩනයට පත් වුණ ගොවියා සහ කම්කරුවා නගා සිටුවීමේ අරමුණින් සමූපකාර ව්‍යාපාරය මූලිකව අරඹන ලදී. 1923දී ප්‍රථම වරට ජාත්‍යන්තර සමූපකාර දිනය සැමරීමට තීරණය කරන ලදී. ඒ අනුව සෑම වසරකම ජූලි මස පළමු



වැනි සෙනසුරාදා ජාත්‍යන්තර සමූපකාර දිනය ලෙස නම් විය.

ආචාර්ය පී.ඒ. කිරිවන්දෙණිය මහතාගේ මූලිකත්වයෙන් ඇරැඹුණු සණස ව්‍යාපාරය සාමාජිකයන් ලක්ෂ 30කට ආසන්න ගණනකින් සමන්විත වන අතර සණස ප්‍රාථමික, දිස්ත්‍රික්, ජාතික සහ ජාත්‍යන්තර ලෙස මට්ටම් කිහිපයකින් ක්‍රියාත්මක වේ. එහි ප්‍රාථමික මට්ටමේ මූලික කාර්යයන් වන්නේ සාමාජිකයන්ගේ සකසුරුවම් බව වර්ධනය කිරීම, ආර්ථික වර්ධනයට මූල්‍ය සම්පත් සැපයීම, සාමාජිකයන්ට අධ්‍යාපනය සැපයීම ආදියයි. "සමූපකාර ව්‍යාපාරය නිර්මාණය වූණේ ලෝකයේ අර්බුද පවතින අවස්ථාවක. එනිසා ඉතාම අර්බුදකාරී අවස්ථාවල ප්‍රමුඛ බලපෑමක් කරන්න සමත් ශක්තිමත් ව්‍යාපාරයක් ලෙස සමූපකාර ව්‍යාපාරය සෑම විටම ක්‍රියාත්මක වුණා. වර්තමන් කොරෝනා අර්බුදය ඇති කළ ගැටලු විසඳ ගෙන ජන ජීවිත ජය ගන්න අවශ්‍ය මඟ පෙන්වීම සිදු කරන්න අප සූදානම්." සණස නිර්මාතෘ ආචාර්ය පී.ඒ. කිරිවන්දෙණිය මහතා පැවසීය.

සංචිත අර්බුදයට පිළියමක්

ඇමෙරිකානු ඩොලර් බිලියනයක විදේශ ණය නැවත ගෙවීමත් සමඟ ආණ්ඩුව තුළත් රට තුළත් ඒ සම්බන්ධයෙන් කතාබහක් ඇති විය. එම ණය මුදල ගෙවීමට නියමිතව තිබුණේ ජූලි 27 වැනිදා වන අතර ඊට දිනකට පෙර එය ගෙවා දැමීමට ආණ්ඩුවට හැකියාව ලැබිණි. ඒ අනුව ණය මඟ නොහැර නියමිත දිනට ගෙවීමේ මෙරට වාර්තාව ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යෑමට මේ ආණ්ඩුව ද සමත් විය. මේත් සමඟ රටේ විදේශ මූල්‍යයේ තිබෙන අවදානම් තත්ත්වය විසඳූ ගනු ඇතැයි විශ්වාසය ද ඇති වී තිබේ. විදේශ සංචිත කඩිනමින් නැවත පුරවා ගනිමින් දීර්ඝකාලීනව විදෙස් සංචිත ශක්තිමත් කරගන්නේ කෙසේ ද?

සංචිත නැවත පුරවා ගන්නේ කෙසේ ද?

ඇමෙරිකානු ඩොලර් බිලියන තුනකටත් අඩු අගයකට පහත වැටී තිබෙන විදේශ සංචිත ප්‍රමාණය මේ වසර අවසන් වන විටදී සෑහීමකට පත්වීමට හැකි අගයකට ගෙන ඒමට හැකියාව ලැබෙනු ඇතැයි ආණ්ඩුව විශ්වාස කරයි. මිත්‍ර රටවල් සමඟ මුදල් හුවමාරු (ස්වැප්)වලට එළැඹීමටත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රධාන සහ මේ වසරේ ඉදිරි මාසවලදී සේවාවලින් ඉහළ ආදායම් ලබාගත හැකි වනු ඇති බවටත් ආණ්ඩුව බලාපොරොත්තු තබා ඇත.

කෙසේ නමුත් විදේශ සංචිතවල තිබෙන මෙම භයානක සහ අස්ථිර ස්වභාවය මේ වසර අවසානයේදීත් පවතිනු ඇති බවත් ලබන වසරේ දී මෙම තත්ත්වය තවදුරටත් උග්‍ර වනු ඇති බවටත් විශ්ලේෂකයෝ/ විශේෂඥයෝ පෙන්වාදෙති. ලබන වසරේ දී තවදුරටත් විදේශ ණය ගෙවීම් කිරීමට තිබෙන බැවින් සහ ආනයන වියදම් වැඩිවීමත් යන කරුණු මුල් කරගනිමින් මේ තත්ත්වය උග්‍ර වනු ඇතැයි ඔවුහු පෙන්වාදෙති.

මුදල් හුවමාරු (ස්වැප්)

ඉන්දියාව සහ බංග්ලාදේශය සමඟ මුදල් හුවමාරු පහසුකම් තුළින් සහ චීනයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 150ක යුවාන් ණය පහසුකම් ලැබීමට නියමිත අතර මේවා මඟින් විදේශ සංචිත ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් (එස්.ඩී.ආර්./ ජාත්‍යන්තර සංචිත වත්කම්) යටතේ මෙරටට ලැබීමට නියමිත ඇමෙරිකානු ඩොලර් මිලියන 780ක මුදල ද විදෙස් සංචිත ඉහළ යෑමට උපකාරී වනු ඇතැයි අපේක්ෂිත ය.

මුදල් හුවමාරු යනු සංචිත ඉහළ දමන තාවකාලික පහසුකම් වන අතර එම මුදල් නැවත ගෙවිය යුතු වේ. චීනයෙන් ලැබෙන ණය පහසුකම චීනයෙන් ආනයනය කිරීමට උපකාරී වනු ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලැබෙන මුදල ප්‍රදානයකි.

ඉන්දියාවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක් ද බංග්ලාදේශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 250ක් ද වශයෙන් මුදල් හුවමාරු පහසුකම් ලැබීමට නියමිත ය. මේවා කෙටිකාලීන පහසුකම් වන අතර අවිනිශ්චිත තත්ත්වයක තිබේ. චීනයෙන් ලැබෙන යුවාන් ණය පහසුකම ප්‍රයෝජනවත් වන්නේ චීනයෙන් භාණ්ඩ මිලදී ගැනීමට පමණි.

ප්‍රයෝජනවත් සහන

මුදල් හුවමාරු, ණය සහ අනෙකුත් මූල්‍ය පහසුකම් සියල්ල සහන වන නමුත් ඒවා විසඳුම් නොවේ. කෙසේ නමුත් මේවා දැනට විදේශ මූල්‍යයේ තිබෙන අර්බුදකාරී තත්ත්වය විසඳගැනීමට ප්‍රයෝජනවත් වේ. කෙසේ නමුත් මේවා ප්‍රශ්නයට විසඳුම් නොවේ.

විසඳුම්

දැඩි ආනයන සීමා පනවමින් වෙළෙඳ හිඟය අඩු කරගැනීම අත්‍යවශ්‍ය වේ. වෙළෙඳ භාණ්ඩ අපනයන ආදායම වැඩි කිරීමත් සේවාවලින් ආදායම් වැඩි කරගැනීමත් රටේ විදේශ මූල්‍යයේ තිබෙන අර්බුදකාරී තත්ත්වය පාලනය කරගැනීමට උපකාරී වේ. දැනට අපේක්ෂිත බොහෝ අරමුදල්/ පහසුකම් කෙටිකාලීන සහන පියවර ය.

සරල සත්‍යය සම් රට විදේශ විනිමය උපයාගත්තේ ආනයන මත වියදම් කිරීමෙන් පසු ඉතිරි වන මුදලිනි. කෙටියෙන්ම සඳහන් කරන්නේ නම් වෙළෙඳ හිඟය අඩු කරගැනීමට පියවර ගත යුතු ය. හැකියාවක් ඇති නම් 2019 වසරේ දී මෙන් ගෙවුම් ශේෂයේ අතිරික්තයක් උපයාගත යුතු ය. එම අවස්ථාවේදී වෙළෙඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන අටක් වූ අතර සේවාවලින් සහ ප්‍රාග්ධන ගලාඒම්වලින් එය පියවා ගැනීමට හැකියාව ලැබිණි.

ඉකුත් වසරේ දැඩි ආනයන සීමා පනවමින් ආනයන අඩු කරගැනීමටත් වෙළෙඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන හයක් දක්වා අඩු වුවත් ගෙවුම් ශේෂයේ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන 2.3ක් විය.

ඉහළ ආදායම්

මේ වසරේ සිවුවැනි කාර්තුවේ දී ප්‍රේෂණ, තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවාවලින් සහ සංචාරක කර්මාන්තයෙන් ලැබෙන ආදායම් ඉහළ යනු ඇතැයි අපේක්ෂිත ය. එමඟින් සංචිත ප්‍රමාණවත් ප්‍රමාණයට වැඩි වනු ඇතැයි අපේක්ෂිත ය. ඉහළ වටිනාකමකින් සමන්විත මැණික් සොයාගැනීම තවත් වාසියකි. ඒවා ඇමෙරිකානු ඩොලර් මිලියන 100ත් 200ත් අතර වනු ඇතැයි ගණන් බලා ඇත. මැණික්, ඒවායේ අයිතිකරුවන්ට වාසියක් වුවද රටේ විදේශ සංචිතවලට නම් එතරම් වටිනාකමක් නැත. අප සිටින්නේ දැඩි අර්බුදයක ය. එබැවින් මහ මුහුදකට

ආචාර්ය
නිමල් සඳරත්න PhD

වතුරු බිංදු කිහිපයක් දමන්නාක් මෙන් මේ මැණික් අපේ දුර්වල සංචිතවලට එක් කළ හැකි ය. කෙසේ නමුත් මේ මැණික්වල වටිනාකම අඩු බවද මේ වනවිට දැනගන්නට ලැබේ. ඉහත කී මේ ගලාඒම් මඟින් මේ වසර අග වනවිට විදෙස් සංචිත ඉහළ යනු ඇතැයි අපේක්ෂිත ය.

අතීත අත්දැකීම්

රටේ වෙළෙඳ ගිණුමේ අතිරික්තයක් පැවැතියේ වසර හතරක් හෝ පහක් පමණි. ව්‍යුහගත ගැටලු තිබෙන බව එයින් ඉතා හොඳින් පැහැදිලි ය. අවසාන වරට වෙළෙඳ හිඟයේ අතිරික්තයක් වාර්තා වූයේ මීට වසර 44කට පෙර එනම් 1977 වසරේ දී ය. එය ද ඉතා කුඩා අගයකි. එම අතිරික්තය ළඟා කරගත්තේ දැඩි ආනයන සීමා පනවමින් සහ අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල හිඟ පවතින තත්ත්වයක් තුළ ය. එම සමයේ දී ජීවනෝපායවලට දැඩි දුෂ්කරතා ඵල්ලා විය. එමෙන්ම ආර්ථික වර්ධන වේගය ද අඩු අගයක පැවතුණි.

මූලධර්ම හේතු

දිගින් දිගටම වෙළෙඳ හිඟ පැවැතීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ අපනයන වැඩි කිරීමට ඇති අසමත්කම ය. කෙසේ නමුත් අපනයන වැඩි නොවුණ ද ආනයන දිගින් දිගටම සැලකිය යුතු අගයකින් වැඩි විය. බොහෝ වසරවලදී ආනයන වියදම අපනයන ආදායම මෙන් දෙගුණයක් විය. ඉකුත් වසරේ දී (2020) වෙළෙඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන හයක අගයකට ගෙන ඒමට සමත් විය. කෙසේ නමුත් එම වසරේ ආනයන වියදම ඇමෙරිකානු ඩොලර් බිලියන 16ක් වූ අතර අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 10ක් විය.

2021 වෙළෙඳ ශේෂය මේ වසරේ වෙළෙඳ ශේෂය කුමක් වනු ඇති ද ?

ඉකුත් වසරේ දී වෙළෙඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන හයක් වූ අතර මේ වසරේ දී වෙළෙඳ හිඟය දෙගුණ වනු ඇත. මේ වසරේ මුල් අර්ධයේ දී අපනයන ආදායම ඉතා හොඳ තත්ත්වයක් පෙන්නුම් කළ ද දැඩි ආනයන සීමා පනවා තිබුණ ද ආනයන වැඩි වීම හේතුවෙන් මේ වසරේ දී වෙළෙඳ හිඟය පසුගිය වරට සාපේක්ෂව දෙගුණ වනු ඇත.

අපනයන

මේ වසරේ මුල් අර්ධයේ අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 5.6ක් වූ බව අපනයන සංවර්ධන මණ්ඩලය ඉකුත් ද සඳහන් කළේය. වෙළෙඳ භාණ්ඩ අපනයන ඇමෙරිකානු ඩොලර් බිලියන 12ක් වනු ඇතැයි එම මණ්ඩලය ඇස්තමේන්තු කර ඇත. එය එසේ වුවත් ඉහළ ආනයන වියදම හේතුවෙන් වෙළෙඳ හිඟය තවදුරටත් පුළුල් වනු ඇත.

මේ වසරේ මුල් අර්ධයේ දී වෙළෙඳ භාණ්ඩ අපනයන ඇමෙරිකානු ඩොලර් බිලියන 5.56ක් ලෙස දැක්වුණු අතර එය පසුගිය වසර හා සැසඳීමේදී සියයට 27.5ක වර්ධනය කි. පසුගිය වසරේ මුල් මාස හයේ දී වෙළෙඳ භාණ්ඩ අපනයන ඇමෙරිකානු ඩොලර් බිලියන 4.36ක් විය. කොවිඩ්-19 වසංගතය තෙවැනි රැල්ල මධ්‍යයේ වුවද එම අපනයන ආදායම ලබාගත හැකි වූයේ දැඩි සීමා සහ බාධක මධ්‍යයේ ය. ජාත්‍යන්තර ඉල්ලුම ක්‍රමයෙන් වැඩි වීමත් සමඟ නිෂ්පාදිත අපනයන ද ක්‍රමයෙන් වැඩි විය.

ඉල්ලුම

ආනයන මත දැඩි සීමා පනවා තිබුණ ද ආනයන වියදම් වැඩි වීම හේතුවෙන් මේ වසරේ ගෙවුම් ශේෂයට අහිතකර ලෙස බලපෑම් ඵල්ල වනු ඇත. ආහාර, අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සහ අමුද්‍රව්‍ය සහ කෘෂිකාර්මික අපනයන ඇඳු වීම යනාදිය හේතුවෙන් මේ වසරේ දෙවැනි අර්ධයේ දී වෙළෙඳ හිඟය තවදුරටත් පුළුල් වනු ඇත. පොහොර ආනයනය මත සීමා පැනවීම හේතුවෙන් මීට ප්‍රතිචාර දක්වනු ඇති අතර විමඟින් වෙළෙඳ ශේෂයේ තත්ත්වය උග්‍ර වනු ඇත. ඊට ප්‍රධානම හේතුව ආහාර නිෂ්පාදන අඩු වීම යි.

ගෙවුම් ශේෂය

වෙළෙඳ ශේෂය පුළුල් වීම යන තත්ත්වය මධ්‍යයේ සේවා අංශවලින් ලැබෙන ආදායම් ඉතා වැදගත් වේ. පසුගිය වසරේ දී එය ඉතා වැදගත් විය. කෙසේ නමුත් මේ මොහොතේ තිබෙන වැදගත්ම ප්‍රශ්නය වන්නේ සේවක ප්‍රේෂණ, තොරතුරු සන්නිවේදන සහ තාක්ෂණ ක්ෂේත්‍රයෙන් ලැබෙන ආදායම් සහ ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් වෙළෙඳ හිඟය ඉක්මවා ගොස් ගෙවුම් ශේෂයේ අතිරික්තයක් නිර්මාණය කරනු ඇත්ද යන්න යි.

සාරාංශය

ඉකුත් මාසයේ දී විදේශ සංචිත ඇමෙරිකානු ඩොලර් බිලියන තුනටත් අඩු අගයකට අඩු විය. මෙය ඉතාමත් අඩු අගයක් වන මෙය භයානක තත්ත්වයකි. මේ වසරේ ආනයන අවශ්‍යතා ද ඉතා ඉහළ බැවින් පවතින්නේ අවදානම් සහගත තත්ත්වයකි. මුදල් හුවමාරු සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලැබෙන ප්‍රදානය මේ කඩිනම් දුෂ්කරතාවලින් රටට තාවකාලික සහන සහ පිළියම් සපයනු ඇත. මේවා මේ අවස්ථාවේ අවශ්‍ය සහන/පහසුකම් වන අතර කෙසේ නමුත් මේවා විසඳුම් නොවේ. විදේශ මූල්‍යයේ තිබෙන ව්‍යුහගත අර්බුදවලට විසඳුම් අවශ්‍ය වේ.

නිගමනය

රටේ විදේශ මූල්‍යයේ තිබෙන ප්‍රශ්නයට තිබෙන ඇති එකම ප්‍රායෝගික විසඳුම වන්නේ අපනයන වැඩි කරමින් වෙළෙඳ හිඟය අඩු කිරීමත් සේවාවලින් ආදායම් උපයමින් ගෙවුම් ශේෂයේ අතිරික්තයක් ඇති කරගැනීමත් ය.

සන්ඩේ ටයිම්ස් පුවත්පතේ පළවූ ලිපියේ පරිවර්තනය

හර්ෂණ තුෂාර සිල්වා

හම්බන්තොට වරායේ තොග නාණ්ඩ හැසිරවීම් ඉහළට



හම්බන්තොට ජාත්‍යන්තර වරාය (HIP) විසින් මුද හරින ලද ඉහළතම තොග ප්‍රමාණය වාර්තා කරමින් මැතකදී ඉන්සි සිමෙන්ති සඳහා ගෙන ආ පිප්සම් තොග දිනකට මෙට්‍රික් ටොන් 24,000 බැගින් හසුරුවන ලදී.

ඉන්සි සිමෙන්ති සමාගමේ ප්‍රසම්පාදන හා සැපයුම්හි අධ්‍යක්ෂ තුසිත් ගුණවර්ණසූරිය මහතා පවසන්නේ මෙය ශ්‍රී ලංකාවේ වරායකට වේගය සහ කාර්යක්ෂමතාව අනුව හිමිවූ සුවිශේෂී ජයග්‍රහණයක් බවයි. ඒ මහතා මෙසේද පැවසීය. "ශ්‍රී ලංකාවේ අංක 1 සිමෙන්ති නිෂ්පාදන සමාගම ලෙස අප විශාල යාත්‍රාවලින් අමුද්‍රව්‍ය ආනයනය කරනවා. එම යාත්‍රා රටට පැමිණි පසු හම්බන්තොට ජාත්‍යන්තර වරාය සමූහය (HIPG) සහ හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝර්ට් සර්විසස් සමාගම (HIPS) , වේගයෙන් තොග මුදහැරීමේ කටයුතු සිදු කරනවා. වරාය මෙහෙයුම් වේගවත් වන තරමට අපට පමණක් නොව රටටත් වැඩි වාසියක් ලැබෙනු ඇත. මහද්‍වයත් යාත්‍රාව වරායේ රැඳී සිටින දින 2 1/2 සඳහා අප, රඳවා තබා ගැනීමේ හා ප්‍රමාද ගාස්තු ලෙස ඇමෙරිකානු ඩොලර් 75,000කට ආසන්න මුදලක් ගෙවයි. එබැවින්, අප මෙවර සිදු කළ ආකාරයට මෙන් දින දෙකහමාරකට කලින් මුදහැරීමේ කටයුතු නිමා කළ නිසා, සැලකිය යුතු ලෙස පිරිවැය ඉතිරි කර ගැනීමට අපට හැකි වුණා. එය අපගේ සමාගමට වාසියක් වන අතර රට සඳහාද විදේශ විනිමය සැලකිය යුතු ලෙස ඉතිරි කිරීමකි".

HCL ශ්‍රී ලංකා මධ්‍යස්ථානයට සිනමන් Life තෝරාගනී



කොළඹ නගරයේ අභිනවින පහසුකම් වලින් සමන්විත නවතම කාර්යාලයීය කුලුන වන Cinnamon Life ව්‍යාපෘති 'The Offices' තම ශ්‍රී ලංකා මධ්‍යස්ථානය ලෙස තෝරාගැනීමට, ලොව ප්‍රමුඛතම තාක්ෂණ සමාගමක් වන HCL Technologies තීරණය කර තිබේ.

ඒ අනුව එම සමාගම 'The Offices' හි කාර්යාල අවකාශ අතරින් සියයට 80ක ප්‍රමාණයක් භාවිත කරනු ඇත. ජාත්‍යන්තර සමාගමක් මේ ආකාරයක මෙරට A ශ්‍රේණියේ කාර්යාලයීය කුලුනක කාර්යාල අතරින් බහුතරය වෙන්කරවා ගත් ප්‍රථම අවස්ථාව මෙයයි.

මේ සඳහා වන ගිවිසුමට HCL Technologies සහ පෝන් කිල්ස් හෝල්ඩින්ස් (JKH) යන සමාගම් වල නියෝජිතයන් විසින් පසුගියදා අත්සන් තබන ලදී. මේ ඔස්සේ තවත් දේශීය හා ජාත්‍යන්තර සමාගම් රැසක් මෙම ව්‍යාපෘතිය වෙත ආකර්ෂණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එමෙන්ම ජාත්‍යන්තර සමාගමක් මේ ආකාරයට මෙරට තුළ තම ව්‍යාපාර කටයුතු පුළුල් කිරීමට සැලසුම් කිරීම, දකුණු ආසියාවේ ව්‍යාපාරික කේන්ද්‍රයක් බවට පත්වීමට කොළඹ නගරය සතු හැකියාව පිළිබිඳ මනා සාක්ෂියක් ලෙසද සැලකිය හැකි ය.

කොළඹ නගරයේ සුවිශේෂී ස්ථානයක පිහිටා තිබීම, නවීනතම පහසුකම් වලින් සමන්විතවීම සහ උසස් ප්‍රමිතිය සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමුකරමින් ඉදිකර තිබීම යනාදිය, Cinnamon Life ව්‍යාපෘතියේ The Offices තෝරාගැනීමට HCL සමාගම යොමුකරවූ ප්‍රධානතම සාධක ලෙස සැලකේ.

එමිරේට්ස් මඟින්ට නොමිලේ Expo නරඹන්න අවස්ථාවක්

කළාපයේ දැවැන්තම වෙළෙඳ ප්‍රදර්ශනයක් වන 2020 ඩුබායි Expo වෙළෙඳ ප්‍රදර්ශනයේ ප්‍රමුඛතම පාර්ශ්වකරුවා සහ නිල ගුවන් සමාගම ලෙස එමිරේට්ස් මෙම ප්‍රදර්ශනය නැරඹීමට සමාගමේ ගුවන් මඟින්ට සුවිශේෂී ප්‍රතිලාභයක් ඉදිරිපත් කර තිබේ.

මේ අනුව, මෙම වැඩසටහන පැවැත්වෙන 2021 ඔක්තෝම්බර් 01 වැනිදා සිට 2022 මාර්තු 31 වන දක්වා කාල සීමාව තුළදී ඕනෑම අවස්ථාවක ඩුබායි වෙත පැමිණෙන සහ ඩුබායි හරහා ගමන් කරන එමිරේට්ස් මඟින්ට ඔවුන්ගේ සියලුම ගුවන් ටිකට්පත් වලට නොමිලේ Emirates Expo Day Pass එකක් ලබාදීමට ගුවන් සමාගම කටයුතු කර ඇතැයි එම සමාගම සඳහන් කරයි.

එමිරේට්ස් සඳහන් කරන්නේ 2021 ඔක්තෝම්බර් 01 වැනිදා සිට 2022 මාර්තු 31 වැනිදා දක්වා ඩුබායි වෙත හෝ ඩුබායි හරහා ගමන් කරන සියලුම එමිරේට්ස් ගුවන් මඟින්ගේ ටිකට් පත් සඳහා මෙම විශේෂ දීමනාව ලබාදෙන බවයි. මීට අමතරව, චක්සත් අරාබි එමීර් රාජ්‍යයට පිටත සිට පැමිණෙන එක් දිගාවකට පමණක් ගමන් කරන ගුවන් මඟින් ඩුබායි වෙත පැමිණීමේදී හෝ ඩුබායි හි අවම රැඳී සිටීමේ කාලය සම්පූර්ණ කරමින් වෙනත් ගමනාන්ත වෙත ගමන් කිරීමේදී ත්‍යාගයක් ලෙස Expo Day Pass එකක් ප්‍රදානය කිරීමටද එමිරේට්ස් කටයුතු කර තිබේ.

ස්පාර්ක්ලින්ක් හතළිස් දෙවසරක විශිෂ්ටත්වය සමරයි

දශක හතරකට අධික කාලයක් පුරා මෙරට සංචාරක ක්ෂේත්‍රය තුළ විශිෂ්ට සහ කැපිපෙනෙන කාර්යභාරයක් සිදුකළ ස්පාර්ක්ලින්ක් ට්‍රැවල්ස් (Sparklink Travels) ආයතනය පසුගියදා සිය 42වැනි සංවත්සරය සමරනු ලැබිය. වර්ෂ 1979දී නිහාල් පෙරේරා මහතාගේ මූලිකත්වයෙන් පවුලේ ව්‍යාපාරයක් ලෙස ආරම්භ වූ Sparklink Travels අද දක්වාම ඒකාබද්ධතාව, සක්‍රියතා සහ ගුවන් සවාරි, නෞකා සවාරි සහ සංචාරවල විශිෂ්ටත්වය තුළින් සුවිශේෂී සේවාවක් සංචාරකයන්ට ලබාදීමට කැපවී සිටියි. එම සුවිශේෂත්වය හේතුවෙන් ප්‍රතිඵල සහතිකය ලත් සංචාර ආයතනයක් බවට පත්වීමට ද එම ආයතනයට හැකිවී තිබේ.

මෙරට සංචාරක කර්මාන්තය තුළ සිටින ප්‍රවීණ චරිතයක් වන නිහාල් පෙරේරා මහතා ලංකා සංචාරක මණ්ඩලයේ සංවර්ධන හා ප්‍රචාරණ අංශයේ අධ්‍යක්ෂවරයා ලෙස ද සේවය කළේය. ඔහු මේ වනවිට ප්‍රකී පෙරේරා සමඟ එක්ව ඕස්ට්‍රේලියාවේ සිට ස්පාර්ක්ලින්ක් ට්‍රැවල්ස් Australia ආයතනය ද මෙහෙයවනු ලබයි. ස්පාර්ක්ලින්ක් ට්‍රැවල්ස් සතු පළපුරුදු සහ වෘත්තීය කාර්යමණ්ඩලය වර්තමානයේදී සිය සංචාරක සේවා, කොල්ලුපිටිය, ලිබර්ටි ආර්කේඩ්හි පිහිටි සිය කාර්යාලයේ මෙන්ම දුරස්ථ වශයෙන් ද ක්‍රියාත්මක වෙමින් ලබාදෙන අතර, සඳුදා සිට සිකුරාදා දක්වා දූරකථනය ඔස්සේ ද ඔවුන්ගේ සේවා පිළිබඳ තොරතුරු ලබාගත හැක. මේ අතර කොරෝනා විසංගත තත්ත්වය හමුවේ අවලංගු වූ සංචාරවලට අදළව සංචාරකයන් විසින් ගෙවා තිබූ මුදල්වලින් රුපියල් මිලියන 10කට වැඩි ගණනක් නැවත ගෙවීමට ද සමාගම විසින් දැනටමත් පියවර ගෙන තිබේ. නැවතත් ජාත්‍යන්තර දේශසීමා විවෘත වීමත් සමඟ තම සුපුරුදු සේවා සංචාරකයන්ට ලබාදීමට ස්පාර්ක්ලින්ක් ට්‍රැවල්ස් සමාගම සූදානම්ව සිටියි.

ඛයලොග් ක්‍රීඩා අමාත්‍යාංශය සමඟ youth Can දියත් කරයි

ශ්‍රී ලාංකික තාරුණ්‍යයට තම කුසලතා ඔප් නැංවීමට මඟ පෙන්වීම හා සහයෝගය ලබා දීම අරමුණකර ගනිමින්, අන්තර්ජාතික තරුණ දිනයට සමගාමීව ඛයලොග් ආෂ්ආථා සමාගම තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය සමඟින් එක්ව Youth Can වැඩසටහන පසුගිය දා දියත් කළේය.

මෙම වැඩසටහන තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය හා ජාතික තරුණ සේවා සභාව සමඟින් එක්ව, මිනිස් බල හා රැකියා දෙපාර්තමේන්තුවේ, කුඩා ව්‍යවසාය සංවර්ධන අංශයේ සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව, සුවිශේෂී හැකියාවන් සහිත තරුණ තරුණියන්ට ඔවුන්ගේ කැමති ක්ෂේත්‍රවල ඉදිරියට යාමට අවශ්‍ය අවස්ථාව උදකර දෙයි. ඔවුන්ගේ සිහින සැබෑ කර ගැනීමට අවස්ථාව උදෙ වේ.

මෙම තුන් අවුරුදු වැඩසටහන වයස අවුරුදු 14

ත් 35 ත් අතර වයස් සීමාවන් තුළ සිටින තරුණ තරුණියන්ගේ හැකියාවන් සහ දක්ෂතාව ක්‍රීඩා, නව ව්‍යාපාර අදහස්, ශිල්ප කලා, මෝස්තර නිර්මාණකරණය, සූපවේදය සහ කෝපි චිත්‍රපට යන අංශ 6ක් ඔස්සේ තරඟකාරීව එළිදැක්වීම කෙරෙහි අවධානය යොමු කෙරේ. තෝරාගත් අයදුම්කරුවන් සඳහා වැඩමුළුව, අදළ මෙවලම් හා පුහුණුව ලබා දී, දැනුමින් සහ හැකියාවන්ගෙන් බලගැන්වීමත් සිදුවනු ඇත. ජාතික තරුණ සේවා සභාව, මිනිස්බල හා රැකියා දෙපාර්තමේන්තුව, කුඩා ව්‍යවසාය සංවර්ධන අංශය සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් පත්කළ ඒ ඒ ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගෙන් තේරීම් කමිටුව සමන්විත වනු ඇති අතර, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ තේරීම් සිදුවනු ඇත. මේ පිළිබඳව වැඩි විස්තර ලබා ගැනීම් සහ අයදුම්පත් යොමු කිරීම www.youthcan.lk කෘන වෙබ් අඩවිය ඔස්සේ සිදුකළ හැකිය.

සිංගර් වෙතින් අති නවීන ස්මාර්ට් බෝඩ්

සිංගර් විසින් ඩිජිටල් අධ්‍යාපනය සඳහා ස්මාර්ට්බෝඩ් නිෂ්පාදන පෙළක් වෙළඳපොළට හඳුන්වා දෙනු ලැබ ඇත. මාර්ගගත අධ්‍යාපනික කටයුතු සහ ව්‍යාපාරික රැස්වීම්/සම්මන්ත්‍රණ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම මෙහි මූලික අරමුණයි.

සිංගර්, දැනට ලොව නවීනතම LED තිර නිෂ්පාදනය කරන Skyworth සමාගමේ ස්මාර්ට්බෝඩ් නිෂ්පාදන පෙළක් හඳුන්වාදී ඇත. පරිගණකය, රූපවාහිනිය, ප්‍රොජෙක්ටරය සහ වයිට්බෝඩ් සතු සියලු විශේෂාංග වලින් සමන්විත වන ලෙස මෙම ස්මාර්ට්බෝඩ් නිර්මාණය කරඇත.



කාර්යන් කිහිපයක් එකවර කරගත හැකි මෙම ස්මාර්ට්බෝඩ් වර්තමාන ඔන්ලයින් අධ්‍යාපන කටයුතු සඳහා පවතින හොඳම විකල්පය බව එම සමාගම කියයි.

මෙය අඟල් 55, 65 සහ 75 ලෙස ප්‍රමාණයන් තුනකින් සහ ඇන්ඩ්‍රොයිඩ් හෝ වින්ඩෝස් 10 යන මෙහෙයුම් පද්ධති වලින් ලබාගත හැක. මෙම ස්මාර්ට්බෝඩ් නිෂ්පාදන පෙළ මඟින් වයිට්බෝඩ් හි සටහන් ලිවීම, අනෙක් පාර්ශ්වයට නැරඹිය හැකිලෙස වීඩියෝ සහ තිරය පෙන්විය හැකිවීම වැනි ප්‍රතිලාභ රැසක් හිමිකරදෙයි. ගුරුවරුන්ට ඉගැන්වීමට අවශ්‍ය දෑ මෙහි ගබඩා කර තබාගත හැකි බැවින් ඉදිරි ඉගැන්වීම් කටයුතු වලදී ඒවා පහසුවෙන් භාවිත කළ හැකිය.

ඩබ්ලිව් ආයුර්වේද රෝහලෙන් පොත් බෙදාදීමක්

**ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයුර්වේද රෝහලක් වන ඩබ්ලිව් ආයුර්වේද රෝහල සිය ආයතනික සමාජ වගකීම මනාව හඳුනා ගනිමින් පාසල් සහ දහම් පාසල් දරුවන් වෙනුවෙන් පොත් පත් බෙදා දෙමින් සමාජ සත්කාර රැසක් දියත් කළේය. එහි සුවිශේෂ පියවරක් සනිටුහන් කරමින් පසුගියදා මැදිරිගිරිය පෙ/දමෙය්පුර ප්‍රාථමික විද්‍යාලයට, මොරටුව ශ්‍රී ආරියවංශ දහම් පාස

මතුගම-කටුගහහේන කොවිඩ් රෝහලේ ඉදිකිරීම් ප්‍රමාදයි

සති දෙකින් හදනවා කිව් රෝහල මාස තුනක් ගිහිල්ලත් නෑ

රෝහල් සංවර්ධන කමිටුව කියයි

තවමත් වැඩ අවසන් නොමැති ගොඩනැගිල්ල

නව කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානය සඳහා ගෙනැවිත් තිබෙන ඇඳන්

(මතුගම බන්දු තඹවිට)

මැයි මාසයේ ආරම්භ කිරීමට නියමිතව තිබූ මතුගම කටුගහහේන රෝහලේ කොවිඩ් ප්‍රතිකාර ඒකකය, ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතුවල ප්‍රමාදය නිසා මේවනතෙක් ආරම්භ කිරීමට නොහැකිව ප්‍රදේශවාසී රෝගී ජනතාව දැඩි අපහසුතාවයට පත්වී ඇති බව රෝහල් සංවර්ධන කමිටුව පවසයි.

අමාත්‍යවරයා සහ බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා, කළුතර දිස්ත්‍රික් ලේකම් ඇතුළු නිලධාරීන් එම වාට්ටු සංකීර්ණය පසුගිය මැයි මස 07 වනද නිරීක්ෂණය කර එම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් භාරව කටයුතු කරන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ඉංජිනේරුවරයා සමග කරන ලද සාකච්ඡාවේ දී සති දෙකක් ඇතුළත ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ලබාදෙන බවට පැවසීමෙන් අනතුරුව නව කොවිඩ් ප්‍රතිකාර ඒකකයට අවශ්‍ය උපකරණ ඉක්මනින් ලබා දී මසක් ඇතුළත විවෘත කිරීමට කටයුතු සැලසීමට තීරණය විය.

ඒ අනුව නව ප්‍රතිකාර ඒකකයට අවශ්‍ය ඇඳන්, මෙට්ට, ලීබඩු ඇතුළු උපකරණ බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් සපයා ඇතත් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මගින් තවමත් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් නොකිරීම නිසා කොවිඩ් ප්‍රතිකාර ඒකකයේ ආරම්භය දිනෙන් දින ප්‍රමාද වෙමින් පවතී.

මේ පිළිබඳව කටුගහහේන රෝහලේ රෝහල් සංවර්ධන කමිටුවේ සභාපති නාරවිල සමිතවංශ නිමියෝ මෙසේ පැවසූහ.

කටුගහහේන රජයේ රෝහල අපේ ප්‍රදේශයට තිබෙන මහඟු සම්පතක්. මෙම රෝහල මගින් මෙම ප්‍රදේශයට විශාල සේවයක් සලසනවා. මේ වනවිට පවතින කොරෝනා වසංගතය මැඩලීමටත් මෙම රෝහල මගින් විශාල දායකත්වයක් සලසනවා. මෙම රෝහලට අයත් ප්‍රදේශයේ ජනතාවට කොවිඩ් මර්දන එන්නත් ලබාදීමත්, ආසාදිත සහ නිරෝධායනය වන නිවෙස් වෙත ගොස් එම නිවැසියන්ට වෛද්‍ය ප්‍රතිකාර ලබාදීමත් මෙම රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී රංජිත් දිසානායක මහතා ඇතුළු කණ්ඩායම් සාර්ථකව සිදුකරනවා.

නව කොරෝනා වාට්ටුවට අවශ්‍ය ඇඳන්, මෙට්ට, ලී බඳු ආදිය පවා ගෙනැවිත් තිබෙනවා. ඒත් සති දෙකෙන් දෙනවා කිව්ව ගොඩනැගිල්ල මාස තුනක් ගිහිල්ලත් තවමත් ඉදිකිරීම් අවසන් කර නැහැ.

මේ වන විට මේ ප්‍රදේශයේ විශාල වශයෙන් කොරෝනා පැතිරෙනවා. දිනකට රෝගීන් විශාල ප්‍රමාණයක් හඳුනා ගන්නවා. බොහෝ දෙනා තම නිවෙස්වල රැඳී සිටියත් සමහර රෝගීන්ට රෝහල් ගතකර ප්‍රතිකාර ලබා දීමට සිදුවෙනවා. මේ වන විට කළුතර දිස්ත්‍රික්කයේ කොරෝනා ප්‍රතිකාර මධ්‍යස්ථාන සියල්ලම පාහේ රෝගීන්ගේ පිරී පවතිනවා.

රෝගීන් විශාල පිරිසකට ප්‍රතිකාර ලබා දීමට හැකි මෙම ගොඩනැගිල්ල ඉක්මනින් වැඩ නිමකර ලබා දෙනවා නම් මේ අවස්ථාවේ විශාල සේවයක් වෙනවා. එම නිසා බලධාරීන්ගේ අවධානය මේ පිළිබඳව යොමුකර ඉක්මනින් මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන් කර නව කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානය ආරම්භ කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

මේ පිළිබඳව කටුගහහේන රෝහලේ, ප්‍රධාන ප්‍රධාන වෛද්‍ය නිලධාරී රංජිත් දිසානායක මහතා පැවසුවේ මේ වන විට මෙම ප්‍රදේශයේ කොවිඩ් පැතිරීම ඉතාම ඉහළ තත්ත්වයක පවතින බවත් දිනකට සිදුකරන රැපිඩ් ඇන්ටිජන් පරීක්ෂණ වලින් සියයට 70කට වඩා ආසාදිතයන් හමුවන බවත්, කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානයක අවශ්‍යතාවය ඉතා ඉහළින් දැනෙන බවත්ය.

කප්පිත්තන්ගොඩ පවුලකට නව නිවෙසක්

(අලුත්ගම තුසිත කුමාර ද සිල්වා)

බේරුවල කප්පිත්තන්ගොඩ පදිංචි පවුලකට නිවෙසක් තනා දෙන්නැයි කරදගොඩ බෙත්තාරාම විහාරාධිකාරී කුරුවිට ඤාන විසුද්ධි නාහිමියන් හා බේරුවල සමථ මූල මණ්ඩලයේ සභාපති විශ්‍රාමික විදුහල්පති කේ.ඩී. චන්ද්‍රපාල මහතා නිර්මල මරිය නිකායේ ඩිලාන් පෙරේරා පියතුමන් වෙත කළ ඉල්ලීම මත ඉදි කළ නව නිවෙස පසුගිය දා බාර දීම සිදු කෙරිණි.

නිර්මල මරිය නිකායික පියතුමන්ලාගේ ජනතාවට නිවාස ඉදිකිරීමේ කළුතර දිස්ත්‍රික් ව්‍යාපෘතිය මගින් බේරුවල ඉදි වූ මෙම නිවෙස ඉදිකිරීමේ කටයුතු සම්බන්ධීකාරකවරයා වන අරුණෝදය සමාජ සංවර්ධන පදනමේ සභාපති හා හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී. ඇන්ටන් සිල්වා මහතා මෙම නිවෙස ඉදිකිරීම පිළිබඳ අදහස් දක්වමින් මෙසේ පැවසීය.

නිවෙසක් නොමැතිව අසරණව ජීවත්වන ඕනෑම පවුලකට නිවාස ඉදි කර දීමේ නිර්මල නිකායික පියතුමන්ලාගේ නිවාස ව්‍යාපෘතියේ කළුතර දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරයා ද වන තමන් වෙත මෙම පවුල පිළිබඳ තොරතුරු ලද විගස සොයා බලා එම නිවෙස ඉදි කිරීමට අවශ්‍ය පසුබිම සකසා 2021-03-21 වැනිදා බුදු හා කිතුණු ආගමික ආශීර්වාදය ඇතුව මුල්ගල් තබා කොවිඩ් අවධානම ද නොතකා එම නිවෙස මාස පහක පමණ කාලයක් ඇතුළත දී සාදවා නිම කර බාර දීමට කටයුතු කළ බවත් මෙහි විශේෂත්වය වන්නේ නිර්මල නිකායික පියතුමන්ලාගේ නිවාස ව්‍යාපෘතිය තුළින් නිවාස ඉදිවන්නේ සෑම ආගමකම අසරණ නිවාස නොමැති පවුල් සඳහා වීම ද විශේෂ සත්‍යයක් බව ඒ මහතා මෙහිදී සඳහන් කළේය. මේ ආකාරයෙන් ඉදි කළ තවත් නිවාස රැසක් නොබෝ දිනකින් ජනතා අයිතියට පත් කරන බව ද සිල්වා මහතා පැවසීය.

මෙම අවස්ථාවට පූජ්‍ය කුරුවිට ඤනවිසුද්ධි නාහිමියන් වැඩම කර බෞද්ධාගමික වතාවත් ඉටු කළ අතර ගරු ඩිලාන් පෙරේරා පියතුමා, කේ.පී. ඇන්ටන් සිල්වා, බේරුවල සමථ මූල මණ්ඩලයේ සභාපති කේ.ඩී. චන්ද්‍රපාල මහතා ඇතුළු පිරිසක් සෞඛ්‍ය ක්‍රමවේද අනුගමනය කරමින් එක් වී සිටියහ.

පවුලේ අය ජීවත් වූ පැරැණි නිවෙස

ඉදි වූ නව නිවස භාර දීමෙන් පසු නිවාසලාභීන් සමඟ කුරුවිට ඤනවිසුද්ධි නාහිමියන්, ගරු ඩිලාන් පෙරේරා පියතුමන්, කේ.පී. ඇන්ටන් සිල්වා, කේ.ඩී. චන්ද්‍රපාල මහතා ඇතුළු ආගමික නායකයන් නිවාසලාභී පවුල් සමඟ සමූහ ඡායාරූපයකට පෙනී සිටින අයුරු.

පොල්ගස්ඕවිට සමෘද්ධිලාභීන්ට කාබනික පොහොර පාඩමක්

කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

(පාදුක්ක විශේෂ නිහාල් වෙත්තසිංහ)

සමෘද්ධිලාභී පවුල් ලක්ෂ දෙකක් සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පොල්ගස්ඕවිට සමෘද්ධි කලාපයේ සමෘද්ධිලාභීන්, කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් කහතුඩුව ග්‍රාම නිලධාරී වසමේ දී පසුගියදා පැවැත්වුණි.

පොල්ගස්ඕවිට සමෘද්ධි කලාපයට අයත් ග්‍රාම නිලධාරී වසම් 15 ක සමෘද්ධි ප්‍රජා මූල සංවිධානවල සාමාජික සාමාජිකාවන්ට, කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ දැනුවත් කිරීම හා ප්‍රායෝගික පුහුණුව ලබාදීම, කහතුඩුව කෘෂි උපදේශක ටී.ඒ.ඩී.එස්. කරුණාරත්න මහතා විසින් සිදු කෙරුණි.

හෝමාගම ප්‍රාදේශීය ලේකම් බී.ඒ.ඩී. වින්තක, සහකාර ප්‍රාදේශීය ලේකම් ඩී.එස් . කැකුලාවල යන මහත්වරුන්ගේ උපදෙස් හා මඟ පෙන්වීම මත, හෝමාගම සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියේ ව්‍යාපෘති අංශයේ, සම්බන්ධීකරණයෙන් පොල්ගස්ඕවිට සමෘද්ධි කළමනාකාර පී. සංජීවනි වේවැල්ල, මහත්මියගේ අධීක්ෂණයෙන්, කහතුඩුව උතුර සමෘද්ධි සංවර්ධන නිලධාරී තුෂාරි වත්සලා ඉලේපෙරුම, මහත්මිය විසින් මෙම වැඩසටහන සංවිධානය කර තිබුණි.

එම අවස්ථාවට පොල්ගස්ඕවිට සමෘද්ධි කළමනාකාර පී. සංජීවනි වේවැල්ල, ව්‍යාපෘති කළමනාකාර පියනන්ද සමන් කුමාර, කහතුඩුව ගොවිජන සේවා මධ්‍යස්ථානයේ තාක්ෂණ නිලධාරී ජී.ටී. තිළිණ යන මහතුන්ගේ මහත්ම මහත්මීන් ද, පොල්ගස්ඕවිට සමෘද්ධි කලාපයේ ක්ෂේත්‍ර සමෘද්ධි සංවර්ධන නිලධාරී මහත්ම මහත්මීහුද, පොල්ගස්ඕවිට සමෘද්ධි කලාපයේ ප්‍රජාමූල බැංකුවල සාමාජික සාමාජිකාවෝ ද, සහභාගි වූහ.

කන්තර රෝහල්වලට ඔක්සිජන් සිලින්ඩර

සුවි ජාත්‍යන්තර බෞද්ධ සංවිධානය මගින් කළුතර දිස්ත්‍රික්කයේ රෝහල්වල කොරෝනා රෝගීන්ගේ ප්‍රයෝජනය සඳහා රුපියල් ලක්ෂ 65 ක් වටිනා ඔක්ස් සිලින්ඩර් 100 ක් පසුගියදා කළුතර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය උදය රත්නායක මහතාගේ ඉල්ලීම මත ලබාදෙන ලදී.

එම ඔක්සිජන් සිලින්ඩර් සංකේතාත්මකව සුවි බෞද්ධ පදනමේ ශ්‍රී ලංකා සම්බන්ධීකරණ අරෝෂ් පරණවිතාන මහතා හොරණ මූලික රෝහලේ වෛද්‍ය අධිකාරී අසන්ති ජයවර්ධන මහත්මියට බාර දුන් අයුරු.

කළුතර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය උදය රත්නායක මහතා ද මෙහි සිටී. **(කළුතර සුනිල් එස්. තන්ත්‍රිආරච්චි)**

කොම්පියුටර් පිල්මාටි එකකින් දේපළ අස්ථානගත වෙලා: පරීක්ෂණයක් ඕනෑ

මාදිවෙල කුරුලු උයන සංවර්ධන මුවාවෙන් අක්කර 35ක් විකුණලා

මහරගම නගර සභාව

රුවන් සේනාරත්න (ස්වාධීන 01)

සමන් සේනාධීර (ශ්‍රීලනිප)

මාදිවෙල අනවසර තට්ටු බිල්ඩිමට අවසර දුන්නේ කවුද?

උපුල් ඉන්දික (සජබ)

(මත්තේගොඩ ශාන්ත ප්‍රදීප් කුමාර කුලරත්න)

මහරගම නගර සභා බල ප්‍රදේශයෙන් වරිපනම් අයකළ දේපළ, තිස් දෙදහසක් පරිගණක පිල්මාර්ටි එකකින්, මේ වසරේදී අස්ථානගත වීම පිළිබඳව, සභාපතිවරයා මැදිහත්වී, වහාම පරීක්ෂණයක් පවත්වන ලෙස, මහරගම නාගරික මන්ත්‍රී (ස්වාධීන අංක 1) රුවන් සේනාරත්න මහතා පැවසිය.

මහරගම නගර සභාවේ මාසික මහා සභා රැස්වීම, නගර සභාවේ සභාපති විරාජ් ලක්රුවත් මහතාගේ ප්‍රධානත්වයෙන්, නගර සභා ශ්‍රවණාගාරයේදී ඉකුත්ද පැවති අවස්ථාවේදී සේනාරත්න මහතා එසේ කීය.

නගර සභාවේ ලේකම් එස්. ඒ.කේ.එන්. ඉන්ද්‍රජිත් මහතාගේ ආරාධනයෙන්, පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ හා නිලධාරීන්ගේ ප්‍රධානත්වයෙන් මෙදින මහා සභා රැස්වීම පැවැත්විණි.

රුවන් සේනාරත්න මහතා:- 2020 වසරේදී නගර සභාවට වරිපනම් අය කිරීම සඳහා දේපළ එක්ලක්ෂ විසි එක්දහසක් තිබුණා. නමුත් එය 2021 වසරේදී අඩු නව දහසකට අඩු වෙලා.

එහිදී අඩුවුණු දේපළ ගණන 32000 ක්. ඒ සඳහා රුපියල් 06.50 බැගින් අය කරගන. ඉන් ලැබුණු දෙලක්ෂ අට දහසක මුදල නිලධාරීන් අතරේ බෙදගෙනත් තියෙනවා. ඒ සඳහා ලේකම්වරයාගේ අනුමැතියත් ලැබිලා.

මේක සම්පූර්ණම වැරදි වැඩක්. මහරගම නගර සභාවේ වරිපනම් අංශය තමයි ලංකාවේ දූෂිතම වරිපණම් අංශය. මොකද මේකේ නිලධාරිනියක් ළඟ තමයි පරිගණක පින් අංකය තියෙන්නේ. මේ නගර සභාවේ සවස 5.30 පසුව සේවයේ නිරත ඇතැම් නිලධාරීන් කොම්පියුටර් හරහා හොල්මං කරනවා.

විවිධ රාජකාරි සිදුකර ගැනීමට පැමිණෙන පුද්ගලයින්ගෙන් රුපියල් 20,000 - 50,000 අල්ලස් අරගෙන තියෙනවා. මේ හැම දෙයක්ම කරන්නේ සභාපතිවරයා මුලා කරලා.

ඒ නිසා වරිපනම් අංශයේ සියලු නිලධාරීන් වෙනත් අංශවලට මාරු කරන්න. එහෙම නොවුණොත් ඉදිරියේදී විශාල මූල්‍ය වංචාවක් වරිපණම් අංශයෙන් සිදු විය හැකියි.

කාන්ති කොඩිකාර මහත්මිය (ශ්‍රී ලංකා) පොදුජන පෙරමුණ):- රුවන් සේනාරත්න මන්ත්‍රීවරයා හෙළිකළ තොරතුරට අනුව වරිපනම් අංශයෙන් දේපළ 32000 ක වංචාවක් සිදුකොට ඇත්නම් 2020 වසරේ දී ඉදිරිපත් කළ අයවැය වාර්තාව සම්පූර්ණයෙන් නීති විරෝධියි.

ඒ අනුව සභාපතිවරයා ඉදිරිපත් කර ඇත්තේ බොරු අයවැයක්. ඇයි මේ විදිහට වංචනික ලෙස සභාවට වත්කම් පෙන්නුවේ .

ඒ වගේම තමයි ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව මුදල් රෙගුලාසි හා වෙනස් කරලා වැඩකරලා තියෙනවා. මේකට සම්පූර්ණයෙන් සභාපතිවරයා වගකිවයුතුයි. මේ නීති විරෝධී වැඩ පිළිබඳව ඉදිරියේදී යම් පරීක්ෂණයක් කළහොත් සියලු මන්ත්‍රීවරුන්ට වගකියන්න සිද්ධවේවි.

අද මහරගම නගර සභාවේ විපක්ෂය නිදි නිසා මේ වංචා හෙළි කරන්න වෙලා තියෙන්නේ පාලක පක්ෂයටයි.

රුවන් ජයසිංහ මහතා (සමගි ජන බලවේගය):- මහරගම නගර සභාවේ මුදල් රෙගුලාසි චක්‍ර ලේඛ උල්ලංඝනය වන සිදුවීම් දකින්න, පාලක පක්ෂයට අවුරුදු තුනක් ගතවෙලා තියෙනවා. මේ ප්‍රකාශ පෞද්ගලික න්‍යාය පත්‍ර අනුව සිදුකරන දේවල්. විරුද්ධ දේට විරුද්ධ වෙන්නත් අගය කළ යුතු දේට සහාය දෙන්නත් විපක්ෂය එදා සිට ක්‍රියා කළා. අපි නිදි නැහැ ඔබතුමිය තමයි නිදි.

විපක්ෂය කාර්යභාරය පිළිබඳ අපිට උගන්නන්න එන්න එපා. ඒක අපි කර ගන්නම්. පාලක පක්ෂයේ කාර්යභාරය ඔබ තුමියල හරියට කරන්න පියවර ගන්න යැයි පැවසීය.

නිශාන්ත විමලචන්ද්‍ර මහතා (ශ්‍රී ලංකා) පොදුජන පෙරමුණ):- මේ නගර සභාවේ විශාල වශයෙන් දූෂණ සිදු වෙනවා, නිලධාරීන් චක්‍ර ලේඛන උල්ලංඝනය කරනවා. මේවා සභාපතිවරයාට කිව්වත් ඔහු හිතුවක්කාරී ලෙස මේ සභාව පවත්වාගෙන යනවා. මේව තවත් අපට ඉවසිය නොහැකියි.

ඒ නිසා මේ පිළිබඳව ආණ්ඩුකාරවරයා ඇතුළු ඉහළ බලධාරීන්ට මා පැමිණිලි කර තිබෙනවා.

මේ තත්ත්වය මත මහරගම නගර සභාව අයාලේ යන තත්ත්වයකට පත්වෙලා. මාස තුනක් වෙනවා ස්ථිර ඉංජිනේරුවරයෙක් පත් කරලා නෑ. අභ්‍යන්තර විගණනවරයෙක් ඉන්නවා. ඔහු හොඳයි සාර බුලත් විටවලට බුලත් ගණන් කරන්න. මේවා පිළිබඳව විපක්ෂය නිහඬයි.

අද වන විට මහරගම නගර සභාව අයාලේ යන තත්ත්වයකට පත්වෙලා. නිවැරදි කරන්න මොනතරම් උත්සාහ කළත් සාර්ථක උනේ නැහැ.

සමන් සේනාධීර මහතා (ශ්‍රී ලංකා) නිදහස් පක්ෂය):- මාදිවෙල කුරුලු උයන සංවර්ධනය කිරීම සඳහා පසුගියදා විශාල උත්සවයක් පවත්වලා නාගරික සංවර්ධන අධිකාරිය මැදිහත් වී මුල්ගල තිබ්බා. ප්‍රදේශවාසීන් හැටියට අපි සතුටු වුණා ප්‍රදේශයේ සංවර්ධනය පිළිබඳව. නමුත් අද සිද්ධවෙන්නේ වෙනත් දෙයක්.

මේ සංවර්ධනය මුවාවෙන් ප්‍රදේශයේ අක්කර 35ක් නාගරික සංවර්ධන අධිකාරිය මගින් පුද්ගලික සමාගමකට විකුණලා. මේක ද සංවර්ධනය කියන්නෙ. අද නාගරික සංවර්ධන අධිකාරිය ලෑන්ඩ් සේල් එකක් වෙලා.

ඒ නිසා නගර සභාව මැදිහත් වී නගර සභා බල සීමාවේ සිදුවන අත්තනෝමතික ව්‍යාපෘතිය වහාම නවත්තන්න පියවර ගන්න. ඒ සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රදේශවාසීන් ඉදිරියේදී පියවර ගන්නවා. ඒ වගෙම තමයි නගර සභා බල සීමාවේ පිහිටි, නාවින්න රිවඩ් පීරිස් පුද්ගලික සමාගම ඉදිරිපිට ඉඩමත් මේ වන විට විකුණන්න සැලසුම් කරලා තියෙනවා. ඒ නිසා ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ අත්තනෝමතික ක්‍රියා වහාම නවත්තන්න කියලා.

උපුල් ඉන්දික මහතා (සමගි ජන බලවේගය):- මාදිවෙල ප්‍රදේශය කියන්නේ අධි ආරක්ෂිත කලාපයක්. නමුත් මෙම අධි ආරක්ෂිත කලාපයේ තට්ටු හතරක ගොඩනැගිල්ලක් හදනවා. මේවට කවුද? අවසර දුන්නේ . මේ පිළිබඳව වහාම මැදිහත් වෙලා ගොඩනැගිල්ල ඉදිකිරීම නවත්වන්න කටයුතු කරන්න.

ඒ වගේම මෙම ප්‍රදේශයේ ගරාජයක් හා වඩු මඩුවක් නීති විරෝධීව පවත්වාගෙන යනවා. මේ තුළින් අවට පදිංචිකරුවන් දැඩි අපහසුතාවයට පත්වෙලා. මේ පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරියටත් පොලීසියටත් දැනුම් දුන්නහම ඔවුන් කියන්නේ මේක ඉවත් කිරීමේ අයිතිය තියෙන්නේ නගරසභාවට කියල. නමුත් මේ පිළිබඳව නගර සභාව නිහඬයි. මාස දහයකට ආසන්න වෙනව නගර සභාවට මේ ගැන පැමිණිලි කරලා. නමුත් පියවරක්ගෙන නැහැ.

එච්.එම්. රසිකා මහත්මිය (ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ):- කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳව රජය ගෙන යන වැඩපිළිවෙළට සමගාමීව ග්‍රාමීය වශයෙන් දැනට ගෙවතු වගා පවත්වාගෙන යන අය ඉලක්ක කරගනිමින්, එම නිෂ්පාදන වර්ධනය කර ගැනීමට නගර සභාව මැදිහත්වී උපදේශන සේවාවන් හා අනුග්‍රහය දක්වන ලෙස ඉල්ලා සිටිනවා. ඊට සමගාමීව කොම්පෝස්ට් බැරලයක්, උදැලු තලයක්, අත්මුල්ලුවක් වැනි කෘෂි උපකරණ කට්ටියක් ලබාදීමට නගරසභාව මැදිහත් වන ලෙසත් ඉල්ලා සිටිනවා.

සාවිත්‍රි ගුණසේකර මහත්මිය (ශ්‍රී ලංකා) පොදුජන පෙරමුණ):- මේ වෙනවිට මහරගම ප්‍රදේශය පුරා සුනඛ ගහණය වැඩි වීමෙන් ජලභීතිකාව වැනි රෝග ව්‍යාප්තවෙලා. ඒ නිසා සුනඛයින් එන්නත් කිරීම හා වන්ධ්‍යාකරණය කිරීමේ වැඩසටහන් දියත් කිරීම කාලෝචිත බව දන්වා සිටිනවා යැයි පැවසුවාය.

සණස ව්‍යාපාරය ජාත්‍යන්තර සමූපකාර දිනය සමරයි

ලොව පුරා ව්‍යාප්තව පවතින ප්‍රමුඛතම සමාජ සුබසාධන ව්‍යාපාරයක් වන සමූපකාර ව්‍යාපාරය සිය 99 වැනි සංවත්සරය පසුගියදා උත්සවාකාරයෙන් සැමරූ අතර ඊට සමගාමීව සණස සමිති, සණස ලයිෆ් ඉන්ෂුවරන්ස්, සණස ජෙනරල් ඉන්ෂුවරන්ස්, සණස සංවර්ධන බැංකුව ඇතුළු මෙරට සණස සමූහ ව්‍යාපාරයට අයත් ආයතනද, ජාත්‍යන්තර සමූපකාර දිනය අභිමානවත් ලෙස සැමරිය.

'එක්වී මනාව යළි ගොඩ නැගෙමු' යන තේමාව ඔස්සේ මෙවර ජාත්‍යන්තර සමූපකාර දිනය පැවැත්විණි. රටවල් 112ක් ජාත්‍යන්තර සමූපකාර සන්ධානයේ සාමාජිකත්වය ලබා ඇත. කාර්මික විප්ලවය සමග ඇති වුණ සාමාජීය සහ ආර්ථික වෙනස්කම් සමග පීඩනයට පත් වුණ ගොවියා සහ කම්කරුවා නගා සිටුවීමේ අරමුණින් සමූපකාර ව්‍යාපාරය මූලිකව අරඹන ලදී. 1923දී ප්‍රථම වරට ජාත්‍යන්තර සමූපකාර දිනය සැමරීමට තීරණය කරන ලදී. ඒ අනුව සෑම වසරකම ජූලි මස පළමු



වැනි සෙනසුරාදා ජාත්‍යන්තර සමූපකාර දිනය ලෙස නම් විය.

ආචාර්ය පී.ඒ. කිරිවන්දෙණිය මහතාගේ මූලිකත්වයෙන් ඇරැඹුණු සණස ව්‍යාපාරය සාමාජිකයන් ලක්ෂ 30කට ආසන්න ගණනකින් සමන්විත වන අතර සණස ප්‍රාථමික, දිස්ත්‍රික්, ජාතික සහ ජාත්‍යන්තර ලෙස මට්ටම් කිහිපයකින් ක්‍රියාත්මක වේ. එහි ප්‍රාථමික මට්ටමේ මූලික කාර්යයන් වන්නේ සාමාජිකයන්ගේ සකසුරුවම් බව වර්ධනය කිරීම, ආර්ථික වර්ධනයට මූල්‍ය සම්පත් සැපයීම, සාමාජිකයන්ට අධ්‍යාපනය සැපයීම ආදියයි. "සමූපකාර ව්‍යාපාරය නිර්මාණය වූණේ ලෝකයේ අර්බුද පවතින අවස්ථාවක. එනිසා ඉතාම අර්බුදකාරී අවස්ථාවල ප්‍රමුඛ බලපෑමක් කරන්න සමත් ශක්තිමත් ව්‍යාපාරයක් ලෙස සමූපකාර ව්‍යාපාරය සෑම විටම ක්‍රියාත්මක වුණා. වර්තමන් කොරෝනා අර්බුදය ඇති කළ ගැටලු විසඳ ගෙන ජන ජීවිත ජය ගන්න අවශ්‍ය මඟ පෙන්වීම සිදු කරන්න අප සූදානම්." සණස නිර්මාතෘ ආචාර්ය පී.ඒ. කිරිවන්දෙණිය මහතා පැවසීය.

සංචිත අර්බුදයට පිළියමක්

ඇමෙරිකානු ඩොලර් බිලියනයක විදේශ ණය නැවත ගෙවීමත් සමඟ ආණ්ඩුව තුළත් රට තුළත් ඒ සම්බන්ධයෙන් කතාබහක් ඇති විය. එම ණය මුදල ගෙවීමට නියමිතව තිබුණේ ජූලි 27 වැනිදා වන අතර ඊට දිනකට පෙර එය ගෙවා දැමීමට ආණ්ඩුවට හැකියාව ලැබිණි. ඒ අනුව ණය මඟ නොහැර නියමිත දිනට ගෙවීමේ මෙරට වාර්තාව ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යෑමට මේ ආණ්ඩුව ද සමත් විය. මේත් සමඟ රටේ විදේශ මූල්‍යයේ තිබෙන අවදානම් තත්ත්වය විසඳූ ගනු ඇතැයි විශ්වාසය ද ඇති වී තිබේ. විදේශ සංචිත කඩිනමින් නැවත පුරවා ගනිමින් දීර්ඝකාලීනව විදෙස් සංචිත ශක්තිමත් කරගන්නේ කෙසේ ද?

සංචිත නැවත පුරවා ගන්නේ කෙසේ ද?

ඇමෙරිකානු ඩොලර් බිලියන තුනකටත් අඩු අගයකට පහත වැටී තිබෙන විදේශ සංචිත ප්‍රමාණය මේ වසර අවසන් වන විටදී සෑහීමකට පත්වීමට හැකි අගයකට ගෙන ඒමට හැකියාව ලැබෙනු ඇතැයි ආණ්ඩුව විශ්වාස කරයි. මිත්‍ර රටවල් සමඟ මුදල් හුවමාරු (ස්වැප්)වලට එළැඹීමටත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රධාන සහ මේ වසරේ ඉදිරි මාසවලදී සේවාවලින් ඉහළ ආදායම් ලබාගත හැකි වනු ඇති බවටත් ආණ්ඩුව බලාපොරොත්තු තබා ඇත.

කෙසේ නමුත් විදේශ සංචිතවල තිබෙන මෙම භයානක සහ අස්ථිර ස්වභාවය මේ වසර අවසානයේදීත් පවතිනු ඇති බවත් ලබන වසරේ දී මෙම තත්ත්වය තවදුරටත් උග්‍ර වනු ඇති බවටත් විශ්ලේෂකයෝ/ විශේෂඥයෝ පෙන්වාදෙති. ලබන වසරේ දී තවදුරටත් විදේශ ණය ගෙවීම් කිරීමට තිබෙන බැවින් සහ ආනයන වියදම් වැඩිවීමත් යන කරුණු මුල් කරගනිමින් මේ තත්ත්වය උග්‍ර වනු ඇතැයි ඔවුහු පෙන්වාදෙති.

මුදල් හුවමාරු (ස්වැප්)

ඉන්දියාව සහ බංග්ලාදේශය සමඟ මුදල් හුවමාරු පහසුකම් තුළින් සහ චීනයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 150ක යුවාන් ණය පහසුකම් ලැබීමට නියමිත අතර මේවා මඟින් විදේශ සංචිත ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් (එස්.ඩී.ආර්./ ජාත්‍යන්තර සංචිත වත්කම්) යටතේ මෙරටට ලැබීමට නියමිත ඇමෙරිකානු ඩොලර් මිලියන 780ක මුදල ද විදෙස් සංචිත ඉහළ යෑමට උපකාරී වනු ඇතැයි අපේක්ෂිත ය.

මුදල් හුවමාරු යනු සංචිත ඉහළ දමන තාවකාලික පහසුකම් වන අතර එම මුදල් නැවත ගෙවිය යුතු වේ. චීනයෙන් ලැබෙන ණය පහසුකම චීනයෙන් ආනයනය කිරීමට උපකාරී වනු ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලැබෙන මුදල ප්‍රදානයකි.

ඉන්දියාවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක් ද බංග්ලාදේශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 250ක් ද වශයෙන් මුදල් හුවමාරු පහසුකම් ලැබීමට නියමිත ය. මේවා කෙටිකාලීන පහසුකම් වන අතර අවිනිශ්චිත තත්ත්වයක තිබේ. චීනයෙන් ලැබෙන යුවාන් ණය පහසුකම ප්‍රයෝජනවත් වන්නේ චීනයෙන් භාණ්ඩ මිලදී ගැනීමට පමණි.

ප්‍රයෝජනවත් සහන

මුදල් හුවමාරු, ණය සහ අනෙකුත් මූල්‍ය පහසුකම් සියල්ල සහන වන නමුත් ඒවා විසඳුම් නොවේ. කෙසේ නමුත් මේවා දැනට විදේශ මූල්‍යයේ තිබෙන අර්බුදකාරී තත්ත්වය විසඳගැනීමට ප්‍රයෝජනවත් වේ. කෙසේ නමුත් මේවා ප්‍රශ්නයට විසඳුම් නොවේ.

විසඳුම්

දැඩි ආනයන සීමා පනවමින් වෙළෙඳ හිඟය අඩු කරගැනීම අත්‍යවශ්‍ය වේ. වෙළෙඳ භාණ්ඩ අපනයන ආදායම වැඩි කිරීමත් සේවාවලින් ආදායම් වැඩි කරගැනීමත් රටේ විදේශ මූල්‍යයේ තිබෙන අර්බුදකාරී තත්ත්වය පාලනය කරගැනීමට උපකාරී වේ. දැනට අපේක්ෂිත බොහෝ අරමුදල්/ පහසුකම් කෙටිකාලීන සහන පියවර ය.

සරල සත්‍යය සම් රට විදේශ විනිමය උපයාගත්තේ ආනයන මත වියදම් කිරීමෙන් පසු ඉතිරි වන මුදලිනි. කෙටියෙන්ම සඳහන් කරන්නේ නම් වෙළෙඳ හිඟය අඩු කරගැනීමට පියවර ගත යුතු ය. හැකියාවක් ඇති නම් 2019 වසරේ දී මෙන් ගෙවුම් ශේෂයේ අතිරික්තයක් උපයාගත යුතු ය. එම අවස්ථාවේදී වෙළෙඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන අටක් වූ අතර සේවාවලින් සහ ප්‍රාග්ධන ගලාඒම්වලින් එය පියවා ගැනීමට හැකියාව ලැබිණි.

ඉකුත් වසරේ දැඩි ආනයන සීමා පනවමින් ආනයන අඩු කරගැනීමටත් වෙළෙඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන හයක් දක්වා අඩු වුවත් ගෙවුම් ශේෂයේ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන 2.3ක් විය.

ඉහළ ආදායම්

මේ වසරේ සිවුවැනි කාර්තුවේ දී ප්‍රේෂණ, තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවාවලින් සහ සංචාරක කර්මාන්තයෙන් ලැබෙන ආදායම් ඉහළ යනු ඇතැයි අපේක්ෂිත ය. එමඟින් සංචිත ප්‍රමාණවත් ප්‍රමාණයට වැඩි වනු ඇතැයි අපේක්ෂිත ය. ඉහළ වටිනාකමකින් සමන්විත මැණික් සොයාගැනීම තවත් වාසියකි. ඒවා ඇමෙරිකානු ඩොලර් මිලියන 100ත් 200ත් අතර වනු ඇතැයි ගණන් බලා ඇත. මැණික්, ඒවායේ අයිතිකරුවන්ට වාසියක් වුවද රටේ විදේශ සංචිතවලට නම් එතරම් වටිනාකමක් නැත. අප සිටින්නේ දැඩි අර්බුදයක ය. එබැවින් මහ මුහුදකට

ආචාර්ය
නිමල් සඳරත්න PhD

වතුරු බිංදු කිහිපයක් දමන්නාක් මෙන් මේ මැණික් අපේ දුර්වල සංචිතවලට එක් කළ හැකි ය. කෙසේ නමුත් මේ මැණික්වල වටිනාකම අඩු බවද මේ වනවිට දැනගන්නට ලැබේ. ඉහත කී මේ ගලාඒම් මඟින් මේ වසර අග වනවිට විදෙස් සංචිත ඉහළ යනු ඇතැයි අපේක්ෂිත ය.

අතීත අත්දැකීම්

රටේ වෙළෙඳ ගිණුමේ අතිරික්තයක් පැවැතියේ වසර හතරක් හෝ පහක් පමණි. ව්‍යුහගත ගැටලු තිබෙන බව එයින් ඉතා හොඳින් පැහැදිලි ය. අවසාන වරට වෙළෙඳ හිඟයේ අතිරික්තයක් වාර්තා වූයේ මීට වසර 44කට පෙර එනම් 1977 වසරේ දී ය. එය ද ඉතා කුඩා අගයකි. එම අතිරික්තය ළඟා කරගත්තේ දැඩි ආනයන සීමා පනවමින් සහ අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල හිඟ පවතින තත්ත්වයක් තුළ ය. එම සමයේ දී ජීවනෝපායවලට දැඩි දුෂ්කරතා ඵල්ලා විය. එමෙන්ම ආර්ථික වර්ධන වේගය ද අඩු අගයක පැවතුණි.

මූලධර්ම හේතු

දිගින් දිගටම වෙළෙඳ හිඟ පැවැතීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ අපනයන වැඩි කිරීමට ඇති අසමත්කම ය. කෙසේ නමුත් අපනයන වැඩි නොවුණ ද ආනයන දිගින් දිගටම සැලකිය යුතු අගයකින් වැඩි විය. බොහෝ වසරවලදී ආනයන වියදම අපනයන ආදායම මෙන් දෙගුණයක් විය. ඉකුත් වසරේ දී (2020) වෙළෙඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන හයක අගයකට ගෙන ඒමට සමත් විය. කෙසේ නමුත් එම වසරේ ආනයන වියදම ඇමෙරිකානු ඩොලර් බිලියන 16ක් වූ අතර අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 10ක් විය.

2021 වෙළෙඳ ශේෂය මේ වසරේ වෙළෙඳ ශේෂය කුමක් වනු ඇති ද ?

ඉකුත් වසරේ දී වෙළෙඳ හිඟය ඇමෙරිකානු ඩොලර් බිලියන හයක් වූ අතර මේ වසරේ දී වෙළෙඳ හිඟය දෙගුණ වනු ඇත. මේ වසරේ මුල් අර්ධයේ දී අපනයන ආදායම ඉතා හොඳ තත්ත්වයක් පෙන්නුම් කළ ද දැඩි ආනයන සීමා පනවා තිබුණ ද ආනයන වැඩි වීම හේතුවෙන් මේ වසරේ දී වෙළෙඳ හිඟය පසුගිය වරට සාපේක්ෂව දෙගුණ වනු ඇත.

අපනයන

මේ වසරේ මුල් අර්ධයේ අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 5.6ක් වූ බව අපනයන සංවර්ධන මණ්ඩලය ඉකුත් ද සඳහන් කළේය. වෙළෙඳ භාණ්ඩ අපනයන ඇමෙරිකානු ඩොලර් බිලියන 12ක් වනු ඇතැයි එම මණ්ඩලය ඇස්තමේන්තු කර ඇත. එය එසේ වුවත් ඉහළ ආනයන වියදම හේතුවෙන් වෙළෙඳ හිඟය තවදුරටත් පුළුල් වනු ඇත.

මේ වසරේ මුල් අර්ධයේ දී වෙළෙඳ භාණ්ඩ අපනයන ඇමෙරිකානු ඩොලර් බිලියන 5.56ක් ලෙස දැක්වුණු අතර එය පසුගිය වසර හා සැසඳීමේදී සියයට 27.5ක වර්ධනය කි. පසුගිය වසරේ මුල් මාස හයේ දී වෙළෙඳ භාණ්ඩ අපනයන ඇමෙරිකානු ඩොලර් බිලියන 4.36ක් විය. කොවිඩ්-19 වසංගතය තෙවැනි රැල්ල මධ්‍යයේ වුවද එම අපනයන ආදායම ලබාගත හැකි වූයේ දැඩි සීමා සහ බාධක මධ්‍යයේ ය. ජාත්‍යන්තර ඉල්ලුම ක්‍රමයෙන් වැඩි වීමත් සමඟ නිෂ්පාදිත අපනයන ද ක්‍රමයෙන් වැඩි විය.

ඉල්ලුම

ආනයන මත දැඩි සීමා පනවා තිබුණ ද ආනයන වියදම් වැඩි වීම හේතුවෙන් මේ වසරේ ගෙවුම් ශේෂයට අහිතකර ලෙස බලපෑම් ඵල්ල වනු ඇත. ආහාර, අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සහ අමුද්‍රව්‍ය සහ කෘෂිකාර්මික අපනයන ඇඳු වීම යනාදිය හේතුවෙන් මේ වසරේ දෙවැනි අර්ධයේ දී වෙළෙඳ හිඟය තවදුරටත් පුළුල් වනු ඇත. පොහොර ආනයනය මත සීමා පැනවීම හේතුවෙන් මීට ප්‍රතිචාර දක්වනු ඇති අතර විමඟින් වෙළෙඳ ශේෂයේ තත්ත්වය උග්‍ර වනු ඇත. ඊට ප්‍රධානම හේතුව ආහාර නිෂ්පාදන අඩු වීම යි.

ගෙවුම් ශේෂය

වෙළෙඳ ශේෂය පුළුල් වීම යන තත්ත්වය මධ්‍යයේ සේවා අංශවලින් ලැබෙන ආදායම් ඉතා වැදගත් වේ. පසුගිය වසරේ දී එය ඉතා වැදගත් විය. කෙසේ නමුත් මේ මොහොතේ තිබෙන වැදගත්ම ප්‍රශ්නය වන්නේ සේවක ප්‍රේෂණ, තොරතුරු සන්නිවේදන සහ තාක්ෂණ ක්ෂේත්‍රයෙන් ලැබෙන ආදායම් සහ ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් වෙළෙඳ හිඟය ඉක්මවා ගොස් ගෙවුම් ශේෂයේ අතිරික්තයක් නිර්මාණය කරනු ඇත්ද යන්න යි.

සාරාංශය

ඉකුත් මාසයේ දී විදේශ සංචිත ඇමෙරිකානු ඩොලර් බිලියන තුනටත් අඩු අගයකට අඩු විය. මෙය ඉතාමත් අඩු අගයක් වන මෙය භයානක තත්ත්වයකි. මේ වසරේ ආනයන අවශ්‍යතා ද ඉතා ඉහළ බැවින් පවතින්නේ අවදානම් සහගත තත්ත්වයකි. මුදල් හුවමාරු සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලැබෙන ප්‍රදානය මේ කඩිනම් දුෂ්කරතාවලින් රටට තාවකාලික සහන සහ පිළියම් සපයනු ඇත. මේවා මේ අවස්ථාවේ අවශ්‍ය සහන/පහසුකම් වන අතර කෙසේ නමුත් මේවා විසඳුම් නොවේ. විදේශ මූල්‍යයේ තිබෙන ව්‍යුහගත අර්බුදවලට විසඳුම් අවශ්‍ය වේ.

නිගමනය

රටේ විදේශ මූල්‍යයේ තිබෙන ප්‍රශ්නයට තිබෙන ඇති එකම ප්‍රායෝගික විසඳුම වන්නේ අපනයන වැඩි කරමින් වෙළෙඳ හිඟය අඩු කිරීමත් සේවාවලින් ආදායම් උපයමින් ගෙවුම් ශේෂයේ අතිරික්තයක් ඇති කරගැනීමත් ය.

සන්ඩේ ටයිම්ස් පුවත්පතේ පළවූ ලිපියේ පරිවර්තනය

හර්ෂණ තුෂාර සිල්වා

හම්බන්තොට වරායේ තොග නාණ්ඩ හැසිරවීම් ඉහළට



හම්බන්තොට ජාත්‍යන්තර වරාය (HIP) විසින් මුද හරින ලද ඉහළතම තොග ප්‍රමාණය වාර්තා කරමින් මැතකදී ඉන්සි සිමෙන්ති සඳහා ගෙන ආ පිප්සම් තොග දිනකට මෙට්‍රික් ටොන් 24,000 බැගින් හසුරුවන ලදී.

ඉන්සි සිමෙන්ති සමාගමේ ප්‍රසම්පාදන හා සැපයුම්හි අධ්‍යක්ෂ තුසිත් ගුණවර්ණසූරිය මහතා පවසන්නේ මෙය ශ්‍රී ලංකාවේ වරායකට වේගය සහ කාර්යක්ෂමතාව අනුව හිමිවූ සුවිශේෂී ජයග්‍රහණයක් බවයි. ඒ මහතා මෙසේද පැවසීය. "ශ්‍රී ලංකාවේ අංක 1 සිමෙන්ති නිෂ්පාදන සමාගම ලෙස අප විශාල යාත්‍රාවලින් අමුද්‍රව්‍ය ආනයනය කරනවා. එම යාත්‍රා රටට පැමිණි පසු හම්බන්තොට ජාත්‍යන්තර වරාය සමූහය (HIPG) සහ හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝර්ට් සර්විසස් සමාගම (HIPS) , වේගයෙන් තොග මුදහැරීමේ කටයුතු සිදු කරනවා. වරාය මෙහෙයුම් වේගවත් වන තරමට අපට පමණක් නොව රටටත් වැඩි වාසියක් ලැබෙනු ඇත. මහද්‍වයත් යාත්‍රාව වරායේ රැඳී සිටින දින 2 1/2 සඳහා අප, රඳවා තබා ගැනීමේ හා ප්‍රමාද ගාස්තු ලෙස ඇමෙරිකානු ඩොලර් 75,000කට ආසන්න මුදලක් ගෙවයි. එබැවින්, අප මෙවර සිදු කළ ආකාරයට මෙන් දින දෙකහමාරකට කලින් මුදහැරීමේ කටයුතු නිමා කළ නිසා, සැලකිය යුතු ලෙස පිරිවැය ඉතිරි කර ගැනීමට අපට හැකි වුණා. එය අපගේ සමාගමට වාසියක් වන අතර රට සඳහාද විදේශ විනිමය සැලකිය යුතු ලෙස ඉතිරි කිරීමකි".

HCL ශ්‍රී ලංකා මධ්‍යස්ථානයට සිනමන් Life තෝරාගනී



කොළඹ නගරයේ අභිනවින පහසුකම් වලින් සමන්විත නවතම කාර්යාලයීය කුලුන වන Cinnamon Life ව්‍යාපෘති 'The Offices' තම ශ්‍රී ලංකා මධ්‍යස්ථානය ලෙස තෝරාගැනීමට, ලොව ප්‍රමුඛතම තාක්ෂණ සමාගමක් වන HCL Technologies තීරණය කර තිබේ.

ඒ අනුව එම සමාගම 'The Offices' හි කාර්යාල අවකාශ අතරින් සියයට 80ක ප්‍රමාණයක් භාවිත කරනු ඇත. ජාත්‍යන්තර සමාගමක් මේ ආකාරයක මෙරට A ශ්‍රේණියේ කාර්යාලයීය කුලුනක කාර්යාල අතරින් බහුතරය වෙන්කරවා ගත් ප්‍රථම අවස්ථාව මෙයයි.

මේ සඳහා වන ගිවිසුමට HCL Technologies සහ පෝන් කිල්ස් හෝල්ඩින්ස් (JKH) යන සමාගම් වල නියෝජිතයන් විසින් පසුගියදා අත්සන් තබන ලදී. මේ ඔස්සේ තවත් දේශීය හා ජාත්‍යන්තර සමාගම් රැසක් මෙම ව්‍යාපෘතිය වෙත ආකර්ෂණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එමෙන්ම ජාත්‍යන්තර සමාගමක් මේ ආකාරයට මෙරට තුළ තම ව්‍යාපාර කටයුතු පුළුල් කිරීමට සැලසුම් කිරීම, දකුණු ආසියාවේ ව්‍යාපාරික කේන්ද්‍රයක් බවට පත්වීමට කොළඹ නගරය සතු හැකියාව පිළිබිඳ මනා සාක්ෂියක් ලෙසද සැලකිය හැකි ය.

කොළඹ නගරයේ සුවිශේෂී ස්ථානයක පිහිටා තිබීම, නවීනතම පහසුකම් වලින් සමන්විතවීම සහ උසස් ප්‍රමිතිය සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමුකරමින් ඉදිකර තිබීම යනාදිය, Cinnamon Life ව්‍යාපෘතියේ The Offices තෝරාගැනීමට HCL සමාගම යොමුකරවූ ප්‍රධානතම සාධක ලෙස සැලකේ.

එමිරේට්ස් මඟින්ට නොමිලේ Expo නරඹන්න අවස්ථාවක්

කළාපයේ දැවැන්තම වෙළෙඳ ප්‍රදර්ශනයක් වන 2020 ඩුබායි Expo වෙළෙඳ ප්‍රදර්ශනයේ ප්‍රමුඛතම පාර්ශ්වකරුවා සහ නිල ගුවන් සමාගම ලෙස එමිරේට්ස් මෙම ප්‍රදර්ශනය නැරඹීමට සමාගමේ ගුවන් මඟින්ට සුවිශේෂී ප්‍රතිලාභයක් ඉදිරිපත් කර තිබේ.

මේ අනුව, මෙම වැඩසටහන පැවැත්වෙන 2021 ඔක්තෝම්බර් 01 වැනිදා සිට 2022 මාර්තු 31 වන දක්වා කාල සීමාව තුළදී ඕනෑම අවස්ථාවක ඩුබායි වෙත පැමිණෙන සහ ඩුබායි හරහා ගමන් කරන එමිරේට්ස් මඟින්ට ඔවුන්ගේ සියලුම ගුවන් ටිකට්පත් වලට නොමිලේ Emirates Expo Day Pass එකක් ලබාදීමට ගුවන් සමාගම කටයුතු කර ඇතැයි එම සමාගම සඳහන් කරයි.

එමිරේට්ස් සඳහන් කරන්නේ 2021 ඔක්තෝම්බර් 01 වැනිදා සිට 2022 මාර්තු 31 වැනිදා දක්වා ඩුබායි වෙත හෝ ඩුබායි හරහා ගමන් කරන සියලුම එමිරේට්ස් ගුවන් මඟින්ගේ ටිකට් පත් සඳහා මෙම විශේෂ දීමනාව ලබාදෙන බවයි. මීට අමතරව, චක්සත් අරාබි එමීර් රාජ්‍යයට පිටත සිට පැමිණෙන එක් දිගාවකට පමණක් ගමන් කරන ගුවන් මඟින් ඩුබායි වෙත පැමිණීමේදී හෝ ඩුබායි හි අවම රැඳී සිටීමේ කාලය සම්පූර්ණ කරමින් වෙනත් ගමනාන්ත වෙත ගමන් කිරීමේදී ත්‍යාගයක් ලෙස Expo Day Pass එකක් ප්‍රදානය කිරීමටද එමිරේට්ස් කටයුතු කර තිබේ.

ස්පාර්ක්ලින්ක් හතළිස් දෙවසරක විශිෂ්ටත්වය සමරයි

දශක හතරකට අධික කාලයක් පුරා මෙරට සංචාරක ක්ෂේත්‍රය තුළ විශිෂ්ට සහ කැපිපෙනෙන කාර්යභාරයක් සිදුකළ ස්පාර්ක්ලින්ක් ට්‍රැවල්ස් (Sparklink Travels) ආයතනය පසුගියදා සිය 42වැනි සංවත්සරය සමරනු ලැබිය. වර්ෂ 1979දී නිහාල් පෙරේරා මහතාගේ මූලිකත්වයෙන් පවුලේ ව්‍යාපාරයක් ලෙස ආරම්භ වූ Sparklink Travels අද දක්වාම ඒකාබද්ධතාව, සක්‍රියතා සහ ගුවන් සවාරි, නෞකා සවාරි සහ සංචාරවල විශිෂ්ටත්වය තුළින් සුවිශේෂී සේවාවක් සංචාරකයන්ට ලබාදීමට කැපවී සිටියි. එම සුවිශේෂත්වය හේතුවෙන් ප්‍රතිඵල සහතිකය ලත් සංචාර ආයතනයක් බවට පත්වීමට ද එම ආයතනයට හැකිවී තිබේ.

මෙරට සංචාරක කර්මාන්තය තුළ සිටින ප්‍රවීණ චරිතයක් වන නිහාල් පෙරේරා මහතා ලංකා සංචාරක මණ්ඩලයේ සංවර්ධන හා ප්‍රචාරණ අංශයේ අධ්‍යක්ෂවරයා ලෙස ද සේවය කළේය. ඔහු මේ වනවිට ප්‍රකී පෙරේරා සමඟ එක්ව ඕස්ට්‍රේලියාවේ සිට ස්පාර්ක්ලින්ක් ට්‍රැවල්ස් Australia ආයතනය ද මෙහෙයවනු ලබයි. ස්පාර්ක්ලින්ක් ට්‍රැවල්ස් සතු පළපුරුදු සහ වෘත්තීය කාර්යමණ්ඩලය වර්තමානයේදී සිය සංචාරක සේවා, කොල්ලුපිටිය, ලිබර්ටි ආර්කේඩ්හි පිහිටි සිය කාර්යාලයේ මෙන්ම දුරස්ථ වශයෙන් ද ක්‍රියාත්මක වෙමින් ලබාදෙන අතර, සඳුදා සිට සිකුරාදා දක්වා දූරකථනය ඔස්සේ ද ඔවුන්ගේ සේවා පිළිබඳ තොරතුරු ලබාගත හැක. මේ අතර කොරෝනා විසංගත තත්ත්වය හමුවේ අවලංගු වූ සංචාරවලට අදළව සංචාරකයන් විසින් ගෙවා තිබූ මුදල්වලින් රුපියල් මිලියන 10කට වැඩි ගණනක් නැවත ගෙවීමට ද සමාගම විසින් දැනටමත් පියවර ගෙන තිබේ. නැවතත් ජාත්‍යන්තර දේශසීමා විවෘත වීමත් සමඟ තම සුපුරුදු සේවා සංචාරකයන්ට ලබාදීමට ස්පාර්ක්ලින්ක් ට්‍රැවල්ස් සමාගම සූදානම්ව සිටියි.

ඛයලොග් ක්‍රීඩා අමාත්‍යාංශය සමඟ youth Can දියත් කරයි

ශ්‍රී ලාංකික තාරුණ්‍යයට තම කුසලතා ඔප් නැංවීමට මඟ පෙන්වීම හා සහයෝගය ලබා දීම අරමුණකර ගනිමින්, අන්තර්ජාතික තරුණ දිනයට සමගාමීව ඛයලොග් ආෂ්ආථා සමාගම තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය සමඟින් එක්ව Youth Can වැඩසටහන පසුගිය දා දියත් කළේය.

මෙම වැඩසටහන තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය හා ජාතික තරුණ සේවා සභාව සමඟින් එක්ව, මිනිස් බල හා රැකියා දෙපාර්තමේන්තුවේ, කුඩා ව්‍යවසාය සංවර්ධන අංශයේ සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව, සුවිශේෂී හැකියාවන් සහිත තරුණ තරුණියන්ට ඔවුන්ගේ කැමති ක්ෂේත්‍රවල ඉදිරියට යාමට අවශ්‍ය අවස්ථාව උදකර දෙයි. ඔවුන්ගේ සිහින සැබෑ කර ගැනීමට අවස්ථාව උදෙ වේ.

මෙම තුන් අවුරුදු වැඩසටහන වයස අවුරුදු 14

ත් 35 ත් අතර වයස් සීමාවන් තුළ සිටින තරුණ තරුණියන්ගේ හැකියාවන් සහ දක්ෂතාව ක්‍රීඩා, නව ව්‍යාපාර අදහස්, ශිල්ප කලා, මෝස්තර නිර්මාණකරණය, සූපවේදය සහ කෝපි චිත්‍රපට යන අංශ 6ක් ඔස්සේ තරඟකාරීව එළිදැක්වීම කෙරෙහි අවධානය යොමු කෙරේ. තෝරාගත් අයදුම්කරුවන් සඳහා වැඩමුළුව, අදළ මෙවලම් හා පුහුණුව ලබා දී, දැනුමින් සහ හැකියාවන්ගෙන් බලගැන්වීමත් සිදුවනු ඇත. ජාතික තරුණ සේවා සභාව, මිනිස්බල හා රැකියා දෙපාර්තමේන්තුව, කුඩා ව්‍යවසාය සංවර්ධන අංශය සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් පත්කළ ඒ ඒ ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගෙන් තේරීම් කමිටුව සමන්විත වනු ඇති අතර, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ තේරීම් සිදුවනු ඇත. මේ පිළිබඳව වැඩි විස්තර ලබා ගැනීම් සහ අයදුම්පත් යොමු කිරීම www.youthcan.lk කෘන වෙබ් අඩවිය ඔස්සේ සිදුකළ හැකිය.

සිංගර් වෙතින් අති නවීන ස්මාර්ට් බෝඩ්

සිංගර් විසින් ඩිජිටල් අධ්‍යාපනය සඳහා ස්මාර්ට්බෝඩ් නිෂ්පාදන පෙළක් වෙළඳපොළට හඳුන්වා දෙනු ලැබ ඇත. මාර්ගගත අධ්‍යාපනික කටයුතු සහ ව්‍යාපාරික රැස්වීම්/සම්මන්ත්‍රණ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම මෙහි මූලික අරමුණයි.

සිංගර්, දැනට ලොව නවීනතම LED තිර නිෂ්පාදනය කරන Skyworth සමාගමේ ස්මාර්ට්බෝඩ් නිෂ්පාදන පෙළක් හඳුන්වාදී ඇත. පරිගණකය, රූපවාහිනිය, ප්‍රොජෙක්ටරය සහ වයිට්බෝඩ් සතු සියලු විශේෂාංග වලින් සමන්විත වන ලෙස මෙම ස්මාර්ට්බෝඩ් නිර්මාණය කරඇත.



කාර්යන් කිහිපයක් එකවර කරගත හැකි මෙම ස්මාර්ට්බෝඩ් වර්තමාන ඔන්ලයින් අධ්‍යාපන කටයුතු සඳහා පවතින හොඳම විකල්පය බව එම සමාගම කියයි.

මෙය අඟල් 55, 65 සහ 75 ලෙස ප්‍රමාණයන් තුනකින් සහ ඇන්ඩ්‍රොයිඩ් හෝ වින්ඩෝස් 10 යන මෙහෙයුම් පද්ධති වලින් ලබාගත හැක. මෙම ස්මාර්ට්බෝඩ් නිෂ්පාදන පෙළ මඟින් වයිට්බෝඩ් හි සටහන් ලිවීම, අනෙක් පාර්ශ්වයට නැරඹිය හැකිලෙස වීඩියෝ සහ තිරය පෙන්විය හැකිවීම වැනි ප්‍රතිලාභ රැසක් හිමිකරදෙයි. ගුරුවරුන්ට ඉගැන්වීමට අවශ්‍ය දෑ මෙහි ගබඩා කර තබාගත හැකි බැවින් ඉදිරි ඉගැන්වීම් කටයුතු වලදී ඒවා පහසුවෙන් භාවිත කළ හැකිය.

ඩබ්ලිව් ආයුර්වේද රෝහලෙන් පොත් බෙදාදීමක්

**ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයුර්වේද රෝහලක් වන ඩබ්ලිව් ආයුර්වේද රෝහල සිය ආයතනික සමාජ වගකීම මනාව හඳුනා ගනිමින් පාසල් සහ දහම් පාසල් දරුවන් වෙනුවෙන් පොත් පත් බෙදා දෙමින් සමාජ සත්කාර රැසක් දියත් කළේය. එහි සුවිශේෂ පියවරක් සනිටුහන් කරමින් පසුගියදා මැදිරිගිරිය පෙ/දමෙය්පුර ප්‍රාථමික විද්‍යාලයට, මොරටුව ශ්‍රී ආරියවංශ දහම් පාස